321 වන කාණ්ඩය - 10 වන කලාපය
தொகுதி 321 - இல. 10
Volume 321 - No. 10

2025 ඔක්තෝබර් 08වන බදාදා
2025 ஒக்ரோபர் 08, புதன்கிழமை
Wednesday, 08th October, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**
කථානායකතුමාගේ සහතිකය [තීරුව 1567]
වරප්‍රසාද: 2025.07.17 දින කෝප් කමිටුවේදී කරන ලද චෝදනාව [තීරුව 1567]
පාර්ලිමේන්තුවේ නවරාත්‍රී උත්සවය [තීරුව 1569]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 1570]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 1570]

**ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න** [තීරුව 1579]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1591-1614]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
මත්ද්‍රව්‍ය උවදුර පාලනය කිරීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම [තීරුව 1615]
වාහන අංක තහඩු නිකුත් නොකිරීම නිසා මුහුණ දෙන දුෂ්කරතා [තීරුව 1617]

**රාජ්‍ය විශ්වවිද්‍යාල උපාධිධාරීන්ගේ බුද්ධි ගලනය:**
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය [තීරුව 1621]

**කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රමාදය:**
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1624]

**රජයේ භාෂා පරිවර්තක සේවයේ ගැටලු:**
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1627]

**පරිපූරක මුදල:**
වැය ශීර්ෂ අංක 117හි ඉතිරි ප්‍රතිපාදන මූල්‍ය කේතය 11 යටතේ දේශීය අරමුදල් වෙත මාරු කිරීම [තීරු 1630– 1727]

**කල්තැබීමේ යෝජනාව:**
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු ඉඩම් පදිංචිකරුවන්ට නිදහස් කිරීම [තීරු 1727-1740]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**
சபாநாயகரது சான்றுரை [ப: 1567]
சிறப்புரிமை: 2025.07.17ஆம் திகதி 'கோப்' குழுவில் முன்வைக்கப்பட்ட குற்றச்சாட்டு [ப: 1567]
பாராளுமன்றத்தில் நவராத்திரி விழா [ப: 1569]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 1570]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 1570]

**மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்** [ப: 1579]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1591-1614]

**தனி அறிவித்தல் மூல வினா:**
போதைப்பொருள் அச்சுறுத்தலைக் கட்டுப் படுத்துவதற்கான பொறிமுறையை வலுப் படுத்துதல் [ப: 1615]
வாகன இலக்கத் தகடுகள் வழங்காமையால் ஏற்படும் சிரமங்கள் [ப: 1617]

**அரச பல்கலைக்கழக பட்டதாரிகள் நாட்டைவிட்டு வெளியேறல்:**
பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று [ப: 1621]

**காங்கேசன்துறை துறைமுகத்தைப் புனரமைப்பதில் தாமதம்:**
போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரினது கூற்று [ப: 1624]

**அரசாங்க மொழிபெயர்ப்பாளர் சேவையிலுள்ள பிரச்சினைகள்:**
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரினது கூற்று [ப: 1627]

**குறைநிரப்புத் தொகை:**
செலவினத் தலைப்பு இல. 117இன் எஞ்சியுள்ள ஒதுக்கீடுகளை நிதியளிப்பு குறியீடு 11இன்கீழ் உள்நாட்டு நிதிக்கு மாற்றுதல் [ப: 1630 - 1727]

**ஒத்திவைப்புப் பிரேரணை:**
திருகோணமலை மாவட்டத்தில் இலங்கை துறைமுக அதிகாரசபையின் காணிகளைக் குடியிருப்பாளர் களுக்கு விடுவித்தல் [1727-1740]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
Speaker's Certificate [Col. 1567]
Privilege: Allegation Made at COPE Held on 17.07. 2025 [Col. 1567]
Navaratri Festival of Parliament [Col. 1569]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1570]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 1570]

QUESTIONS POSED TO HON. PRIME MINISTER [Col. 1579]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1591-1614]

QUESTION BY PRIVATE NOTICE:
Strengthening of Mechanism for Controlling Drug Menace [Col. 1615]
Difficulties Faced Due to Non-Issuance of Vehicle Number Plates [Col. 1617]

BRAIN DRAIN OF GRADUATES OF STATE UNIVERSITIES:
Statement by Prime Minister and Minister of Education, Higher Education and Vocational Education [Col. 1621]

DELAY IN RENOVATING KANKESANTHURAI PORT:
Statement by Minister of Transport, Highways, Ports and Civil Aviation [Col. 1624]

ISSUES IN GOVERNMENT TRANSLATORS' SERVICE:
Statement by Minister of Public Administration, Provincial Councils and Local Government [Col. 1627]

SUPPLEMENTARY SUM:
Transfer of Remaining Provisions of Head No. 117 to Local Funds under Financing Code 11 [Cols. 1630– 1727 ]

ADJOURNMENT MOTION:
Release of Sri Lanka Ports Authority Lands in Trincomalee District to Settlers [1727-1740]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 ඔක්තෝබර් 08වන බදාදා***
*2025 ஒக்ரோபர் 08, புதன்கிழமை*
*Wednesday, 08th October, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මවිසින් 2025 ඔක්තෝබර් 07 දින "ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය" සහ "ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## II

### වරප්‍රසාද: 2025.07.17 දින කෝප් කමිටුවේදී කරන ලද චෝදනාව
### சிறப்புரிமை: 2025.07.17ஆம் திகதி 'கோப்' குழுவில் முன்வைக்கப்பட்ட குற்றச்சாட்டு
### PRIVILEGE: ALLEGATION MADE AT COPE HELD ON 17.07.2025

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය විසින් 2025 ජූලි 22 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ඔබතුමා චමින්ද්‍රාණි කිරිඇල්ල මැතිනිය ඉදිරිපත් කරපු වරප්‍රසාද ප්‍රශ්නය ගැන ඔබතුමාගේ තීන්දුව ඉදිරිපත් කළා. හැබැයි, තවත් මන්ත්‍රීවරු ගණනාවක් වරප්‍රසාද ප්‍රශ්න ඉදිරිපත් කර තිබෙනවා. කවිරත්න මැතිනියත්, දිලිප් වෙදආරච්චි මැතිතුමාත්, ජගත් විතාන මැතිතුමාත් ඊට මාස ගණනාවකට පෙර වරප්‍රසාද ප්‍රශ්න ඉදිරිපත් කළත්, අද වෙනකම් ඒවා සම්බන්ධයෙන් තීන්දුවක් ලැබිලා නැහැ. ඒවා වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කරන්නවත් ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ සම්බන්ධයෙන් කිසිම නිගමනයක් නැහැ, කිසිම විභාගයක් නැහැ. ඒ නිසා මේ සම්බන්ධව ගරු කථානායකතුමාගේ අවධානය යොමු කරවනවා. කවිරත්න මැතිනියගෙත්, දිලිප් වෙදආරච්චි මැතිතුමාගෙත්, ජගත් විතාන මැතිතුමාගෙත් වරප්‍රසාද ප්‍රශ්න පිළිබඳව මේ පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කරලා, ඒ පිළිබඳව විභාග කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතිනවා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

ගරු කථානායකතුමනි, මගේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරලා මාස දෙකක් වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතිනවා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා මගේ ජීවිතය සම්බන්ධව තර්ජන ආපු අවස්ථාවල- *[බාධා කිරීමක්]* අද වෙනතුරු කිසිම තැනකදී ඒ පිළිබඳව අවධානය යොමු කරලා ඒ සම්බන්ධයෙන් ගත් තීන්දුවක්, තීරණයක් ගැනවත් කිසිදු සටහනක් ඇවිල්ලා නැහැ. *[බාධා කිරීමක්]* පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විධියට අපි මෙතැනදී වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම ඒ සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය මේක නම් සාමාන්‍ය ජනතාවගේ ප්‍රශ්න සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය මොකක්ද කියලා ඔබතුමා පොඩ්ඩක් හිතන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ ප්‍රශ්නය සම්බන්ධයෙන් පොලිස්පතිතුමාගෙන් වාර්තාවක් කැඳවා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජගත් විතාන මන්ත්‍රීතුමා.

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
අපේ ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා, මගේ ළඟ නීති විරෝධි අවි තිබෙනවා කියලා ප්‍රසිද්ධ නාළිකාවක කරපු ප්‍රකාශය ගැන මම අගෝස්තු මස 5වැනි දා වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. ගරු කථානායකතුමනි, ඒ පිළිබඳව තවම -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතිනවා.

## III

## පාර්ලිමේන්තුවේ නවරාත්‍රී උත්සවය
## பாராளுமன்றத்தில் நவராத்திரி விழா
## NAVARATRI FESTIVAL OF PARLIAMENT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නවරාත්‍රී උත්සවය, 2025 ඔක්තෝබර් 09වැනි බ්‍රහස්පතින්දා පෙ.ව. 7.50 සිට පෙ.ව. 9.00 දක්වා මාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තු සංකීර්ණයේ දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බැවින්, එයට පැමිණ සහභාගි වන ලෙස සියලුම ගරු මන්ත්‍රීවරයන්ට කාරුණිකව ආරාධනය කිරීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

- Order made by the Minister of Education, Higher Education and Vocational Education under Section 27(1)(b) read with Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Bachelor of Science Honours in Counselling Psychology Degree awarded by Benedict XVI Catholic International Institute of Higher Education and published in Gazette Extraordinary No. 2438/26 of 28th May, 2025;
- Order made by the Minister of Education, Higher Education and Vocational Education under Section 27(1)(b) read with Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Bachelor of Science Honours in Computer Science in Network Security and Forensics Degree awarded by CINEC Campus (Private) Limited and published in Gazette Extraordinary No. 2441/15 of 18th June, 2025;
- Order made by the Minister of Education, Higher Education and Vocational Education under Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Bachelor of Science (Honours) in Information Technology and Bachelor of Business Administration Honours Degrees awarded by Sri Lanka Institute of Information Technology (Guarantee) Limited - Kandy Branch and published in Gazette Extraordinary No. 2441/16 of 18th June, 2025; and
- Order made by the Minister of Education, Higher Education and Vocational Education under Section 25A of the Universities Act, No. 16 of 1978 with regard to the Bachelor of Science (Honours) in Information Technology and Bachelor of Business Administration Honours Degrees awarded by Sri Lanka Institute of Information Technology (Guarantee) Limited - Jaffna Branch and published in Gazette Extraordinary No. 2441/17 of 18th June, 2025. - [The Hon. (Dr.) Harini Amarasuriya]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, on behalf of the Chairman of the Committee on Public Finance, I present the Report of the Committee on Public Finance on Supplementary Estimate No. 03 of 2025, Head 117 - Programme 02 for the year 2025 under the Ministry of Transport, Highways, Ports and Civil Aviation, which was referred to the said Committee.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
Hon. Speaker, I present the Report of the Special Meeting of the Sectoral Oversight Committee on Environment, Agriculture and Resource Sustainability on Finding Solutions to Climate Change through Updating the Sri Lanka Climate Prosperity Plan.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

Sir, I would like to thank all the Delegates from the Climate Vulnerable Forum, especially His Excellency Mohommad Nasheed, Secretary-General of the CVF and former President and Speaker of the Maldives, Mr. Sandith Samarasinghe, Director - Inclusive Resilience and former Member of Parliament and Ms. Rachel Mundilo, Deputy Director, Parliaments and Membership and Partnership Coordinator.

This, I think, is a very special Report and therefore, I would like to urge everyone to read it carefully and pay attention to its contents. We want to implement the CPP in Sri Lanka.

Thank you very much.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු කථානායකතුමනි, අනුරාධපුර, සාලියපුර, මාන්කඩවල, මංගල පාර, අංක 218/1 යන ලිපිනයෙහි පදිංචි ආර්.පී. නිව්ටන් රත්නායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ගාල්ල, බටගන්විල, වේවැල්වල පාර, අංක 9/10 බී යන ලිපිනයෙහි පදිංචි ප්‍රසන්න දියුණුගේ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නන්දන පත්මකුමාර මහතා**
(மாண்புமிகு நந்தன பத்மகுமார)
(The Hon. Nandana Pathmakumara)

ගරු කථානායකතුමනි, කළුතර, නාගොඩ, පරණ ගුවන් තොටුපොළ පාර, අංක 97/07 යන ලිපිනයෙහි පදිංචි ජී.ඒ.අයි.වී. කරුණාතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නන්ද බණ්ඩාර මහතා**
(மாண்புமிகு நந்த பண்டார)
(The Hon. Nanda Bandara)

ගරු කථානායකතුමනි, අරණායක, අම්බලකන්ද යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ටී.කේ. විජේසේකර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු කථානායකතුමනි, බණ්ඩාරවෙල, අමුණුදෝව, ඇටම්පිටිය පාර, අංක 36/සී යන ලිපිනයෙහි පදිංචි එස්.එස්. නඩරාස් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரியந்த விஜேரத்ன)
(The Hon. Priyantha Wijerathna, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, වැම්පිටිය, පූලාවල, අංක 42 යන ලිපිනයෙහි පදිංචි ටී.එම්. කරුණාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)

ගරු කථානායකතුමනි, දර්ගා නගරය, මීගම, කඹුරුගොඩ යන ලිපිනයෙහි පදිංචි බන්දුල සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)

ගරු කථානායකතුමනි, කැකිරාව, ඉලුක්ගම, අංක 226, දිරිය නිවස යන ලිපිනයෙහි යෙහි පදිංචි පී.ජී. චන්ද්‍රසේකර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලට යොමු වීමට පෙර විපක්ෂයේ මන්ත්‍රීවරුන් වෙනුවෙන් මේ කාරණය කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවන්න මම කැමැතියි. මේ දිනවල වාර්තා පළ වෙනවා, ස්වාධීන කොමිෂන් සභාවක් ලෙස ස්ථාපනය කර තිබෙන පොලිස් කොමිසම සතුව තිබෙන නිලධාරීන් මාරු කිරීම ඇතුළු බලතල පිටතට ගැනීමේ උත්සාහයක් තිබෙන බවට. ඒ පිළිබඳ සත්‍ය අසත්‍යතාව සහ රජයේ ස්ථාවරය අපට පැහැදිලි කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, එම කාරණාව සම්බන්ධයෙන්මද ඔබතුමාත් කථා කරන්නේ?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

එම කාරණය සම්බන්ධයෙන් තමයි මමත් පොඩි අදහසක් ඉදිරිපත් කරන්නේ, ගරු කථානායකතුමනි. මේ National Police Commission එක ස්ථාපිත කරන්නේ 1991දී. මේ සම්බන්ධව තිබෙන පනත තමයි, 1990 අංක 1 දරන පොලිස් කොමිෂන් සභා පනත. එතැනින් පස්සේ කොමිෂන් සභා ස්ථාපිත කිරීමේදී දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය දිගටම ක්‍රියාත්මක වෙනවා. ගරු කථානායකතුමනි, National Police Commission එකට තමයි සම්පූර්ණ බලය තිබෙන්නේ, පොලීසිවල ස්ථානාධිපතිවරු මාරු කිරීම සම්බන්ධව තීන්දුවක් ගන්න. නමුත් කිසිම හේතුවක් නැතුව අද වෙනකොට පොලිස් ස්ථානාධිපතිවරුන් තිස් දෙදෙනෙක් මාරු කරලා තිබෙනවා. ඒ වාගේම senior DIGsලා මාරු කරලා තිබෙනවා, කිසිම වැඩ පිළිවෙළක් නැතුව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, Standing Order No. 126 යටතේ මේ ප්‍රශ්නය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාවට යොමු කරලා විසඳාගන්න ඕනෑ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමා. *[බාධා කිරීමක්]* මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාවට යොමු කරමු. *[බාධා කිරීමක්]* ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මටත් අවස්ථාවක් දෙන්න, මේ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරන්න. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉතාම පැහැදිලිව සඳහන් වෙනවා, මේ කොමිෂන් සභා පත් කරන්නේ ස්වාධීනත්වය, අපක්ෂපාතීත්වය සහ කාර්යක්ෂමතාව ශක්තිමත් කරන්න කියලා.

ඒ වාගේම ඒවායේ කටයුතු නිර්දේශපාලනීකරණයට ලක්කොට මේ රටේ යහපත් රාජ්‍ය පාලනයක් ක්‍රියාත්මක කරන්නටයි. පැහැදිලිවම දහහත්වන සහ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මඟින් සංවරණ සහ තුලන - checks and balances - ක්‍රමවේදය තුළ මේ රටේ පොලිස් ක්ෂේත්‍රය -පොලිස් සේවාව- අපක්ෂපාතීව, ස්වාධීනව ක්‍රියාත්මක කරන්නට එම බලය කොමිෂන් සභාවලට ලබා දුන්නා. මේ මොහොත වනවිට අර කියපු ආකාරයට පොලිස් සේවාව තුළ සිදු වන මේ මාරු කිරීම් තනි අතකට පැවරිලා තිබෙනවා; පොලිස්පතිවරයාට ඒක පැවරිලා තිබෙනවා. එම නිසා අපි බොහොම පැහැදිලිව කියන්න ඕනෑ වාගේම අවබෝධ කර ගන්න ඕනෑ, අපේ රට පොලිස් රාජ්‍යයක් නොවෙයි, මේක ප්‍රජාතන්ත්‍රවාදී රටක් බව. මේ ප්‍රජාතන්ත්‍රවාදී රට තුළ සංවරණ හා තුලන - checks and balances - තිබෙන්නට ඕනෑ. පොලිස් කොමිසම ආණ්ඩුවේ රූකඩයක් කර ගන්නට බැහැ. ඒක පඹයෙක් කර ගන්නට බැහැ. ගරු කථානායකතුමනි, මේ පිළිබඳව විධිමත් පියවරක් ගන්නට ඕනෑ. බොහොම කාරුණිකව, ඒ කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. පොලිස් කොමිසම සතු බලතල පොලිස්පතිවරයාගේ තනි අතට ලබා දීම ගැන විපක්ෂයක් හැටියට අනිවාර්යයෙන්ම අපේ පොදු විරෝධතාව මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. ස්ථාවර නියෝග 126 යටතේ මම මේ කාරණය අහන්නේ. ඒ අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ගෙනෙන යෝජනා එතැනට යැවිය හැකියි. ඔබතුමා හැම දාම ස්ථාවර නියෝගවල තිබෙන දේවල් පෙන්වලා මේ සභාව නොමඟ යවන්න එපා. මේ ආණ්ඩුවත් එහෙමයි. දැන් ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා ප්‍රකාශ කළේ මොකක්ද? එතුමා කිව්වේ, පොලිස් කොමිසමට තිබෙන බලතල පොලිස්පතිවරයාට දෙන එක පිළිබඳව තිබෙන ගැටලුව සම්බන්ධයෙන් ආණ්ඩුවට යම් පැහැදිලි කිරීමක් කරන්න කියායි. එතකොට ඔබතුමන්ලා බලයට ආවේ කොහොමද? ඔබතුමන්ලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවත් විකෘති කළා.

හැබැයි, එහෙම කරන්න නොවෙයි ඔබතුමන්ලාට මේ ජන වරම දුන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, ඔය කාරණය විවාදයක් කර ගන්න එපා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ඒ නිසා ආණ්ඩුවට පුළුවන් නැඟිටලා කියන්න, "එහෙම වෙන්නේ නැහැ. එහෙම කරන්නේ නැහැ" කියලා. ඒක අහන එකට ඇයි ඔබතුමා ස්ථාවර නියෝග පොත පෙරළලා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් අසනු ලබන ප්‍රශ්න.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

Hon. Speaker, Standing Order No. 92 (2) (a) states, I quote;

> "A Member may in any proceedings question whether proper procedures have been ......."

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මේක ඉතා සංවේදී ප්‍රශ්නයක්. මේ රටේ දැන් පවතින මේ ආණ්ඩුව, මේ පක්ෂය ගත්තාම, නීතිය වාගේම යහ පාලනය සම්බන්ධයෙන් විශාල වශයෙන් සටන් කරපු පුද්ගලයෙක්, මේ ජනාධිපතිතුමා. ඒ වාගේම ස්වාධීන කරන මෙම ආයතන ස්වාධීන වීමේ වැදගත්කම තමයි, රටේ නීතිය හරියටම සියලුදෙනාට සමව ක්‍රියාත්මක වෙනවාය කියන එක. හැබැයි, ගරු කථානායකතුමනි, Bribery Commission එක, පොලිසිය වාගේ ආයතනවලට දැන් නිලධාරින් පත් වන ආකාරය බලන්න. විශාල ඒකාධිපති වියරුවකින් ආණ්ඩුවක් වශයෙන් ක්‍රියාත්මක වන බවක් අපිට පෙනෙනවා. ඉතා අමාරුවෙන් අපි සියලුදෙනා සටන් කරලා තමයි මේ ස්වාධීන කොමිෂන් සභා ගෙනාවේ, ගරු කථානායකතුමනි. මේවා ගෙනාවේ කාටවත් ඕනෑ විධියට ක්‍රියාත්මක කරන්නවත්, තමන්ගේ බලය නැති වනකොට, ජනතාව විරුද්ධ වනකොට, මැතිවරණවලින් පරාජය වනකොට, ජනතාවගේ අප්‍රසාදයට පත් වනකොට බලහත්කාරයෙන් පොලිසිය හෝ හමුදාව පාවිච්චි කරලා ආණ්ඩු කරන්නවත් නොවෙයි. ඒ නිසා විශේෂයෙන්ම අපිත් එක්ක සටන් කරපු සගයෝ වශයෙන් අනුර කුමාර දිසානායක මහත්තයා ඇතුළු මේ කණ්ඩායම මේ කරන දේ ඉතාම බරපතළයි. මේක පොලිස් රාජ්‍යයක්, හමුදා රාජ්‍යයක්,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔය කාරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාවට යොමු කිරීමට අපි දැන් යෝජනා කළා, ගරු විපක්ෂ නායකතුමාට පිළිතුරක් වශයෙන්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි,- මේකට උත්තරයක් දෙන්න වෙනවා, ගරු කථානායකතුමනි. දැන් මේ බොරු භීතියක් හදන්න යන්නේ. අපි ප්‍රජාතන්ත්‍රවාදය අනුව කටයුතු කරමින් යනවා. ජන වරම තිබෙන්නේ ඒකට. පොලිසියේ, -පොලිස් ස්ථානාධිපතිවරු පත් කරලා නොවෙයි- ඔය ස්ථාන මාරු කිරීම් කරලා තිබෙන්නේත් පොලිස් කොමිසම.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

නැහැ, නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

පොලිස් කොමිසම තමයි මේ මාරුවීම් කරලා තිබෙන්නේ. *[බාධා කිරීම්]*

ප්‍රශ්නය තිබෙන්නේ කාට හරි මොකක් හරි අසාධාරණයක් වුණා නම් කොමිසමෙන් කරපු දෙයක් නිසා ඒක අභියාචනා කරන්න තැනක් නැතිකමයි. එච්චරයි. කොමිසමෙන් කරන්නේ. *[බාධා කිරීම්]* කොමිසමෙන් කළේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔය කාරණාව මෙතැන විවාදයක් බවට පත් වෙන්න බැහැ. එහෙම නම් ගරු මන්ත්‍රීතුමා වෙනම Adjournment Motion එකක්,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, 91වන වගන්තිය මම පැහැදිලි කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මට කියන්න තිබෙන්නේ මේ සභාව නොමඟ යවන්න එපා කියන එකයි. *[බාධා කිරීමක්]* ඒක තමයි මම මේ කියන්න හදන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා රීති ප්‍රශ්නය නඟන ස්ථාවර නියෝග අංකය කීයද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ඉන්න, ගරු කථානායකතුමනි. ඒක තමයි මම මේ පෙන්වන්න හදන්නේ. මේකේ පැහැදිලිව,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා point of Order එක ගෙනෙන ස්ථාවර නියෝග අංකය කියන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේ සභාව නොමග යවන්න දෙන්න බැහැ, ගරු කථානායකතුමනි. පොලිස් කොමිසම කිසිම transfer එකක් කරලා නැහැ. දැන් පොලිස් කොමිසම බලාගෙන ඉන්නවා, ඒ transfer කරපු කට්ටිය ඒගොල්ලන්ට,-

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, පොලිස් සේවයේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්න තමයි පොලිස් කොමිසම පත් කළේ. පසුගිය දා කළුතර තිබුණු පොලීසියේ උත්සවයකදී

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

පොලිස් කොමිසමට තර්ජනය කරලා තිබුණා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අදි මදි කරනවා කියලා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඔව්, අදි මදි කරනවා කියලා. ඒ කියන්නේ, මේගොල්ලන් ඒකාධිපතිවාදයට යන්න හදන්නේ. කවදාවත් පොලිස් කොමිසමට පිටින් පොලිස්පතිට බලතල දීලා නැහැ. මමත් හිටපු පොලීසිය විෂය භාර ඇමතිවරයෙක්. අපි කවදාවත් මේවාට ඇඟිලි ගහලා නැහැ. අපි ඉල්ලා සිටිනවා, මේ ස්වාධීන කොමිෂන් සභාවල බලය එහෙමම තියන්න කියලා, පොලිස්පතිට පවරන්නේ නැතුව. පසුගිය දවස්වල පොලිස්පති මාරුවීම් කරලා තිබෙනවා, පොලිස් කොමිසමට පිටින්. ඔබතුමා ඒ ගැන සොයා බලන්න. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ස්ථාවර නියෝග 92. I can read it, Sir, if you want. I draw your attention to that. It is very clear in Standing Order No. 92.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay, Hon. Member.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Thank you, Sir.

නලින්ද ජයතිස්ස ඇමතිතුමා ප්‍රකාශ කළා, පොලිස් කොමිසමෙන් තමයි මේ තීන්දු තීරණ ගන්නේ කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔය සම්බන්ධයෙන් විපක්ෂ නායකතුමා දැන් කථා කළා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, just give me a minute. I can have a minute under Standing Orders.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය කාරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට යොමු කරනවා කියලා කිව්වාට පස්සේ නැවත ඒ ගැන විවාදයකට යන්න එපා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, just give me a minute. I can take one minute under Standing Orders. Can I have at least 40 seconds, the balance of my one minute?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කියන්න.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, නලින්ද ජයතිස්ස ඇමතිතුමා කිව්ව ආකාරයට පොලිස් කොමිසමට ඒ බලතල තිබෙනවා කියලා එතුමා පිළිගන්නවා. හැබැයි ඒකත් අයින් කරලා, ගැසට් එකක් ගෙනැල්ලා පොලිස්පතිට භාර දෙන්නයි යන්නේ සියලු ස්ථාන මාරුකිරීම් සහ ඊට අදාළ දේවල්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මෙතුමන්ලාම කියනවා, පොලිස් කොමිසමෙන් කළාට පසුව අභියාචනා කරන්න තැනක් නැහැ කියලා. පොලිස් කොමිසමම පොලිස්පතිවරයාට බලය පැවරුවොත්,- පොලිස්පතිවරයා එහෙම දෙයක් කළාම කොමිසමට අභියාචනා කරන්න පුළුවන්. කොමිසමම කැමැත්තෙන් ඒ බලය පවරනවා, පොලිස්පතිවරයාට. කාට හරි මොකක් හරි අසාධාරණයක් වෙනවා නම් අභියාචනා කරන්න කොමිසමකුත් තිබෙනවා. ඒ නිසා ඒකට කවුරුත් බය වෙන්න එපා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
නැහැ, නැහැ. බය වෙන්නේ නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඔබතුමන්ලා කලබල වෙන්නත් එපා, බය වෙන්නත් එපා. පොලිස් නිලධාරින්ට අසාධාරණයක් නොවන ලෙසට අභියාචනා කරන්න පුළුවන් තැනකුත් එක්ක තමයි මේ කටයුතු සිද්ධ වෙන්නේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා වාඩි වෙන්න. අපි ඊළඟ කරුණට යොමුවෙමු.

## ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න
## மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
## QUESTIONS POSED TO HON. PRIME MINISTER

**ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே)
(The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, 2025 වසරේ මුල් මාස තුළ සිය මව්වරු බන්ධනාගාරගත වීම හේතුකොට ගෙන කුඩා දරුවන් 47කට බන්ධනාගාරගත වීමට සිදුව ඇති බව මාධ්‍ය මඟින් වාර්තා කොට තිබුණා. ඒ අනුව ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් මා අසනු ලබන ප්‍රශ්න වනුයේ,

1. 2025 වසරේ මුල් මාස තුළ කාන්තාවන් කොපමණ ප්‍රමාණයක් බන්ධනාගාරගත වී තිබේද?
2. ඒ අතුරින් දරුවන් සමඟ බන්ධනාගාරගත වූ කාන්තාවන් ප්‍රමාණය කොපමණද?
3. බන්ධනාගාරගතව සිටින එම දරුවන්ගේ ආරක්ෂාව, පෝෂණය සහ අධ්‍යාපනය සඳහා මේ වන විට රජය ලෙස ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?
4. මෙම දරුවන්ගේ සුබසාධනය සහ අනාගතය වෙනුවෙන් රජය ගැනීමට බලාපොරොත්තු වන ඉදිරි පියවර මොනවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු කථානායකතුමනි, ගරු හසාරා ලියනගේ මන්ත්‍රීතුමිය විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

1. 2025 ජනවාරි මස සිට 2025 අගෝස්තු මස අවසන් දින තෙක් බන්ධනාගාරගත වී ඇති කාන්තා රැඳවියන් සංඛ්‍යාව,

   සිරගත වෙලා සිටින කාන්තාවන් - 425යි.

   සැක මත සිටින කාන්තාවන් - 4,686යි.

2. 2025 වර්ෂය තුළ අතදරුවන් සමඟ බන්ධනාගාරගත වූ කාන්තාවන් සංඛ්‍යාව 38කි. (පිරිමි ළමයි 15යි. ගැහැනු ළමයි 23යි.)

3. දරුවන්ගේ ආරක්ෂාව:

   - මවුවරුන් සමඟ බන්ධනාගාරගත වන වයස අවුරුදු 5ට අඩු දරුවන් රැක බලා ගැනීමට බන්ධනාගාර කාන්තා අංශ තුළ අනෙකුත් රැඳවියන්ගෙන් වෙන්ව මවුවරුන් සමඟ ගත කිරීමට වෙනම ළමා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවා ඇත.

   දරුවන්ගේ පෝෂණය:

   - දෛනිකව රැඳවියන්ට ලබා දෙන ආහාර සලාකය මෙන් කුඩා දරුවන්ට අවශ්‍ය කිරිපිටි ද්‍රව්‍ය සහ දිනකට සැහැල්ලු ආහාරයක් බන්ධනාගාර ආයතනයේ සලාක අංශය මඟින් දරුවන්ට ලබා දීම.
   - මීට අමතරව පරිත්‍යාගශීලීන්ගෙන් යම් යම් අවස්ථාවල ලබා දෙන දිවා ආහාර, කෙටි ආහාර, කිරි ආහාර, පලතුරු වර්ග දරුවන්ට ලබා දීම.
   - සිරකරු සුබසාධක සංගම් උපකමිටු හරහා වරින් වර කුඩා දරුවන්ට හා මවුවරුන්ට විශේෂ ආහාර ද්‍රව්‍ය ලබා දීම.

   දරුවන්ගේ අධ්‍යාපනය:

   - පෞද්ගලික ආයතනයක සම්පත්දායකත්වය ඇතිව දැනට වසර 10ක පමණ කාලයක සිට මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන භාර උපදේශකවරියකගේ දායකත්වයෙන් මෙම කුඩා දරුවන්ට අවශ්‍ය මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපන කටයුතු සිදු කිරීම.
   - විටින් විට සමාජ සත්කාර සිදු කරනු ලබන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල සාමාජිකයන්ගේ ස්වේච්ඡා දායකත්වයෙන් විවිධ වැඩසටහන් හා ක්‍රියාකාරකම් බන්ධනාගාර පුනරුත්ථාපන අංශයේ මැදිහත්වීමෙන් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම හා ඔවුන්ට අවශ්‍ය අධ්‍යාපනික උපකරණ හා සෙල්ලම් උපකරණ ලබා දීම.
   - සිරකරු සුබසාධක සංගම් උප කමිටු හරහා වරින් වර ඔවුන්ට අවශ්‍ය ක්‍රියාකාරකම් සහිත වැඩසටහන් හා අධ්‍යාපනික උපකරණ ලබා දීම හා ළමා සුරැකුම් මධ්‍යස්ථානවල කටයුතු සංවර්ධනය කිරීම මෙන්ම විශේෂ කෙටි ආහාර ද්‍රව්‍ය ලබා දීම. මෙම වැඩසටහන්වලට අමතරව කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ මැදිහත් වීම මත 2025 වර්ෂයේදී වැලිකඩ බන්ධනාගාර කාන්තා අංශයේ ළමා සුරැකුම් මධ්‍යස්ථානයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, මේ වන විට එම සංවර්ධන කටයුතු ආරම්භ කර ඇත.

4. - ළමා සුරැකුම් මධ්‍යස්ථානවල දරුවන්ගේ පූර්ව ළමා විය අධ්‍යාපන හා සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා පුහුණුවලත් මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන භාර උපදේශකවරියක බැගින් ළමා සුරැකුම් මධ්‍යස්ථාන ස්ථාපිත කර ඇති බන්ධනාගාර සඳහා රජයේ මැදිහත් වීම මඟින් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

- කුඩා දරුවන්ට අවශ්‍ය පෝෂණීය ආහාර රජය මඟින්ම ලබා දීමට අවශ්‍ය බන්ධනාගාර අණ පනත් නැවත සංශෝධනය කිරීම.
- දැනට පවතින ළමා සුරැකුම් මධ්‍යස්ථාන රජයේ මැදිහත් වීම මත ප්‍රතිසංස්කරණය කිරීම.
- මව්වරුන් සමඟ බන්ධනාගාරගත වන දරුවන්ගේ වයස අවුරුදු 05 සම්පූර්ණ වූ පසු මව තවදුරටත් බන්ධනාගාරගතව සිටින අවස්ථාවලදී ඔවුන්ගේ භාරකරුවන්ට දරුවා භාර දුන් පසු එම දරුවන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍යය සම්බන්ධයෙන් සොයා බැලීමට රජයේ මැදිහත් වීම මත පසු භාරකාරීත්ව කටයුතු සිදු කිරීම.

**ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே)
(The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law)
ගරු අග්‍රාමාත්‍යතුමියනි, පිළිතුර ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, මේ රජයේ පළමු අය වැයේදීත් අප විශේෂයෙන්ම අවධානය යොමු කළේ සමාජයේ සෑම කොටසක්ම අත් නොහැර, ඒ වාගේම ආන්තිකරණයට ලක් නොකර, දරුවන් කොහේ ඉපදුණත්, කොහේ හැදී වැඩුණත් ඔවුන් පොදු සමාජයෙන් විතැන් නොකර ඔවුන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍ය ආදි සියලු අයිතිවාසිකම් ආරක්ෂා වන ලෙස රජයක් විධියට කටයුතු කරන්නයි. ගරු අගමැතිතුමියනි, ඉදිරියටත් මේ වාගේ ප්‍රගතිශීලී වෙනස්වීම් සමඟ ඒ දරුවන්ගේ අයිතීන් ආරක්ෂා කර ගැනීම සම්බන්ධව අපට සහතික විය හැකි දැයි මම ඔබතුමියගෙන් තවදුරටත් විමසනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, බන්ධනාගාරයේ සිදු විය යුතු ප්‍රතිසංස්කරණ ගැන ගරු අධිකරණ ඇමතිතුමාත්, අමාත්‍යාංශයත් මේ වන විට සොයා බලනවා; විශේෂයෙන් කාන්තා රැඳවියන් සහ වයස අවුරුදු 5ට අඩු දරුවන් වෙනුවෙන් ගත යුතු ක්‍රියාමාර්ග ද ගනිමින් ඉන්නවා; ඔවුන්ගේ ආරක්ෂාව වාගේම ඔවුන්ගේ වර්ධනය, ඔවුන්ගේ සුබසාධනය ආදිය සම්බන්ධයෙන් ද මැදිහත් වීමට සැලසුම් කරගෙන යනවා. දැනට තිබෙන ඒවා තවත් දියුණු විය යුතුයි.

මූලික වශයෙන් අප උත්සාහ කරන්න ඕනෑ, එවැනි තත්ත්වයන් ඇති නොවීමට අවශ්‍ය පියවර ගැනීමයි. විශේෂයෙන්ම දරුවන් එවැනි ස්ථානවල සිටීම වළක්වන්න නම් අධිකරණ ක්‍රියාවලියම මීට වඩා ඉක්මන් විය යුතුයි. ගරු මන්ත්‍රීතුමියනි, මා කලිනුත් කිව්වා වාගේම ඔබතුමියත් දන්නවා, නඩු තීන්දුවෙන් පසුව රැඳී සිටින කාන්තා රැඳවියන්ට වඩා විශාල ප්‍රමාණයක් ඉන්නේ සැක පිට අත්අඩංගුවට ගත්තු රැඳවියන් බව. මේ කියන ක්‍රියාවලිය ඉක්මන් කිරීම තුළින් අපි විශ්වාස කරනවා, වයස අවුරුදු 5ට අඩු දරුවන් ඒ විධියට බන්ධනාගාරය තුළ සිටීම අඩු කර ගන්නත්, ඒ තත්ත්වය වළක්වා ගන්නත් අපට පුළුවන් වේවි කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ ප්‍රශ්නය, ගරු ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
ගරු කථානායකතුමනි, මා ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් අසන ප්‍රශ්නය මෙයයි.

ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය සඳහා ගුරුවරුන් බඳවා ගන්නා ප්‍රධාන මූලයක් ලෙස අධ්‍යාපන විද්‍යාපීඨ හඳුන්වා දිය හැකි අතර, පුහුණුව අවසානයේ ගුරු සේවයට බඳවා ගැනීමේ ස්ථිරභාවය හේතුවෙන් ඇතැම් සිසුන් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබුණද විද්‍යාපීඨ තෝරා ගනු ලබනවා.

1. දිවයිනේ පවතින සම්පූර්ණ විද්‍යාපීඨ සංඛ්‍යාව කොපමණද?
2. එක් එක් විද්‍යාපීඨයේ නම සහ එම විද්‍යාපීඨවල පවත්වනු ලබන පාඨමාලා මොනවාද?
3. අවසන් වරට විද්‍යාපීඨ සඳහා බඳවාගෙන ඇත්තේ උසස් පෙළ කවර වර්ෂයේ පවත්වන ලද විභාගය පදනම් කරගෙනද?
4. විද්‍යාපීඨ සඳහා 2023 වර්ෂයේ පවත්වන ලද උසස් පෙළ විභාගය පදනම් කරගෙන බඳවා ගැනීම ප්‍රමාද වී තිබේද?
5. එසේ ප්‍රමාද වී තිබේ නම් එම සිසුන් බඳවා ගැනීමට අපේක්ෂා කරන කාල වකවානු මොනවාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ගරු ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. දිවයිනේ පවතින සම්පූර්ණ විද්‍යාපීඨ සංඛ්‍යාව 20කි.
2. එක් එක් විද්‍යාපීඨයේ නම සහ එම විද්‍යාපීඨවල පවත්වනු ලබන පාඨමාලා ඇමුණුම මඟින් ඉදිරිපත් කර ඇත. ඇමුණුම **සභාගත*** කරමි.
3. පැවැති විද්‍යාපීඨ සඳහා අ.පො.ස. (උසස් පෙළ) 2022 වර්ෂයේ ප්‍රතිඵල පාදක කරගෙන අවසාන බඳවා ගැනීම සිදු කර ඇති අතර, කුලියාපිටිය තාක්ෂණවේදී ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය වෙත ප්‍රථම ශික්ෂණලාභීන් කණ්ඩායම ලෙස 2023 අ.පො.ස. (උසස් පෙළ) ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කර ඇත.
4. රටේ පැවැති කොවිඩ් වසංගත රෝගී තත්ත්වය හේතුවෙන් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථාන හා නිරෝධායන මධ්‍යස්ථාන ලෙස යොදා ගැනීම නිසා දීර්ඝ කාලයක් වසා තබන ලදී.

   එම කාල සීමාව තුළ ප්‍රමාද වූ ප්‍රායෝගික අධ්‍යයන කටයුතු සම්පූර්ණ කිරීමට සිදු වූ හෙයින්, නියමිතව තිබූ බඳවා ගැනීම් කටයුතු ද සිදු කළ නොහැකි විය. විද්‍යාපීඨ නැවත ලබා දීමේදී විද්‍යාපීඨ තුළ නේවාසිකාගාරයන්හි හා මුළුතැන්ගෙවල්හි භෞතික සම්පත්වලට හානි වීම් හා අස්ථානගත වීම් බොහොමයක් සිදු වී තිබුණි. එබැවින්, විද්‍යාපීඨ නැවත ආරම්භ කිරීමට පෙර අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට හා භෞතික සම්පත් ලබා දීමට සිදු විය.

   සිදු වූ බඳවා ගැනීමේ ප්‍රමාදය යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා එකවර අ.පො.ස. (උසස් පෙළ) කණ්ඩායම් දෙක බැගින් බඳවා ගැනීමට සිදු විය. එබැවින්, 2024

---

** පිළිතුර අවසානයේ පළ කර ඇත.*
** விடையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of Answer.*

වර්ෂයේ විද්‍යාපීඨ තුළ අ.පො.ස. (උසස් පෙළ) වර්ෂ 4කට අදාළව ශිෂ්‍ය කණ්ඩායම් 2ක් අධ්‍යයන කටයුතුවල නිරත වී සිටි බැවින්, නව ශිෂ්‍ය කණ්ඩායමක් බඳවා ගැනීමට භෞතික සම්පත් ප්‍රමාණවත් නොවීම මත නැවත බඳවා ගැනීමක් සිදු කිරීමට නොහැකි විය.

එබැවින්, 2025 වසරේදී 2023 සහ 2024 අ.පො.ස. (උසස් පෙළ) ප්‍රතිඵල මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ශික්ෂණලාභීන් කණ්ඩායම් දෙක එකවර බඳවා ගැනීමට නියමිතව තිබූ අතර, මෙම බඳවා ගන්නා ශික්ෂණලාභී කණ්ඩායම පත්වීම් ලබන 2029 වසර වන විට පාසල් පද්ධතියේ 1-11 විෂය මාලා නවීකරණය සම්පූර්ණ වන බැවින්, මෙම කණ්ඩායම නව විෂය මාලා සඳහා බඳවා ගත යුතු වේ. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුව ගැසට් නිවේදනයේ අදාළ සංශෝධන සිදු කළ යුතුව තිබෙන බැවින්, 2023 අ.පො.ස. (උසස් පෙළ) ප්‍රතිඵල මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ශික්ෂණලාභීන් බඳවා ගැනීම කෙටි කාලයක් ප්‍රමාද වී ඇත.

5. ගැසට් නිවේදනය නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයට අනුව සංශෝධනය වන පාඨමාලාවලට ගළපා අයදුම් පත් කැඳවීම හා සුදුසු අයදුම්කරුවන් තේරීමේ පරිගණක වැඩසටහනෙහි අවශ්‍ය සංශෝධන සිදු කළ පසු 2026 ජනවාරි/පෙබරවාරි මස තුළ 2023 හා 2024 අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ශික්ෂණලාභීන් බඳවා ගැනීමට බලාපොරොත්තු වේ.

*** සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

| | විද්‍යාපීඨයේ නම | පවතින පාඨමාලා |
|---|---|---|
| 01 | ඌව | ප්‍රාථමික (සිංහල, සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන (සිංහල) |
| 02 | නිල්වලා | ප්‍රාථමික (සිංහල), විද්‍යාව (සිංහල), විද්‍යාව (ඉංග්‍රීසි), ගණිතය (සිංහල), ගණිතය ( ඉංග්‍රීසි), සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන (සිංහල), සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන (ඉංග්‍රීසි) |
| 03 | මහවැලි | ප්‍රාථමික (සිංහල), චිත්‍ර (සිංහල), නැටුම් (පෙරදිග), සංගීතය (පෙරදිග), නාට්‍ය හා රංග කලාව (සිංහල), දෙවන බස (සිංහල), ඉංග්‍රීසි |
| 04 | සාරිපුත්ත (නිට්ටඹුව) | බුද්ධ ධර්මය (පූජ්‍ය පක්ෂය) |
| | සාරිපුත්ත (දඹදෙණිය) | බුද්ධ ධර්මය (ගිහි , ප්‍රාථමික (සිංහල) |
| 05 | සියනෑ | ප්‍රාථමික (සිංහල), විද්‍යාව (සිංහල), විද්‍යාව (ඉංග්‍රීසි)<br>ගණිතය (සිංහල), ගණිතන (ඉංග්‍රීසි), ශිල්ප කලා (සිංහල)<br>නිර්මාණකරණය හා ඉදි කිරීම් තාක්ෂණවේදය (සිංහල)<br>නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය (සිංහල)<br>නිර්මාණකරණය හා විදුලි හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය (සිංහල) |
| 06 | පුලතිසිපුර | ප්‍රාථමික (සිංහල), කෘෂි හා ආහාර තාක්ෂණය (සිංහල) |
| 07 | වයඹ | ප්‍රාථමික (සිංහල), චිත්‍ර (සිංහල), නැටුම්(පෙරදිග), සංගීතය (පෙරදිග), නාට්‍ය හා රංග කලාව (සිංහල), දෙවන බස (සිංහල), ක්‍රිස්තියානි/කතෝලික (සිංහල) |
| 08 | රුහුණ | ප්‍රාථමික (සිංහල) , සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය (සිංහල)<br>ගෘහ ආර්ථික විද්‍යාව (සිංහල) |
| 09 | හාපිටිගම | ප්‍රාථමික (සිංහල), පළමු බස (සිංහල), චිත්‍ර (සිංහල), නැටුම් (පෙරදිග), සංගීතය (පෙරදිග), සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන (සිංහල)<br>විශේෂ අධ්‍යාපන (සිංහල) |
| 10 | රුවන්පුර | ප්‍රාථමික (සිංහල), තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ඉංග්‍රීසි) |
| 11 | පස්දුන්රට | ප්‍රාථමික (සිංහල), ඉංග්‍රීසි, ගණිතය (ඉංග්‍රීසි), තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ඉංග්‍රීසි) |
| 12 | පේරාදෙණිය | පළමු බස (සිංහල) , පළමු බස (දෙමළ) , ඉංග්‍රීසි |
| 13 | මහරගම | ප්‍රාථමික (සිංහල) , දෙවන බස(සිංහල) , විශේෂ අධ්‍යාපන (සිංහල)<br>ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (සිංහල), ඉංග්‍රීසි, බටහිර සංගීතය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ඉංග්‍රීසි) |
| 14 | ශ්‍රීපාද | ප්‍රාථමික (සිංහල), ප්‍රාථමික (දෙමළ), විද්‍යාව (සිංහල), විද්‍යාව (දෙමළ), ගණිතය (සිංහල), ගණිතය (දෙමළ), පළමු බස (දෙමළ), චිත්‍ර (දෙමළ), නැටුම් (භරත), සංගීතය (කර්ණාටක), සමාජ විද්‍යාව (සිංහල) |
| 15 | වව්නියා | දෙවන බස (සිංහල), ප්‍රාථමික (දෙමළ), විද්‍යාව (දෙමළ), ගණිතය (දෙමළ) හින්දු ධර්මය , කතෝලික / ක්‍රිස්තියාන (දෙමළ) , සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන (දෙමළ) , ගෘහ ආර්ථික විද්‍යාව (දෙමළ)<br>කෘෂි හා ආහාර තාක්ෂණය (දෙමළ), දෙවන බස (දෙමළ) |
| 16 | මඩකලපුව | ප්‍රාථමික (දෙමළ), විද්‍යාව (දෙමළ), ගණිතය (දෙමළ), පළමු බස (දෙමළ) චිත්‍ර (දෙමළ), නාට්‍ය හා රංග කලාව (දෙමළ), ශිල්ප කලා (දෙමළ), නිර්මාණකරණය හා ඉදි කිරීම් තාක්ෂණවේදය (දෙමළ)<br>නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය (දෙමළ)<br>නිර්මාණකරණය හා විදුලි හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය (දෙමළ), සමාජ විද්‍යාව (දෙමළ) |
| | | නිර්මාණකරණය හා විදුලි හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය (දෙමළ), සමාජ විද්‍යාව (දෙමළ) |
| 17 | යාපනය | ප්‍රාථමික (දෙමළ), විද්‍යාව (දෙමළ), ගණිතය (දෙමළ), පළමු බස (දෙමළ), චිත්‍ර (දෙමළ), සංගීතය (කර්ණාටක), නැටුම් (භරත), සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන (දෙමළ), විශේෂ අධ්‍යාපනය (දෙමළ), ඉංග්‍රීසි, විද්‍යාව (ඉංග්‍රීසි), ගණිතය (ඉංග්‍රීසි), තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ඉංග්‍රීසි) |
| 18 | අඩ්ඩාලච්චේන | ප්‍රාථමික (දෙමළ), විද්‍යාව (දෙමළ), ගණිතය (දෙමළ), ඉස්ලාම් ධර්මය (දෙමළ), ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (දෙමළ), විශේෂ අධ්‍යාපනය (දෙමළ) |
| 19 | දර්ගා නගර් | ප්‍රාථමික (දෙමළ), පළමු බස (දෙමළ), ගෘහ ආර්ථික විද්‍යාව (දෙමළ), සමාජ විද්‍යාව (දෙමළ) |
| 20 | තාක්ෂණවේදී ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය කුලියාපිටිය | <u>අ.පො.ස. (උ.පෙළ) සඳහා</u><br>ඉංජිනේරු තාක්ෂණවේදය , ජෛව පද්ධති තාක්ෂණවේදය<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදය<br>(මෙම විද්‍යාපීඨයේ පාඨමාලා 2024 වර්ෂයේ ආරම්භ කරන ලදී.) |

❖ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුව ගැසට් නිවේදනයේ සිදු වීමට නියමිත සංශෝධන

**පාඨමාලා නාම සංශෝධනය**

| පවතින පාඨමාලා නාමය | නව පාඨමාලා නාමය |
|---|---|
| කෘෂි හා ආහාර තාක්ෂණවේදය | කෘෂිකර්ම තාක්ෂණවේදය |
| නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය | නිර්මාණකරණය හා ඉංජිනේරු තාක්ෂණවේදය |
| නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය | |
| නිර්මාණකරණය, විදුලි හා ඉලොක්ට්‍රොනික තාක්ෂණවේදය | |
| ගෘහ ආර්ථික විද්‍යාව | ආහාර හා පාරිභෝගික තාක්ෂණවේදය |
| ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාවය |
| විශේෂ අධ්‍යාපනය | විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය |
| බුද්ධ ධර්මය | බුද්ධ ධර්මය හා සාරධර්ම අධ්‍යාපනය |
| හින්දු ධර්මය | හින්දු ධර්මය හා සාරධර්ම අධ්‍යාපනය |
| ඉස්ලාම් | ඉස්ලාම් ධර්මය හා සාරධර්ම අධ්‍යාපනය |
| ක්‍රිස්තියානි / කතෝලික | ක්‍රිස්තියානි / කතෝලික ධර්මය හා සාරධර්ම අධ්‍යාපනය |
| පළමු බස සිංහල | සිංහල භාෂාව හා සාහිත්‍ය |
| පළමු බස දෙමළ | දෙමළ භාෂාව හා සාහිත්‍ය |
| ඉංග්‍රිසි | ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍ය |

**ආරම්භ කිරීමට නියමිත නව පාඨමාලා**

- වෘත්තීය මාර්ගෝපදේශය හා පාසල් උපදේශනය

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
ගරු කථානායකතුමනි, මම අතුරු ප්‍රශ්න දෙකක් අහනවා.

ගරු අගමැතිතුමියනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. විද්‍යාපීඨ තුළ පවතින නීති පද්ධතිය සහ ඒ සම්ප්‍රදාය ඉතාම පැරණි, සීමා කරනලද සහ හිර කරනලද සම්ප්‍රදායයක්. ඒ හේතුවෙන් ශිෂ්‍යයන්ට උසස් පෙළින් පසුව ඔවුන්ගේ අධ්‍යාපන පරාසය පුළුල් කර ගැනීම සඳහා, දැනුම් පරාසය පුළුල් කර ගැනීම සඳහා නොවිධිමත් ක්ෂේත්‍ර භාවිත කරන්න තිබෙන ඉඩ බරපතළ විධියට ඇහිරී තිබෙන්නේ. ඒ නිසා නව ලෝකයට ගැළපෙන ගුරුවරයෙක් නිර්මාණය කිරීම වෙනුවෙන් ඉදිරියේදී හෝ විද්‍යාපීඨ තුළ ශිෂ්‍යයන් සඳහා ගැළපෙන නිදහස් පරිසරයක් ගොඩ නැගීම වෙනුවෙන් කටයුතු කරන්න අධ්‍යාපන අමාත්‍යාංශය විධියට සලකා බලනවාද කියන කාරණය මම අහන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ඔව්.

විද්‍යාපීඨවල විෂයමාලාව විතරක් නොවෙයි, අනෙක් කිසිම දෙයක් කාලයක් තිස්සේ සංශෝධනය වෙලාත් නැහැ, වෙනස් වෙලාත් නැහැ. භෞතික සම්පත් පිළිබඳව විතරක් නොවෙයි, ඒ ක්‍රියා පටිපාටිය පිළිබඳවත් විශාල අවධානයක් යොදවා තිබුණේ නැහැ. නමුත් අපි මේ වසර තුළ විෂයමාලාව සමාලෝචනය කරලා

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

අදට ගැළපෙන සහ යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට ගැළපෙන විධියේ විෂයමාලාවක් සකස් කරනවා. ඒ වාගේම ඒ ආයතන තුළ පවතින ඒ ක්‍රියාපටිපාටි, ඒ සම්ප්‍රදායයන් ඒ සියල්ලම අපට අවශ්‍ය ගුරුවරයා නිර්මාණය කරන්න පුළුවන් විධියට වෙනස් කරන්නත් අපි මැදිහත් වෙනවා. ඒ වාගේම ඒ විද්‍යාපීඨ ගුරුවරුන්ටත්, ගුරු අධ්‍යාපනඥ සේවයේ සිටින සියලු අයටත් පුහුණුවීමක් දෙමින් පවතිනවා. විද්‍යාපීඨ පරිපාලනයත් එක්කත් අපි සාකච්ඡා කරමින් ඉන්නවා ඊට අවශ්‍ය සංශෝධන මේ වසර තුළත්, එන වසර තුළත් ක්‍රියාත්මක කරන්න.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)

ස්තුතියි, ගරු අගමැතිතුමියනි. මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

පසුගිය ගුරු අරගළය පැවැති වෙලාවේ තිබුණු ප්‍රධාන ඉල්ලීමක් තමයි ඔවුන්ගේ වැටුප් පරිමාණ වැඩි කරන්න කියන කාරණය. නව ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා, ගුරු සේවය රටේ ඉහළම ශ්‍රේණි 10 අතරට ගෙනෙනවා කියලා. එතැනදී බලපාන ගැටලුවක් තිබෙනවා. පසුගිය ගුරු අරගළය වෙලාවේ ඔවුන්ගේ ඉල්ලීම් ලබා දෙද්දීත් බලපෑ ගැටලුවක් තිබෙනවා. ඒ තමයි ඒ ගුරු සේවයට බඳවාගත් හැම කෙනෙක්ම ඒ අදාළ ශ්‍රේණිවලට උසස් කිරීම සඳහා වන සුදුසුකම් සපුරලා නැති එක. විද්‍යාපීඨවලින් පිට වෙන පුහුණු ගුරුවරයාත් ඩිප්ලෝමාධාරියෙකු ලෙස තමයි එළියට එන්නේ. ඒක නිසා නව රජයේ අධ්‍යාපන වැඩ පිළිවෙළත් එක්ක විද්‍යාපීඨවලින් එළියට එන ගුරුවරයා ඩිප්ලෝමාධාරියෙකුගෙන් එහාට ගිය උපාධිධරයෙකු බවට පත් කළ යුතුයි කියලා මම හිතනවා. ඇත්තටම ගුරු සේවයට බඳවා ගැනීමේ ප්‍රධානම ක්ෂේත්‍රය බවට විද්‍යාපීඨ පත් කරගත යුතුයි. ඒ සඳහා ඩිප්ලෝමාවෙන් එහාට ගිහිල්ලා උපාධියක් දෙන තැනක් දක්වා විද්‍යාපීඨ සංවර්ධනය කරන්න මොකක්ද තිබෙන සැලැස්ම?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, අපේ රජයේ ඉලක්කය අනුව, සියලු ගුරුවරුන් උපාධිධාරින් විය යුතුයි කියන තැනට අපි ක්‍රමානුකූලව එන්න ඕනෑ. එතකොට විද්‍යාපීඨත් උපාධියක් පිරිනමන තැනට ගෙනෙන එක අවශ්‍යයි. ඒකට අපි එකඟයි. ඒක තමයි අපේ ප්‍රතිපත්තියේත් තිබෙන්නේ. ඒ සඳහා අපි වැඩ කරගෙන යනවා. දැනටමත් කුලියාපිටිය විද්‍යාපීඨය, උපාධි ප්‍රදානය කරන විද්‍යාපීඨයක්. ඒක තමයි පළමුවැනි එක. අනෙක් 19ත් ඒ තත්ත්වයට ගෙනෙන්න අපි ක්‍රමානුකූලව මැදිහත් වෙනවා, ගරු කථානායකතුමනි. දැනට තිබෙන භෞතික තත්ත්වයත්, ඒ තැන්වල ඉන්න ගුරුවරුන්ගේත් වෙනස්කම් කරමින් තමයි අපට මෙතැනට එන්න වෙන්නේ. උපාධියක් දෙනවා කියන එක සරල දෙයක් නොවෙයි. ඒකේ ගුණාත්මකභාවය තහවුරු කරන්න ඕනෑ. විශේෂයෙන්ම ගුරුවරුන්ට මේ පුහුණුව දෙනකොට අපට ඒ පිළිබඳව විශාල වගකීමක් තිබෙනවා. මොකද, මේ ඉන්නේ අනාගත දරු පරපුර භාර ගන්න ඉන්න ගුරුවරු. ඒ නිසා අපි මේ පිළිබඳව අධ්‍යයනය කරමින් ඒ ඉලක්කය කරා යන්න සැලසුම් කරගෙන ඉන්නවා. උපාධිධාරින් බිහි කරන ආයතන බවට විද්‍යාපීඨත් පත් කරන එක තමයි අපේ ඉලක්කය වෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අගමැතිතුමියගෙන් අසනු ලබන මීළඟ ප්‍රශ්නය, ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු කථානායකතුමනි, රටක සංවර්ධනය යනු හුදෙක් ආර්ථික සංවර්ධනය පමණක් නොවන අතර එයට සමාජ, සංස්කෘතික යන ක්ෂේත්‍රද අදාළ වේ. ශ්‍රී ලංකාව අවුරුදු 2500ක ශ්‍රේෂ්ඨ ඉතිහාසයක් ඇති රටක් වන අතර, සංචාරකයින් මෙරටට පැමිණෙන්නේ අප රටේ තිබෙන විවිධත්වය - පාරිසරික, වනජීවී සහ වෘක්ෂලතා - නැරඹීමටයි. නමුත් වර්තමානයේ සංචාරක ප්‍රවර්ධන වැඩසටහනක් ලෙස LGBTQ ප්‍රජාව ප්‍රවර්ධනය කිරීම පිළිබඳව කතිකාවක් ගොඩනැඟී ඇත. ඒ අනුව මා පහත සඳහන් ප්‍රශ්න යොමු කරමි.

01. විදේශීය සමලිංගික - LGBTQ - ප්‍රජාව ප්‍රවර්ධනය මෙරට තුළ සිදු කිරීමට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය පියවර ගනිමින් සිටීද?

02. අපේ රටේ දණ්ඩ නීති සංග්‍රහය අනුව සමලිංගිකත්වය සම්බන්ධයෙන් දැක්වෙන නීති කවරේද?

03. LGBTQ ප්‍රජාව ප්‍රවර්ධනයට ආගමික නායකයින්ගේ - ත්‍රෛනිකායික මහානායක හිමිවරු, අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් - විරෝධතා තිබෙන බැවින් ඒ සම්බන්ධව අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවරයන් කවරේද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

01. නැත.

මේ පිළිබඳව පැහැදිලි කිරීමක් ලෙස ගරු විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා විසින් සංචාරක දිනය වෙනුවෙන් 2025.10.02 දින පැවති උත්සවයේදී සිදු කළ කථාවේදී සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් මාධ්‍ය වෙත දැනුම් දෙන ලදී. ඒක තමයි රජයේ ප්‍රතිපත්තිය.

02. 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනතින් සංශෝධිත දණ්ඩ නීති සංග්‍රහයේ 365අ වගන්තියේ මේ පිළිබඳව දක්වා ඇත. එම වගන්තිය ඇමුණුම මඟින් දක්වා ඇත.

ඇමුණුම **සභාගත*** කරමි.

03. මේ පිළිබඳ රජයේ ස්ථාවරය ගරු ජනාධිපතිතුමා විසින් මහානායක හිමිවරුන් ඉදිරියේ පැහැදිලි කර අතර, ගරු විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා විසින් සංචාරක දිනයේදී සිදු කළ කථාවෙහිද මේ පිළිබඳව පැහැදිලිව සඳහන් වේ. ඒ අනුව, රජයේ ස්ථාවරය පිළිබඳව මේ වන විටත් ආගමික නායකයන් සහ මහජනතාව දැනුවත් කිරීමක්ද සිදු කර ඇති අතර අප රජය විසින් මෙරට සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේදී විශේෂ කණ්ඩායම් ප්‍රවර්ධනය නොකරන අතර, සංචාරක ව්‍යාපාරය කිසිදු පුද්ගලයෙකුට හානි නොවන අයුරින් ක්‍රියාත්මක කිරීම රජයේ ප්‍රතිපත්තිය බව දන්වා සිටිමි.

***පිළිතුර අවසානයේ පළ කර ඇත.***
** விடையினிறுதியில் தரப்பட்டுள்ளது.*
**Produced at end of Answer.*

**** සභාමේසය මත තබන ලද ඇමුණුම:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

"1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනතින් සංශෝධිත දණ්ඩ නීති සංග්‍රහයේ 365අ වගන්තිය

ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ හෝ වෙනත් තැනැත්තෙකු සමඟ යම් දැඩි අශිෂ්ට ක්‍රියාවක් සිදු කරන නැතහොත් එවැනි යම් ක්‍රියාවකට පාර්ශ්වකරුවෙකු වන හෝ එබඳු යම් ක්‍රියාවක් යම් තැනැත්තෙකු විසින් කරනු ලැබීම කුට්ටනය කරන හෝ කුට්ටනය කිරීමට තැත් කරන කවර හෝ තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, ඔහුට අවුරුදු 02ක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ ඒ බන්ධනාගාර ගත කිරීම හා දඩය යන දඬුවම් දෙකින්ම හෝ දඬුවම කරනු ලැබිය යුතුය. තවද ඒ වරද වයස අවුරුදු 18කට වැඩි තැනැත්තෙකු විසින් වයස අවුරුදු 16කට අඩු තැනැත්තෙකු සම්බන්ධයෙන් සිදු කරනු ලබන අවස්ථාවක, අවුරුදු 10කට නොඅඩු වූද අවුරුදු 20ක් නොඉක්මවන්නා වූද කාලයකට බරපතළ වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීමකින් හා දඩයකින් ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය යුතුය. තවද, ඒ වරද සිදු කරන ලද්දේ යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙසද අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකිය."

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු අග්‍රාමාත්‍යතුමියනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මම ප්‍රවෘත්ති බලනකොට දැක්කා, ඔබතුමිය ගිය උත්සවයකදී ගුරුතුමියකට, එහෙම නැත්නම් වැඩිහිටියෙකුට දණ ගහලා වඳිනවා. ඒක තමයි අපේ සභ්‍යත්වය; ඒක තමයි අපි හැදිච්ච පරිසරය.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, හැබැයි 2025 සැප්තැම්බර් 09වැනි දා නිකුත් කර තිබෙන ලිපියෙහි, Sri Lanka Tourism Development Authority and Sri Lanka Tourism Promotion Bureauහි බුද්ධික හේවාවසම් කියන සභාපතිවරයා පැහැදිලිව මෙසේ කියනවා:

> "Accordingly, Sri Lanka Tourism is pleased to endorse this initiative and grant you the authority to liaise with relevant stakeholders in the tourism industry, including tour operators, hotels, training institutes, guides, and drivers...."

ගරු අග්‍රාමාත්‍යතුමියනි, එතකොට මේ ලියුමේ පැහැදිලිව සඳහන් වෙනවා, LGBTQ ප්‍රජාව ප්‍රවර්ධනය කරන්න authority එක grant කරනවා කියලා, බලය ලබා දෙනවා කියලා. අතිගරු ජනාධිපතිතුමාගේ ස්ථාවරයත්, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගේ ස්ථාවරයත් ඔබතුමිය පැහැදිලි කළා. එතකොට, මේ ලියුම නිකුත් කරපු සභාපතිවරයාට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කර තිබෙනවාද? එහෙම නැත්නම් ආණ්ඩුව මේ ලිපිය අහෝසි කරනවාද? ගරු කථානායකතුමනි, එක පැත්තකින් රජයෙන් කියනවා, අවුරුදු 16ක පාසල් යන දරුවන්ට ලිංගික නිදහස දෙනවා කියලා. අනෙක් පැත්තෙන් රජයේම ලිපි ශීර්ෂයක ඉදිරිපත් කරනවා, මේ රටේ tourism promote කිරීමට සමලිංගිකයන්ට අවස්ථාව දෙනවා කියලා. යම් කෙනෙකුට තමන්ගේ ශරීර සෞඛ්‍ය හේතු මත, එහෙම නැත්නම් තමන්ගේ ජානමය හේතු මත anatomically and physiologically ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒ ගැන නොවෙයි අපි කථා කරන්නේ. අපි කථා කරන්නේ මේ රටේ ඉන්න සමලිංගික ප්‍රජාව ගැන නොවෙයි. ගරු කථානායකතුමනි, හැබැයි සමලිංගික ප්‍රජාව පිටරට ඉඳන් මේ රටට ගෙනැල්ලා සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කරනවා නම්, ගරු අගමැතිතුමිය කියූ ආකාරයටම දණ්ඩ නීති සංග්‍රහයේ 375වන වගන්තිය අනුව ඒක නීති විරෝධියි නම්, එවැනි නීති විරෝධී දෙයක් රට තුළ ක්‍රියාත්මක කරන්න ලියුමක් ගහපු මේ නිලධාරියාට විරුද්ධව ගත් ක්‍රියාමාර්ගය මොකක්ද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ඒ මුළු ලිපිය කියෙව්වා නම් එහි අවසාන ඡේදයේ තිබෙනවා, මේ පිළිබඳව අදාළ අමාත්‍යතුමාව දැනුවත් කළ යුතුයි, එහෙම නැත්නම් රජය දැනුවත් කළ යුතුයි කියන එක. එතකොට ඒකෙන්ම අදහස් වෙනවා, දේශපාලන අධිකාරිය සමඟ මේ පිළිබඳව සාකච්ඡා කරලා නොවෙයි, මේ ලිපිය නිකුත් කළේ කියන එක. ඒ නිසා අදාළ අමාත්‍යවරයා ඒ සභාපතිතුමා එක්ක කථා කරලා රජයේ ස්ථාවරය මොකක්ද, දේශපාලන අධිකාරියේ ස්ථාවරය මොකක්ද කියන එක ගැන එතුමාට අවවාද, උපදෙස් දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, අපි මෙතැන මේක ප්‍රශ්නයක් කරගත යුතු නැහැ කියා මම හිතනවා. මොකද, ගරු ජනාධිපතිතුමාත්, ගරු අමාත්‍යවරයාත් රජයේ ස්ථාවරය පැහැදිලිව ප්‍රකාශ කරලා තිබෙනවා. මේ ලිපිය සභාපතිතුමා නිකුත් කළ ලිපියක්. ඉතින්, ඒක පිළිබඳ අපි විශේෂයෙන් කලබල විය යුතු නැහැ.

ගරු කථානායකතුමනි, සංවේදී ප්‍රශ්න ගැන කථා කරනකොට ඒවා දේශපාලන වාසි වෙනුවෙන් භාවිත නොකළ යුතුයි කියන එකත් අපි මතක තියා ගන්න ඕනෑ. මොකද, මේ ප්‍රකාශවලින් හානි වෙන ප්‍රජාවකුත් ඉන්නවා. ඒ නිසා ඒ පිළිබඳවත් සංවේදීතාව තියාගෙන කටයුතු කළ යුතුයි. ඒ වාගේම අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේම තිබෙනවා, සියලු දෙනාටම ගරුත්වය ඇතිව සමාන ලෙස සැලකිය යුතුයි කියලා. ඒකත් මේ අවස්ථාවේ ගරු මන්ත්‍රීතුමාට මම මතක් කරනවා. සංවේදී ප්‍රශ්න ගැන කථා කරනකොට ඒවාට මැදිහත් විය යුතු විධියත්, මේ ප්‍රශ්න නිසා අපහසුතාවට පත් වෙන ප්‍රජාවන් ගැනත් හිතලා අපි මේවා කථා කරමු. රජයේ ස්ථාවරය පැහැදිලියි. අපි කිසිම කණ්ඩායමකට විශේෂ වරප්‍රසාදයක්, විශේෂ ප්‍රවර්ධනයක් කරන්නේ නැහැ. ඒක ඉතාම පැහැදිලියි.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය අහනවා.

ප්‍රශ්නයට උත්තර දීම පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමියට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. හැබැයි, ලංකාවේ ඉන්න මේ ප්‍රජාව ගැන අපි සංවේදීයි කියන එකත් මම කියන්න කැමැතියි. ගරු අග්‍රාමාත්‍යතුමියනි, ලංකාවේ ඉන්න මේ ප්‍රජාව ගැන අපට ප්‍රශ්නයක් නැහැ. අපි ඒගොල්ලන් ගැන අසංවේදී නැහැ. අපි සංවේදීයි. අපට තිබෙන ප්‍රශ්නය ලංකාව, තායිලන්තයක් කරන එකට. මොකද, මේ රටේ සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම සඳහා වනජීවී, වෘක්ෂලතා, අපේ ඉතිහාසය, ප්‍රෞඪත්වය කියන සියල්ලම තිබියදී LGBTQ ප්‍රජාව ප්‍රවර්ධනය කිරීමේ තත්ත්වයට අපේ රට පත් කර ගැනීම පිළිබඳව තමයි අපි ප්‍රශ්න කරන්නේ.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඒ වාගේම මේ සභාපතිවරයා දේශපාලන පත්වීමක් බව මම නැවත වතාවක් කියනවා. එතකොට මේ සභාපතිවරයා ක්‍රියාත්මක කරන්නේ ආණ්ඩුවේ න්‍යාය පත්‍රයද? *[බාධා කිරීමක්]* ජනාධිපතිතුමා පත් කරලා තිබෙන්නේ. එතකොට ඒ සභාපතිතුමා ක්‍රියාත්මක කරන්නේ ආණ්ඩුවේ න්‍යාය පත්‍රයද, නැද්ද? ආණ්ඩුවේ න්‍යාය පත්‍රය නොවේ නම්, මම අහන්නේ හරි සරල ප්‍රශ්නයක්. එතුමාට විරුද්ධව නීතිය ක්‍රියාත්මක වෙනවාද, නැද්ද? මොකද, අද රටේ නීතිය හැමෝටම එකයි කියලා කියනවා. ගරු කථානායකතුමනි, හැබැයි නීතිය සිදු වෙන්නේ දෙපැත්තකට කියලා අපට පෙනෙනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, එම සභාපතිතුමා නීතිය කඩ කරලා තිබෙනවා නම්, ඒකට එරෙහිව අධිකරණයත්, නීතියත් ක්‍රියාත්මක වෙයි. එතැනට දේශපාලන අධිකාරිය මැදිහත් වෙන්න ඕනෑ නැහැ. විශේෂයෙන් නීතිය කඩලා තිබෙන තැන්වලට. ඒකට තමයි අධිකරණ පද්ධතිය තිබෙන්නේ; නීති පද්ධතිය තිබෙන්නේ. එතුමා නීතියක් කඩලා තිබෙනවා නම්, ඒ සම්බන්ධව එතැනින් මැදිහත් වෙයි. ඒ වාගේම මේ LGBTQ ප්‍රජාව සහ ජෛව විවිධත්වය අතර සම්බන්ධතාව මට තේරෙන්නේ නැහැ. මම හිතන විධියට, ඒක එතුමා වෙනම කියපු කථාවක්. නමුත් සභාපතිතුමා නීතිය කඩලා නම්, එතුමාට විරුද්ධව ක්‍රියාමාර්ග ගන්න ක්‍රියාවලියක් තිබෙනවා. ඒ ක්‍රියාවලිය සිද්ධ වෙයි. රජයේ ප්‍රතිපත්තිය මොකක්ද කියන එක ජනාධිපතිතුමා ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. අදාළ අමාත්‍යවරයා එය ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. ඒ නිසා, මම හිතන විධියට ඊට වඩා කරන්න දෙයක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟ ප්‍රශ්නය, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ මහ කොමසාරිස්වරයා විසින් පසුගිය දා පැවති මානව හිමිකම් කොමිසමේ වාර්ෂික සමුළුවට ශ්‍රී ලංකාව පිළිබඳ වූ වාර්තාව ඉදිරිපත් කරන ලදී. එයට පෙර, මානව හිමිකම් කොමිසමේ මහ කොමසාරිස්වරයා ශ්‍රී ලංකාවේ කළ සංචාරයෙන් අනතුරුව මාධ්‍ය නිවේදනයක් නිකුත් කරමින්, ශ්‍රී ලංකා ආණ්ඩුව යුක්තිය, ප්‍රතිසන්ධානය, මාධ්‍ය ක්ෂේත්‍රය ඇතුළු බොහෝ අංශ පිළිබඳව අවධානය යොමු කරමින් ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කළ යුතු යැයි අපේක්ෂා කරනු ලබන වැඩ පිළිවෙළක් ද පෙන්වා දුනි. මෙම පසුබිම සැලකිල්ලට ගනිමින් මතු සඳහන් ප්‍රශ්න ගරු අගමැතිතුමිය වෙත මම යොමු කරමි.

01. මානව හිමිකම් කොමිසමේ ශ්‍රී ලංකාවේ තත්ත්වය පිළිබඳව ඉදිරිපත් කළ වාර්තාව පිළිබඳව රජයේ ස්ථාවරය සහ ඒ පිළිබඳව ගන්නා වූ පියවර මේ සභාවට පැහැදිලි කළ හැකිද?

02. මහ කොමසාරිස්වරයාගේ වාර්තාවේ සඳහන් නියාමන හා නිර්දේශ වෙන් වෙන්ව මෙම සභාවට ඉදිරිපත් කරමින් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට රජය කටයුතු කරන්නේද? නැතහොත් ඒ මන්ද යන්න පැහැදිලි කරන්නේද?

03. මානව හිමිකම් මහ කොමසාරිස්වරයාගේ වාර්තාවේ ශ්‍රී ලංකාවේ වගවීමේ ප්‍රගමනය සඳහා වෙනත් අන්තර්ජාතික නෛතික විකල්ප යොදා ගැනීම සලකා බැලීම සඳහා වූ නිර්දේශ පිළිබඳව ආණ්ඩුවේ මතය කුමක්ද යන්න සඳහන් කරන්නේද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ෂාණක්කියන් රාසමාණික්කම් මැතිතුමා මීට පෙර වෙනත් ප්‍රශ්න කිහිපයක් තමයි අගමැතිතුමියගෙන් අහන ප්‍රශ්න හැටියට ඉදිරිපත් කර තිබුණේ. ඇත්තටම මම ඒවාට පිළිතුරු දෙන්න තමයි සූදානම් වුණේ. මේ අලුත් ප්‍රශ්න මගේ කාර්යාලයට ලැබුණේ ඊයේ දවල්. ඒ නිසා මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. සති දෙකකින් මම මේ ප්‍රශ්නයට උත්තර සපයනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, එහෙනම් ගරු අග්‍රාමාත්‍යතුමිය ලැහැස්ති වෙලා ආපු ප්‍රශ්නයට පිළිතුරු දෙන්න කියන්න. මොකද, මම යොමු කරපු ප්‍රශ්නය නිසා ආණ්ඩුවේ policies පිළිබඳව ප්‍රශ්න කරන්න පුළුවන්, එම නිසා ඒක වෙනස් කරන්න අවශ්‍ය වෙයි කියපු නිසා තමයි මා එය වෙනස් කළේ. මම කලින් අහපු ප්‍රශ්නයට පිළිතුරු දෙන්න අග්‍රාමාත්‍යතුමිය සූදානම් වෙලා ඉන්නවා නම් බොහොම හොඳයි. මොකද, මගේ ඇත්ත ප්‍රශ්නය ඒක. අග්‍රාමාත්‍යතුමියට පුළුවන් නම්, එම ප්‍රශ්නයට උත්තර දුන්නොත් මම සතුටු වෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් අසන ප්‍රශ්න වටයේදී ඉදිරිපත් කරපු ප්‍රශ්නයට උත්තරය ලබා දෙන්න නේ සූදානම් වෙන්නේ. එතුමිය මේ ප්‍රශ්න 4ටම පිළිතුරු සූදානම් කරගෙන සිටියා. ගරු මන්ත්‍රීතුමනි, හැබැයි ඔබතුමා ප්‍රශ්නය වෙනස් කළා, withdraw කරගත්තා. ඒ ප්‍රශ්නය withdraw කරගෙන අලුත් ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න තමයි එතුමිය සාධාරණව අගමැතිතුමියගෙන් අසනු ලබන ඊළඟ ප්‍රශ්න වටයේදී උත්තර දෙන්නම් කිව්වේ. ඒ වාගේම, ඔය කාරණය සම්බන්ධයෙන් විදේශ කටයුතු ඇමතිවරයා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයකුත් කරනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේක දැන් විවාදයක් කරගන්න එපා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

නැහැ, විවාදයක් කරගන්නවා නොවෙයි. ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරයෙකුට කථා කරන්න ඉඩ දෙන්න. ඔබතුමා විවාදයක් කරගන්න යනවා කියන්න එපා. ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් ප්‍රශ්න අහන්න ලැබෙන්නේ මාසයකට එක්වරයි. මේ පිළිබඳ ගැටලුවක් තිබෙනවා නම් ඒ ගැන අහන්න දෙන්නකෝ. ඔබතුමා හැම එකක්ම විවාදයක් කරගන්නවා කියලා හිතන්න එපා. ගරු කථානායකතුමනි, මම ලියලා දුන් ප්‍රශ්නය අන්තිම මොහොතේ ඉල්ලා අස්කරගෙන වෙන ප්‍රශ්නයක් දුන්නා කියන එක වැරදි මතයක්. මම ලියලා දුන් ප්‍රශ්නය, Standing Orders යටතේ it has to be on a policy matter. Therefore, මේක වෙනස් කරන්න කියලා ඉල්ලීමක් කරපු නිසා තමයි මම එය වෙනස් කළේ. මම ලියලා දුන් ප්‍රශ්නය මම වෙනස් කර ගත්තේ නැහැ. ගරු කථානායකතුමනි, හැබැයි මට තේරෙනවා, ඇයි මේකට උත්තර දෙන්න අකැමැති කියලා. මොකද, ජිනීවා මානව හිමිකම් කොමිසමේදී ආණ්ඩුව ගත් ස්ථාවරය පිළිබඳව ආණ්ඩුවට උත්තර දෙන්න බැහැ. මේ ප්‍රශ්නය වැදගත් ප්‍රශ්නයක්. මේක ගැන දැන් ජාත්‍යන්තරයත් බලාගෙන ඉන්නවා. The international

community has said, "Take action; no assurances". එතකොට actions නැති, ඒ කියන්නේ කිසිම වැඩක් කරන්නේ නැති, නිකම් පොරොන්දු විතරක් දීම පිළිබඳව කියලා තිබෙන අවස්ථාවක, මගේ ප්‍රශ්නය පිළිබඳව ගැටලුවක් තිබෙනවා කියලා ප්‍රශ්නයෙන් පැනයාමක් කරන්නේ. ඒක අසාධාරණයි, ගරු කථානායකතුමනි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අපි ප්‍රශ්නවලින් පැනලා යන්නේ නැහැ. අපි මේ ඉදිරිපත් වෙලා තිබෙන තත්ත්වයට සාධාරණව කටයුතු කරමින් ඉන්නවා. මේ සම්බන්ධයෙන් විදේශ කටයුතු ඇමතිවරයා නිල ප්‍රකාශයකුත් පාර්ලිමේන්තුවේදී කරනවා. මෙතැනදී ප්‍රශ්නය වුණේ මේකයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මුලින් අසන ලද ප්‍රශ්නය වෙනස් කළාට පස්සේ ඒ වෙනස් කරපු ප්‍රශ්නයට මේ මොහොතේ අගමැතිතුමියට උත්තර දෙන්න බැහැ. ඒ නිසා තමයි අපි ඊළඟ වාරයේදී මේ ප්‍රශ්නයට උත්තර දෙන්නම් කියලා කිව්වේ. ඒ ප්‍රශ්නයෙන් පළායෑමක් නැහැ. විදේශ කටයුතු ඇමතිවරයා හරහා අපි පිළිතුරක් ලබා දෙනවා.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -1180/2025- (1), ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

### රැකියා සඳහා විදේශගත වූ ත්‍රිවිධ හමුදාව හැරගිය නිලධාරීන්: ගත් පියවර
### சேவையிலிருந்து விலகி வெளிநாட்டு வேலைவாய்ப்புக்குச் சென்றுள்ள முப்படையினர்: நடவடிக்கை
### DESERTERS OF TRI-FORCES MIGRATED FOR EMPLOYMENT: ACTION TAKEN

1235/2025

**2. ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)

ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදා සේවයේ නියුක්තව සිට, නිවාඩු ලබා නොගෙන විවිධ හේතු මත සේවය අතහැර ගොස් විදේශගතවී සිටින නිලධාරීන් සංඛ්‍යාව සහ සෙසු නිල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) පසුගිය රජය අවධියේදී පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් ඔවුන් විදේශගතවී ඇති අතර, විවිධ රැකියාවල නිරත වෙමින් මේ වන විට ඔවුන් ශ්‍රී ලංකාවට විශාල විදේශ විනිමයක් උපයා දෙන බව පිළිගන්නේද;

(iii) ඔවුන් නීත්‍යානුකූලව හමුදා සේවයෙන් ඉවත්වී නොමැති බැවින් නැවත ශ්‍රී ලංකාවට පැමිණීමේදී අත්අඩංගුවට ගනු ලබන බව දන්නේද;

(iv) එසේ අත්අඩංගුවට ගනු ලබන ත්‍රිවිධ හමුදා සාමාජිකයන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) ඔවුන්ව නීත්‍යානුකූලව හමුදා සේවයෙන් ඉවත් කිරීම සඳහා ගත වන කාලය අවම කර ගැනීමට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் முப்படைகளில் பணியாற்றி, லீவு பெற்றுக்கொள்ளாது பல்வேறு காரணங்கள் நிமித்தம் தொழிலைக் கைவிட்டு வெளிநாடு சென்றுள்ள அலுவலர்களின் எண்ணிக்கை மற்றும் ஏனைய உத்தியோகபூர்வ அங்கத்தவர்களின் எண்ணிக்கை யாது;

(ii) கடந்த அரசாங்கத்தின் ஆட்சிக் காலத்தில் நிலவிய பொருளாதார நெருக்கடியின் காரணமாக இவர்கள் வெளிநாடு சென்று பல்வேறு தொழில்களில் ஈடுபட்டு வருவதால் இன்றளவில் இலங்கைக்குப் பெருமளவான வெளிநாட்டுச் செலாவணியை ஈட்டித் தருகின்றமையை ஏற்றுக்கொள்வாரா;

(iii) இவர்கள் சட்டரீதியாக இராணுவ சேவையிலிருந்து விலகாத காரணத்தால், மீண்டும் இலங்கைக்கு வரும்போது கைது செய்யப்படுவார்கள் என்பதை அறிவாரா;

(iv) அவ்வாறு கைது செய்யப்படும் முப்படையினர் தொடர்பாக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

(v) இவர்களைச் சட்டரீதியாக இராணுவ சேவையிலிருந்து விலக்குவதற்கு எடுக்கும் காலத்தைக் குறைத்துக் கொள்வதற்கான வேலைத்திட்டம் ஒன்று நடைமுறைப்படுத்தப்படுமா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House -

(i) the number of the officers and those of the other ranks of the Tri- Forces of Sri Lanka who have deserted the service for various reasons and have gone abroad without obtaining leave;

(ii) whether he accepts that the said personnel have gone abroad owing to the economic crisis that prevailed during the previous Government, and they are currently remitting a large amount of foreign exchange to Sri Lanka by engaging in various jobs;

(iii) whether he is aware that they are arrested upon their return to Sri Lanka since they have not legally left the military service;

(iv) the actions that are taken against the personnel of the Tri- Forces who are so arrested; and

(v) whether arrangements will be made to minimize the time taken for their lawful discharge from the military service?

(b) If not, why?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) නිවාඩු නොමැතිව නොපැමිණ සිටින යුද හමුදාවේ නිලධාරින් 385ක් සහ සෙසු නිලයන් 47,265ක් වේ. ගුවන් හමුදාවේ නිලධාරින් 46ක් සහ සෙසු නිලයන් 3,396ක් වේ. නිවාඩු නොමැතිව නොපැමිණ සිටින පුද්ගලයන් ලෙස එම ප්‍රමාණය වාර්තා වෙනවා. නාවික හමුදාව ගත්තාම නිලධාරින් 87ක් සහ සෙසු නිලයන් 3,108ක් වේ.

එම පිරිස අතරින් නිශ්චිතව හඳුනා ගත් විදේශගත ප්‍රමාණය ලෙස යුද හමුදාවේ නිලධාරින් 232ක් සහ සෙසු නිලයන් 93ක්, නාවික හමුදාවේ නිලධාරින් 64ක් සහ සෙසු නිලයන් 19ක් වශයෙන් හඳුනාගෙන තිබෙනවා. ගුවන් හමුදාවේ නිලධාරින් 15ක් සහ සෙසු නිලයන් 05ක් වේ. ඒ වාගේම නිවාඩු නොමැතිව නොපැමිණ සිටින පිරිස විශාල ප්‍රමාණයක් බැවින්, ඒ අතරින් විදේශගතව සිටින නිලධාරින් සහ සෙසු නිලයන් සංඛ්‍යාව හරියටම නිශ්චිතව සඳහන් කළ නොහැක.

ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් දීර්ඝ විස්තරයක් තිබෙනවා.

(ii) ඔවුන්ගේ විදේශගතවීම සම්බන්ධයෙන් නිවැරදි සංඛ්‍යා දත්ත නොමැති බැවින් නිශ්චිත පිළිතුරක් ලබා දිය නොහැක.

මේ පිළිබඳවත් දීර්ඝ විස්තරයක් තිබෙනවා.

(iii) නිවාඩු නොමැතිව සේවයට නොපැමිණ සිටීම මත විදෙස්ගතව ඇති බැවින් නැවත ලංකාවට පැමිණීමේදී හමුදා නීති රෙගුලාසිවලට අනුකූලව හමුදා භාරයට ගන්නවා.

මේ පිළිබඳවත් දීර්ඝ විස්තරයක් තිබෙනවා.

(iv) අත්අඩංගුවට ගනු ලැබූ යුද හමුදා නිලධාරින් යුද අධිකරණයකට පමුණුවා අස් කිරීමට කටයුතු කරනවා. යුද හමුදා සෙසු නිලධාරින් කෝප්‍රල් නිලයෙන් පහළ නම් වසරකට වැඩි කාලයක් නිවාඩු නොමැතිව සේවයට නොපැමිණ සිටීම මත හා සැරයන් නිලයේ සිට ඉහළට නම් එම කාලය මාස 6කට වැඩි වුවහොත් එම නිලධාරින් අස් කිරීම සිදු කරනු ලබනවා.

නාවික හමුදාවේ නම් ලඝු නඩු විභාග කිරීමෙන් පසුව සේවයෙන් ඉවත් කරනවා.

ගුවන් හමුදාවේ නම් සේවයේ යෙදී සිටීමට කැමැති අයවලුන් රාජ්‍ය බුද්ධි සේවය සහ විශේෂයෙන්ම පොලීසිය මඟින් ලබා දෙනු ලබන නිෂ්කාසන වාර්තා පදනම් කරගෙන නැවත සේවයේ තබාගන්නා අතර එහිදී විශේෂයෙන්ම සේවයේ යෙදීමට අකැමැත්ත ප්‍රකාශ කරන අය "සේවය තවදුරටත් අවශ්‍ය නොවේ" -"Service no longer required"- කියන වගන්තිය යටතේ අස්කරනු ලබයි.

මේ පිළිබඳවත් දීර්ඝ විස්තරයක් තිබෙනවා.

(v) ගරු මන්ත්‍රීතුමනි, ඔවුන් අතරින් බොහෝදෙනෙක් හමුදාවට බැඳෙනකොට ඇප බැඳුම්කර, බැංකු ණය හා වෙනත් ආයතන වෙතින් ලබා ගත් ණය මුදල් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ඔවුන් නීත්‍යානුකූලව හමුදා සේවයෙන් ඉවත් කිරීමට අදාළ ආයතන සමඟ සම්බන්ධතාවෙන් විධිමත් ක්‍රියාවලියකට යටත්ව කාර්යක්ෂමව කටයුතු කරනු ලබනවා.

මේ පිළිබඳවත් දීර්ඝ විස්තරයක් තිබෙනවා.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට අදාළ සවිස්තරාත්මක පිළිතුර මම **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ)(i)

| ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | ශ්‍රී ලංකා නාවික හමුදාව | | ශ්‍රී ලංකා ගුවන් හමුදාව |
|---|---|---|---|
| | නිලධාරින් | සෙසු නිල | |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සේවයේ නියුක්තව සිට නිවාඩු නොමැතිව සේවයට නොපැමිණ සිටින නිලධාරින් - 385<br><br>සෙසු නිලයන් 47265 ක් වාර්තා වී ඇත. එම අයවලුන් නිවාඩු නොමැතිව සේවයට නොපැමිණ සිට විදේශගතවී අත්දැයි ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය විසින් ආගමන විගමන දෙපාර්තමේන්තුව හා සම්බන්ධතාවයෙන් යුතුව පරීක්ෂා කරමින් පවතින අතර, දැනට නිවාඩු නොමැතිව සේවයට නොපැමිණ සිටින නිලධාරින් 232 ක් හා විශේෂ බලකායට අයත් සෙසු නිලයන් 93 දෙනෙකු විදේශගතවී ඇති බවට තොරතුරු අනාවරණය වී ඇත. නිවාඩු නොමැතිව සේවයට නොපැමිණ සිටින සංඛ්‍යාව විශාල ප්‍රමාණයක් බැවින් එම අයවලුන් විදේශගතවී ඇති/නැති බව සනාථ කර ගැනීම සඳහා සැලකිය යුතු කාලසීමාවක් ගතවන බව දන්වා සිටිමි . | විදේශ නිවාඩු මත සිටියදී - 55<br><br>විදේශ සංචාර මත සිටියදී - 03<br><br>විදේශ පාඨමාලා සඳහා අනුයුක්තව සිටියදී - 06 | විදේශ සංචාර මත සිටියදී - 02<br><br>විදේශ පාඨමාලා සහ රාජකාරී සඳහා අනුයුක්තව සිටියදී - 17 | ගුවන් හමුදා සක්‍රිය සේවයේ නියුක්තව සිට, නිවාඩු ලබා නොගෙන විවිධ හේතු මත සේවය අතහැර ගොස් සිටින නිලධාරින් - 46<br><br>සෙසුනිල සාමාජිකයින් 3396 ක් වන අතර, විදේශගතවී සිටින නිලධාරින් සහ සෙසුනිල සංඛ්‍යාව නිශ්චිතව සඳහන් කල නොහැකිය. |

(ii)

| ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | ශ්‍රී ලංකා නාවික හමුදාව | ශ්‍රී ලංකා ගුවන් හමුදාව |
|---|---|---|
| නිශ්චිත පිළිතුරක් ලබා දිය නොහැක. | නිවැරදි සංඛ්‍යා දත්ත නොමැති බැවින් නිශ්චිත පිළිතුරක් ලබාදිය නොහැක. | අනුමත නිවාඩු නොලබා සේවය අතහැර ගොස් විදේශගතවී ඇති ගුවන් හමුදා සේවා පුද්ගලයින් කවුරුන්ද යන වග නිශ්චිතව සඳහන් කල නොහැකි හෙයින්, විදේශ ගතවී විවිධ රැකියාවල නිරත වෙමින් මේ වනවිට ඔවුන් ශ්‍රී ලංකාවට විශාල විදේශ විනිමයක් උපයා දෙන ගුවන් හමුදා නිලධාරීන් හා සෙසු නිලයන් සම්බන්ධයෙන් අසා ඇති ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු ලබාදීම සඳහා ගුවන් හමුදාව සතුව දත්තයන් නොමැත. |

(iii)

| ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | ශ්‍රී ලංකා නාවික හමුදාව | ශ්‍රී ලංකා ගුවන් හමුදාව |
|---|---|---|
| (i) නිවාඩු නොමැතිව සේවයට නොපැමිණ සිටින යුද්ධ හමුදා සාමාජිකයන් අසාදුගත ලේඛනය වෙත ඇතුළත් කර ඇත්නම් පමණක් ඔවුන් විදේශගත වීමේදී සහ නැවත දිවයිනට පැමිණීමේ දී ගුවන්තොටුපල පොලීසිය/රාජ්‍ය බුද්ධි සේවය මගින් අත්අඩංගුවට ගෙන ශ්‍රී ලංකා පොලිස් හේවා බලකාය වෙත භාරදෙනු ලබයි.<br><br>(ii) කොමිෂන්ලත් නිලධාරීන් රාජකාරි කරනු ලබන ස්ථානයන් හි අවි, මුදල්, උපකරණ සහ හයි පිරිස් භාරව වගකීම් දරන අයවලුන් බැවින් එම නිලධාරීන් නිවාඩු නොමැතිව සේවයට නොපැමිණ සිට විදේශගතවී නැවත පැමිණීමේදී ඉදිරි විමර්ශණ හා නිශ්කාෂණ කටයුතු සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය විසින් අත්අඩංගුවට ගනු ලබයි. | ඔවුන් නිවාඩු නොමැතිව බැහැරව සිටින බැවින් නැවත ශ්‍රී ලංකාවට පැමිණීමේදී නාවික හමුදා නිතීය ප්‍රකාරව අත්අඩංගුවට පත් වේ. | ඔවුන් නිත්‍යානුකූලව හමුදා සේවයෙන් ඉවත්වී නොමැති හෙයින් පවත්නා ගුවන් හමුදා නීති රෙගුලාසි වලට අනුකූලව අත්අඩංගුවට ගනු ලැබේ. |

(iv)

| ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | | ශ්‍රී ලංකා නාවික හමුදාව | ශ්‍රී ලංකා ගුවන් හමුදාව |
|---|---|---|---|
| නිලධාරීන් | සෙසු නිල | | |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙන් නිවාඩු නොගෙන නොපැමිණ සිට විදේශගතවී ඇති නිලධාරීන් යුද්ධ හමුදාවෙන් පැනගිය නිලධාරීන් සේ සලකා අත්අඩංගුවට ගැනීමෙන් පසුව යුද්ධාධිකරණයක් ඉදිරියට පමුණුවා චෝදනා විභාග කර යුද්ධ හමුදා සේවයෙන් අස්කිරීමට කටයුතු කරනු ලබයි. | ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙන් නිවාඩු නොගෙන නොපැමිණ සිටින සෙසුනිලයගේ නිලය හා නිනොනො කාලසීමාව අනුව මේ වන විට පහත ආකාරයට ඔවුන් සබැඳිව ක්‍රියා කර යුද්ධ හමුදා සේවයෙන් අස්කිරීම් කරනු ලබයි.<br><br>(i) සැරයන් සහ ඉන් ඉහල ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන්/බලලත් නිලධාරින් අතරින් මාස 06ට වැඩි කාලසීමාවක් නිනොනොව සිට අත්අඩංගුවට ගනු ලබන හෝ පැමිණ භාරවන අයවලුන් යුද්ධ හමුදා සේවයෙන් අස්කිරීමට කටයුතු කරනු ලැබේ.<br><br>(ii) ආධුනික සෙබළ නිලයේ සිට කෝප්‍රල් නිලය දක්වා වූ සෙසුනිලයන් අතරින් මාස 12ට වැඩි කාලසීමාවක් නිනොනොව සිට අත්අඩංගුවට ගනු ලබන හෝ පැමිණ භාරවන අයවලුන් යුද්ධ හමුදා සේවයෙන් අස්කිරීමට කටයුතු කරනු ලැබේ. | නාවික හමුදාවෙන් පැන යාම යන වරද සම්බන්ධයෙන් විධිමත් ලඝුනඩු විභාගයන් හෝ යුධ අධිකරණයන්, අත්අඩංගුවට පත්වන එක් එක් නාවික පුද්ගලයින් හට ක්‍රියාත්මක කරන අතර, ඉන් අනතුරුව අධිකරණ බලතල ප්‍රකාරව සුදුසු දඬුවමක් ප්‍රධානය කරනු ලබයි. | (අ) නිවාඩු නොමැතිව සේවය හැරගොස් ඇති ගුවන් හමුදා නිලධාරීන් හා සෙසු නිලයන් සම්බන්ධයෙන් ගුවන් හමුදාව විසින් පනවන ලද නීතිරීතින්ට යටත්ව විනයානුකූලව පියවර ගෙන **'සේවය තවදුරටත් අවශ්‍ය නොවේ'** යන වගන්තිය යටතේ ගුවන් හමුදා සේවයෙන් ඉවත් කරලීමට කටයුතු සිදු කිරීම කරනු ලබයි.<br><br>(ආ) තවද, ගුවන් හමුදා සේවයේ රැඳී සිටීමට කැමති අයවළුන් ඔවුන්ගේ සේවයට නොපැමිණි කාල වකවානුව, වෘත්තිය කුසලතාවන් පදනම් කරගෙන සහ රාජ්‍ය බුද්ධි සේවය මගින් හා සිවිල් පොලිස් ස්ථානයන් මගින් ලබා දෙනු ලබන නිෂ්කාශන වාර්තාව පදනම්ව ගුවන් හමුදා නීතිරීති වලට අනුකූලවන්නේ නම් තවදුරටත් සේවයේ රැඳී සිටීමට ඉඩ ප්‍රස්ථා ලබා දෙනු ලැබේ. |

(v)

| ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | ශ්‍රී ලංකා නාවික හමුදාව | ශ්‍රී ලංකා ගුවන් හමුදාව |
|---|---|---|
| (i) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් මත 2022 වර්ෂයේ ක්‍රියාත්මක කරුන ලද පොදුසමා අදියර යටතේ නිවාඩු නොමැතිව සේවයට නොපැමිණ විදේශගතව සිටින නිලධාරීන්/සෙසුනිලයන් හට ශ්‍රීලංකාවට පැමිණීමකින් තොරව ලියාපදිංචි කරන ලද වලංගු ඇටෝර්නි බලපත්‍රයක් හරහා නියෝජිතයකු මගින් ලේඛන යුද්ධ හමුදාව වෙත ඉදිරිපත් කර තම අස්වීම් කටයුතු සිදුකර ගැනීම සඳහා අවස්ථාව හිමිව තිබූ අතර, 2024 වර්ෂයේද පොදුසමා අදියරයක් ක්‍රියාත්මක කර ඇත.<br><br>(ii) යුද්ධ හමුදා සේවය හැරගොස් ඇති නිලධාරින් සහ සෙසුනිලයන් අතරින් බොහෝ දෙනෙක් ඇප බැදුම්කර මුදල්, රාජ්‍ය හා පුද්ගලික බැංකු වෙතින් ලබාගත් ණය, යුද්ධ හමුදා සුවසහන ණය සහ වෙනත් යුද්ධ හමුදා ආයතන වෙතින් ලබාගෙන ඇති ණය මුදල් ඇතුලුව රෙජිමේන්තු මධ්‍යස්ථාන සහ ඒකක වෙත අයවීමට ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින් එම මුදල් අයකර ගැනීමකින් තොරව ඔවුන් යුද්ධ හමුදාවෙන් නීත්‍යානුකූලව ඉවත් කිරීම සඳහා නිශ්කාෂන ලබාදීමට නොහැකි බැවින් සහ නිවාඩු නොමැතිව සේවයට නොපැමිණ සිටින නිලධාරින්/සෙසුනිලයන් සේවයේ යෙදී සිටින අනෙකුත් නිලධාරි/සෙසුනිලයන් හට වැරදි පූර්වාදර්ශයක් සපයන බැවින් ඔවුන්ට එරෙහිව යුද්ධ හමුදා පනත අනුව විනය ක්‍රියාමාර්ග/සිවිල් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමෙන් පසුව පමණක් එම අයවලුන් නිශ්කාෂන සහිතව යුද්ධ හමුදාවෙන් නීත්‍යානුකූලව ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අධිකරණ ක්‍රියාවලිය තුළ අත්අඩංගුවට පත් වන නාවික පුද්ගලයන් නාවික හමුදාවෙන් ඉවත් කිරීමට තීරණය කරන්නේ නම් පමණක් අත්අඩංගුවට ගැනීමේ සිට විධිමත් ලෙස නාවික හමුදාවෙන් ඉවත් කිරීම දක්වා වූ කාලය තුළ නාවික හමුදාවේ මෙම ක්‍රියාවලියට සම්බන්ධ දෙපාර්තමේන්තු එකිනෙකට සහයෝගිත්වයකින් සහ විධිමත් ක්‍රියාවලියකට යටත්ව කාර්යක්ෂමව කටයුතු කරනු ලැබේ. | ආසන්න වශයෙන් දින 30 ක පමණ කාලයක් (මෙය ඔවුන් සේවය අතහැර ගොස් සිටි කාලසීමාවට අනුව ගනු ලබන විනය ක්‍රියාමාර්ගයේ තීරණ මත වෙනස්වේ). |

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් පිළිතුරු දැනගන්නට අවශ්‍ය මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙහෙම සක්‍රිය සේවයේ ඉඳලා නිසි නිවාඩු ලබා ගැනීමකින් තොරව හමුදා සේවයෙන් ඉවත් වෙලා, නැත්නම් පලා ගිහිල්ලා, නැත්නම් පිටරටවලට ගිහිල්ලා ඉන්න අය සේවයෙන් අයින් කරන්නට සුදුසු ක්‍රමයක්, ඒ කියන්නේ කාලයක් සේවයෙන් ඉවත් වෙලා ඉන්න අයට සහ විවිධ ආයතනවල කිසිම ගැටලුවකට ලක් වී නැති අයට නැවත ලංකාවට පැමිණීමකින් තොරව ඒ රටවල ඉන්නකොටම ලංකාවේ සේවයෙන් ඉවත්වීමට අවශ්‍ය නම් ඒ අයට මොකක් හරි තාක්ෂණික ක්‍රමවේදයක් යොදාගෙන, එහෙම නොමැතිනම් ඒ අය නීත්‍යානුකූලව නම් කරන ඔවුන්ගේ next of kin හෝ වෙන කවුරුහරි සම්බන්ධ කරගෙන ඔවුන්ව සක්‍රිය සේවයෙන් ඉවත් කිරීමට කටයුතු කරන්නට පුළුවන්ද?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ අතුරු ප්‍රශ්නය පැහැදිලියි. විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදා නිලධාරින් ගත්තාම එම නිලධාරින්ට අධිකාරිය ලබා දෙන්නේ ගරු ජනාධිපතිතුමා. එතැනදීම විශාල බැඳීමක් ඇති කර ගන්නවා. මම කලින් කිව්වා වාගේ ඇප බැඳුම්කර, බැංකු ණය හා වෙනත් ආයතනවලින් ලබා ගත් ණය මුදල් ආදියේ ගෙවීම් පැහැර හැරලා සමහර අය විදෙස්ගත වෙලා තිබෙනවා. හමුදාවෙන් නීත්‍යානුකූලව ඉවත් වෙන්නේ නැතුව එලෙස විදෙස්ගත වූ විශාල සංඛ්‍යාවක් ඉන්නවා. එම ආයතන සමඟ සම්බන්ධ වෙලා කටයුතු කිරීමත් ඉතා සංකීර්ණයි. මොකද, සමහර අයගේ විස්තර නැහැ. ඒ වාගේම හමුදාවට නොකියා ගිහින් විදෙස්ගත වෙලා ඉන්න කට්ටිය සමහර විට මොන විධියේ දේවල්වලට සම්බන්ධ වෙලා ඉන්නවාද කියලා අපි දන්නේත් නැහැ. මොකද, පසුගිය කාලයේ වුණු සිදුවීම් එක්ක බැලුවාම හමුදාවේත් සුළු කොටසක් යම් යම් අපරාධවලට සම්බන්ධ යැයි තොරතුරු ලැබිලා තිබෙනවා. හමුදාවෙන් ඉවත් වෙලා ගිහින් ඉන්න කට්ටිය, නිවාඩු නොමැතිව සේවයට නොපැමිණ සිටින අයවලුන් ඒවාට සම්බන්ධ වෙලා තිබෙනවා.

ඒ වාගේම හමුදාවේ සිටියදී වරදක් කර, නිවාඩු ලබා නොගෙන විදෙස්ගත වෙලා ඉන්න අයවලුන් ගැන අපට නිවැරැදි තොරතුරක් ගන්න බැහැ. ඔබතුමා කියන විධියට නිවැරැදි තොරතුරක් ගන්න අපට සම්බන්ධතාවකුත් නැහැ. මොකද, හමුදාවේ මූලික වශයෙන් පුහුණුවීම් ලබනකොට සමහර අයට අවුරුද්දක කාලයක් පුහුණුවීම ලබා දෙනවා. සමහර අයට අවුරුදු දෙකක කාලයක් එහෙම නැත්නම් අවුරුදු තුනක කාලයක් වාගේම සමහර අයට අවුරුදු හතරක පුහුණුවීම් කාලයක් ලබා දෙනවා. සමහර අයව පුහුණුවීම් සඳහා විදේශ රටවල පාඨමාලාවලට යවනවා. ඔවුන් විදේශ රටවල නැවතිලා නැවත සේවයට රපෝර්තු නොකර සිටිනවා. ඔවුන් වෙනුවෙන් රජය විශාල මුදලක් වැය කරලා තිබෙනවා. ඔවුන් නැවත මේ රටට එන්නේ නැතුව සිටින්න කොයි විධියටද විදෙස්ගතවීම සකසා ගෙන තිබෙන්නේ? ඒ කියන්නේ, විශේෂයෙන් හමුදාවක සේවය කරන කෙනෙක් පාස්පෝට් එකක් ගන්නකොට හමුදාවෙන් සහතික කරපු ලියුමක් ඕනෑ. ඔවුන් හමුදාවට බැඳෙනකොට තිබෙන ලියකියවිලි, සහතික ඔක්කෝම හමුදා භාරයේ තිබෙන්නේ. ඔවුන් ඒවාත් ලබා නොගෙනයි විදෙස්ගත වෙන්නේ. එලෙස විදෙස්ගත වන්න පාස්පෝට් එක ගන්න පොලිස් වාර්තාව ඕනෑ. ඔබතුමා දන්නවා, පසුගිය කාලයේ අපේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමහර අපරාධකරුවන්ට කොයි විධියටද පාස්පෝට් දීලා තිබෙන්නේ කියලා. එම නිසා අපි මේ ගැන විශේෂයෙන්ම සැලකිලිමත් වුණා. ගරු ජනාධිපතිතුමා එක්කත් කථා කළා, ඔවුන්ට පොදුවේ සමාවක් දෙන්න. නමුත්, ඒකත් කරන්න අපහසුයි. මොකද, ඒක වැරදි පූර්වාදර්ශයක් වනවා කියලා හමුදාපතිවරු තුන්දෙනා එක්ක පැවැති සාකච්ඡාවේදී අපි ප්‍රකාශ කළා. මේ සම්බන්ධව විශේෂ සැලකිල්ලක් යොමු කර ඒ වෙනුවෙන් අවශ්‍ය වැඩ පිළිවෙළක් යොදන්න අපි උත්සාහ කරනවා.

පසුගිය කාලයේ ඇති වෙච්ච ඒ සිද්ධි දාමයත් එක්ක බැලුවාම අපිට එක විටම තීරණයක් ගන්න බැහැ, ඒ සම්බන්ධව කාට හෝ බලයක් පවරලා ඔවුන් වෙනුවෙන් ඉදිරිපත් වෙන්න. අනිවාර්යයෙන්ම ඔවුන් ලංකාවට පැමිණිය යුතුමයි. ඔවුන් ලංකාවට ගෙන්වලා අපේ භාරයට අරගෙන, ඔවුන්ගෙන් ලබා ගන්නා ඒ ප්‍රකාශ අනුව කිසිම අපරාධයකට හෝ වෙනත් අකටයුත්තකට සම්බන්ධ නැහැ කියන තහවුරුව කර ගත්තාට පසුව නීත්‍යානුකූලව හමුදාවෙන් අස් කිරීමේ කටයුත්ත ලොකු කාලයක් ගන්නේ නැතුව අපිට කරලා දෙන්න පුළුවන්.

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. නිවාඩු ලබා නොගෙන හමුදා සේවයට නැවත වාර්තා නොකොට විදෙස්ගතව ඉන්න පිරිස සහ ලංකාව තුළ සිටිමින් නැවත සේවයට වාර්තා නොකර ඉන්න සියලුදෙනා අත්අඩංගුවට ගැනීමට හෝ හමුදා භාරයට ගැනීමට යෑමේදී ඒ වෙනුවෙන් යම් පිරිවැයකුත් දරන්න වෙනවා. ඒත් එක්කම ඔවුන්ව ඉවත් කිරීම සඳහා යම් කාලයක් ගත වන නිසා යම් මානුෂීය ගැටලු කිහිපයකුත් පැන නඟින්න පුළුවන්. මීට ඉස්සෙල්ලාත් මේ වාගේ අවස්ථාවලදී පොදු සමා කාලය ලබා දීලා තිබෙන විධියට විදෙස්ගතව ඉන්න පිරිසට සහ ලංකාව තුළ සේවයට වාර්තා නොකර හමුදා සේවයෙන් ඉවත් වෙලා ඉන්න පිරිසට - සියලුදෙනාට බලපාන පරිදි - පොදු සමා කාලයක් ලබා දීමට හැකියාවක් තිබෙනවාද කියලා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම දැනගන්න කැමතියි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි මම ඔබතුමා අහපු පළමුවන අතුරු ප්‍රශ්නයේදීත් මේ ගැන සඳහන් කළේ. විශේෂයෙන්ම පොදු සමා කාලයක් එක වතාවටම අපිට තීරණය කරන්න බැහැ. එහෙම අපි තීරණය කරලා පොදු සමා කාලයක් ලබා දුන්නොත් දැනට සේවයේ ඉන්න අයත් ඒක පුරුද්දක් හැටියට භාවිත කරන්න පුළුවන්. එතකොට ඒක වැරදි පූර්වාදර්ශයක් වෙනවා. කලින් පොදු සමා කාලය ලබා දුන්නා, අපේ රටේ යුද වාතාවරණය තිබුණු අවස්ථාවේදී අපේ භට පිරිස් හිඟතාව නිසා ඇති වූ තත්ත්වය හේතුවෙන්. අපි යම් යම් කාලවලදී ඒ නිර්ණායක අනුව ප්‍රතිපත්තියකට යටත්ව, නීත්‍යානුකූලව ඔවුන්ට පොදු සමා කාලයක් ලබා දුන්නා. නමුත්, ඉදිරියේදී එවැනි පොදු සමා කාලයක් ලබා දෙන්න බැහැ. මොකද, ඒකට අපිට තවත් කරුණු කාරණා විශේෂයෙන් සැලකිල්ලට ගන්න වෙනවා. ඒ වෙනුවෙන් තව කාලයක් අවශ්‍යයි. හමුදාවේ සිටින සහ හමුදාවෙන් ඉවත්ව ගිය සුළු පිරිසක් පසුගිය කාලයේදී සිදු කළ අපරාධ සම්බන්ධයෙනුයි විශේෂයෙන්ම මම කලින් සඳහන් කළේ. මොකද, මේ නිලධාරින් විශේෂයෙන්ම හමුදාවේ මුදල් භාරව හිටියා; අවි භාරව හිටියා; පතොරම් භාරව ඉඳලා තිබෙනවා. ඒවා කිසි දෙයක් නීත්‍යානුකූලව භාර දෙන්නේ නැතුව හොරෙන්ම විදෙස්ගත වෙච්ච අයවලුන් සිටිනවා, විශේෂයෙන්ම නිලධාරින්. ජනාධිපතිතුමා විසින්ම තමයි ඒ අධිකාරිය ලබා දෙන්නේ. ජනාධිපතිතුමා විසින්ම තමයි නැවත ඒ අධිකාරිය ඉවත් කරන්නත් ඕනෑ. ඒ නිසා පොදු සමා කාලයක් ලබා දීම එක සැරේ අපට තීන්දු කරන්න බැහැ, පසුගිය කාලයේ සිදු වෙච්ච අපරාධ කටයුතු සම්බන්ධව ගත්තාම.

අනිවාර්යයෙන් අපි මේ සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් දක්වා තිබෙනවා, ඉදිරියේදී මේ අයව සහනදායී පදනමක් මත නීත්‍යානුකූලව හමුදාවෙන් ඉවත් කරන්නේ කොහොමද කියලා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මේ අමාත්‍යාංශය සම්බන්ධයෙන් වාගේම පාර්ලිමේන්තුවේ තිබෙන වැඩ කටයුත්තක් සම්බන්ධයෙන් මම සඳහන් කරන්නේ. සාමාන්‍යයෙන් ගුවන්, නාවික සහ ප්‍රවාහන කටයුතු, අධ්‍යාපනය, සෞඛ්‍යය,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක point of Order එකක් නොවෙයි නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මොහොතක් ඉන්න, ගරු කථානායකතුමනි. Ministerial Consultative Committee එක නැහැ. ඇයි Ministerial Consultative Committee එක,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වාඩිවෙන්න, ගරු මන්ත්‍රීතුමා. ප්‍රශ්න අංක 03, ගරු ධර්මප්‍රිය දිසානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order. මම අහන්නේ පාර්ලිමේන්තුවේ වැඩ කටයුත්තක් සම්බන්ධයෙන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා මාසයකට සැරයක් රැස් වෙන්නේ නැත්තේ ඇයි? මේවාට උත්තර ලබා ගන්න පාර්ලිමේන්තුවේදී මිසක් එළියේ අහන්නයැ.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා මුලින් ඇහුවේ වෙන ප්‍රශ්නයක්. අපි බබාලා නොවෙයි නේ. අපට ඒවා තේරෙනවා. ස්ථාවර නියෝග මඟින් පනවා තිබෙන ආකාරයට, පාර්ලිමේන්තුවේ කාරක සභා කැඳවීම පිළිබඳව ඇමතිවරු විසින් කටයුතු කරනවා. ඒ වාගේම ඇමතිවරුන්ට අයිතියකුත් තිබෙනවා, ඒ අනුව කටයුතු කරන්න. පාර්ලිමේන්තුවේ වැඩ පිළිවෙළ පවත්වා ගෙන යෑමට බාධා කරන්නේ නැතුව කටයුතු කරන්න කියන ඉල්ලීම තමයි මට කරන්න තිබෙන්නේ. අපි සියලුම අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා කැඳවනවා. ජනාධිපතිතුමා පවා ඇවිල්ලා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා කැඳවලා තිබෙනවා.

## බන්ධනාගාර රැඳවියන්: රඳවා තබා ගැනීමේ කාලය
### சிறைக் கைதிகள்: தடுப்புக் காலம்
### PRISON INMATES: PERIODS OF DETENTION

1258/2025

**3.ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ බන්ධනාගාර තුළ මේ වනවිට රඳවා සිටින රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රැඳවියන් අතරින් වර්ෂ 20ක රැඳවුම් කාලයකින් පසු නිදහස ලැබීමට නියමිත රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 20ක කාලය සම්පූර්ණ වීමෙන් පසු එම රැඳවියන් නිදහස් කරන්නේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත රැඳවියන් හැර දඬ ගෙවීමට නොහැකිව දීර්ඝ කාලීනව බන්ධනාගාරගත කර සිටින රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් සම්බන්ධයෙන් සාධාරණ හා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරන්නේද;

(iii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை சிறைச்சாலைகளில் இன்றளவில் எத்தனை சிறைக் கைதிகள் தடுத்து வைக்கப்பட்டுள்ளனர் என்பதையும்;

(ii) மேற்படி சிறைக் கைதிகளுள் 20 ஆண்டுகள் தடுத்துவைக்கப்பட்டதன் பின்னர் விடுவிக்கப்படவுள்ள சிறைக் கைதிகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) 20 ஆண்டுகால சிறைத்தண்டனை நிறைவடைந்த பின்னர் அச்சிறைக் கைதிகள் விடுவிக்கப்படுவார்களா என்பதையும்;

[ගරු ධර්මප්‍රිය දිසානායක මහතා]

(iv) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி சிறைக் கைதிகளைத் தவிர அபராதம் செலுத்த முடியாமல் நீண்ட காலமாகச் சிறைச்சாலைகளில் தடுத்து வைக்கப்பட்டுள்ள கைதிகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அவர்களின் விடயத்தில் நியாயமான மற்றும் முறையான வழிமுறையொன்று பின்பற்றப்படுமா என்பதையும்;

(iii) ஆமெனில், அவ்வழிமுறை யாது என்பதையும்;

(iv) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

மேலும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House -

(i) the number of inmates who are currently detained in Sri Lankan prisons;

(ii) the number of inmates who are scheduled to be released after a detention period of 20 years, out of the said prisoners;

(iii) whether those prisoners will be released after the completion of the period of 20 years; and

(iv) if not, the reasons for it?

(b) Will he also inform this House -

(i) the number of prisoners who have been imprisoned for long periods, being unable to pay fines, apart from the inmates referred to above;

(ii) whether a fair and systematic methodology will be followed regarding them;

(iii) if so, that procedure; and

(iv) if not, the reasons for it?

(c) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**

(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)

(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2025.09.23 දින වනවිට රැඳවියන් - සිරකරුවන් - 10,509කුත්, සැකකරුවන් 24,256කුත් රඳවා සිටිනවා. ඒ අනුව සමස්තය 34,765ක් වෙනවා.

(ii)
- වසර 20ක් බන්ධනාගාරයේ සිටීම පදනම්ව මුදා හැරීමේ ක්‍රමවේදයක් අනුගමනය නොකරයි.
- අධිකරණ මඟින් මරණ දඬුවම, ජීවිතාන්ත සිර දඬුවම් සහ යම් නිශ්චිත කාලයක් සඳහා සිර දඬුවම් නියම කරනු ලබයි.
- එමඟින් බන්ධනාගාරගත කරනු ලබන රැඳවියන් සහ රක්ෂිත බන්ධනාගාරගත කරනු ලබන සැකකරුවන් බන්ධනාගාරය විසින් රඳවා සිටී.
- මරණ දඬුවම නියම වූ සහ ජීවිතාන්ත සිරකරුවන් හැර නිශ්චිත සිර දඬුවම් විඳිමින් සිටින සිරකරුවන් හට අධිකරණය මඟින් ලබා දුන් දඬුවම් බන්ධනාගාර රීති (302) ප්‍රකාරව දඬුවම් ගණනය කර නිදහස් කිරීමට නියමිත දිනයේදී මුදා හරිනු ලැබේ. ඒ අනුව දණ්ඩනයෙන් යම් අවස්ථාවල තුනෙන් එකක්, යම් අවස්ථාවල හතරෙන් එකක් දක්වා remission තත්ත්වයකට පත් වෙනවා. එය මරණ දඬුවම සහ ජීවිතාන්තය දක්වා සිර දඬුවමට අදාළ වෙන්නේ නැහැ.

(iii) නැත.

(iv) වසර 20ක් බන්ධනාගාරයේ සිටීම පදනම්ව බන්ධනාගාරයේ මුදා හැරීමේ ක්‍රමවේදයක් අනුගමනය නොකරන අතර, අධිකරණය මඟින් ලබා දෙන දඬුවම බන්ධනාගාර ව්‍යවස්ථාපිත රීති (302) ප්‍රකාරව ගණනය කර අදාළ නිදහස් දිනයේදී මුදා හැරීම් සඳහා පමණක් බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත නෛතික බලය ඇත.

(ආ) (i) 2,122යි.

(ii) ඔව්.

දඩ ගෙවා ගැනීමට නොහැකිව රඳවා සිටින සිරකරුවන් පිළිබඳ තොරතුරු

2025 අගෝස්තු මස 31 දිනට

| අනු අංකය | ආයතනය | මාස 03 ට අඩු | මාස 03 ත් 06ත් අතර | මාස 06 ත් 12ත් අතර | මාස 12 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1 | වැලිකඩ | 72 | 50 | 10 | 3 | 135 |
| 2 | මහර | 72 | 25 | 8 | 2 | 107 |
| 3 | බෝගම්බර | 38 | 15 | 12 | 4 | 69 |
| 4 | අනුරාධපුර | 34 | 0 | 0 | 0 | 34 |
| 5 | මැගසින් | 37 | 9 | 2 | 0 | 48 |
| 6 | කොළඹරිමාන්ඩ් | 13 | 2 | 1 | 0 | 16 |
| 7 | අගුණකොලපැලැස්ස | 38 | 83 | 44 | 11 | 176 |
| 8 | ත්‍රිකුණාමලය | 3 | 26 | 6 | 2 | 37 |
| 9 | කළුතර | 49 | 18 | 14 | 12 | 93 |
| 10 | කුරුවිට | 81 | 59 | 22 | 9 | 171 |
| 11 | බදුල්ල | 15 | 7 | 4 | 2 | 28 |
| 12 | ගාල්ල | 34 | 19 | 4 | 0 | 57 |
| 13 | මාතර | 16 | 23 | 2 | 1 | 42 |
| 14 | මීගමුව | 29 | 4 | 1 | 0 | 34 |
| 15 | කෑගල්ල | 6 | 25 | 5 | 0 | 36 |
| 16 | යාපනය | 5 | 7 | 0 | 0 | 12 |
| 17 | බූස්ස | 8 | 6 | 3 | 0 | 17 |
| 18 | මොණරාගල | 17 | 12 | 5 | 0 | 34 |
| 19 | පල්ලෙකැලේ | 0 | 18 | 8 | 3 | 29 |
| 20 | පොළොන්නරුව | 11 | 0 | 0 | 0 | 11 |
| 21 | වීරවිල | 58 | 46 | 4 | 0 | 108 |
| 22 | පල්ලන්සේන | 240 | 31 | 10 | 6 | 287 |
| 23 | තල්දෙන | 10 | 68 | 7 | 7 | 92 |
| 24 | වව්නියාව | 15 | 13 | 4 | 2 | 34 |
| 25 | අඹේපුස්ස | 10 | 34 | 10 | 6 | 60 |
| 26 | මඩකළපුව | 9 | 4 | 0 | 0 | 13 |
| 27 | වාරියපොල | 151 | 45 | 27 | 2 | 225 |
| 28 | වටරැක | 23 | 46 | 19 | 4 | 92 |
| 29 | කදුරුගස්ආර | 9 | 12 | 3 | 1 | 25 |
| එකතුව | | 1103 | 707 | 235 | 77 | 2122 |

(iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන වගන්තිය ප්‍රකාරව ජනාධිපතිතුමාට සිරකරුවන් සඳහා ජනාධිපති සමාව ප්‍රදානය කිරීමට ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව යම් විශේෂිත දිනවලදී සිරකරුවන්ට ජනාධිපති සමාව ලබා දීමේදී දඩ ගෙවා ගත නොහැකිව බන්ධනාගාරගතව සිටින තෝරා ගත් සිරකරුවන්ගේ දඬුවමේ ශේෂය අහෝසි කිරීමට කටයුතු කරනු ලබයි.

(iv) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ලංකාවේ නීතිඥවරියන් විසින් එක්තරා ප්‍රසංගයක් කරලා යම්කිසි මුදලක් උත්පාදනය කර ගත්තා, මේ විධියට අසරණභාවයට පත්වෙච්ච කාන්තා රැඳවියන් නිදහස් කරගැනීම වෙනුවෙන්. නමුත් මෙතෙක් ඒ ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක කරලා නැහැ. ඔබතුමා ඒ පිළිබඳව දන්නවාද? මම හිතන විධියට, ඒ තුළින් ලොකු මුදලක් උත්පාදනය කර ගත්තා. නමුත්, මේ වන තෙක් ඒ කටයුත්ත ක්‍රියාත්මක වෙලා නැහැ. ඔවුන් තවමත් ඒ සිර කඳවුරුවල පරණ පුරුදු විධියටම ඉන්නවා. ලංකාවේ නීතිඥවරියන් සහ නීතිඥවරුන් තමයි මේ ප්‍රසංගය කළේ. ඒ සම්බන්ධයෙන් ඔබතුමා දන්නවාද? ඒ මුදල්වලට මොකද වුණේ කියන එකත් අභ්‍යන්තර ගැටලුවක් විධියට තවමත් තිබෙනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ඒ සම්බන්ධයෙන් මා සතුව මේ මොහොතේ කරුණු නැහැ. කෙසේ වෙතත්, නොයෙකුත් charity organizations විසින් අවස්ථා ගණනාවකදී ඒ ආකාරයට කටයුතු කර තිබෙනවා, ඔවුන්ගේ ඇප මුදල්, දඩ මුදල් ගෙවලා ඔවුන්ව මුදා හැර ගන්න. නමුත්, මේ නිශ්චිත මොහොතේදී යම් කණ්ඩායමක් විසින් ගෙවපු මුදල් අනුව වැඩ කරලා නැද්ද යන කරුණු සොයා බලන්න වෙනවා, ගරු මන්ත්‍රීතුමනි. මා ඉතා ගෞරවයෙන් ඉල්ලනවා, හැකියාවක් තිබෙනවා නම් එම කාර්යයට සම්බන්ධ වුණු නීතිඥවරුන් මාහට සම්බන්ධ කරවලා, මේ ගැන සාකච්ඡා කරමු කියලා. මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ කියලා එතකොට බලන්න පුළුවන්. මොකද, සාමාන්‍යයෙන් දඩ මුදල් ගෙව්වාට පස්සේ, ඒගොල්ලන්ට එළියට එන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ. නමුත් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන විධියට ගැටලුවක් තිබෙන බව පෙනෙනවා. ඒ ගැන තොරතුරු මා ළඟ නැහැ. නමුත්, ඒ ගැටලුව විසඳන්න මට මැදිහත් වෙන්න පුළුවන්. ඒ පුද්ගලයන් සම්බන්ධ කරලා, අවශ්‍ය තොරතුරු මට ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)

ගරු ඇමතිතුමනි, මේ පාර්ලිමේන්තුවේත් ඒ පිළිබඳව දැනුවත් යම් යම් නීතිඥවරුන් සහ නීතිඥවරියන් ඉන්නවා. මම අද දිනයේම ඔබතුමාට ඒ පිළිබඳව යොමු කිරීමක් කරන්නම්.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. සිරකරුවන් සිරමැදිරි තුළ සිටියදී ඔවුන්ට තමන්ගේ ජීවිත පිළිබඳව විශාල අවදානමක් තිබෙන තත්ත්වයක් පසුගිය කාලසීමාව තුළ ඇති වෙලා තිබෙනවා. ඒක දිගටම වුණු සිද්ධියක්. "සිරකරුවෝ ද මනුෂ්‍යයෝය" කියලා වගන්තියක් තිබෙනවා තමයි. හැබැයි, ඒ වගන්තියට අනුව ඇතුළේ හැසිරෙන්නේ නැහැ. සමහර නිලධාරින් තමන්ට කැමැති කැමැති විධියට සිරමැදිරි තුළ කටයුතු කරනවා. ගරු ඇමතිතුමනි, මම දන්නා විධියට, ඔබතුමාටවත් ඒක ඇතුළට ගිහිල්ලා පරීක්ෂණයක් කරන්න අයිතියක් නැහැ. සිරකරුවන්ට ඒක ඇතුළේ නිදහසේ ජීවත් වෙන්න පුළුවන්කමක් නැහැ. ඒක ඇතුළේ සිරකරුවන්ගෙන් වෙනම පිරිසක් හැදිලා තිබෙනවා, ඔවුන් තමයි සිරමැදිරිවල අයිතිකරුවන්. ඔවුන් අලුතින් සිරගත වන සිරකරුවන්ට ඉතා අමානුෂීය විධියට සලකන ලද අවස්ථා ගණනාවක් තිබෙනවා. ජීවිතක්ෂයට පත් වෙච්ච සමහර සිරකරුවන් පිළිබඳ වාර්තා තිබෙනවා. ඒ වාගේම ඔවුන්ට අවශ්‍ය, අවශ්‍ය දේවල් මේ සිරමැදිරි ඇතුළට පිටින් ගෙනියන අවස්ථා බොහෝ විට දැන ගන්න ලැබිලා තිබෙනවා. ඒ විධියට සිරකරුවන් විසින් කරන ව්‍යාපාරත් තිබෙනවා, ඒ වාගේම සිරමැදිරි ආරක්ෂා කරන සමහර නිලධාරින් විසින් කරන අවස්ථාත් අපි දැකලා තිබෙනවා. ඔබතුමා පසුගිය කාලසීමාවේදී ඒවාට අදාළ සමහරුන්ට දඬුවම් කළා. නමුත්, ඒ මාෆියාව තවමත් මේ සිරමැදිරි තුළින් නිදහස් වෙලා නැහැ කියන එක අපට දැන ගන්න ලැබිලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නය කෙටි කරන්න.

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)

ඒ වාගේම තවත් ගැටලුවක් මතු වෙලා තිබෙනවා. මේ සිරමැදිරි දැන් ප්‍රමාණවත් නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒ තත්ත්වයට මොනවා හෝ පියවරක් ගන්න කටයුතු සිද්ධ කරලා තිබෙනවාද කියන එක මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා කියපු කාරණය හරි. ඒ සිර ගෙවල් තුළ ඔය කියන ආකාරයේ යම් නිලධාරි තන්ත්‍රයක් විසින් යම් පුද්ගලයන්ට හිරිහැර කිරීම, ඒ වාගේම ඔවුන්ගෙන් මුදල් ලබා ගැනීම් සහ ඔවුන්ට මානුෂීයව නොසලකන බවට ඔබතුමාගෙන් පමණක් නොවෙයි, දිගින් දිගටම මට කරුණු වාර්තා වෙනවා. ඔබතුමා දන්නවා, පසුගිය කාලය තුළ අපට යම් යම් නිලධාරින් මාරු කරන්න සිද්ධ වුණා; යම් යම් නිලධාරින් ඉවත් කරන්න සිද්ධ වුණා; ඒ වාගේම නිලධාරින් අලුතෙන් ගන්නත් අපි කටයුතු කරගෙන යනවා. මම පිළිගන්නවා, ඔබතුමා කියන ප්‍රශ්නය එතැන තිබෙන බව. ඒ වාගේම ඔබතුමා තේරුම් ගත්තා, මේ ප්‍රශ්නය එක පාරටම විසඳා ගන්න තිබෙන අමාරුවත්. මක්නිසාද යත්, ඇතුළේ සිදු වන දේවල් ගැන හොයා බලන්න අපට එළියෙන් උපාය දූතයෝ යවන්න බැහැ; ගේට්ටුව ඇරගෙන ගිහිල්ලා බලන්න බැහැ. එතැන prisonersලාට ගෝචර නොවන, හිතකර නොවන, හානි විය හැකි එක්තරා විධියක උප සංස්කෘතියක් බිහි වෙලා දශක ගණනාවක් තිස්සේ පැවත එනවා. ඒ සම්බන්ධයෙන් අපි ගන්න පුළුවන් සෑම පියවරක්ම ගන්නවා පමණක් නොවෙයි, මට එවන තොරතුරුත් වර්තමාන කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරනවා. ඉදිරිපත් කරලා, ඒ තත්ත්වයන් සමනය කරන්න අපි කටයුතු කරනවා. ඒක එක්තරා විධියකට දූෂිත රාජ්‍යයේ, දූෂිත වළලු සමඟ කරන නොනවතින අරගළයේ කොටසක්. අපි යම් ප්‍රගතියක් ලබා තිබෙනවා. නමුත් එය තවමත් ප්‍රමාණවත් නැති බව මම පිළිගන්නවා. ඒ සම්බන්ධයෙන් පියවර ගනිමින් ඉන්නවා.

දෙවනුව ඔබතුමා ඉදිරිපත් කළ කාරණාව, සෙනඟ සම්බන්ධයෙන්. ඔව්. ගැටලුවක් තිබෙනවා. රිමාන්ඩ් බන්ධනාගාරගතව විශාල සෙනඟක් ඉන්නවා. ඒ සඳහා අපි හැකි

[ගරු නිතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

ඉක්මනින් ප්‍රවේශයන් ගන්නවා, එක පැත්තකින් ඒ ගොඩනැඟිලිවල තත්ත්වය වැඩි දියුණු කරන්නත්. මොකද, ඒවා ඇත්තටම මනුස්සයෙකුට ඉන්න පුළුවන් තත්ත්වයක නැහැ කියන එකයි මගේ මතය. ගොඩනැඟිලි ඉදිකරලා විතරක් මදි. අපි ක්‍රමවේදයක් හදමින් පවතිනවා, ඉක්මනට රස පරීක්ෂක වාර්තා ගෙන්වා ගෙන මිනිසුන්ට ඇප දෙන්න. ඒ වාගේම අපි යම් පනත් වෙනස් කරන්නත් බලාපොරොත්තු වෙනවා, මහාධිකරණයෙන් ඇප දෙන්න පුළුවන් වන විධියට. ඒ වාගේ නීත්‍යනුකූල ක්‍රම කිහිපයකුත් අපි අනුගමනය කරනවා. මොකද, සිර ගෙවල් ලොකු කරලා විතරක් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ඒ වාගේම ඔවුන්ට ඉක්මනට එළියට එන්න පුළුවන් විධියේ නීත්‍යනුකූල ක්‍රමවේදයකුත් සකස් කරන්න ඕනෑ. කලින් ආණ්ඩුවේ සංශෝධනයක ප්‍රශ්නයක් තිබෙනවා, සමහර සිද්ධි සම්බන්ධව bail ගන්න Court of Appeal එකට යන්න සිද්ධ වෙලා තිබෙනවා. එතකොට කෙළින්ම අවුරුද්දක් විතර යනවා. ඒ වාගේම රස පරීක්ෂක වාර්තා පරක්කු වෙනවා. දැන් අපි රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට 50දෙනෙක් ගත්තා අලුතෙන්. දැන් ඔවුන් වැඩ කරන්න පටන් ගන්න ඕනෑ. එක පැත්තකින් මනුෂ්‍ය අයිතිවාසිකම් ආරක්ෂා වන විධියට අපි පහසුකම් වැඩි කරන්න උත්සාහ කරනවා පමණක් නොවෙයි, ඒ පුද්ගලයන් දීර්ඝ කාලීනව බන්ධනාගාරය ඇතුළේ ඉන්න එක වළක්වන්නත් නීත්‍යනුකූලව අවශ්‍ය පියවර, legislation මඟින් ගන්නවාය කියන එකත් තමයි මට දෙන්න තිබෙන උත්තරය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4, ගරු සුදත් බලගල්ල මහතා.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
ගරු කථානායකතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමක් සඳහා විනාඩියක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාලය කළමනාකරණය කර ගන්න අවශ්‍ය නිසා ගරු සුදත් බලගල්ල මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහන්න.

## මහියංගනය සති පොළ පිහිටි ස්ථානයේ ඉදිකරන ලද වෙළෙඳ සංකීර්ණය: විස්තර
மஹியங்கனை வாராந்த சந்தை வளவுக்குள் நிர்மாணிக்கப்பட்டுள்ள வர்த்தகக் கட்டிடத்தொகுதி: விபரம்
SHOPPING COMPLEX CONSTRUCTED IN THE PREMISES OF MAHIYANGANA WEEKLY FAIR: DETAILS

1271/2025

**4. ගරු සුදත් බලගල්ල මහතා**
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මහියංගනය ප්‍රාදේශීය සභාව විසින් පාලනය කරනු ලැබූ සතිපොළ ඉවත් කර එම ස්ථානයේ වෙළෙඳ සංකීර්ණයක් ඉදිකර ඇති බව දන්නේද;

(ii) එම වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීමට හේතු පාදකවූ කරුණු කවරේද;

(iii) එම වෙළෙඳ සංකීර්ණයේ වෙළෙඳ කුටි බෙදා දෙනු ලැබූ පදනම කවරේද;

(iv) එම වෙළෙඳ කුටි ලබා ගත් එක් එක් පුද්ගලයාගේ නම, ලබා ගෙන ඇති වෙළෙඳ කුටි සංඛ්‍යාව සහ ප්‍රාදේශීය සභාවට ගෙවනු ලබන මාසික කුලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) වෙළෙඳ කුටි ලබා ගත් පුද්ගලයන් සමඟ එළඹ ඇති ගිවිසුම අනුව එම වෙළෙඳ සංකීර්ණයේ පූර්ණ අයිතිය අදාළ ප්‍රාදේශීය සභාවට අයත් වන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மஹியங்கனை பிரதேச சபையால் நிருவகிக்கப்பட்ட வாராந்த சந்தையை அகற்றி, அந்த இடத்தில் வர்த்தகக் கட்டிடத்தொகுதியொன்று நிர்மாணிக்கப்பட்டுள்ளமையை அறிவாரா;

(ii) மேற்படி வர்த்தகக் கட்டிடத் தொகுதியை நிர்மாணிப்பதற்கு ஏதுவாக அமைந்த காரணிகள் யாவை;

(iii) மேற்படி வர்த்தகக் கட்டிடத் தொகுதியின் வர்த்தகக் கூடங்கள் பகிரப்பட்டுள்ள அடிப்படை யாது;

(iv) மேற்படி வர்த்தகக் கூடத்தைப் பெற்றுக்கொண்டுள்ள ஒவ்வொரு நபரினதும் பெயர், பெற்றுக்கொண்டுள்ள வர்த்தகக் கூடங்களின் எண்ணிக்கை மற்றும் பிரதேச சபைக்குச் செலுத்தப்படும் மாதாந்த வாடகை ஆகியன வெவ்வேறாக யாது;

(v) வர்த்தகக் கூடங்களைப் பெற்றுக்கொண்டுள்ள நபர்களுடன் மேற்கொள்ளப்பட்டுள்ள ஒப்பந்தத்தின் பிரகாரம், மேற்படி வர்த்தகத் தொகுதியின் முழு உரிமையும் குறிப்பிட்ட பிரதேச சபைக்கு உரித்தாகும் திகதி யாது;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he state -

(i) whether he is aware that the weekly fair, which had been under the administration of the Mahiyangana Pradeshiya Sabha, had been removed and a shopping complex has been constructed at that location;

(ii) the reasons that led to the construction of that shopping complex;

(iii) the basis on which the stalls in the said shopping complex have been distributed;

(iv) the names of the persons who have obtained stalls, the number of stalls

obtained by each of them, and the monthly rent paid to the Pradeshiya Sabha, separately; and

(v) the date on which the full ownership of the said shopping complex will come to the relevant Pradeshiya Sabha as per the agreement entered into with the persons who obtained the stalls?

(b) If not, why?

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා මම අහන කාරණයට උත්තර දෙන්න කැමැතියි. මට පොඩි වෙලාවක් දෙන්න, ප්‍රශ්නය අහන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමනි, 4වන ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න. *[බාධා කිරීමක්]* කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii)
- 2012.10.22 වන දින මාසික සභා රැස්වීමේදී සතිපොළ භූමිය තුළ පිහිටි කඩ කාමර කඩා ඉවත් කර නව සැලසුමකට අනුව සංවර්ධනය කිරීම සුදුසු බවට මහා සභා සම්මුතියක් ලබා ගැනීම.
- වෙළඳ සංකීර්ණය ඉදිකර මධ්‍ය භූමිය සතිපොළක් ලෙස සංවර්ධනය කර ප්‍රදේශයේ ජනතාවට සතිපොළක අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට සභාව තීරණය කිරීම.
- අම්පාර දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය හා පදියතලාව යන ප්‍රදේශවලත්, මහනුවර දිස්ත්‍රික්කයේ මීණිපේ හා උඩදුම්බර යන ප්‍රදේශවලත්, බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය, රිදීමාලියද්ද, කන්දකැටිය ආදී ප්‍රදේශවලත් මොනරාගල දිස්ත්‍රික්කයේ බිබිල ප්‍රදේශයෙහි ජනතාවටත් තම අවශ්‍යතා සපුරා ගන්නා වෙළෙඳපළ නගරය ලෙස මහියංගනය නගරය ප්‍රචලිත වී තිබීම මත ඇති වන අවශ්‍යතා සපුරා ගැනීමට ප්‍රමාණවත් පහසුකම් සපයා ගැනීමේ අවශ්‍යතාව.
- ඉතා විශාල පාරිභෝගික පිරිසකට ප්‍රතිලාභ සලසන නගරය ලෙස මහියංගනය නගරය ස්ථානගත වීම සහ තම අවශ්‍යතා සපුරා ගත හැකි වෙළෙඳ මධ්‍යස්ථානයක අවශ්‍යතාව පිළිබඳ මහජන හා පාරිභෝගික ඉල්ලීම් ඉදිරිපත් කිරීම.
- වෙළඳ සංකීර්ණය ඉදිකිරීම තුළින් මහියංගනය ප්‍රාදේශීය සභාවට ආදායම් උත්පාදනය කර ගැනීමට හැකියාවක් ලැබීම.
- වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් අවසන් වන තෙක් විකල්ප ස්ථානයක පොළ භූමිය, ස්ථානගත කර ඉදිකිරීම් අවසානයේදී නැවත එම ස්ථානයේම විධිමත් පරිදි පොළ භූමිය ස්ථානගත කිරීමට සැලසුම් කිරීම තුළ සභාවේ අවශ්‍යතා සහ අමතර ආදායම් උත්පාදනයක් සභාවට ලැබීම.

(iii) මෙම වෙළඳ සංකීර්ණය ඉදිකිරීම රාජ්‍ය සහ පෞද්ගලික හවුල්කාරිත්ව - PPP - සංකල්පය යටතේ සිදුකොට ඇති බැවින්, එහි ආයෝජන සිදු කරනු ලැබූ, වෙළඳ සංගමය විසින් ලිඛිතව නම් කර එවන ලද කඩ හිමියන් සමඟ පමණක් මහියංගනය ප්‍රාදේශීය සභාව ගිවිසුම් ගත වී ඇත. වෙළඳ සංකීර්ණයේ වෙළඳ කුටි ලබා දී ඇත්තේ ඒ අනුව වේ.

(iv) ඊට අදාළ සවිස්තර පිළිතුර ඇමුණුම 1 මඟින් ඉදිරිපත් කර ඇත. ඇමුණුම * **සභාගත** කරමි.

නම් ටික විතරක් මම පිළිවෙළට කියන්නම්. ආර්.එම්.එන්.එස්. වනිගරත්න මයා, ආර්.එම්.අයි.එල්. රත්නපාල මයා, එච්.පී. ජයන්ත කුමාර මයා, ඩබ්ලිව්.එම්.එස්.එම්. ජයවර්ධන මයා, හැන්කෝ ඉන්වෙස්මන්ට් පුද්ගලික සමාගම. ගැටලුවක් තිබෙනවා, හැන්කෝ ඉන්වෙස්මන්ට් පුද්ගලික සමාගමට වර්ග අඩි 15,780ක් දීලා තිබෙනවා. හැබැයි, තවම මාසික කඩ කුලිය රුපියල් 5,000යි. වර්ග අඩි 150ක් ලබා දුන් කඩ හිමියන්ටත් මාසික කුලිය රුපියල් 5,000යි. ඒ නිසා මේක වෙනස් කර ගන්න අවශ්‍ය වෙනවා.

ජී.පී.එන්.ජී. විජේසිරි මයා, එම්.එම්.පී.ජී.ඩී. බණ්ඩාර මයා, ඩබ්ලිව්.එච්.අයි.ඩී. ජයතිලක මයා, ඩබ්ලිව්.එම්. සුනිල් මයා, ආර්.කේ.එම්. ඥාණතිලක මයා, ආර්.එම්. ගාමිණී උපතිස්ස මයා, එස්.කේ. කසුන් චතුරික ද සිල්වා මයා, යූ.ජී.එන්. ප්‍රදීප් මයා, ඩබ්ලිව්.සී. ආරියසිංහ මිය, වයි.ඒ.එම්.එස්. කුමාරි මිය, ආර්.එම්.සී. බණ්ඩාර මයා, එම්.කේ.පී. කුමාර මයා, එම්.එච්.එම්. පස්ලීන් මයා, ආර්.එම්. අනුලාවතී මිය, එච්.එම්.යූ. ජයසිංහ මයා, පී.ජී.සී. එදිරිසිංහ මයා, කේ.ඩී.ටී.කේ.එච්.එම්. තුසිත කුමාර මයා, ජේ.එම්. ඉන්දික කුමාර මයා, මිහිමඩල විෂන් ලංකා පුද්ගලික සමාගම, ඩබ්ලිව්.ඒ.ජේ.බී. වික්‍රමආරච්චි මයා, එච්.එම්.ඩී.ඒ. දේදුනු මිය, ඩබ්ලිව්.ඒ.ජී.පී. හරිස්චන්ද්‍ර මයා, එන්.එස්. රවිසංකර් මයා, එම්.එම්.එම්.පී.ජී.සී.කේ. මහන්තේ මිය, ඩී.එම්.සී. අරුණ කුමාර දිසානායක මහතා, බී.එම්.ඩබ්ලිව්.කේ. බස්නායක මයා, එම්.ඩී. නදෙන් ප්‍රසන්න මයා, ඩී.එම්.කේ.ඩී. කැළුම් දිසානායක මයා, එම්. ඕෂධී රශ්මිකා මිය, ඊ.ජී. රොහාන් නිශාන්ත එදිරිසිංහ මයා, මිහිමඩල විෂන් ලංකා පුද්ගලික සමාගම.

දෙවන මහල - ඩබ්ලිව්.එම්. සෙනරත් බණ්ඩාර විජේකෝන් මයා, පී.ජී. උදය කුමාර බණ්ඩාර මයා,

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්නමහතා]

කේ.එම්. කුසුමා කුලසේකර මිය, රුවන්පුර නන්දන ප්‍රියන්ත මයා, ඉන්දික නිරෝෂන් මුදුන්කොත් මයා, පී.එම්.එච්. චන්ද්‍රසේන බණ්ඩාර මයා, ටී.කේ.ජී.ආර්.එම්. ශෂින්ද්‍ර රාමනායක මයා, එම්. අනුර ජයලත් මයා, ඒ.එම්. කුලරත්න බණ්ඩා මයා, එස්.එම්.ඒ.කේ. සමරනායක මයා, මීහිමඩල විෂන් ලංකා පුද්ගලික සමාගම.

බිම් මහල අසල - ආර්.කේ.එම්. ඉසුරු මධුශාන් මයා.

ගරු කථානායකතුමනි, මේ පිළිබඳව ප්‍රචාරයක් ගිහින් තිබුණා අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මේ කඩ කාමර ලබාගෙන තිබෙනවාය කියලා. මම මේ නාම ලේඛනය ඉදිරිපත් කළේ ඒකයි. මේ නාම ලේඛනයේ කිසිම තැනක අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන හෝ ඉන් පිටත පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කඩ කාමර ලබාගෙන තිබෙන බවක් සඳහන්ව නැහැ.

(v) භූමියේ අයිතිය මහියංගනය ප්‍රාදේශීය සභාව සතු වන අතර, කඩ කාමරවල අයිතිය කඩ හිමියන් ප්‍රාදේශීය සභාව සමඟ බදු පදනම මත ගිවිසුම්ගත වූ දින සිට වසර 25ක කාලයක් සම්පූර්ණ වන දිනය හෝ ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කිරීමක් සිදු වුවහොත් එකී දිනය යන දෙකෙන් පළමුවන එළඹෙන දිනයේදී.

(ආ) අදාළ නොවේ.

**ගරු සුදත් බලගල්ල මහතා**
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)

ගරු අමාත්‍යතුමනි, ඉදිරිපත් කළ පිළිතුර මම මුළුමනින්ම ප්‍රතික්ෂේප කරනවා. ඒකට හේතුව මේකයි. මේ ගැටලුව සම්බන්ධයෙන් 2012 සිට මම මැදිහත් වුණා. මම FCID එකටත් ගියා. මම මේ සම්බන්ධයෙන් පළාත් සභාවේ කථා කළා, පළාත් සභාවේ මහජන පෙත්සම් කාරක සභාවේ කථා කළා. ඒ කඩ කාමර සම්බන්ධයෙන් දැන් ඔබතුමා ඉදිරිපත් කළ කාරණාත් මීට කලින් එවපු වාර්තාවේ කාරණාත් පරස්පරයි. ගිවිසුම්ගත වෙලා තිබුණේ කඩ කාමර 87කට. කලින් එවපු වාර්තාවේ අංක 5 යටතේ තිබුණේ, කඩ කාමර ගණන 33ක් කියලා. ඔබතුමා අද ඉදිරිපත් කරන වාර්තාවෙන් කියන්නේ, කඩ කාමර 1යි කියලා. ඒ වෙනුවට කියනවා, වර්ග අඩි 15,780ක් තිබෙනවා කියලා. එතකොට, වර්ග අඩි 15,780කටත් මාසික බදු කුලිය විධියට ගන්නේ රුපියල් 5,000යි. ඇහුවාම කියනවා, එය පසුව තක්සේරු කරනවා කියලා. හැබැයි ප්‍රශ්නය තමයි, ඇප තැන්පතු මුදල විධියට රුපියල් 60,000ක් ගන්නා එක. ගරු අමාත්‍යතුමනි, එතකොට කඩ කාමර 33කට ඇප තැන්පතු මුදල විධියට රුපියල් 1,980,000ක් ගන්න ඕනෑ. රුපියල් 1,980,000ක් ගන්න ඕනෑ තැන වංචනික විධියට කටයුතු කරලා රුපියල් 60,000ක් ගන්නවා.

අනික් එක තමයි, කඩ කාමර 33ක් සහිත තැනක එක් කඩයක මාසික කුලිය විධියට ගන්නේ රුපියල් 5,000යි. වර්ග අඩි 310කට අදාළවත් ගන්නේ රුපියල් 5,000යි. සාමාන්‍යයෙන් ගත්තොත්, රුපියල් 165,000ක් ගන්න ඕනෑ. එම නිසා මම මේ පිළිතුර සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරනවා. ඔබතුමාට වාර්තා දෙකක් එවලා තිබෙනවා. මේකත් හරියට අර රොකට් එක සම්බන්ධයෙන් ගරු අගමැතිතුමියට එවලා තිබුණු උත්තරය වගේම තමයි. අමාත්‍යතුමා නොමඟ යවලා තිබෙනවා. එම නිසා මේ පිළිතුර මම භාර ගන්නේ නැහැ. මේක තමයි මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, ඒ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද කාරණය පිළිබඳව අපි අවධානය යොමු කරනවා. ඇත්තටම මම නොමඟ යැමක් වුණේ නැහැ. මට ලැබී තිබෙන තොරතුරු අනුවයි මම මේ පිළිතුර ඉදිරිපත් කළේ. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, පළාත් පාලන සහ සභා ලේකම්, මහියංගනය යන දෙදෙනා ලබා දුන් තොරතුරු පදනම් කරගෙන තමයි මගේ පිළිතුර ලබා දුන්නේ. ඒ පිළිතුර මඟින් සත්‍යය විකෘති කිරීමක් කරලා තිබෙනවා නම්, ඊට අදාළ ක්‍රියාමාර්ග ගැනීමට අමාත්‍යාංශය හැටියට අපි කටයුතු කරනවා.

**ගරු සුදත් බලගල්ල මහතා**
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා කිව්වා, මේක රාජ්‍ය සහ පෞද්ගලික අංශය මැදිහත් වෙලා කරපු එකක් කියලා. නමුත්, එය ඉදිකිරීමේදී පළාත් සභා ඉංජිනේරුවෙක් හෝ වෙනත් එවැනි කිසියම් කෙනෙක් මුල සිටම හිටියේ නැහැ. එම නිසා මම ඒ කාරණයත් ප්‍රතික්ෂේප කරනවා. ඒ සඳහා රජය පැත්තෙන් මැදිහත් වීමක් වුණේ නැහැ. පසුව තමයි ඒ සඳහා අදාළ මැදිහත් වීම කළේ.

මගේ ප්‍රශ්නය මෙයයි. එම ස්ථානයේ තිබුණේ සති පොළ. එම සති පොළ එතැනින් ඉවත් කිරීම නිසා මේ වන කොට කුලිය විධියට රුපියල් 4,205,000ක් මහියංගනය ප්‍රාදේශීය සභාව ගෙවලා තිබෙනවා. එතැන අටවා ගත් මොකක්දෝ වෙළෙඳ සංගමයක් තිබෙනවා. ඒ මඟින් එම කුලී මුදල අය කර ගැනීම සිදු කරනවාද? එහෙම නැත්නම් ඒ පාඩුව විඳ දරා ගන්නේ කවුද? අදටත් අපට එම සති පොළ ගෙනෙන්න තැනක් නැහැ. එතැන බිල්ඩින් එක හැදුවාට පස්සේ සති පොළ පවත්වන්න ඉඩ කඩ මදි. එම ස්ථානය සම්බන්ධයෙන් දැවැන්ත ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. එම නිසා ඒ මුදල අය කර ගන්නේ කොහොමද? ඒ වාගේම, මුළු ගොඩනැඟිල්ල සම්බන්ධයෙන්ම විධිමත් පරීක්ෂණයක් කරන්න කියලා මම අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා. මොකද, සමහර අය කඩ කාමර 3ක් ගන්න රුපියල් 38,000,000ක් ගෙවලා තිබෙනවා. එතකොට, කඩ කාමර 33ක් අයිති කෙනා රුපියල් කෝටි 42ක් ගෙවලා තිබෙනවා. රුපියල් කෝටි 42ක් ගෙවලා කොහොමද, මහියංගනය නගරයේ කඩ කාමර ගන්නේ? එම නිසා එතැන දැවැන්ත මූල්‍ය වංචාවක් වෙලා තිබෙනවා. ඒ කඩ කාමර ගත්තු අයටත් සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑ. එච්චර මුදලක් වැය කරලා කඩ කාමර ගන්නේ කොහොමද කියන එකත් ප්‍රශ්නයක්. කසුන් සුපර් මාර්කට් එකේත් කඩ කාමර 10ක් එතුමාටම තිබෙනවා. එතකොට, මහියංගනය නගරයේ තිබෙන කඩ කාමර 43ක් හෝමාගම නිහාල් රත්දැල්ල කියන මහත්මයෙකුගේ නමට තිබෙන්නේ. ඒ නමත් වහලායි එවා තිබෙන්නේ. අනෙක් documentsවල ඒ නම තිබෙනවා. නමුත්, මේකේ ඒ නමත් වහලායි තිබෙන්නේ.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, ගරු සුදත් බලගල්ල මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන ලද කරුණු පදනම් කරගෙන ඒ පිළිබඳව විධිමත් විමර්ශනයක් අමාත්‍යාංශය විසින් ආරම්භ කරන බව මා සඳහන් කරන්න කැමැතියි. මෙතැන ගැටලුවක් තිබෙන බව බැලූ බැල්මටම පෙනෙනවා. ඒ නිසා අපි ඒ පිළිබඳව විමර්ශනයක් කරනවා.

## වවුනියාව දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස: කාර්යාල සහ පහසුකම් හිඟය
வவுனியா மாவட்டத்திலுள்ள கிராம உத்தியோகத்தர் பிரிவுகள்: அலுவலகங்கள் மற்றும் வசதிகள் பற்றாக்குறை
GRAMA NILADHARI DIVISIONS IN VAVUNIYA DISTRICT: LACK OF OFFICES AND FACILITIES

1314/2025

**5. ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වවුනියාව දිස්ත්‍රික්කයේ ඇති ග්‍රාම නිලධාරි වසම් 102 අතරින් ස්ථිර ග්‍රාම නිලධාරි කාර්යාලයක් නොමැති ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව සහ තාවකාලික ග්‍රාම නිලධාරි කාර්යාල පවත්වාගෙන යනු ලබන ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වවුනියාව දිස්ත්‍රික්කයේ ඇති ග්‍රාම නිලධාරි කාර්යාල අතරින් මේ වන විට අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින, වැසිකිළි පහසුකම් නොමැති, ජල පහසුකම් නොමැති, විදුලිය පහසුකම් නොමැති සහ මේ වන විට විදුලිය විසන්ධි කර ඇති ග්‍රාම නිලධාරි කාර්යාල සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත ගැටලු හේතුවෙන් අදාළ ග්‍රාම නිලධාරින්ට නිසි පරිදි සිය සේවා සැපයීමට නොහැකි වී ඇති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வவுனியா மாவட்டத்தில் அமைந்துள்ள 102 கிராம உத்தியோகத்தர் பிரிவுகளில், நிரந்தர கிராம உத்தியோகத்தர் அலுவலகமொன்றைக் கொண்டிராத கிராம உத்தியோகத்தர் பிரிவு களின் எண்ணிக்கை மற்றும் தற்காலிக கிராம உத்தியோகத்தர் அலுவலகங்களைக் கொண்டு இயங்கும் கிராம உத்தியோகத்தர் பிரிவுகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) வவுனியா மாவட்டத்தில் காணப்படும் கிராம உத்தியோகத்தர் அலுவலகங்களில் தற்போது புனரமைக்க வேண்டிய நிலையில் காணப் படுகின்ற, மலசலகூட வசதி, நீர் வசதி, மின்சார வசதி காணப்படாத, இன்றளவில் மின்சார இணைப்புத் துண்டிக்கப்பட்டுள்ள கிராம உத்தியோகத்தர் அலுவலகங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) மேற்படி பிரச்சினைகள் காரணமாக குறிப்பிட்ட கிராம உத்தியோகத்தர்களுக்கு உரிய முறையில் தமது சேவைகளை வழங்க முடியாதுள்ளமையை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) out of the 102 Grama Niladhari Divisions in the Vavuniya District, the number of divisions which do not have a permanent Grama Niladhari office and the number of divisions that are functioning with temporary Grama Niladhari offices, separately;

(ii) from among the Grama Niladhari offices in the Vavuniya District, the number of Grama Niladhari Offices which require refurbishment at present, which lack toilet facilities, water facilities, electricity facilities and have had the electricity supply disconnected as of now, separately; and

(iii) whether he admits that these inadequacies have hindered the Grama Niladharis from providing their services effectively?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| ස්ථිර ග්‍රාම නිලධාරි කාර්යාල ගණන | තාවකාලික ග්‍රාම නිලධාරි කාර්යාල ගණන |
|---|---|
| 50 | 52 |

(ii)

| අලුත්වැඩියා කළ යුතු ග්‍රාම නිලධාරි කාර්යාල ගණන | පහසුකම් නොමැති කාර්යාල ගණන | | |
|---|---|---|---|
| | විදුලිය නොමැති | වැසිකිළි පහසුකම් නොමැති | ජලය නොමැති |
| 55 | 48 | 43 | 61 |

(iii) ජලයත්, වැසිකිළි පහසුකමත්, විදුලියත් නොමැතිව නිසි පරිදි සේවා සැපයීමට නොහැකි බව විශේෂයෙන් සඳහන් කළ යුතු නැහැ. නමුත් ගරු කථානායකතුමනි, දීර්ඝ කාලයක් තිස්සේ අඩු තරමින් ග්‍රාම නිලධාරි කාර්යාලයකට අවශ්‍ය කරන ජල පහසුකමවත් සපයා දීමට නොහැකි වුණු වකවානුවක් තමයි අප පසු කර තිබෙන්නේ. ඒ නිසා මෙම දුෂ්කරතාවලට මුහුණ දෙන ග්‍රාම නිලධාරිවරුන්ට අවශ්‍ය පහසුකම් සපයා දීම සඳහා අප කටයුතු කරන බව මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ.

(ආ) අදාළ නොවේ.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

கௌரவ சபாநாயகர் அவர்களே, கடந்த காலத்தில் வசதிகள் செய்து கொடுக்கப்படாத நிலையிலே இங்கே கௌரவ அமைச்சர் அவர்கள் வழங்கிய தரவுகளின்படி, கிட்டத்தட்ட 52 GN பிரிவு அலுவலகங்கள் இப்போதும் தற்காலிகமாகவே காணப்படுகின்றன. அங்குள்ள மக்கள் சில கிராம சேவையாளர் காரியாலயங்களுக்கு மிகவும் நீண்ட தூரத்திலிருந்து - கிட்டத்தட்ட 20 மைல் தூரத்திலிருந்துகூட - வரவேண்டி இருக்கின்றது. இதனால் மக்கள் மிகவும் கஷ்டப்படுகிறார்கள். நான் கேட்கின்ற இந்த மின்சார இணைப்பு வசதி, toilet வசதி, நீர் வசதிகளைச் செய்து கொடுப்பதன்மூலம் அந்த மக்கள் மிகவும் பயனடைவார்கள். அந்த அடிப்படையில், அவற்றை மிக விரைவாகச் செய்து கொடுக்கும்படி கேட்டுக் கொள்கிறேன்.

ஒவ்வோர் அரசாங்கமும் மீள்குடியேற்றத்துக்காக மில்லியன் கணக்கான ரூபாயை ஒதுக்கியிருந்தாலும், இவ்வாறான சேவைகள் செய்யப்படுவதில்லை. நான் நினைக்கிறேன், கடந்த வருடம் உங்களுடைய அமைச்சுக் கூடாகச் சரியாக அடையாளப்படுத்தப்படாமையாலோ என்னவோ தெரியவில்லை, இன்னும் அவை செய்து கொடுக்கப்படவில்லை. எனவே, அந்த மக்கள் உரிய முறையில் சேவைகளைப் பெறுவதற்கான ஏற்பாடுகளை, வருகின்ற Budgetஇனூடாக நிதி ஒதுக்கீடு செய்து விரைவாகச் செய்து கொடுப்பதற்கான திட்டங்கள் ஏதும் இருக்கின்றதா?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයට අනුව අප පසුගිය කාලය පුරාම දැකපු දේවල් තිබුණා. "උතුරු වසන්තය" වාගේ දේවල්වලින් උතුරේ ජනතාවට වසන්තය උදා වී නොමැති බව තමයි මන්ත්‍රීතුමාගේ කථාවෙන් පෙනෙන්නේ. වසන්තය උදා වුණේ කාටද දන්නේ නැහැ. නමුත් වර්තමාන රජය ජනතාවට බලපාන ගැටලු නිරාකරණය කිරීම සඳහා පසුගිය අය වැයෙනුත් යම් ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කළා. 2026 අය වැයෙනුත් ඊට අදාළ ප්‍රතිපාදන වෙන් කරමින් අවශ්‍ය පහසුකම් සලසා දීමට කටයුතු කරනවා.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

கௌரவ சபாநாயகர் அவர்களே, கடந்த தேர்தலில் மக்கள் வாக்களிப்பு வீதப்படி வட மாகாணத்திலுள்ள இரண்டு தேர்தல் மாவட்டங்களிலும் NPP அணிதான் வெற்றி பெற்றதென்பது எல்லோருக்கும் தெரியும். 2025ஆம் ஆண்டுக்கான Budgetஇலும் உங்களுடைய அமைச்சுக்கூடாக இது தொடர்பில் நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது; அது வேறு வேலைகளுக்குப் பயன்படுத்தப்பட்டு இருக்கலாமென நான் நினைக்கின்றேன். சாதாரண மக்கள் அரச சேவைகளில் முதலாவதாகச் சேவை பெறுவது இந்தக் கிராம சேவையாளர் களிடம்தான். ஆகவே, இவ்வாறான வேலைத்திட்டங்களைத் தொடர்ச்சியாக இழுத்தடிக்காமல், விரைவாக வருகின்ற வருடத்துக்குள் முடிக்கும் விதத்தில் அதற்கான நிதி ஒதுக்கீட்டைச் செய்து, அவற்றைச் செய்துதருமாறு வேண்டுகிறேன்.

நன்றி!

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, එතුමා සඳහන් කරපු කාරණය පිළිබඳව අපි මේ වනවිට ක්‍රියාමාර්ග ආරම්භ කරලා තිබෙනවා. කඩිනමින් සියල්ල සම්පූර්ණ කරන්න බැහැ. නමුත් අපි මේ ක්‍රියාවලිය ආරම්භ කරලා තිබෙනවා. ඉතා ඉක්මනින් මේ ගැටලු නිරාකරණය කිරීම සඳහා මැදිහත් වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

ප්‍රශ්න අංක 1 -1180/2025- (1), ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ස්තුතියි, ගරු කථානායකතුමනි.

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය අහන්න කලින් මට ජාතික වැදගත්කමකින් යුත් ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද? මොකද, බලශක්ති ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ ඉන්න නිසා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අද "ඩේලි මිරර්" පත්තරේ චතුරංග ප්‍රදීප් සමරවික්‍රම "Threat of power cuts looms?" යන ශීර්ෂය යටතේ ලිපියක් ලියලා තිබෙනවා. මේක ඇත්තද, නැද්ද? ඊයේ ඒ අය වැඩ නැවැත්වුවා. ඔබතුමා හිතනවා නම් මේ ප්‍රශ්නය වටිනවා කියලා, උත්තරයක් දෙන්න. රටට ඔබින සහ වැදගත් ප්‍රශ්නයක් ලෙසයි මම මෙය සලකන්නේ.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### මත්ද්‍රව්‍ය උවදුර පාලනය කිරීමේ යන්ත්‍රණය ශක්තිමත් කිරීම
### போதைப்பொருள் அச்சுறுத்தலைக் கட்டுப்படுத்துவதற்கான பொறிமுறையை வலுப்படுத்துதல்
### STRENGTHENING OF MECHANISM FOR CONTROLLING DRUG MENACE

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා විසින් අසනු ලබන ප්‍රශ්නය මෙයයි.

මත්ද්‍රව්‍ය සහ මත්පැන් සම්බන්ධ ව්‍යසනය දශක ගණනාවක් තිස්සේ අප සමාජයේ මූලික ව්‍යුහය විනාශ කරමින් තිබෙනවා. පවුල බිඳ වැටීම, තරුණ පරපුර විනාශ වීම, අපරාධ ව්‍යාප්ත වීම සහ ජාතික නිෂ්පාදනය පහළ යෑමට ද එය හේතු වී ඇත.

ශ්‍රී ලංකාවේ පෙර පැවති රජයන් මෙම භයානක තර්ජනය පිළිබඳව අවධානයෙන් සිටිමින් එය මැඩපැවැත්වීම සඳහා ව්‍යාපාර ආරම්භ කර ඇත. වර්තමාන රජය ද මත්ද්‍රව්‍ය මර්දනය ප්‍රමුඛතම කාර්යයක් ලෙස සලකා, ජාතික ආරක්ෂාව නැවත පිහිටුවීම සඳහා ජාල විනාශ කිරීම, ජාවාරම්කරුවන් අත්අඩංගුවට ගැනීම ආදී ක්‍රියාමාර්ගවලට දැඩි කැපවීමක් පෙන්වා ඇත. කෙසේ වෙතත්, අපේ සීමාව තුළ තිබෙන මත්ද්‍රව්‍ය මූලිකව මර්දනය කිරීම වැදගත් වුවද, ඒවා රටට ඇතුළු වන ප්‍රවේශ ස්ථාන ශක්තිමත් කිරීමේ වැදගත්කම පිළිගැනීම අත්‍යවශ්‍ය ය. මුහුද, ගුවන, භූමිය ඔස්සේ මත්ද්‍රව්‍ය මෙහි උත්පාදනය නොවේ. ප්‍රවේශ ස්ථාන, දුර්වල පරීක්ෂණ ස්ථාන, දූෂිත නිලධාරින් සහ නූතන ජාවාරම් මාර්ග ඔස්සේ ඒවා රටට ඇතුළු වේ. එම ද්වාර දුර්වලව පවතින තුරු, රට තුළ ඒවා මර්දනයෙන් ලබා ගන්නා සාර්ථකත්වය නිරන්තර නව සැපයුම් මඟින් විනාශ විය හැක.

මෙම සටනේදී අපේ පොලීසිය, ත්‍රිවිධ හමුදාව සහ බුද්ධි සේවාව ප්‍රථම ආරක්ෂක පේළිය ලෙස ක්‍රියා කරයි. ඔවුන්ගේ අවධානය, වීරත්වය, කැපවීම සහ ජාවාරම්කරුවන් අල්ලා ගැනීම, ජාල විනාශ කිරීම සහ අපේ දරුවන්ගේ අනාගතය ආරක්ෂා කිරීම සඳහා අත්‍යවශ්‍යය. ඔවුන්ගේ මෙහෙයුම් හැකියාව වර්ධනය කිරීම සඳහා වචනවලින් පමණක් නොව, ස්ථාවර සහයෝගයත් ලබා දිය යුතුය. එම නිසා මේවා මර්දනය රට තුළ කෙරෙන අත්අඩංගුවට ගැනීම් සහ සෙවීම්වලට පමණක් සීමා විය නොහැක. එය සම්පූර්ණයෙන් ආරක්ෂණ උපාය මාර්ගයකින් යුතුව ක්‍රියාත්මක විය යුතුයි. විනය, නවීන පරීක්ෂණ, තාක්ෂණය, ප්‍රාදේශීය සහයෝගය සහ බලලත් ආයතනවල දැඩි වගකීම් සහිත ක්‍රියාමාර්ග ඒකාබද්ධ කිරීම මඟින් ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තව පවතින මත්ද්‍රව්‍යවලට එරෙහිව ප්‍රතික්‍රියා කිරීම පමණක් නොව, ඒවා රටට ඇතුළු වීම වැළැක්වීම සඳහා සක්‍රියව ක්‍රියා කළ හැක.

ගරු කථානායකතුමනි, ම විසින් මෙම සභාවට පහත සඳහන් ප්‍රශ්න යොමු කරමි.

1. මේ වසරේ මෙතෙක් රාජ්‍ය ආයතන විසින් අල්ලාගත් මත්ද්‍රව්‍යවල සම්පූර්ණ ප්‍රමාණය (කිලෝග්‍රෑම් සහ ගුලි ගණන) සහ පාරිභෝගික වටිනාකම (රුපියල් සහ ඩොලර්වලින්) කීයද? මාසය අනුව සහ ආයතන අනුව ඊට අදාළ වගුවක් ලබා දෙන්න. (පොලිස් මත්ද්‍රව්‍ය මර්දන කාර්යාලය, නාවික හමුදාව, වෙරළාරක්ෂක බලකාය, රේගුව සහ වෙනත් ආයතන ඇතුළු)
2. වාර්තා වූ සොයා ගැනීම්වල රුපියල් වටිනාකම කීයද? ප්‍රවේශ ස්ථානවලදී (ගුවන් තොටුපළ, මුහුදු සීමා, භූමිය තුළ) අල්ලාගත් මත්ද්‍රව්‍ය ප්‍රමාණය සහ රට තුළ (නගර පරීක්ෂාවේදී, ප්‍රවාහනයේදී අත්අඩංගුවට ගැනීම්) අල්ලාගත් ප්‍රමාණය ආයතන අනුව වෙන්කර දක්වන්න.
3. නීතිමය/විද්‍යාත්මක ක්‍රියාවලිය සඳහා අල්ලාගත් මත්ද්‍රව්‍ය මේ වනවිට ගබඩා කර ඇත්තේ කොතැනද? එක් එක් ගබඩා ස්ථානවලට අදාළව,
   (a) වගකීම් සහිත ආයතනය
   (b) ගබඩා හැකියාව/ආරක්ෂණ ක්‍රම
   (c) වංචාව වැළැක්වීම සඳහා භාරදීමේ ක්‍රම මොනවාද?
4. නිල භාරයේ ඇති මත්ද්‍රව්‍ය නැවත නීතිවිරෝධී වෙළඳපොළට යා හැකිද? (ආරක්ෂණයේදී, මාරු කිරීමේදී, භාරදීමේදී සහ අභිමිවීම්, දූෂණය තුළ) එසේ නම්, පසුගිය මාස 36 තුළ වාර්තා වූ වංචා සිදුවීම් (දිනය සහ ඇතුළත්ව) සහ ගත් ක්‍රියාමාර්ග මොනවාද?
5. අල්ලා ගැනීමෙන් පසුව විද්‍යාත්මක විශ්ලේෂණය (රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව), නඩු පවරා ගැනීම සහ අවසන් විනාශය/විනාශ කිරීම දක්වා වන නීතිමය සහ පරිපාලන කාලය කොපමණද?
6. පවතින ප්‍රතිපත්තිය සහ ක්‍රියාවලිය අනුව, අල්ලාගත් මත්ද්‍රව්‍ය කවදා සහ කෙසේ විනාශ කරනු ලබනවාද? පසුගිය මාස 24 තුළ පැවැත්වූ විනාශ කිරීම් සිදු වූ දිනයන් සහ ප්‍රමාණය දක්වන්න. විනාශ කිරීමේදී මහජන/ස්වාධීන සාක්ෂිකරුවන් පැමිණ සිටියාද?
7. පසුගිය මාස 24 තුළ මත්ද්‍රව්‍ය සෙවීම්වලට දායක තොරතුරු ලබාදුන් පුද්ගලයන්ට පොලීසිය, මහජන ආරක්ෂක අමාත්‍යාංශය හෝ වෙනත් ආයතන විසින් ලබා දුන් මුදල් සහ ත්‍යාග කීයද? මේ වසරේදී ගෙවූ මුළු මුදල කීයද?
8. අල්ලාගත් මත්ද්‍රව්‍ය ප්‍රමාණයේ වටිනාකම කීයද? තවමත් විනාශයට ලක් නොවූ, නඩු සඳහා සාක්ෂි ලෙස තබාගෙන ඇති ප්‍රමාණය කොපමණද? සාක්ෂි ලෙස තබාගෙන ඇති ඒවා විනාශ කිරීමේ කාල සටහන කුමක්ද?
9. පොලීසිය, ත්‍රිවිධ හමුදාව සහ බුද්ධි සේවාවල පැහැදිලි භූමිකාව සැලකිල්ලට ගනිමින්, රජය විසින්,
   (a) ප්‍රවේශ ස්ථාන ශක්තිමත් කිරීම,
   (b) විද්‍යාත්මක විශ්ලේෂණය සහ විනාශ කිරීම වේගවත් කිරීම සහ;
   (c) අල්ලාගත් මත්ද්‍රව්‍ය නැවත වෙළඳපොළට ඒම නැවැත්වීමට කටයුතු කරන්නේ කොහොමද?

ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, මෙය සංකීර්ණ ප්‍රශ්නාවලියක්. මේ මහජන ආරක්ෂක අමාත්‍යාංශය මත පදනම්ව පමණක් අහපු ප්‍රශ්න නොවෙයි. සමහර ඒවා අධිකරණ අමාත්‍යාංශයට සහ ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ ප්‍රශ්න. කෙසේ නමුත් ගරු කථානායකතුමනි, සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා, මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා.

## II

## වාහන අංක තහඩු නිකුත් නොකිරීම නිසා මුහුණ දෙන දුෂ්කරතා
வாகன இலக்கத் தகடுகள் வழங்காமையால் ஏற்படும் சிரமங்கள்
DIFFICULTIES FACED DUE TO NON-ISSUANCE OF VEHICLE NUMBER PLATES

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27(2)இன் கீழ் போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர் கௌரவ பிமல் ரத்நாயக்க அவர்களிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

மோட்டார் வாகனப் போக்குவரத்துத் திணைக்களத்தினால் கடந்த சில மாதங்களாக வாகனப் பதிவு இலக்கத் தகடுகள் வழங்கப்படாமல் இருக்கின்றன. இதனால் பொதுமக்கள் பாரிய இன்னல்களுக்கு முகங்கொடுக்க வேண்டிய சூழ்நிலை ஏற்பட்டுள்ளது. தற்பொழுது நாட்டில் இடம்பெற்று வருகின்ற பல்வேறு விதமான அசம்பாவிதங்களுக்கு, வாகன இலக்கத் தகடுகள் வழங்கப்படாத இந்தச் சூழ்நிலையைச் சிலர் ஒரு சந்தர்ப்பமாகப் பயன்படுத்தி வருகின்றனரோ என்ற சந்தேகம் எழுகின்றது. நாட்டின் பாதுகாப்புக்கு இது பாரிய ஓர் அச்சுறுத்தலாகும். அதேநேரம், தற்காலிகமான இலக்கத் தகடுகளைப் பொருத்திப் பாவிக்கின்றபோது, மழை போன்ற காரணங்களினால் அவை இலகுவாகச் சேதமடைந்து விடுகின்றன. இதனால் பொலிஸாரினால் வாகன உரிமையாளர்கள் நிறுத்தப்பட்டு விசாரிக்கப்படுவதாகவும் அதனூடாகப் பல்வேறு முரண்பாடுகளும் முறைகேடுகளும் இடம்பெறுவதாகவும் தெரிவிக்கப்படுகிறது. அந்த அடிப்படையில், பின்வரும் வினாக்களைக் கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்கின்றேன்:

01. நாட்டின் தேசிய பாதுகாப்புக்கு இந்தச் சூழ்நிலை பாரிய அச்சுறுத்தலாக இருக்கின்றமை தொடர்பாக எடுக்கப்படுகின்ற நடவடிக்கைகள் யாவை?

02. குற்றச் செயல்களில் ஈடுபடுகின்ற ஒழுங்கமைக்கப்பட்ட குற்றக் குழுக்கள், இனந்தெரியாத நபர்கள் அல்லது வேறு குழுக்கள் இவ்வாறான சந்தர்ப்பத்தைப் பயன்படுத்திக்கொள்வதைத் தடுப்பதற்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை?

03. இதுவரை இலக்கத் தகடுகள் வழங்கப்படாத வாகனங்களின் எண்ணிக்கை யாது?

04. இலக்கத் தகடுகளை வழங்குவதற்குத் தனியார் நிறுவனங்களுடன் ஒப்பந்தங்கள் செய்யப் பட்டுள்ளனவா? அவ்வாறெனில், அந்நிறுவனங்கள் யாவை?

05. இந்தச் சூழ்நிலை பற்றி பொலிஸாருக்கும் பொது மக்களுக்கும் தேவையான அறிவுறுத்தல்கள் வழங்கப்பட்டுள்ளனவா?

06. இலக்கத் தகடுகள் மீண்டும் எவ்வளவு காலத்திற்குள் வழங்கப்படும்?

என்பதனை இச்சபைக்கு அறிவிப்பீர்களா?

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ගරු කාදර් මස්තාන් මන්ත්‍රීතුමා අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

Number plates නැති වීම නිසා ජාතික ආරක්ෂාවට විශාල තර්ජනයක් ඇති වී තිබෙනවාද කියන කරුණ පිළිබඳව විමර්ශන කටයුතු කරන ආයතනවලින් තහවුරු කර ගත යුතුයි. ප්‍රභූ පෙළැන්තියට අයිති පුද්ගලයන්ගේ වාහනවලින් ආරක්ෂාව ඇතිව තමයි ගොඩක් දේවල් සිද්ධ වෙලා තිබෙන්නේ කියන එක තමයි අපි නම් මෑත භාගයේ දුටුවේ.

01. වාහන අංක තහඩු සපයා නිකුත් කිරීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කටයුතු සිදු කර අභියාචනා මණ්ඩලයේ තීරණය සඳහා ඉදිරිපත් කර ඇත. ප්‍රසම්පාදනයේ අවසන් අදියරෙහි පවතී.

02. පැය 24 පුරාම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පොලිස් මුරපොළ වෙත වාහන දත්ත පද්ධතිය හරහා තොරතුරු ලබා ගැනීමේ පහසුකම සපයා ඇත. ඒ අනුව දිවයිනේ ඕනෑම පොලිස් ස්ථානයක නිලධාරියෙකුට ඕනෑම අවස්ථාවක වාහනය සම්බන්ධ තොරතුරු මෙම පොලිස් මුර පොළ හරහා ලබා ගැනීමේ හැකියාව ඇත.

දැනට පවතින ගැටලු විසඳීම සඳහා "DMT App" පහසුකම මඟින් වැසි අංකය හරහා අදාළ වාහනය සම්බන්ධ තොරතුරු ඕනෑම අවස්ථාවක ඕනෑම පුද්ගලයෙකුට ලබා ගැනීමේ හැකියාව ඇත.

ශ්‍රී ලංකා පොලීසියේ CCTV අංශය වෙත වාහන දත්ත පද්ධතියට ඇතුළු වී තොරතුරු ලබා ගැනීමේ හැකියාව සලසා ඇත.

ආරක්ෂක අමාත්‍යාංශයේ රාජ්‍ය බුද්ධි අංශයේ අදාළ නිලධාරින්ට වාහන ලියාපදිංචි තොරතුරු ලබා ගැනීමේ පහසුකමක් ලංකාවේ ජංගම දුරකථන පහසුකම් සපයන ආයතනයක් මඟින් සම්බන්ධතාව හරහා ලබා දී ඇත.

03. 2025.09.30 දිනට වාහන අංක තහඩු ලබා දී නොමැති වාහන සංඛ්‍යාව 165,512කි.

04. 2000 වර්ෂයේ සිට 2024.04.30 දින දක්වා වරින් වර සිදු කරන ලද ප්‍රසම්පාදන හා කැබිනට් මණ්ඩල තීරණ මත Access International (Pvt.) Limited ආයතනය සමඟ ගිවිසුම්ගත වී අංක තහඩු මුද්‍රණය කර ඇති අතර, එය 2025.04.30 දිනෙන් අවසන්ව ඇත.

දැනට නව ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී.

ගරු කථානායකතුමනි, 2000 අගෝස්තු මස පළමුවැනි දා තමයි පළමු වතාවට ලංකාවේ English numbers සහිත number

plates issue කළේ. එම ටෙන්ඩරයට ඉදිරිපත් වෙලා තිබුණේත් ඇක්සස් ආයතනයයි. ඉන්පසුව කාලය දිගු කිරීමත් එක්ක 2008දී හා 2019දී නැවත ටෙන්ඩර් කැඳවීම් කර තිබුණා. ඒ සියලුම ඒවාට ඇක්සස් ආයතනය තමයි ඉදිරිපත් වෙලා තිබෙන්නේ. ඔවුන් පමණමයි. වෙන කිසිම ආයතනයකට සුදුසුකම් ලැබී නැහැ. ඒ නිසා වසර 25ක් එකම ආයතනය තමයි මෙම number plates මුද්‍රණය කර තිබෙන්නේ. අපි මේ සඳහා 2025 වසරේදී අලුතෙන් ටෙන්ඩර් කැඳවීමක් කළා. දැනට සමාගම් තුනක් මේ සඳහා තමන්ගේ ටෙන්ඩර් ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව දැනට නීත්‍යානුකූල ක්‍රමයට කරුණු තෝරාගෙන නව ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරෙනවා.

ඇත්තටම දැනට අපි plan කළාට වඩා ප්‍රමාදයට හේතුවක් තිබෙනවා, ගරු කථානායකතුමනි. මේ නව number platesවල මූලික වශයෙන් අලුතෙන් විශේෂ ආරක්ෂිත ලක්ෂණ - features - 7ක් අඩංගු වෙනවා. එතකොට මේවා ලංකාවේ පරීක්ෂා කිරීම සඳහා, මේ ලක්ෂණ 7ම accredit කරලා දෙන්න කියලා මොරටුව සරසවියට භාර දුන්නා. ඔවුන් මේ සඳහා මාස තුනක පමණ කාලයකුත් ගත්තා. ඔවුන්ට accredit කරන්න පුළුවන් කියලා ප්‍රකාශ කළේ එයින් 6ක් විතරයි. ඒ නිසා 7වෙනි එක සිදු කර ගැනීම සම්බන්ධයෙන් නැවත අන්තර්ජාතික accreditation labs එක්ක කථා කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා තමයි මේ ප්‍රමාදය ඇති වෙලා තිබෙන්නේ. එම නිසා ඒ ආරක්ෂිත තත්ත්වය වැඩි කිරීමට දැරූ උත්සාහයේ ප්‍රතිඵලයකුත් මේකට එකතු වෙලා තිබෙනවා. ඒ වාගේම දිගුකාලීනව එකම සමාගමක් යටතේ අවුරුදු 25ක් පමණ මෙය සිදුවීම නිසාත් සමහර සංකීර්ණතා ඇති කරලා තිබෙනවා.

05. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ අංක DMT/Ho/IT/03/04/09 හා 2024.09.27 සහ 2025.05.08 දිනැති ලිපි මඟින් පොලිස්පතිවරයා දැනුවත් කර ඇත. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ අංක DMT/Ho/IT/03/04/09 හා 2025.05.08 දිනැති ලිපිය මඟින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් හා සියලු දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන් දැනුවත් කර ඇත.

06. දැනට වාහන අංක තහඩු සපයා නිකුත් කිරීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදනයක් සිදු කර ලංසු ප්‍රදානය කිරීමට අපේක්ෂා කරන ලංසුකරු වෙත දැනුම්දීම South Asian Technologies (Pvt.) Limited වෙත ලබා දී ඇත. ඊට විරුද්ධව අභියාචනා 2ක් ඉදිරිපත්ව ඇති අතර, 2025.10.07 දින අභියාචනා මණ්ඩලය කැඳවා සාකච්ඡා කරන ලදී. අභියාචනා මණ්ඩලය ලබා දෙනු ලබන තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

ගරු කථානායකතුමනි, මේ නීත්‍යානුකූල පියවරට අපි යා යුතුයි කියලා මම හිතනවා. නමුත් අපට ඉතාම කෙටි කාලයකින් මේ ප්‍රශ්න අවසන් කරගන්න පුළුවන් වෙයි කියා විශ්වාස කරනවා. ඒක තමයි ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුර, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට පැහැදිලි කිරීමක් කරගන්න අවශ්‍යද?

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

கௌரவ சபாநாயகர் அவர்களே, எனது கேள்விகளுக்குப் போதுமான விளக்கம் தந்தமைக்காக கௌரவ அமைச்சர் அவர்களுக்கு நன்றி கூறிக்கொள்கின்றேன். அத்தோடு, கடந்த காலங்களிலே வாகனங்களுக்கு இலக்கத் தகடுகளை வழங்கும் செயற்பாட்டை ஒரே நிறுவனத்திடம் கொடுத்ததால் ஏற்பட்ட பாரிய நிதி வீண் விரயத்தை இல்லாமற் செய்யும் வகையில் இப்பொழுது 3 நிறுவனங்களுக்குக் கொடுக்க எடுத்திருக்கின்ற முயற்சி நல்ல விடயம். கௌரவ அமைச்சர் அவர்களே, இதனைத் தனியார் நிறுவனங்களிடம் கொடுப்பதைவிட, எதிர்காலத்தில் அதனை அரசே செய்ய முடியுமா? என்ற நிலைமை பற்றியும் நீங்கள் சிந்தித்துச் செயற்பட்டால் பிரயோசனமாக இருக்கும். ஏனென்றால், இதற்கு முன்னர் நீங்கள் ஒரு கேள்விக்கு வழங்கிய பதிலின்படி, வாகனப் புகைப் பரிசோதனையின்மூலம் தனியார் நிறுவனங்கள் பல மில்லியன் கணக்கான வருமானங்களைப் பெறுவதாகத் தெரியவந்தது. கிட்டத்தட்ட அதில் 80%ஆன வருமானத்தைத் தனியார் நிறுவனங்கள் பெறுவதால், அந்த நிலைமையை இல்லாமற்செய்து, அதையும் அரசாங்கமே செய்யக்கூடிய ஒரு நிலைமையை ஏற்படுத்தினால் பொருத்தமாக இருக்கும் என்று நான் உங்களிடம் தெரிவித்துக் கொள்கின்றேன்.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අපි හිතනවා, පෞද්ගලික අංශය විසින්ම කළ හැකි, කළ යුතු දේවල් තිබෙනවා කියලා. ඒ නිසා පෞද්ගලික අංශයේ ව්‍යාපාරිකයන් එවැනි දේවල් සැපයීම ගැටලුවක් කියා අපි සලකන්නේ නැහැ. ඒ වාගේම සමහර ඒවා තිබෙනවා, කිසිම විශේෂ තාක්ෂණික එකතු කිරීමක් නැතිව, කිසිම දැනුමක් නැතිව සකස් කරපු ඒවා. ඒ softwareවල අයිතිය, manpower training වාගේ කිසිම දෙයක් නැතිව, අවුරුදු 25කට පසුවත් ඉතාම ප්‍රාථමික මට්ටමේ කටයුතුවලට අධික මිල ගණන් යොදා ගනිමින්, හිටපු දේශපාලන නායකයන්ගේ, ජනාධිපතිවරුන්ගේ, අගමැතිවරුන්ගේ, ඇමතිවරුන්ගේ සෘජු දායකත්වය මත කෙරෙන අතිදැවැන්ත දූෂණයක්, වංචාවක් තිබෙනවා. නිශ්චිතව ගත්තොත්, Department of Motor Traffic කියන්නේ එහි එක් ගොදුරක් පමණයි. ප්‍රතිපත්තියක් වශයෙන් පෞද්ගලික ආයතන මේ දේවල් කිරීම පිළිබඳව අපි එකඟයි. අපි ඒ සඳහා අවස්ථාව ලබා දෙනවා. නමුත් මේ සමහර දේවල් ඉතාම පැහැදිලිව ගණන කථා කරගෙන කරපු ඉතාම බරපතළ අපරාධ.

ඔබතුමා කියන කාරණයට අදාළව නිශ්චිත උදාහරණයක් කියලා මම කරුණු පැහැදිලි කිරීම අවසන් කරන්න කැමැතියි, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා ඇහුවා, මේ දේ රජයට කරන්න පුළුවන්ද කියලා. රජයට කරන්න පුළුවන් දේවල් විධියට ගත්තොත්, ඔබතුමා දන්නවා දැනට driving licence එක සම්බන්ධවත් මේ ප්‍රශ්නයම තිබෙන බව. Driving licences print කරන එකත් මේ ආකාරයටම මට මතක විධියට අවුරුදු 28කට ආසන්න කාලයක් තිස්සේ එකම කණ්ඩායමක් විසින් තමයි කරන්නේ. ඒකෙන් අධික ලෙස මුදල් නාස්තියකුත්, සමාගම් පොහොසත් වීමකුත්, වංචනික කටයුතුත් සිද්ධ වෙලා තිබෙනවා. අවසානයේදී අපි ඒක නතර කර, ඒකටත් අලුත් ක්‍රමවේදයකට ගිහින් තිබෙනවා. ඒකෙන් වන වාසිය මම සරලව කියන්නම්, ගරු කථානායකතුමනි.

දැනට driving licences පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. නමුත්, ඒ ප්‍රශ්නයට කිසිම දෙයක් නොකර, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ඇතුළේ දැනුමක් හෝ හැකියාවක් බවට පත් වෙන්නේ නැතිව තමයි මේ අවුරුදු 28ම මේ කටයුත්ත කරගෙන ගිහින් තිබෙන්නේ. ගෝඨාභය ජනාධිපතිතුමාත් හමුදාව යොදා මේ කටයුත්ත කරන්න උත්සාහ කළා. ඒත් හරි ගියේ නැහැ. ඒ නිසා අපි ඒක නතර කළා. නතර කරලා අපි දැන් driving licence printing machines ගෙනැල්ලා ඊයේ ඉඳලා ඒවා install කරනවා. අප සතුව දැනට driving licence cards ලක්ෂ 8ක් තිබෙනවා.

[ගරු බිමල් රත්නායක මහතා]

ඔක්තෝබර් 18වෙනි දා සිට ඒවා නිකුත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා, ගරු කථානායකතුමනි. මේ වන විට driving licence නිකුත් කිරීමේ ප්‍රමාදයක් තිබෙනවා. අපි ඔක්තෝබර් 18වෙනි දා සිට ඒ ප්‍රශ්නය විසඳනවා. ඒ වාගේම අපි ඒ ලක්ෂ 8 අවසන් වෙන්න කලින් තව ලක්ෂ 10ක් order කරනවා. එතකොට ඒක print කරන්න යන්නේ රජයෙන් - DMT එකෙන් - ගරු මන්ත්‍රීතුමනි. ඒකෙන් එන ලාභයත් මම කියන්නම්. මීට කලින් ඒක කළේ Metropolitan කියලා company එකක්. ඒගොල්ලන් driving licence එකක් print කරලා දෙනකොට අපි ඒකට රුපියල් 534.54ක් වියදම් කරනවා. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ඒක කරන්න වැය වන්නේ රුපියල් 368.16යි. ඒකෙන් රුපියල් 166ක් අපි රජයට ඉතිරි කරනවා. ඒක තමයි අපට ඔබතුමාට කියන්න තිබෙන්නේ. අපි අපට කර ගන්න පුළුවන් දේවල් එහෙම කරනවා. අනික් දේවල්වලට පෞද්ගලික අංශයටත් අවස්ථාව ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය.

## රාජ්‍ය විශ්වවිද්‍යාල උපාධිධාරීන්ගේ බුද්ධි ගලනය: අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය
## அரச பல்கலைக்கழக பட்டதாரிகள் நாட்டைவிட்டு வெளியேறல்: பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று
## BRAIN DRAIN OF GRADUATES OF STATE UNIVERSITIES: STATEMENT BY PRIME MINISTER AND MINISTER OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, thank you for this opportunity. This is in response to the Question raised by the Hon. Ravi Karunanayake under Standing Order No. 27(2) on 22nd August, 2025.

1. Details of public university graduates who have left the country within one year of graduation are not available.
2. There is no restriction imposed on graduates who passed out from State universities with regard to serving in other countries. Therefore, calculation of the expenditure as a percentage of GDP is not required.
3. There are no contractual agreements between graduates and the Government in terms of their departing the country after graduation.
4. Taxes, as you know, are collected by the Government mainly from two sources, as direct taxes and indirect taxes. All taxes are contributed towards maintaining the free education system in the country and it is done with the intention of providing all students an equal opportunity to access quality education irrespective of their socio -economic background. There are no restrictions placed on those graduates about how they may use their knowledge, either in the country or outside the country.
5. The Government has not imposed any regulations or any kind of obligation on students who receive Mahapola Fund or free education about serving the country for a minimum period.
6. No such proposal has been introduced by the Government to recover money spent as expenses on an individual graduate, if they go abroad and find employment.
7. The Government has not taken any policy decision to recover money spent by the Government on free education of the students.

   As the Hon. Member is aware, free education is seen as a right in this country. Simply, it is not a transaction between an individual student and the Government. The benefits of free education and what the student does are enjoyed by the society at large in many ways; it could even be through the remittances that are sent by those students to the country.

   So, the Government's policy is, we invest in education because it is a right of all citizens and the returns of that cannot simply be calculated based on an individual's monetary return *per se.*
8. Not relevant since it has been answered in the previous parts of the Question.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය නම් කෙටියෙන් ඉදිරිපත් කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I thank the Prime Minister for the Answer given to my Question. About 173,000 students get through the A/Ls and only 53,000 students enter State universities. So, on that basis, there is a deprivation of about 120,000

students who get through the A/Ls with the Government not affording them an opportunity. When we consider that, we find that those who have done better have the opportunity to go into State universities and get free education. Thereafter, their leaving our shores for better pastures or for the betterment of their future does not help the country. Therefore, is there any way we could link them so that there would be some contributory service provided by them to the country? I am all for free education, and if all the 173,000 students could get that opportunity, there is no problem at all. But, there is a loss of opportunity for those students who have succeeded at the exam with the Government not providing them that opportunity. Also, it is the taxpayers who are paying for their education. You select those who get higher Z-scores. Later, while they get the opportunity to go overseas, the others get deprived of that opportunity. Anyway, you openly answered and I appreciate that.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

The problem has to be looked at much more broadly. First, free education is a right that we protect. In that education system, we need to inculcate students with a spirit of responsibility and service. That, we need to improve. It is not just by imposing laws or contractual agreements, but the development that takes place within the education system should inculcate students with that spirit of service. We have to acknowledge that in today's global world, that service could happen within the country and outside the country as well. We would like our students to remain in this country and provide that service; that is the kind of spirit we want to promote within education, and that, we are doing.

Also, broadening opportunities in education is also something we are working on. That could include broadening opportunities in the existing State education institutions and also broadening vocational and professional education opportunities so that more and more people could access higher education. So, there are multiple ways in which this problem needs to be addressed or to approach this problem, all of which we are looking into.

The other thing is, by having a stronger economy and a more resilient and a more developed society, we would also be able to retain graduates better. Graduates often leave the country seeking greener pastures, but if they feel confident that our own country could provide those opportunities, they would remain here.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟ අමාත්‍යාංශ නිවේදනය, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය ගරු බිමල් රත්නායක මහතා.

## කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රමාදය: ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## காங்கேசன்துறை துறைமுகத்தைப் புனரமைப்பதில் தாமதம்: போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரினது கூற்று
## DELAY IN RENOVATING KANKESANTHURAI PORT: STATEMENT BY MINISTER OF TRANSPORT, HIGHWAYS, PORTS AND CIVIL AVIATION

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ 2025.07.23වන දින අසන ලද ප්‍රශ්නයට මම පිළිතුරු ලබා දෙනවා. පාර්ලිමේන්තුවේ විවිධ මන්ත්‍රීවරු විවිධ ආකාරයෙන් අසන ලද මේ ප්‍රශ්නයටම මම මීට පෙරත් අවස්ථා කිහිපයකදීම පිළිතුරු ලබා දී තිබෙනවා. නමුත්, මම නැවතත් මෙම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්නම්.

01. ඉන්දියානු රජයේ අනුග්‍රහය සහිතව RITES නම් ඉන්දියානු සමාගමක් විසින් කන්කසන්තුර වරාය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2016 වර්ෂයේදී ඩොලර් මිලියන 45.27ක මූලික ඇස්තමේන්තුවක් පිළියෙළ කර තිබුණි. ඉහත මුදල පදනම් කරගෙන ඉන්දියානු එක්සිම් බැංකු ණය මඟින් මෙම ව්‍යාපෘතිය සඳහා 2020 වර්ෂයේදී තෝරා පත් කර ගන්නා ලද ව්‍යාපෘති කළමනාකරණ උපදේශක විසින් 2021 වර්ෂයේදී පිළියෙළ කරන ලද සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව මඟින් ඇස්තමේන්තුව ඩොලර් මිලියන 61.5ක් දක්වා ඩොලර් මිලියන 16.23කින් වැඩිවීමක් සිදු විය. එම හිඟ ණය මුදල ලබා ගැනීමට ඉන්දියානු රජයේ එකඟතාව නොලැබීම තුළ මෙම ව්‍යාපෘතිය ප්‍රමාද වී ඇත.

නමුත්, පහත දක්වා ඇති සංවර්ධන ව්‍යාපෘතීන් වරාය අධිකාරියේ මූල්‍යමය දායකත්වය මඟින් ක්‍රියාත්මක කර ඇත.

I 2020 වර්ෂයේදී ඇති වූ බුරෙවි සුළි කුණාටුව මඟින් කන්කසන්තුර වරායේ දිය කඩනයට සිදු වූ හානිය පිළිසකර කිරීම.

II 2020 වර්ෂයේදී කන්කසන්තුර වරාය පිවිසුම් ගේට්ටු සංකීර්ණය, වරාය සීමා තාප්පය සහ ආරක්ෂක මායිම් වැට ඉදිකිරීම සිදු කිරීම.

III 2021 හා 2022 වර්ෂයන් තුළදී කන්කසන්තුර වරාය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ සවිස්තරාත්මක සැලසුම් සිදු කර අවසන් කිරීම.

IV 2022 වර්ෂයේදී කන්කසන්තුර වරාය සඳහා නළ ජලය හා විදුලිය ලබා ගැනීම සිදු කිරීම.

V 2023 වර්ෂයේදී මඟී පර්යන්තය සාදා නිම කරන ලදී.

මේ සියල්ල රජයේ මුදල්වලින් ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් කරන ලද දේවල්.

[ගරු බිමල් රත්නායක මහතා]

2024 වර්ෂයේදී ආයෝජන අවස්ථා තුළින් කන්කසන්තුර වරායේ ගබඩා ගොඩනැගිල්ල - warehouse එක - හා බර මැනුම් පාලම - weighbridge එක - ඉදිකරන ලදී.

ගරු කථානායකතුමනි, මීට අමතරව ශ්‍රී ලංකා වරාය අධිකාරිය මඟින් මෙහි breakwater එක නැවත පුනරුත්ථාපනය කරන්නත්, ඒ වාගේම මගී පර්යන්තය සහ ඒ පහසුකම් වැඩි කරන්නත් කටයුතු කරගෙන යනවා. ඒ වාගේම, දැනට තිබෙන rail track එක Kankesanthurai station එකේ ඉඳලා, CPSTL storage එක හරහා වරාය දක්වා කිලෝමීටර 2.3ක් තිබෙනවා. අපි එය ඒ දක්වා දීර්ඝ කරන්නත් කටයුතු කරගෙන යනවා. එම නිසා යම් කාලයකදී කන්කසන්තුර වරායේ සිට rail track එකකුත් රජයේ වියදමින් ඉදිවෙනවා.

02. ඉන්දියානු රජයේ අනුග්‍රහය සහිතව RITES නම් ඉන්දියානු සමාගමක් විසින් කන්කසන්තුර වරාය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2011, 2012 සහ 2016 යන වර්ෂවලදී සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාව - DPR එක - සහ මූලික ඇස්තමේන්තු පිළියෙළ කර තිබුණි. 2016 වසරේ මූලික ඇස්තමේන්තුව පාදක කරගෙන මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු සඳහා ඩොලර් මිලියන 45.27ක ණයක් 2018 වර්ෂයේදී ඉන්දියානු එක්සිම් බැංකුව මඟින් ශ්‍රී ලංකා රජය වෙත ලබා දී තිබුණි. එම ණය කොන්දේසි සහ 2011 වසරේදී එවක රජය විසින් කන්කසන්තුර වරාය පුනරුත්ථාපනය කිරීම සඳහා ඉන්දියානු රජය සමඟ එළඹ තිබූ අවබෝධතා ගිවිසුමට අනුව මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන භාණ්ඩ හා සේවාවලින් සියයට 75ක් ඉන්දියාවෙන් ලබා ගත යුතු බව දක්වා තිබුණි. RITES සමාගම විසින් මෙම කරුණ මූලික ඇස්තමේන්තුවට සලකා බලා තිබුණ ද, ඒ හා සම්බන්ධ වන සේවා සැපයුම් පිරිවැය - logistics cost එක - එකතු කර නොතිබුණි. එම නිසා මෙම ව්‍යාපෘතිය සඳහා 2020 වසරේදී තෝරා පත් කර ගන්නා ලද ව්‍යාපෘති කළමනාකරණ උපදේශක - Project Management Consultant - විසින් 2021 වර්ෂයේදී පිළියෙළ කරන ලද DPR වාර්තාවට අනුව එම ඇස්තමේන්තුව ඩොලර් මිලියන 61.5ක් දක්වා ඩොලර් මිලියන 16.23කින් වැඩිවීමක් සිදු විය. එම අමතර වැඩි වූ මුදල දේශීය බැංකුවලින් ණයක් ලෙස ලබා ගැනීම සඳහා 2022.01.03වන දින රැස් වූ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව දේශීය බැංකුවලින් එම ණය මුදල ලබා ගැනීමට උත්සාහ කළ ද, එවක පැවති මූල්‍ය තත්ත්වය අනුව එය අසාර්ථක වූ අතර, එම මුදල ඉන්දියානු ණය යටතේම ලබා ගැනීමට 2022 වර්ෂයේදීම ඉන්දියානු එක්සිම් බැංකුවෙන් ඉල්ලා සිටින ලදී. කෙසේ වෙතත්, මේ වන තෙක් එම බැංකුව ඒ සඳහා යහපත් ප්‍රතිචාරයක් දක්වා නොමැත.

කන්කසන්තුර වරාය පුනරුත්ථාපනය කිරීමේ වැදගත්කම සලකා 2023 දෙසැම්බර් මාසයේදී එම කටයුතු සඳහා පෞද්ගලික අංශයේද සහභාගිත්වය ලබා ගැනීමට අනුමැතිය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල සන්දේශයක් යොමු කර ඇත. 2024 ජනවාරි මාසයේදී එම සන්දේශයට අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දුන් උපදෙස් ප්‍රකාරව මුදල් අමාත්‍යාංශයේ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සමඟ කරන ලද සන්නිවේදනවල ප්‍රතිඵලයක් ලෙස මෙම සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහාම ඩොලර් මිලියන 61.5ක ප්‍රදානයක් ලබා දීමට සූදානම් බවත්, ඒ සම්බන්ධයෙන් වන අවබෝධතා ගිවිසුමක් සඳහා කෙටුම්පතක් ලබා දෙන බවත් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය මඟින් 2024 මාර්තු මාසයේදී දැනුම් දී තිබුණි. ඒ අනුව අදාළ කෙටුම්පත 2024 වසරේදී ලබා දී තිබුණි.

එම කෙටුම්පත අදාළ රාජ්‍ය ආයතන මඟින් සමාලෝචනය කිරීමේදී ශ්‍රී ලංකාවට අහිතකර විය හැකි වගන්ති කිහිපයක් හඳුනා ගන්නා ලදී. විශේෂයෙන්ම එම වගන්ති අංක 3.1, 6.1 සහ 8.1 වශයෙන් පසුබිම් වාර්තාවේ දක්වා ඇත. පසුබිම් වාර්තාව **සභාගත*** කරමි.

ඒ අනුව, එම වගන්ති සහ අනෙකුත් එවැනි වගන්ති ඉන්දියාව සමඟ සාකච්ඡා කර රටට වඩා සුදුසු ලෙස වෙනස් කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින නිසා මේ කාලය ගත වන අතරම එම කටයුතු අවසන් වූ වහාම ඉන්දියාව සමඟ එම අවබෝධතා ගිවිසුමට එළඹ එම කටයුතු සිදු කිරීමේ හැකියාව තිබේ.

03. පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව - Environmental Impact Assessment Report - ලංකා හයිඩ්‍රොලික් සමාගම - Lanka Hydraulic Institute Limited - මඟින් 2018 අගෝස්තු මාසයේදීම අවසන් කර ඇත.

04. ඉහත 01 හා 02 පිළිතුරුවල සඳහන් පරිදි ඉන්දියාවේද එකඟතාවෙන් අදාළ අවබෝධතා ගිවිසුමේ වෙනස්කම් සිදු කර එම ගිවිසුම අත්සන් කිරීමෙන් පසු ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ ඉදිකිරීම් කටයුතු සඳහා -ගරු කථානායකතුමනි, මේක හඳනවා නම් ඒ කටයුතු අවසන් කරන්න- අවුරුදු 3ක පමණ කාලයක් ගත වේ යැයි ඇස්තමේන්තු කරලා තිබෙනවා, එතැන තිබෙන විශේෂ පාරිසරික තත්ත්වයන්ටත් යටත්ව.

කන්කසන්තුර වරායේ පාරු මෙහෙයුම්වල මගී විස්තර පහත පරිදි වේ.

| කාල සීමාව (අවුරුද්ද සහ මාසය) | ගමන් වාර ගණන | සම්පූර්ණ පැමිණීම | සම්පූර්ණ පිටවීම |
|---|---|---|---|
| 2023 ඔක්තෝබර් 14 සිට ඔක්තෝබර් 20 දක්වා | 4 | 202 | 117 |
| 2023 නොවැම්බර් සිට 2024 ජූලි දක්වා | පැමිණීම හා පිටවීම නොමැත | | |
| 2024 අගෝස්තු 16 සිට අගෝස්තු 29 දක්වා | 7 | 211 | 221 |
| 2024 සැප්තැම්බර් 01 සිට සැප්තැම්බර් 29 දක්වා | 14 | 1158 | 876 |
| 2024 ඔක්තෝබර් 01 සිට ඔක්තෝබර් 29 දක්වා | 13 | 1547 | 1226 |
| 2024 නොවැම්බර් 02 සිට නොවැම්බර් 05 දක්වා | 3 | 377 | 309 |
| 2024 දෙසැම්බර් | පැමිණීම හා පිටවීම නොමැත. මොකද, මුහුදේ තිබෙන රළු ස්වභාවය මත කඩින් කඩ තමයි මෙහෙයුම් කරන්න සිදු වෙන්නේ. | | |
| 2025 ජනවාරි | | | |
| 2025 පෙබරවාරි 22 සිට පෙබරවාරි 24 දක්වා | 3 | 178 | 203 |
| 2025 මාර්තු 03 සිට මාර්තු 31 දක්වා | 24 | 1559 | 1517 |
| 2025 අප්‍රේල් 02 සිට අප්‍රේල් 30 දක්වා | 22 | 1208 | 1150 |
| 2025 මැයි 01 සිට මැයි 23 දක්වා | 19 | 1368 | 943 |
| 2025 ජූනි 01 සිට ජූනි 30 දක්වා | 20 | 1208 | 1226 |
| 2025 ජූලි 01 සිට ජූලි 31 දක්වා | 23 | 1140 | 1356 |
| 2025 අගෝස්තු 01 සිට අගෝස්තු 31 දක්වා | 24 | 1440 | 2028 |
| 2025 සැප්තැම්බර් 01 සිට සැප්තැම්බර් 15 දක්වා | 13 | 925 | 1161 |

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ අමාත්‍යාංශ නිවේදනය, ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න අමාත්‍යතුමා.

## රජයේ භාෂා පරිවර්තක සේවයේ ගැටලු: රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## அரசாங்க மொழிபெயர்ப்பாளர் சேவையிலுள்ள பிரச்சினைகள்: பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரினது கூற்று
## ISSUES IN GOVERNMENT TRANSLATORS' SERVICE: STATEMENT BY MINISTER OF PUBLIC ADMINISTRATION, PROVINCIAL COUNCILS AND LOCAL GOVERNMENT

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)
ගරු කථානායකතුමනි, ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා විසින් 2025.07.11 දින ඉදිරිපත් කරන ලද ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයට මා පිළිතුර ලබා දෙනවා.

1. ඔව්.
2. නැත. දැනටමත් විධිමත් සේවා ව්‍යවස්ථාවක් පවතී. එහෙත් නව සේවා ව්‍යවස්ථාවේ කෙටුම්පත් කර ඇති රජයේ භාෂා පරිවර්තක සේවයට බඳවා ගැනීමේ වැටුප් තලය ඉහළ වීම සහ දැනට සිටින විශේෂ පන්තියේ නිලධාරීන් ඉහළ වැටුප් තලයක පසුවීම යන කරුණු හේතුවෙන් ඇති වී තිබෙන සංකීර්ණ තත්ත්වයට ජාතික වැටුප් ප්‍රතිපත්තියට පටහැනි නොවන පරිදි විසඳුමක් සෙවීමට කටයුතු කරමින් පවතී.
3. ඉහත 2 පිළිතුර අනුව පැන නොනඟී.
4. ඔව්.
5. මේ සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් ඇති බව දනිමි. ඒ අනුව, 2019.05.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2019 අනුව විශේෂ පන්තියට උසස්වීම් ලබා දී ඇත.
6. ඉහත 2 පිළිතුර අනුව පැන නොනඟී.
7. වැටුප් සම්බන්ධයෙන් දැනට උද්ගතව ඇති ගැටලුවට සාධනීය විසඳුමක් සම්බන්ධව නොපමාව අදාළ අංශවල එකඟතාව ලබා ගැනීමෙන් පසු අමාත්‍ය මණ්ඩලය වෙත සංදේශයක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමි.
8. ඉහත 7 පිළිතුර අනුව අවශ්‍යතාවක් නිරීක්ෂණය නොකරමි. එසේ ස්වාධීන කමිටුවක් පත් කළ යුතු වන්නේ අවශ්‍යතාවක් ඇති වුවහොත් පමණි.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ அமைச்சர் அவர்கள் தனது பதிலில், 06/2006 சுற்றறிக்கைக்கு முன்னர், விசேட வகுப்பு மொழிபெயர்ப்பாளர்களுக்கான தொடக்கச் சம்பள அளவுத்திட்டம் TB 5.5.1ஆகவும், வகுப்பு-Iக்குரிய தொடக்கச் சம்பள அளவுத்திட்டம் TB 3.8.2ஆகவும் இருந்ததை ஏற்றுக்கொள்வதாகக் கூறியுள்ளார். அதற்கு அவருக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். 06/2006 சுற்றறிக்கை மூலம் இவர்களுக்கு ஏற்பட்டுள்ள அநீதியை நிவர்த்தி செய்யும் வகையில், விசேட வகுப்பு மொழிபெயர்ப்பாளர்களுக்கு SL வகுதியைச் சேர்ந்த சம்பள அளவுத்திட்டத்தையும், வகுப்பு-Iக்கு MN 7 சம்பள அளவுத்திட்டத்தையும் வழங்கி, நியாயத்தைப் பெற்றுக் கொடுப்பதற்கு நடவடிக்கை எடுப்பீர்களா? எனக் கேட்கின்றேன்.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, මේ පිළිබඳව ඔවුන්ගේ වෘත්තීය සමිති නියෝජිතයන් සමඟ සාකච්ඡාවක් පැවැත්වුවා. ඒ අනුව, යම් ගැටලුවක් පවතින තැනකදී ඒ ගැටලුව නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු. න්‍යාය පත්‍රයේ,-

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 19 (2) යටතේ හදිසි පොදු වැදගත්කමකින් යුක්ත කාරණයක් සාකච්ඡා කිරීම සඳහා කල් තැබීමේ යෝජනාවක් ඔබතුමා වෙත අපේ ගරු මන්ත්‍රීවරු භාර දුන්නා. එම මන්ත්‍රීවරයාට අනුග්‍රහය දැක්වීමක් හැටියට විසිදෙනෙකුට නොඅඩු මන්ත්‍රී සංඛ්‍යාවක් දැන් නැඟී සිට සහය පළ කරන්න බලාපොරොත්තු වනවා.

***[මේ අවස්ථාවේදී විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු විසිදෙනෙකුට වැඩි පිරිසක් සිය අසුන්වලින් නැඟී සිටියහ.]***
*[இச்சந்தர்ப்பத்தில் இருபதுக்கும் மேற்பட்ட எதிர்க்கட்சி உறுப்பினர்கள் தமது ஆசனங்களில் இருந்து எழுந்து நின்றனர்.]*
*[At this stage, more than twenty Hon. Members of the Opposition rose from their seats.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා, යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 19 (2) අනුව මා පහත යෝජනාව ඉදිරිපත් කරනවා.

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

"1991 පාර්ලිමේන්තු පනතක් මඟින් ස්ථාපිත කළ පොලිස් කොමිසම වඩාත් ශක්තිමත් ස්වාධීන කොමිසමක් ලෙස ස්ථාපිත කිරීම දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් සිදු කරන ලදී. විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින්ද එය නැවතත් තහවුරු කරන ලදී. පොලිස් කොමිසම විෂය පථයට අයත් වූ පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ මාරුවීම් විශේෂ ගැසට් නිවේදනයක් මඟින් පොලිස්පතිවරයාට පැවරීමට කටයුතු කරන බවට මාධ්‍ය වාර්තා පළ වී ඇත. පොලිස් කොමිසමේ ස්වාධීනත්වය තහවුරු කිරීමට වහාම පාර්ලිමේන්තුව මැදිහත් විය යුතුය" යි අපි යෝජනා කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මෙම විවාදය කල් තැබීමේ විවාදයක් ලෙස පවත්වා ගෙන යෑම සඳහා ගරු සභාව එකඟ ද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් අපට විවාද කරන්න පුළුවන්. ඕනෑ නම් විවාද නොකර යෝජනාව පරද්දන්නත් පුළුවන්. නමුත්, අපි කැමැතියි මේ සඳහා අවස්ථාව ලබා දෙන්න. ඒ කියන්නේ, මේක විවාද කරන්න පුළුවන්. ඒකට අවස්ථාව ලබා දෙන්නම්. නමුත් මම හිතනවා පක්ෂ නායක රැස්වීමක් කැඳවා හෙට දිනයේදී මෙම විවාදය කරමු කියලා. මොකද, අද හවස විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය මර්දනය කිරීම සම්බන්ධයෙන්, කුඩු හෙරොයින් ඇතුළු එම ව්‍යාපාරය අඩපණ කිරීම පිළිබඳ විශේෂ සාකච්ඡාවකට මහජන ආරක්ෂක ඇමතිතුමා සම්බන්ධ වෙනවා. ඒක නිසා ඒ නිලධාරින් පැමිණෙමින් ඉන්නේ. මම හිතන විධියට, හෙට දවසේදී අපිට මේ ගැන විවාද කරන්න පුළුවන්කමක් තිබෙනවා. ඒ සඳහා අපි ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් පක්ෂ නායක රැස්වීමක් කැඳවමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හෙට දිනයේ මෙම යෝජනාව විවාද කිරීමට එකඟද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේක හදිසි යෝජනාවක් බවට පත් කළේ මේ නිසායි. මොකද, හෙට පොලිස් කොමිසම රැස්වෙනවා. ඉතින් අපි දන්නේ නැහැ මොනවා වෙයිද කියලා. මොකද, ඒ තරම් බලපෑමක් ඒගොල්ලන්ට තිබෙනවා, මේ බලතල පොලිස්පතිට දෙන්න කියලා. මත්ද්‍රව්‍ය වාගේම මේකත් රටේ වැදගත් කාරණයක්. මත්ද්‍රව්‍ය අල්ලන්නෙත් පොලීසිය, වළලන්නෙත් පොලීසිය. මම දන්නේ නැහැ, ඒකත් මේකට සම්බන්ධයි. අපි බලමු. මේ ගැන ඔබතුමන්ලාගේ එකඟතාවත් එක්ක තමයි බලන්න වෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, පරිපූරක මුදල - ශීර්ෂය 117 - වැඩසටහන 02, ඉදිරිපත් කිරීම, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා.

ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

## පරිපූරක මුදල: වැය ශීර්ෂ අංක 117හි ඉතිරි ප්‍රතිපාදන මූල්‍ය කේතය 11 යටතේ දේශීය අරමුදල් වෙත මාරු කිරීම
## குறைநிரப்புத் தொகை: செலவினத் தலைப்பு இல. 117இன் எஞ்சியுள்ள ஒதுக்கீடுகளை நிதியளிப்பு குறியீடு 11இன்கீழ் உள்நாட்டு நிதிக்கு மாற்றுதல்
## SUPPLEMENTARY SUM: TRANSFER OF REMAINING PROVISIONS OF HEAD NO. 117 TO LOCAL FUNDS UNDER FINANCING CODE 11

[පූ.භා. 11.43]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2025 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් තිස්හය බිලියන හයසිය නව මිලියනයක් (රු. 36,609,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| **ශීර්ෂය** | **117** - | ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා | |
| වැඩසටහන | **02** - | සංවර්ධන වැඩසටහන ප්‍රාග්ධන වියදම් | රු. 36,609,000,000 |
| | **මුළු වියදම** | | **රු. 36,609,000,000** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ගරු කථානායකතුමනි, මෙම පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීමේ මූලික අරමුණ පිළිබඳව ඔබතුමා සහ මෙම සභාව දැනුවත් කිරීම අපේ වගකීමක් විධියට තිබෙනවා. ගරු කථානායකතුමනි, මා එය ලිඛිතවම ඉදිරිපත් කරන්නම්. මා හිතනවා එය වඩාත් කාලය ඉතිරි කරන සහ පැහැදිලි කරුණක් කියලා.

ගරු කථානායකතුමනි, අප අමාත්‍යාංශය සඳහා 2025 වර්ෂයට වෙන් කරන ලද සියලු ප්‍රතිපාදන මෙම මුදල් වර්ෂය තුළ උපයෝජනය වන පරිදි වර්ෂයේ ආරම්භයේදී සැලසුම් කරලා තිබෙනවා. නමුත්, ඔබතුමා දන්නවා අප ආණ්ඩුව, ගරු ජනාධිපතිතුමා 2024දී පත් වුණාට, අප අය වැයක් සම්මත කරන්නේ 2025 මාර්තු මාසයේ බව. එම නිසා කලින් වසරවල ආපු වැඩසටහන් රාශියකුත් අපට අපේ වැඩසටහන්වලට එකතු කරන්න වෙලා තිබෙනවා. ඒ අනුව තමයි අපේ අමාත්‍යාංශයේ වැඩකටයුතු සැලසුම් වෙලා තිබෙන්නේ. ඒ අනුව සියල්ලම යොදා ගැනීම සැලසුම් කළ ද ණය ප්‍රතිපාදන කරන ලද ආයතන සමඟ පැවැති ගැටලු නිරාකරණය නොවීම, ලංකාවට ණය දුන්න විදේශීය ණය ආයතනවල ඒවා ලබා නොදීම, කොන්ත්‍රාත් ආයතන සම්බන්ධයෙන් පැවැති ගැටලු අවසන් නොවීම මෙන්ම ඇතැම් ව්‍යාපෘති සම්බන්ධයෙන් අපේක්ෂිත බිල්පත් අගයට වඩා අඩු අගයක් ගෙවීමට සිදුවීම, ඒ කියන්නේ ඇස්තමේන්තුවට වඩා අඩුවෙන් ගෙවන්න සිදු වීම යන කරුණු හේතු කොටගෙන ඇතැම් වැය විෂයයන් යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් කිසියම් ප්‍රමාණයක් ඉතිරි වන බව නිරීක්ෂණය විය. මේ ආකාරයෙන් වැය ශීර්ෂ අංක 117 ප්‍රවාහන, මහාමාර්ග, වරාය සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ මහාමාර්ග අංශයේ විදේශීය මූල්‍යාකරණය රුපියල් මිලියන 33,272.20ක් සහ දේශීය මූල්‍යාකරණය රුපියල් මිලියන 840ක් වශයෙන් සමස්ත රුපියල් මිලියන 34,112ක ප්‍රතිපාදනයක් ඉතිරි වේ යැයි පුරෝකථනය කර ඇත.

එමෙන්ම මෙම අමාත්‍යාංශය යටතේ වැය ශීර්ෂ අංක 306, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දේශීය මූල්‍යාකරණය යටතේ රුපියල් මිලියන 2,496.80ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරි වේයැයි පුරෝකථනය කර ඇත. මෙසේ අපේක්ෂිත වැය ශීර්ෂ අංක 117 විදේශීය හා දේශීය මූල්‍යාකරණ යටතේ ඉතිරිකිරීම් හා වැය ශීර්ෂ අංක 306 යටතේ දේශීය මූල්‍යාකරණය යටතේ ඉතිරිකිරීම්වල මුළු එකතුව රුපියල් මිලියන 36,609ක් වන අතර, එම ප්‍රතිපාදන ඉහත ව්‍යාපෘතිය යටතේ මූල්‍යාකරණ සංකේත 11ට මාරු කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

ගරු කථානායකතුමනි, ඒක තමයි ලිඛිතව තිබෙන යෝජනාව. මම ඒක සාමාන්‍ය ජනතාවට තේරෙන විධියට කියන්නම්. අප අමාත්‍යාංශයට මුදල් ලබා දී තිබෙනවා, මුදල් අමාත්‍යාංශය සහ අය වැය මඟින්. අපට පෙනී යන විධියට ඒවායින් රුපියල් මිලියන 36,000ක පමණ මුදලක් වියදම් කරන්න වෙන්නේ නැහැ. ඒකට ප්‍රධාන හේතුවක් තිබෙනවා. ඒ පිළිබඳ තොරතුරු අපේ ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු නියෝජ්‍ය ඇමතිතුමන්ලා සභාගත කරයි.

ගරු කථානායකතුමනි, 2021, 2022 අවුරුදුවල ඇති වෙච්ච ආර්ථික අර්බුදය නිසා විදේශීය ණය ලබා දෙන ආයතන ලංකාවට ණය ලබා දෙන එක විශාල වශයෙන් නතර කළා. ඒ හේතුවෙන් අතරමඟ නතර කළ ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් තිබෙනවා. උදාහරණ වශයෙන් ගන්න පුළුවන්, නුවර ගැටඹේ flyover එක සහ කොහුවල නගරයේ flyover එක ඉදිකිරීම, ඉන්දියානු ණය ආධාර යටතේ වන දුම්රිය මාර්ගය ඉදිකිරීම. මාස 10ක් විශාල අරගළයක් කරලා, මහන්සියක් දරලා නැවත පටන් ගත්තු, චීන ණය යටතේ ක්‍රියාත්මක මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය, iRoad Project වැනි අතිවිශාල ව්‍යාපෘති ප්‍රමාණයක් තිබෙනවා, මේ ආර්ථික අර්බුදය නිසා නතර කරපු. ඉතාම නරක ප්‍රතිඵල ගෙනාපු ව්‍යාපෘතියක් තමයි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ දෙවැනි පර්යන්තයේ ඉදිකිරීම. වංචා, දූෂණ හේතුවෙන් එම ව්‍යාපෘතිය කල් දැමීම නිසා අපට දැනට පෙනෙන හැටියට රුපියල් බිලියන 55ක් විතර වැඩිපුර ගෙවන්නත් වෙනවා, ප්‍රමාද ගාස්තු වශයෙන්.

ගරු කථානායකතුමනි, ආර්ථික අර්බුදයක් කියන්නේ හුදු වැඩ නතර කිරීමක් පමණක් නොවෙයි; ඉන්ධන හිඟ වීමක් විතරක් නොවෙයි. ඒක curse එකක් වාගේ අපේ රටේ ආර්ථිකයට බරක් වෙමින් එනවා.

ගරු කථානායකතුමනි, විදේශීය ණයක් ගන්න කොට ඒ ගිවිසුම්වලදී අපි එකඟ වෙනවා, දේශීය වශයෙන් අපත් ඒ ණය මුදලට සියයට 10කින් දායක වෙන්නම්, සියයට 15කින් දායකවෙන්නම්, සියයට 30කින් දායක වෙන්නම් යනාදි වශයෙන්. ඒ ආකාරයට අපි දේශීය අරමුදලුත් වෙන් කරනවා, විදේශීය ණය මුදල් ලැබීම කියන එක මත පදනම් වෙලා. අප එසේ දේශීය මුදල් වෙන් කර තිබුණාට සමහර විදේශීය ණය මුදල් ලබා දීම නතර වුණාම ඒ විදේශීය ණය මුදල් නැතිව දේශීය මුදල් යොදා ගන්න අපට බැහැ. එම නිසා සිදු වෙලා තිබෙන දේ තමයි ඒ දේශීය මුදල් විශාල ප්‍රමාණයක් වියදම් කළ නොහැකි වීම; සමහර විට තවත් රුපියල් බිලියන 4කින්, 5කින් අවසන් කළ හැකි ව්‍යාපෘති පවා නතර වීම. අපට කොහුවල සහ ගැටඹ ගුවන් පාලම් ව්‍යාපෘති දෙකම අවසන් කරන්න රුපියල් බිලියන 8කින් පුළුවන්. අපට මහව සිට ඕමන්තේ දක්වා තිබෙන දුම්රිය පාලම් 5යි, ගල්ගමුව ආසනයේ තිබෙන elephant underpass එකයි හදන්න රුපියල් බිලියන 2කින් පුළුවන්. නමුත් ඒවා සඳහා දේශීය මුදල් පාවිච්චියට ගන්න බැහැ, විදේශීය මූලාශ්‍රයෙන් ණය ලැබෙන්නේ නැතිව. ඒ වාගේම, පසුගිය කාලයේ දේශීය වශයෙනුත් සැලසුම් කරපු ව්‍යාපෘති තිබුණා. ඒවා හරියාකාරව සම්පූර්ණයෙන් සැලසුම් කරලා, comprehensive plansවලට යන්නේ නැතිව තදියමට, ඡන්ද බලාගෙන පටන් ගත්තු දේවල්. "මාර්ග කිලෝමීටර 100,000" කියලා එකක් තිබෙන්නේ. ඒක තනිකරම රනිල් වික්‍රමසිංහගේ ඡන්ද project එකක් නේ. කිලෝමීටර 100,000කට තාර දමන එක GDP එක වාගේ මුදලක් අවුරුදු 5ක් විතර දැම්මත් කරන්න බැහැ, ගරු කථානායකතුමනි. ආරම්භ කරපු ඒ වාගේ නාස්තිකාර ව්‍යාපෘති අද කරගන්න බැරි වෙලා තිබෙනවා. සමහර ඒවා කරන්නම බැහැ. සමහර ඒවා සම්බන්ධයෙන් පරිසර වාර්තා ලබාගෙන නැහැ. සමහර ඒවාට අදාළව හරියාකාරව agreements අත්සන් කරලා නැහැ. ඔබතුමාත් ඒ ගැන දන්නවා, ගරු කථානායකතුමනි. වෙලාව තිබුණොත් මම පසුව ඒ ගැන කියන්නම්.

ඒ නිසා අප අද කරලා තිබෙන දේ තමයි, දේශීය අරමුදල්වලින් අපට වියදම් කරන්න වෙන් කරපු, නමුත් පරිපාලන සහ වෙනත් ප්‍රායෝගික හේතු නිසා වියදම් කරන්න බැරි මුදල් ප්‍රයෝජනවත්ව යොදා ගැනීම. සමහර වෙලාවට අපේ ආයතනවල තිබෙන අකාර්යක්ෂමතාවත් මේකට බලපා තිබෙනවා. අපි ඒකත් පිළිගන්න ඕනෑ. Procurementsවල සිදු වන විශාල ප්‍රමාදයන් ද මේකට බලපා තිබෙනවා. ඇත්තටම ඒ ප්‍රශ්න විසඳා ගන්න අවශ්‍ය කරන සමහර පහසුකම් සැලසීම කළ යුතුව තිබුණා, සමහර රීතිවලට අදාළව අවශ්‍ය කරන space එක මුදල් අමාත්‍යාංශයේ සමහර දෙපාර්තමේන්තුවලින් සකස් විය යුතුව තිබුණා. විවිධ ආණ්ඩුවල හිටපු ඇමතිවරුන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අන්ත දූෂිත ලෙස මේ ව්‍යාපෘතිවල සල්ලි පාවිච්චි කරපු නිසා මුදල් අමාත්‍යාංශය ඉතාම දැඩි - rigid - ලෙස තමයි ඒගොල්ලන්ගේ නිරීක්ෂණ සහ නිර්දේශ දෙන්නේ. ඒවාට අනුව කටයුතු කරන්න යද්දී, අදාළ තීන්දු තීරණ අරගෙන වැඩ කරන්න යද්දී -ඒ කියන්නේ වංචා, දූෂණ පැත්තට නොවෙයි- ඒවාටත් සැලකිය යුතු කාලයක් යනවා. මේ සියලු හේතු නිසා අපට දේශීය වශයෙන් මුදල් වෙන් කරපු සමහර ව්‍යාපෘතිවලට අදාළ දේවල් ද කරන්න බැරි වෙලා තිබුණා. ගරු කථානායකතුමනි, ඒ නිසා අප කළ දේ තමයි දේශීය වශයෙන් මුදල් වෙන් කරපු, නමුත් වියදම් කළ නොහැකිව මුදල් ඉතිරි වෙයි කියලා පෙනුණු ව්‍යාපෘතිවලට අදාළ මුදල් ගරු ජනාධිපතිතුමා සහ මුදල් අමාත්‍යාංශය සමඟ මැයි මාසයේදීම කථා කරලා රාජ්‍ය මූල්‍ය නීති අනුව - Financial Regulations 66 අනුව - දේශීය වශයෙන් වෙනත් ප්‍රයෝජනවත් කාර්යයන් සඳහා වෙන් කරපු එක. උදාහරණයක් වශයෙන්, අපි ග්‍රාමීය මාර්ගවලට වෙන් කර තිබුණේ, රුපියල් බිලියන 14යි. අපි

[ගරු බිමල් රත්නායකමහතා]

දැන් එය බිලියන 26ක් දක්වා ගෙන ගිහින් තිබෙනවා. ඒ අර දේශීය වශයෙන් කරන්න වෙන්නේ නැහැ කියලා විශ්වාස කරන ව්‍යාපෘතිවලින් මුදල් අරගෙන දීලායි.

ලංගම ඩිපෝව සහමුලින්ම බිඳ වට්ටලායි තිබෙන්නේ. ඒවා ගාසාවල වාගේ පරිපාලනමය වශයෙන් කුඩු කරලායි තිබෙන්නේ. ඒවායෙන් අමාරුවෙන් 25ක් තෝරාගෙන ඒ 25ට අපි දැන් රුපියල් මිලියන 3,500ක් දෙනවා. ඒ දීලා තිබෙන්නේත්, මේ විධියට ගත්තු මුදල්වලින්, ගරු කථානායකතුමනි. නමුත්, විදේශීය ණය ලබා දෙන ව්‍යාපෘති සඳහා අප දේශීය වශයෙන් දමපු sinking funds, counterpart funds යොදා ගන්න නම් අපි පාර්ලිමේන්තුවෙන් අවසර ගත යුතුයි. ඒ නිසා අද සිදු කරන්නේ අන්න එහෙම ඉතිරි වේ යැයි සලකන රුපියල් මිලියන 36,000ක පමණ මුදලක් ඉතා ප්‍රයෝජනවත් වෙනත් කටයුත්තකට යොදා ගැනීම සඳහා පාර්ලිමේන්තුවෙන් අවසර ඉල්ලා සිටීමයි.

මේ මිලියන 36,000න් මිලියන 33,000කින් අපි බලාපොරොත්තු වෙන්නේ, මාර්ග සංවර්ධන අධිකාරිය ලබාගෙන තිබෙන ණය වෙනුවෙන් ගෙවන්න තිබෙන පොලී ගෙවන්නයි. මේ සම්බන්ධයෙන් දෝෂ සහිත ප්‍රවෘත්තියක් "දිනමිණ" පුවත්පතේ පළ කර තිබෙනවා මම දැක්කා. මාර්ග සංවර්ධන අධිකාරියෙනුත් ඒක නිවැරැදි කරන්න කියා දන්වා යවා තිබෙනවා. ඒ ලේඛන මම **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, මාර්ග සංවර්ධන අධිකාරිය පාරවල් හදන්න දේශීය බැංකුවලින් ණය අරගෙන තිබෙනවා, මෙන්න මේ ආකාරයට. 2013දී රුපියල් බිලියන 161ක්, 2017දී බිලියන 46ක්, 2018දී බිලියන 33ක්, 2019දී බිලියන 38ක්, 2020දී බිලියන 80ක්, 2021දී බිලියන 55ක් වශයෙන් ඔක්කොම රුපියල් බිලියන 414ක් පමණ අරගෙන තිබෙනවා. ගෙවලා තිබෙනවා, යම් ප්‍රමාණයක්. තවත් ගෙවන්න තිබෙනවා, රුපියල් බිලියන 310ක්. ගරු කථානායකතුමනි, මේ අනුව ඔබතුමාට පේනවා ඇති ඒ මොන මොන පාලන කාලවලද එහෙම වෙලා තිබෙන්නේ කියලා. 2025 වසරේදී දේශීය බැංකුවලින් කිසිදු මුදලක් පාරවල් ඉදිකිරීම සඳහා අපි ණය වශයෙන් අරගෙන නැහැ. මම මේ කිව්වේ, පසුගිය කාලවල ණය අරගෙන තිබෙන විධියයි.

ගරු කථානායකතුමනි, ඒ ණය ලබා ගැනීමේදී අතිවිශාල පොලියක් ගෙවන්න තිබෙනවා. ඒ පොලිය ගෙවන්න හදලා තිබෙන්නේත් bullet payments විධියටයි. ඒ කියන්නේ, අපි කොච්චර ගෙව්වත්, ප්‍රධාන ණය ඉතිරි වෙනවා. අපට අවසානයේදී අතිවිශාල මුදලක් එකවර ගෙවන්න වෙනවා. ඇත්තටම ගත්තොත්, මේ ඔක්කොම ඒ කාලවල හිටපු පාලකයන් - මේ රටට හරියටම කළා කියන කට්ටිය - Treasury එක සම්බන්ධ කරගෙන අරගෙන තිබෙන ණයයි. අප කොච්චර ණය ගෙව්වත්, අවසානයේදී අතිවිශාල bullet payments ප්‍රමාණයක් - රුපියල් බිලියන 5ට, 10ට වඩා වැඩි ඒවා, ඊටත් වඩා වැඩි ඒවා - මාර්ග සංවර්ධන අධිකාරියට, ඒ කියන්නේ අවසානයේ ගත්තොත් රජයට සිදු වෙලා තිබෙනවා ගෙවන්න.

මේ loan balance එකට අදාළව උදාහරණයක් දෙකක් ගනිමු. එය මෙහෙමයි තිබෙන්නේ. Bank of Ceylon එකෙන් loans 23යි, බිලියන 105යි. Commercial Bank එකෙන් loans 5යි, බිලියන 4.7යි. DFCC Bank එකෙන් loans තුනයි, රුපියල් බිලියන 4.5යි. HNB එකෙන් loans 14යි, රුපියල් බිලියන 20යි. NDB එකෙන් loans 5යි, රුපියල් බිලියන 6යි. NSB එකෙන් loans 36යි, රුපියල් බිලියන 106යි. People's Bank එකෙන් loans 9යි, රුපියල් බිලියන 53යි. Sampath Bank එකෙන් loan 1යි, රුපියල් බිලියන 9යි. ආණ්ඩුවේ බැංකුවලින් තමයි, 85 per cent විතර ණය අරගෙන තිබෙන්නේ. මෙතැන loans 96ක් තිබෙනවා, රුපියල් බිලියන 310ක් ගෙවන්න. ගරු කථානායකතුමනි, මේ රුපියල් බිලියන 310න්, බිලියන 119ක්ම තිබෙන්නේ bullet payments විධියට ගෙවන්න; එකවරම විශාල ප්‍රමාණයක් ගෙවන්න ඕනෑ.

ඒ වාගේම මේවායේ පොලී අනුපාත ගත්තොත්, BoC එකේ සාමාන්‍යයෙන් AWPLR+2.% to 2.5% වෙනවා. Commercial Bank එකේ එකත් තිබෙනවා. මේ ගැන දන්නා අය දන්නවා. ඒ ඔක්කොම තේරුම් කරන්න බැරි නිසා මේ කෙටියෙන් කියන්නේ. Average Weighted Prime Lending Rate එකට තව යම් මුදලක් එකතු කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, you have two more minutes.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම තව විනාඩි පහක් විතර ගන්නම්.

මේවාට වග කිව යුතු පුද්ගලයන් මුදල් රාජ්‍ය ඇමතිවරු වශයෙන් සිටියදී, ආණ්ඩුවල නායකයෝ වශයෙන් සිටියදී මේ අපරාධ, වැරැදි දේවල් කරලා, දැන් ඒවා "X" ගිණුමේ දමනවා. මම මේ රටට ඇත්ත කියන්නේ. අපට වෙන ප්‍රශ්නයක් නැහැ. අපි මේ ආණ්ඩුව අරගෙන තවම මාස දහයයි.

ගරු කථානායකතුමනි, බැංකුවක් interest rate එකක් calculate කරද්දී, ඒක ඇතුළෙත් බැංකුවේ ලාභයක් තිබෙනවා. මේවා දේශීය බැංකු. Commercial Bank එක නම් එකතු කරනවා, 0.4.% සිට 2.82% දක්වා. DFCC Bank එක නම්, 0.4% සිට 2.73% දක්වා. HNB එක එකතු කරනවා 1.89% to 2.82% දක්වා. Average Weighted PLR+ ගැන මම මේ කියන්නේ. NSB එක 2 % to 2.87% දක්වා. People's Bank එක එකතු කරනවා 2.% to 2.82% දක්වා. Sampath Bank එක 2.2%, NDB එක එකතු කරනවා 2.81% to 2.82%. ඇත්තටම අපි මේ ගැන මාර්ග සංවර්ධන අධිකාරියේ Finance Division එකටත් කථා කළා. මේ rates ගත්තාම සාමාන්‍යයෙන් සියයට 9 ඉඳලා තිබෙන්නේ. Average Weighted PLR කියන එක සියයට 9, 9.4, 9.49 ඉඳලා 11.94 දක්වාත් තිබෙනවා. ඒකට තමයි අර සියයට 2.5 ඒවා එකතු වෙන්නේ. එහෙම තමයි මේ ණය අරගෙන තිබෙන්නේ. ඒ නිසා අපි මේ ගැන කථා කරලා යෝජනා කළා, මේ මුදල් යොදා ගෙන මේ ණය ගෙවා දැමීම වැදගත් කියලා. ඒ නිසා අද සිදු වෙන්නේ, පාර්ලිමේන්තුවේ සහාය අපි ඉල්ලන්නේ, අපි වෙන් කරලා තිබෙන මුදල් ඒ නිශ්චිතව වෙන් කරපු දේට යොදා ගන්න බැරි නිසා, ඒ හා සමානවම ප්‍රයෝජනවත් දෙයකට වෙන් කිරීමටයි. අපි එකවරම මුදල් ගෙවන නිසා ඒ බැංකු සියල්ල එකඟ වෙලා තිබෙනවා, අපෙන් අමතර ගාස්තු අය නොකර සිටින්න. ගරු කථානායකතුමනි, ඒක තමයි මෙහි මූලික කථාව.

ඒ වාගේම මම දැක්කා, මධ්‍යම අධිවේගී මාර්ගය පිළිබඳවත් කථාවක් කියනවා. ගරු කථානායකතුමනි, මධ්‍යම අධිවේගී මාර්ගයේ ණය පිළිබඳ අපි පැහැදිලි කිරීමක් කළා. අපි Ministerial

---

*** *පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

Statement එකක් කළා. එහිදී අපි පෙන්වා දුන්නා, මධ්‍යම අධිවේගී මාර්ගය 2015දී පටන් ගත්තාට, එහි loan agreement එක අත්සන් කළේ 2019දී කියන එක. ඒක ඇමෙරිකානු ඩොලර් මිලියන 900 ගණනක loan එකක්. 2015දී ඒ loan එකෙන් සියයට 60ක් රුපියල්වලිනුත්, සියයට 40ක් ඩොලර්වලිනුත් ගෙවන්න තමයි එකඟ වෙන්නේ. 2015දී මේ එකඟතාවට ආවාට, 2019දී තමයි ගිවිසුම අත්සන් කරන්නේ. 2019දී ගිවිසුම අත්සන් කරනකොට, 2015දී තිබුණු dollar rate එකට තමයි ඒ පාලකයෝ ගිවිසුම අත්සන් කරලා තිබෙන්නේ. ඒ කාලයේ, 2015දී dollar rate එක රුපියල් 135යි.

2019දී අත්සන් කරන්නේත් ඒ විධියට. ගරු කථානායකතුමනි, අපි 2025දී මේ ණය ගෙවන්න පටන් ගන්නකොට අපට රුපියල අවප්‍රමාණ වීමේ වාසියවත් ගන්න බැහැ. නමුත් මහා ආර්ථික ඔස්තාර්ලා විධියට පෙනී ඉන්නේ. එහෙම කරලා ඇවිල්ලා දැන් කියනවා, අපි වැඩි පොලියට ගත්තා කියලා. නැහැ.

ගරු කථානායකතුමනි, ඒ නිසා ඔබතුමාගේ අවසරය ඇතුව, මධ්‍යම අධිවේගී මාර්ගයේ කථාව මම කෙටියෙන් කියන්නම්, වෙලාව කොච්චර ගියා වුණත්. ඔබතුමන්ලා දන්නවා, ඒක චීන එක්සිම් බැංකුවෙන් ලංකාවට දීපු ණයක්. හැබැයි, ඔවුන් 2022දී ඒ project එක suspend කළා ලංකාවේ ආර්ථික අර්බුදය නිසා. ඊට පස්සේ අපේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ අපි චීන ආණ්ඩුවත් සමඟ කරපු සාකච්ඡා නිමක් නැහැ. ජනාධිපතිතුමා දිවුරුම් දීලා, චීන තානාපතිතුමා ආපු පළමුවැනි මොහොතේ ඉඳලා අපි සාකච්ඡා පටන් ගත්තා. මමත් ඒවාට හිටියා. ජනාධිපතිතුමාගේ මට්ටමින්, මගේ මට්ටමින්, විශේෂයෙන්ම Hon. (Dr.) Harshana Suriyapperuma, Hon. (Dr.) Anil Jayantha, මහින්ද සිරිවර්ධන මැතිතුමා ඇතුළු අපි පුදුමාකාර මහන්සියක් ගත්තා. එහෙම කරලා තමයි අපි නැවත ඒ loan එක activate කර ගන්න කථා කළේ. එතකොට ඔවුන් ප්‍රකාශ කළ දේ තමයි, ඔවුන් තවදුරටත් ඩොලර් ණය දෙන්නේ නැහැ කියන එක. එහෙම නම් අපට තිබිච්ච එකම විධිය තමයි ඒ ඩොලර් loan එක යුවාන් loan එකකට මාරු කරන එක. යුවාන් loan එකට මාරු කරනකොට ඒගොල්ලන්ට තිබෙනවා PLR එකක්. ඒගොල්ලන්ගේ ප්‍රතිපත්තියක් තිබෙනවා. අනිල් ජයන්ත ඇමතිතුමා ඒක තවත් පැහැදිලි කරයි. ඒවායේ තිබෙන්නේ floating rates විතරයි, fixed rates නැහැ. අපට චීන ආණ්ඩුවට බලපෑම් කරන්න, call කරන්න හයියක් නැහැ, ට්‍රම්ප්ට call කරනවා වාගේ. ඒ නිසා විධිමත් විධියට, diplomatic විධියට කථා කරලා අපි එකඟ කර ගත්තා, AWPLR - 0.8%වලට. ඒ කියන්නේ, චීන එක්සිම් බැංකුවේ interest rate එකක් තිබෙනවා. අපි සාකච්ඡා කරලා ඒක අඩු කර ගත්තා ගරු කථානායකතුමනි, AWPLR - 0.8%වලට. නමුත් මම දැක්කා, tweet කරලා තිබුණේ 3.5% කියලා. ඒක වැරදියි. Interest rate එක තිබෙන්නේ 2.5ත්, 3.5ත් අතර. අවම floating rate එක 2.5. මොකද, US Dollarsවලින් යුවාන්වලට මාරු වුණාම වෙන දේ අපට තේරෙනවා. US Dollar එකක් රුපියල් 300ක් විතර වෙනකොට, යුවාන් එකක් රුපියල් හතළිස් ගණනක් මම හිතන හැටියට. එතකොට interest rates වෙනස්. ඉතින් ඒ නිසා- *[බාධා කිරීමක්]* Currency rate එක අනුවම නොවෙයි, interest rates. නමුත් ඒක ඒගොල්ලන් තියපු ගණන. එතැනදී අපි ගත්ත ජයග්‍රහණය මොකක්ද අවම කොන්දේසි යටතේ? එකක්, මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියට ඩොලර් මිලියන 500කට equivalent යුවාන්වලින් ණයක් අරගෙන තිබෙනවා. ඒ වාගේම, ඒ ණය පොලී ප්‍රතිශතය වෙන්නේ 2.5ත්, 3.5ත් අතර. අවමය 2.5ත්, 3.5ත් අතර වෙන්නේ, කොච්චර වැඩි වුණත්. චීනයේ AWPLR කොච්චර ඉහළට ගියත්, ඊට 0.8කුත් අඩු කරලා තිබෙනවා. ඒ නිසා අනිවාර්යයෙන්ම 3.5ට වඩා ගන්න බැහැ. ඒවා තමයි අපි කර ගත්ත වැඩ. එහෙම තමයි මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය පටන් අරගෙන තිබෙන්නේ. මම හිතනවා ඒ පිළිබඳව තවත් පැහැදිලි කිරීම් ගරු මන්ත්‍රීතුමන්ලා කරයි කියලා.

ඒ වාගේම සැප්තැම්බර් 30වැනි දාට අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතිය ගත්තොත් ගරු කථානායකතුමනි, දේශීය මූලාශ්‍රවලින් අපි දැනට සියයට 56.76කට ගිහිල්ලා තිබෙනවා. මධ්‍යම අධිවේගී මාර්ගයේ වැඩ පටන් ගැනීමත් එක්ක අපි හිතනවා, අපට සියයට 90ට එහාට යන්න පුළුවන් වෙයි කියලා. Foreign loansවල තමයි delay එක තිබෙන්නේ. සියයට 21.75යි දැනට තිබෙන්නේ. අපි හිතන හැටියට මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියත් එක්ක ඒකත් තරමක් වෙනස් වෙයි. දැනට සියයට 50ක මූල්‍ය ප්‍රගතියක් තමයි අපට තිබෙන්නේ, ගරු කථානායකතුමනි. මම ඒ කරුණුත් ඉදිරිපත් කරන්න හිතුවා. විදේශීය ණය පැත්තෙන් තමයි ලොකු ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙන්නේ.

අවසාන වශයෙන් මම ඉතාම ඉක්මනින් කරුණු ටිකක් කියන්න කැමැතියි. අද මේ විවාදයේදී ප්‍රවාහන අමාත්‍යාංශය පිළිබඳවත් සාකච්ඡා වුණත්, ජනතාව AWPLR ගැන උනන්දු නොවන බවට මට හොඳටම විශ්වාසයක් තිබෙනවා. ඒ වාගේම ඔවුන් මේ ආණ්ඩුව විශ්වාස කරනවා, හොරකම් කරන්නේ නැති ආණ්ඩුවක් විධියට. ඒ නිසා මම හිතුවා, ජනතාවට වැදගත් වන කාරණා දෙක තුනකුත් කියන්න. මම ඉතාම ඉක්මනින් ඒ ටික කියන්නම්, ගරු කථානායකතුමනි.

එකක්, මම driving licences ගැන පැහැදිලි කිරීමක් කළා. අපි හොඳ දෙයක් පටන් ගත්තාම ඒක අනුගමනය කරන අය දැක්කාමත් සතුටු හිතෙනවා. මම පසුගිය මාර්තු 7වැනි දා මෙතැනදී කිව්වා, අපි කාන්තා රියදුරන් සහ කොන්දොස්තරවරුන් බඳවා ගන්නවා කියලා. අපි දැන් ඒ interviews කරගෙන යනවා. නොවැම්බර් අන්තිම වෙනකොට අපි බඳවා ගෙන අවසන් කරනවා, කාන්තා රියදුරන් සහ කොන්දොස්තරලා යම් ප්‍රමාණයක්, interviewsවලට ආපු ප්‍රමාණයෙන් සුදුසුකම් ලබන අය. ගරු කථානායකතුමනි, මම දුටුවා ලංකාවේ ප්‍රධාන පෞද්ගලික ප්‍රවාහන සමාගමකුත් advertise කරලා තිබුණා, ඒගොල්ලනුත් female conductorsලා සහ driversලා recruit කරන්න යනවා කියලා. ඇත්තටම පෞද්ගලික අංශය එහෙම දෙයක් කරන එක ගැන මම සුබ පතනවා. *[බාධා කිරීමක්]* ඒවා bud කරපු බස් නොවෙයි.

ගරු කථානායකතුමනි, අපි අද දිනයේ Lanka Metro Transit (Pvt.) Limited එකේ office එකක් open කරනවා. ජනාධිපතිවරයා මුදල් ඇමතිවරයා වශයෙන් රුපියල් මිලියන 3,000ක් දුන්නා, metropolitan area එකේ යන්න පුළුවන්, මහ ජනතාවට පහසුවෙන් ගමන් කරන්න පුළුවන්, low-floor bus service එකක් සකස් කරන්න. මගීන්ට සුදුසු බස් ලංකාවේ නැහැ, අඩුයි. අපේ කණ්ඩායමක් ඒ වෙනුවෙන් ගොඩක් මහන්සි වෙලා වැඩ කළා. මුදල් අමාත්‍යාංශයත් අපට උදවු කළා. අපි මීට දින කිහිපයකට කලින් Lanka Metro Transit (Pvt.) Limited එක register කළා. අද අපි ඒ company එකේ office එක open කරනවා, දවල් 1.00ට. හැබැයි, බස් එන්න කල් යනවා. ඒක මතක තබා ගන්න ඕනෑ. සමාගමක් පටන් ගන්න එකයි, බස් ගෙන්වන එකයි ලොකු කාර්යයක්. ඒ නිසා අපි පෞද්ගලික අංශයටත් ආරාධනා කරනවා, එවැනි දේවල්වලට යොමු වෙන්න කියලා.

ගරු කථානායකතුමනි, බස් ටිකට් එකෙන් මාටියා ගහනවා කියන එක හරි ප්‍රසිද්ධ කාරණයක්. ලංකාවේ බස් කර්මාන්තය කරන්න බැරි ප්‍රධාන හේතුවක්, ඒක. ව්‍යාපාරිකයාට කිසිම ආදායමක් ගන්න බැහැ. ඒ නිසා පෞද්ගලික බස් රථ හිමියන්ගේ සංගම්වලින් ලොකු ඉල්ලීමක් තිබුණා, card payment system එකක් හදන්න කියලා. ගොඩක් අය ඒක කරන්නේ නැතිව වටේ ගිහිල්ලා තිබුණා, "transport සඳහා වෙනම card payment system එකක් හදන එක කරදරකාර වැඩක්, ඒක පරණ වැඩක්" කියලා. ඩිජිටල් අමාත්‍යාංශය අපට සහතිකයක් දීලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, නොවැම්බර් 30වැනි දා වනකොට,

[ගරු බිමල් රත්නායක මහතා]

දැනට සාමාන්‍ය මට්ටමේ බස් ටිකට් මැෂින් තිබෙන බස් එකක යන ඕනෑම මගියෙකුට තමන් භාවිත කරන ලංකාවේ බැංකු කාඩ් එකක් පාවිච්චි කරලා ටිකට් එක ගන්න පුළුවන් ක්‍රමයක් ඇති කරන්න. හැම කෙනාටම බැංකු කාඩ් තිබෙනවාද කියලා අහයි. ඒකේ ප්‍රශ්නයක් නැහැ. එහෙම නැති අයට මුදල් ගෙවලා ටිකට් පත ලබා ගන්න පුළුවන්. ටික දවසක් යනකොට ඒගොල්ලන් පුරුදු වෙයි. මට මතකයි, eChannelling ක්‍රමය පටන් ගත් මුල් කාලයේ මිනිස්සු ඒවාට එක එක ඒවා කිව්වා. මම හිතන විධියට, දැන් කවුරුවත් නවලෝකෙට, ආසිරි එකට ගිහිල්ලා උදේ 7.00 ඉඳලා පෝලිමේ ඉඳලා චැනල් කරන්නේ නැහැ. ඕනෑම දෙයක් රටකට apply කළාම පොඩි කාලයක් යනවා, ඒකට පුරුදු වෙන්න. අපි බස්වලට card payment system එකක් හඳුන්වා දෙනවා.

ඒ වාගේම ගරු අගමැතිතුමිය මාර්ග ආරක්ෂාව පිළිබඳ, පාසල් වෑන් පිළිබඳ එතුමියලාගේ යෝජනා අපට දීලා තිබෙනවා. ඒ වාගේම අපි office vans සහ ඒවා regulate කරන්න guidelines, National Transport Commission එකෙන් හදාගෙන යනවා.

ගරු කථානායකතුමනි, බැස්ටියන් මාවත සහ මාකුඹුර දුර ගමන් බස් රථ සේවාව කරන අයට තමන්ගේ බස් රථයේ basic requirements තිබෙනවාද - ටයර් එකේ හුළං තිබෙනවාද, බ්‍රේක් තිබෙනවාද වාගේ දේවල් - කියලා බලන්න පුළුවන් ස්ථාන දෙකක් අපි පටන් ගන්නවා. මාකුඹුරේ අපි ඒක දිගටම කරගෙන යනවා. එතකොට බස් හිමියන්ට පුළුවන් තමන්ගේ බස් රථය ධාවනයට යොදවන්න කලින් පොඩි මුදලක් ගෙවලා පරීක්ෂා කර බලන්න. එවැනි ආකාරයේ දේවල් අපි කරනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. ලංකාවේ පොදු මගී ප්‍රවාහනය තවම ඉතාම නරක තත්ත්වයේ තිබෙන්නේ. අපට හොඳ bus service එකක් නැහැ. හොඳ දුම්රිය සේවාවක් නැහැ. හොඳ taxi service එකකුත් නැහැ. මිනිස්සු පුදුමාකාර දුකක් විඳිනවා. අපට කියන්න තිබෙන්නේ මේක විසඳන්න හැම කෙනාගේම උදවු ලබා දෙන්න කියලායි. ඒක තමයි මට කියන්න තිබෙන්නේ. ඒ අනුව මේ පරිපූරක ඇස්තමේන්තුව සම්මත කර දෙන ලෙස මේ සභාවෙන් මා ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, there is a small issue with regard to Public Business. Tomorrow, there is already an Adjournment Debate in place. Sir, can we have it at 3.30 p.m. on Friday? I think we have agreed on that.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
සිකුරාදාට විවාද කරන්න පෞද්ගලික මන්ත්‍රී යෝජනා 8ක් අපට ඉදිරිපත් වෙලා තිබුණා. නමුත්, එදාට විවාද කරන්න පුළුවන් පෞද්ගලික මන්ත්‍රී යෝජනා 7ක් විතරයි. එක මන්ත්‍රීවරයෙකු යෝජනාවක් කල් දමා ගත්තා. ඒ අනුව පෙරවරු 11.30 සිට පස් වරු 3.30 දක්වා පෞද්ගලික මන්ත්‍රී යෝජනා සම්බන්ධයෙන් විවාදය පැවැත්වුණොත් අපට විනාඩි 210ක් තිබෙනවා. ඒ අනුව, මම හිතන විධියට එක් යෝජනාවක් සඳහා විනාඩි 30ක කාලයක් ලබා දෙන්න පුළුවන්. ඊළඟට, පස්වරු 3.30 සිට 5.30 දක්වා අපට මේ විවාදය කරගෙන යන්න පුළුවන්. ඒ සම්බන්ධයෙන් අපේ එකඟතාව පළ කරනවා, ගරු කථානායකතුමනි. *[බාධා කිරීමක්]* ඔව්, සිකුරාදා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා එකඟද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එකඟයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම තත්පර 30ක් ඉල්ලා සිටිනවා.

මාර්ග අනතුරු වාර්තා කිරීම සම්බන්ධයෙන් පුවත් පත් මඟින් විශාල සේවයක් ඉටු කරනවා. මම ජනමාධ්‍යවේදීන්ගෙන් කරුණාවෙන් ඉල්ලීමක් කරනවා. අද පුවත්පතක් වාර්තා කරලා තිබෙනවා, "කතුන් තිදෙනෙකුට මරු කැඳවූ දොළුව පන්සල අසල මාර්ග අනතුර" කියලා ඒ සිදු වූ අනතුර ගැන. එම වාර්තා කිරීමේ අවුලක් නැහැ. නමුත්, "රියදුරු කත බ්‍රේක් වෙනුවට ඇක්සලේටරය පාගලා" යනුවෙන්ද එහි වාර්තා කර තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙහෙම වෙන්නේ කාන්තාවක්වීම නිසාම නොවෙයි. Driversලා අතින් තමයි මෙහෙම වෙන්නේ. කාන්තාවන් මේ industry එකට ඇතුළත් කර ගන්න හදන වෙලාවක, "රියදුරු කත, රියදුරු පිරිමි" විධියට නැතිව "රියදුරු" කියලා වාර්තා කරන්න කියලා ජනමාධ්‍යවේදීන්ගෙන් මා ගරුත්වයෙන් ඉල්ලා සිටිනවා. මොකද, මේකේ වෙන insult එකක් තිබෙනවා. ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විපක්ෂය විසින් ඉල්ලා සිටින ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව පිළිබඳ විවාදය සිකුරාදා සවස 3.30 සිට 5.30 දක්වා පවත්වනවා.

මීළඟට, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[අ.භා. 12.11]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට ලැබුණු, ඒ කියන්නේ වෙන් කරලා තිබුණු රුපියල් බිලියන 36.6ක මුදලක් පරිපූරක ඇස්තමේන්තුවක් හරහා ණය ගෙවීම සඳහා නැවත යොමු කිරීම පිළිබඳව විවාදයයි පැවැත්වෙන්නේ.

විශේෂයෙන්ම ඇමතිතුමා අපට මේ පිළිබඳව යම් යම් කරුණු දැක්වූවා. විදේශීය ණය ලබා ගන්නා වූ ආයතන සමඟ වර්ෂය මුලදී කළ සාකච්ඡාවල ප්‍රතිඵලයක් හැටියට, ඒ මුදල් ලැබුණේ ඇයිද කියන එක අපි දන්නේ නැහැ. එහෙම නැත්නම් මේක over budget කළාද, ව්‍යාපෘතිවල ප්‍රමාද තිබෙනවාද, එහෙම නැත්නම් cancellations නිසා මෙහෙම වුණාද කියන ගැටලුවකුත් තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ අමාත්‍යාංශය යටතේ විශාල වැඩ කොටසක් කරන්න තිබියදී තමයි මේ සා විශාල මුදල් ප්‍රමාණයක් ලබන අවුරුද්ද වාගේ කාලයක ගෙවන්න තිබෙන ණය වෙනුවෙන් කලින්ම යවන්න වෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොළඹ නගරයේ metropolitan area එකේ හඳුනා ගත්ත bottlenecks 300ක් විතර තිබෙනවා develop කරන්න. විශේෂයෙන්ම වරාය පිවිසුම් elevated highway එකේ වැඩ කටයුතු අවසන් කරලා නැහැ. හේතුව මම දන්නේ නැහැ. නමුත් මේ මුදල් ආපසු යද්දී ඒක ඉතුරු වෙලා තිබෙනවා. ඊළඟට, රාජගිරියේ ඉඳලා නාවල පාරේ, කිරිමණ්ඩල මාවත දක්වා mark කරලා තිබෙන road widening project එකේ වැඩ ආරම්භයක් සිද්ධ වෙලාත් නැහැ. නියෝජ්‍ය ඇමතිතුමා පොඩ්ඩක් අපි කියන ඒවා ලියා ගන්නවා. මට ඒ ගැන සතුටුයි. එතුමා උත්තරයක් දෙයි කියලා මම හිතනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, බුත්ගමුව පාරේ පාලම ළඟ තිබෙන traffic congestion එක සම්බන්ධයෙන් මොනවා හෝ පියවරක් ගෙන තිබෙනවාද? දේශීය අරමුදල් යොදා පටන් ගන්න බැරි වුණේ ඇයිද කියලා මම දන්නේ නැහැ. ඊළඟට highway එකට යන පාරවල, අකුරේගොඩ හමුදා මූලස්ථානයෙන් එහාට මාලබේ-අතුරුගිරිය පාරට යනකම් තිබෙන traffic congestion එක. Road widening එකක් ඒ සඳහා කරන්න හඳුනාගෙන තිබෙනවාද, ඒකට සූදානමක් තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. ඒ වාගේම බේස්ලයින් මාර්ගයේ කිරුලපන හන්දියේ ඉඳලා කොහුවල දක්වා කොටසට වන්දි ගෙවලා ඉවරයි. ගුවන් පාලම දාන්නේ නැත්නම්, කොහුවල දක්වා road widening එක යනවා කියලා තිබුණා. ඒ වැඩ කටයුතුත් ආරම්භ වෙලා නැතිව තිබියදී තමයි මේ මිලියන 36,609ක මුදලක් නැවත යන්නේ. දළ වශයෙන් ගමේ පාරක කිලෝමීටරයක් කාපට් කරන්න මිලියන 10ක් යනවා කියලා ගණන් බැලුවොත්, කිලෝමීටර 3,600ක් හදන මුදල් මේ යන්නේ. ඒ වැඩ වුණා නම්, - මම කියන්නේ වුණා නම් - ගමේ බාස් උන්නැහේටද, තාර විකුණන කෙනාටද, තේ කඩේටද, ඒ ඔක්කෝටම ව්‍යාපාරයක් තිබෙනවා. මේ නිසා ඒවාත් අහිමි වෙනවා කියන එක මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ.

මේ අමාත්‍යාංශයටම අදාළ තවත් කාරණයක් තිබෙනවා කියන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. කන්කසන්තුරේ වරායට ඩොලර් මිලියන 63.5ක් ඉන්දියාවෙන් නිකම් දෙනවා, දියුණු කරන්න. මම දන්නේ නැහැ, ඒක ගන්නේ නැත්තේ මොකද කියලා. වරාය අධිකාරියේ සභාපතිතුමාගෙන් ඒ සම්බන්ධයෙන් ඇහුවාම, එතුමාට කෙළින් පිළිතුරක් දී ගන්න බැරි වුණා. මේකෙන් දකුණු ඉන්දියානු වෙළෙඳ පොළයි අපියි අතර තිබෙන merging එක නැති වෙනවා. මොකද, දකුණු ඉන්දියාවේ වෙළෙඳ පොළ ලංකාවේ ආර්ථිකය වාගේ බර ගාණකින් ලොකු වැඩියි. එතකොට අපි ලෝකයට විවෘත වෙන්නේ නැතිව තවමත් සංවෘත මානසිකත්වයෙන් බලනවාද කියන එක පැහැදිලිවම අහන්න වෙනවා.

මම ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරනවා තවත් කාරණයක්. දැන් ඇමතිතුමා කිව්වා, පසුගිය කාලයේ සිදු වුණු දූෂිතම කාර්යයක් තමයි කටුනායක ගුවන් තොටුපොළේ දෙවන පියවර විවෘත නොකිරීම කියලා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. රටේ බදු ගෙවන ජනතාවගේ මුදල්වලින් බිලියන 55ක් වැඩිපුර ගෙවන්න වෙනවා නම්, ඒක සම්බන්ධව විශේෂ කොමිසමක් පත් කරලා, ඒකට වග කිව යුත්තන්ට දඬුවම් දෙන්න. ඒක market කර කරා ඉඳලා වැඩක් නැහැ. දැන් ඔබතුමන්ලාට තුනෙන් දෙකක බලයක් ලැබිලා තිබෙනවා, ඔබතුමන්ලා වැඩ ආරම්භ කරලා තිබෙනවා. බිලියන 55ක් වැඩිපුර ගෙවන්න වෙනවා, ඒ වාගේම එම ව්‍යාපෘතිය ප්‍රමාදයි. 2028 දෙසැම්බර් මාසයේ තමයි වැඩ නිම වෙන්නේ. ප්‍රමාදයට සහ අතිරේකව ගෙවන්න සිදු වන මුදල්වලට වග කියන්න ඕනෑ අයට දඬුවම් දෙන්න. අපි කොහොම පෙන්නුවත්, ජනවාරි මාසයේ ඉඳලා අගෝස්තු මාසය දක්වා ඇමෙරිකානු ඩොලර් බිලියන 2.3යි සංචාරක කර්මාන්තයෙන් ආදායම විධියට ලැබිලා තිබෙන්නේ. ගිය අවුරුද්දේ එම කාල සීමාව තුළ ඇමෙරිකානු ඩොලර් බිලියන 2.2යි ආදායම විධියට ලැබිලා තිබෙන්නේ. ඒ කියන්නේ ආදායම ඩොලර් මිලියන 100කින් වැඩිවෙලා තිබෙන නිසා high-end touristsලා, commercial touristsලා ගෙන්වා ගැනීම වැදගත් වෙනවා.

මම තව කාරණයක් වෙත මේ පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරවනවා. 2003 මැයි මාසයේ 21වැනි දා යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා, මේ පාර්ලිමේන්තුවට ඉහළ අහසේ ගුවන් යානා යන්න බැහැ කියලා. ඒ කාලයේ යුද්ධය තිබුණා. අද පෙන්ටගනයට අඩි 30,000කට උඩිනුත් ගුවන් යානා යනවා. London City Airport එකේ දිග රත්මලාන ගුවන් තොටුපොළේ දිගට වඩා අඩුයි. ඇයි මේ ගුවන් අවකාශය විවෘත නොකරන්නේ? ඇයි මේකට අවශ්‍ය කටයුතු නොකරන්නේ? ඒ මඟින් කොච්චර අතිරේක සංචාරකයින් පිරිසක් ගෙන්වන්න පුළුවන්ද, ආදායම කොපමණ ප්‍රමාණයකින් වැඩි කරගන්න පුළුවන්ද කියන කරුණු පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවනවා. පසුගිය දවසක අපි ආංශික අධීක්ෂණ කාරක සභාවේදීත් මේ පිළිබඳව සාකච්ඡා කළා. එම නිසා අලුත් යෝජනා ගෙන එන්න කියලා අපි කියනවා.

ජනාධිපතිතුමා හැම වෙලාවේම කියනවා, "අපි ඕනෑ තරම් සල්ලි දීලා තිබෙනවා, හැබැයි දුන් ප්‍රමාණයට වැඩ කරන්නේ නැහැ" කියලා. එතකොට ඒක නොහැකියාවද? සැලසුම් නොමැතිකමද? කළ සැලසුම්වලට, ඉලක්කවලට යන්න බැරි වීමට හේතුව කාර්යක්ෂමතාව අඩු වීමද? එම නිසා ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියන ගමන්ම, මම මේ සභාව තුළ තවත් කාරණයක් මතු කරන්න කැමැතියි.

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තවශයෙන්ම පසුගිය රජය කාලයේ ලංකාවට පිරිපහදු නොකළ පොල් තෙල් ගෙන්වනකොට බද්දක් ගැහුවා. ඊට පස්සේ ඒවා නැවත බෝතල් කරලා විකුණනකොට VAT එකයි, Cess බද්දයි ගෙවන්න ඕනෑ. එතකොට සමාගම් 6ක නමින් රුපියල් බිලියන 5කට ආසන්න බදු මුදලක් ගිය අවුරුද්දේ ජනවාරි මාසයේ 1වැනි දා ඉඳලා ඔක්තෝබර් මාසය දක්වා වූ කාලයට අදාළව ගෙවලා නැහැ. පසුගිය අය වැය විවාදයේදීත් මම මේ පිළිබඳව කිව්වා. එතකොට කිව්වා, එම මුදල අය කර ගන්නවා කියලා. ජනවාරි 22වැනි දා වෙළෙඳ ඇමතිතුමාගෙන් ඇහුවාම කිව්වා, ඒ පිළිබඳව කටයුතු කරනවා කියලා. Documents ඉල්ලුවා, මම ඒ ඔක්කෝම දුන්නා. ඊළඟට, අගමැතිතුමියගෙන් අසනු ලබන ප්‍රශ්න වටයේදී 2025.02.05වැනි දා ප්‍රශ්නය අහනකොට එතුමිය පිළිගත්තා, එම මුදල ගෙවන්න ඕනෑය කියලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව කියලා තිබෙන බව. මට කිව්වා, එම ලේඛන සභාගත කරන්න කියලා. මේ තිබෙන්නේ එදා මම සභාගත කළ ලේඛන. ගෙවන්න කියලා ගැසට් පත්‍රයේ පැහැදිලිව කියලා තිබියදීත් හිටපු ජනාධිපතිවරයාගෙන් tax exemption එකක් ඉල්ලා තිබුණා, මේකට ගෙවන්න ඕනෑ නැහැ කියලා. ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමනි, මා ළඟ මේ තිබෙන්නේ මේ සම්බන්ධයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව Inland Revenue Department එකෙන් විමසීම් කරලා යවපු ලිපිය. ඕනෑ නම් ඔබතුමාට මෙහි copy එකක් දෙන්නම්. Inland Revenue Department එක ලබා දුන් උත්තරයත් මා ළඟ තිබෙනවා. එම මුදල අය කර ගන්න ඕනෑය කියලා, අන්තිම වාක්‍යයේ මෙහෙම සඳහන් කරනවා: "IRD recommends that the observations from....." - එම කොම්පැනියේ නම සඳහන් කරලා - "....should also be taken into account when formulating any policy direction on this matter." මේක වෙන්නේ ගිය ආණ්ඩුව කාලයේ. අගමැතිතුමිය මේකට පැහැදිලි උත්තරයක් දුන්නා. එම උත්තරය සහිත හැන්සාඩ් වාර්තාව දැන් මා ළඟ තිබෙනවා. එම මුදල අය කර ගන්නවා කිව්වා. නමුත්, අද වෙනකල් අය කරගෙන නැහැ. එතකොට හේතු දෙකයි මේකට පාදක වෙන්න පුළුවන් වන්නේ, ගරු ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමනි.

එක්කෝ, මේ අය පිරිපහදු නොකළ පොල් තෙල් ලංකාවට ගෙනැල්ලා, පිරිපහදු නොකරම බෝතල් කරලා විකුණලා තිබෙනවා. ඒක බරපතළ සෞඛ්‍ය ප්‍රශ්න ඇති වෙන්න හේතුවක්. ඔබතුමන්ලා මේකට උත්තර දෙන්න. එහෙම නැත්නම්, මේ අය ගිය අවුරුද්දේ ජනවාරි මාසයේ ඉඳලා ඔක්තෝබර් මාසය වෙනකල් රුපියල් බිලියන 5යි නම් රජයට ගෙවන්න තිබුණේ, අවුරුද්දක් ගත වන මේ මොහොත වන විට රුපියල් බිලියන 10කට වැඩි මුදලක් එම සමාගම් විසින් ගෙවිය යුතුව තිබෙනවා. හොරු අල්ලන්න ආපු ආණ්ඩුව, හොරු කවුද කියලා පෙන්වා දී තිබියදී, ගෙවන්න ඕනෑ කොච්චරද කියලා පෙන්වා දී තිබියදී, ඒවා පිළිගෙන, අය කර ගන්නවා කියලා එකඟ වෙලාත් ඒවා නොකරන්නේ ඇයි? කාට හරි කොමිස් යනවාද, ගරු ඇමතිතුමනි? නැත්නම් කවුරු හරි ඒ අයව රකිනවාද? එහෙමත් නැත්නම් ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිවරයා විධියට -මම දන්නේ නැහැ, නියෝජ්‍ය ඇමතිවරු දෙන උත්තර පිළිගන්න පුළුවන්ද කියලා. ඒක ආණ්ඩුවමයි කිව්වේ. නමුත්, ඔබතුමා ලබා දෙන පිළිතුරු අපි පිළිගන්නම්- මේ සභාවට මේ සම්බන්ධව පැහැදිලි පිළිතුරක් ලබා දෙන්න කියලා ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. මොකද, ඒක ආණ්ඩුව පැත්තෙන් ආණ්ඩුවට හොඳයි. ආණ්ඩුව නිවැරදිව වැඩ කරනවා, ආණ්ඩුව හොරු ආරක්ෂා කරන්නේ නැහැ, ආණ්ඩුවට හොරුත් එක්ක ඩීල් නැහැ, ආණ්ඩුව වක්‍රව හෝ හොරු රකින්නේ නැහැ කියලා පෙන්වන්න මේක හොඳ අවස්ථාවක්. ලබන මාසයේදී අය වැය කථාව ඉදිරිපත් කරනවා. මේ මුදල අය කර ගත්තොත් අය වැය පරතරයෙන් කොටසක් පියවාගන්න පුළුවන් නේද, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි? මම ඔබතුමාට මේ ලියුම් දෙකේ පිටපත් දෙන්නම්, නියෝජ්‍ය ඇමතිතුමනි. අගමැතිතුමියගේ පිළිතුර ඇතුළත් හැන්සාඩ් වාර්තාවේ පිටපතකුත් දෙන්නම්. මෙච්චර සුපැහැදිලිව කරුණු තිබියදී මේක නොවෙන්නේ ඇයිද කියන එක හොයා බලා උත්තරයක් ලබා දෙන්න කියා මම ඉල්ලා සිටිනවා.

මම දැක්කා, පසුගිය දවස්වල residential visa ලබා දෙන වැඩසටහනක් තිබුණා, ඇමෙරිකානු ඩොලර් ලක්ෂයක investments කරන අයට. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒකට ඉල්ලුම් කරන ගොඩක් අය ඇත්තටම පිටරටින් ඩොලර් ගෙනෙන අයද, නැත්නම් ලංකාවේ ඉඳලා හම්බ කරලා ඒ මුදල් reinvest කරලා ගන්න ඒවාද කියා හොයා බලන්න කියලා. එහෙම වුණොත් අපේ purpose එක loss වෙනවා. ඒ නිසා මම ඔබතුමාට ඒ සම්බන්ධව හොයා බලන්න කියා යෝජනා කරනවා. ඩයස්පෝරාවේ, අරහේ, මෙහේ ශ්‍රී ලාංකිකයෝ ඕනෑ තරම් ඉන්නවා, විදේශ රටවල. ඔවුන්ගේ අතිරික්ත මුදල්වලින් එක්කෙනෙක් ලක්ෂ 2 ගණනේ 5,000ක් ගෙනාවොත්, US Dollars 1 billion එනවා. හැබැයි, මේ රටේ ආයෝජනය කරන්න, රටට මුදල් ලබා දෙන්න කියා අපි නිකම් කිව්වාට, එහෙම දෙන්නේ නැහැ. ඇමතිතුමනි, ඔවුන්ට offer කරන්න, අඩුම ගණනේ වාහනයක් මිලදී ගන්නකොට, සියයට 10ක tax waive-off එකක් දෙන්නම්, apartment එකක් ගනිද්දී Stamp Duty එක waive off කරන්නම් කියලාවත්. එහෙම නැත්නම් විදේශීය පුරවැසියන්ට ශ්‍රී ලංකාවේ නේවාසික වීසා, multiple visa ලබා දීම සඳහා මේක පාවිච්චි කරන්න පුළුවන්. ඔබතුමා ගණන් හදා බලන්න, සංචාරකයෝ අච්චර එනවා, මෙච්චර එනවා කියලා numbers දමනවා. එසේ numbers දැම්මාට, average tourist කෙනෙකුගේ spending එක කීයද කියලා හොයා බලන්න. අලුතින් රටට ඩොලර් ලැබීම අත්‍යවශ්‍යයි. මොකද, ඔබගේ ආණ්ඩුවට විදේශ ආයෝජන විශාල වශයෙන් ආකර්ෂණය කිරීමේ හැකියාවක් නැති නිසා.

සමහරු හිතාගෙන ඉන්නවා, ආණ්ඩුව මෙතෙක් අරගෙන තිබෙන ණය 2028 අවුරුද්ද වෙනකම් ගෙවන්න ඕනෑ නැහැ කියලා. ආණ්ඩුව භාර ගනිද්දී තිබුණු සම්පූර්ණ ණය ප්‍රමාණය ඩොලර් බිලියන 93යි. දැන් ඒ ප්‍රමාණය ඩොලර් බිලියන 105කට විතර වැඩි වෙලා. ඒ කියන්නේ මේ අවුරුද්ද තුළ ණය බර ඩොලර් බිලියන 12කින් වැඩි කරලා තිබෙන්නේ. හැබැයි, මම දන්නා තරමට ඒකෙන් 14.5කට, 15කට ආසන්න ප්‍රමාණයක් තමයි ජාත්‍යන්තර බැඳුම්කර හිමියන්ගෙන් අරගෙන තිබෙන්නේ. ඉතුරු ණය service එක දෙන්න ඕනෑ. භාණ්ඩාගාරයේ තිබෙන්නේ ඩොලර් බිලියන 6.2ක සංචිතයක්. එතකොට ලබන අවුරුද්දේත් ණය ගෙවාගෙන යනකොට මේ සංචිතය වැඩිවීම සඳහා අලුතින් ඩොලර් ආදායම ලැබීම - construction industry එක වෙන්න පුළුවන්, tourism industry එක වෙන්න පුළුවන්, investment purposes සඳහා වෙන්න පුළුවන් - අත්‍යවශ්‍යයි. ඒ නිසා වාමාංශික -ලිබරල්වාදී දෙමුහුන් ප්‍රතිපත්තිය නිසා ඔබතුමන්ලාට රට රටවලින් ආයෝජන එන්නේ නැත්නම්, ආයෝජන ළඟා කර ගැනීම සඳහා ප්‍රායෝගික වැඩ පිළිවෙළක් ගෙනෙන්න කියා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි.

අද දවසේ මේ සා විශාල මුදල් ප්‍රමාණයක් ණය ගෙවීමට යොමු කරද්දී, ඊළඟ අය වැයේදීවත් අඩුම ගණනේ මේ වාගේ හඳුනා ගත් ව්‍යාපෘති සඳහා යන වියදම් පිළිබඳව හරි තක්සේරුවක් ලබාගෙන, ලබා ගත හැකි ණය සහ ලබාගත නොහැකි ණය පිළිබඳව පූර්ණ අවබෝධයකින් යුතුව කටයුතු කළා නම් ඇත්තවශයෙන්ම මේ වාගේ පරිපූරක ඇස්තමේන්තු ගෙනෙන්න සිදු වෙන්නේ නැහැ.

ගරු බිමල් ඇමතිතුමනි, ඔබතුමා අර කිලෝමීටර ලක්ෂයේ මාර්ග සංවර්ධන වැඩසටහන පිළිබඳව පැහැදිලි කිරීමක් කළා නේ. පැහැදිලිවම ඒ තුළ වංචාවක් වෙලා තිබෙනවා, දූෂණයක් වෙලා තිබෙනවා. ඒවායේ තත්ත්ව පරීක්ෂණ සිද්ධ වෙලා නැහැ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ඒවා වෙනම කථා නේ. මේ, වෙනම කථා. අපි ආංශික අධීක්ෂණ කාරක සභාව විධියට - *[බාධා කිරීමක්]* විනාඩියක් දෙන්න, මම අවසන් කරනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the House.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මගේ වෙලාවෙන් දෙන්න බැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
තත්පර 10ක් දෙන්න, කමක් නැහැ. කිලෝමීටර ලක්ෂයේ මාර්ග සංවර්ධන වැඩසටහන තුළ පැහැදිලිව වංචාවක් වෙලා තිබෙනවා කියලා ඔබතුමා කිව්වා නේ. අපට ඒ තොරතුරු ලබා දෙන්න. දැන් ඔබතුමන්ලා ආණ්ඩු හදන්න යන්නේ ඒගොල්ලන් එක්ක, රනිල් වික්‍රමසිංහත් එක්ක එකතු වෙලා නේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු ඇමතිතුමා, හරි දේ හරි කියන්නත්, වැරදි දේ වැරදියි කියන්නත් අපට කොන්දක් තිබෙනවා. අපි හොරා කාලත් නැහැ, හිහා කාලත් නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ආණ්ඩුව හෝ මහින්ද මහත්තයාගේ ආණ්ඩුව හෝ වැරදි කළා නම් වැරදියි. ඒ වාගේම ඔබතුමා කියපු නිසා මම මේ කාරණයත් කියන්නම්. අපි 2014 අවුරුද්දේ ඉඳලා මේ වෙනකම් මොනවා හෝ දේශපාලන පක්ෂයකට හෝ දේශපාලනඥයෙකුට චෝදනාවක් නඟා තිබෙනවා නම්, අදටත් ඒක වලංගුයි. ඒවා සුද්ධ කරන්න අපි ඉදිරිපත් වෙන්නේත් නැහැ, හෝදන්න ඉදිරිපත් වෙන්නේත් නැහැ කියන එක මම මතක් කරනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මහ බැංකු හොරකමට විරුද්ධවත් ඔබතුමා එහෙම කරනවාද?

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ඔබතුමා ගෙනැල්ලා පරීක්ෂණ කරලා ඔප්පු කරන්න. කෙළින්ම අපි ඒ වෙනුවෙන් පෙනී සිටිනවා. මෙහෙම නේ, ඇමතිතුමා. *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමනි, පොඩ්ඩක් ඉන්න. පැය 24න් මහ බැංකු හොරු කනෙන් අල්ලාගෙන ගෙනෙනවාය කිව්වාට තවම අර්ජුන මහේන්ද්‍රන්ගේ address එකවත් හොයා ගන්න බැරි වුණා නේ. ගෙනෙන්න අර්ජුන මහේන්ද්‍රන්. ඒකට පක්ෂව අපි අත් දෙකම ඔසවනවා. ඕනෑම සහයෝගයක් ඒ වෙනුවෙන් ලබා දෙනවා. *[බාධා කිරීමක්]* හැබැයි, මට දැන් පිළිතුරු ලබා දීමට අවස්ථාව දෙන්නකෝ. *[බාධා කිරීමක්]* මට පිළිතුරු දෙන්න අවස්ථාව දෙන්නකෝ. මම පැහැදිලිව කිව්වා නේ, කිසිම හොරකමක් වෙනුවෙන්, කිසිම හොරෙක් වෙනුවෙන් පෙනී සිටින්න හෝ ඒ මඩ හෝදන්න අපි සූදානම් නැහැ කියලා. මොකක්ද හේතුව? අපි පැහැදිලිවම මේ කාරණය කියන්න ඕනෑ. මේ ආණ්ඩුව කවදා හරි වැටෙනකොට නැවත මේ රටේ මිනිස්සු හොයන්නේ ආර්ථිකය හදන්න පුළුවන් වාගේම නීතියේ ආධිපත්‍යය රකින්න පුළුවන් කණ්ඩායමක්. ඒ කණ්ඩායම ඉන්නේ සමගි ජන බලවේගයේ විතරයි. ඒක නිසා අපි ඒ අනන්‍යතාව රැකගෙන, හොරු රකින්නේ නැතුව තමයි මේ දේශපාලන ගමන යන්නේ.

මාර්ග කිලෝමීටර ලක්ෂයක් සංවර්ධනය කිරීම කියන කාරණයට මම නැවත එන්නම්. අපි ආංශික අධීක්ෂණ කාරක සභාවේදී ආණ්ඩුවද, විපක්ෂයද කියලා බලන්නේ නැතුව ඒ ආයතනවල පැහැදිලිවම සිදු වෙලා තිබෙන අඩුපාඩුකම්, සිදු කරලා තිබෙන වැරැදි සියල්ලම ගැන කථා කරනවා. ඒක නිසා අපි පැහැදිලිව කිව්වා, "ඒවායේ තත්ව පරීක්ෂා කරන්න. ඒවායේ කරපු වැඩ, නොකරපු වැඩ මොනවාද කියලා බලන්න" කියලා. මම ඔබතුමාට පොඩි තොරතුරක් දෙන්නම්. එක නිලධාරියෙක් කොන්ත්‍රාත්කාරයන්ට කියනවා, "කම්ටුව ගෙවීම් නවත්වලා තිබෙන්නේ. ඒ කම්ටුව කිව්වොත් දෙනවා" කියලා. අපට එහෙම කියන්න බැහැ. ඒ නිලධාරීන් කොන්ත්‍රාත්කාරයන්ට එහෙම උපදෙස් දෙන එක වැරැදියි, ගරු ඇමතිතුමනි. අපි කිව්වේ තත්ව පරීක්ෂාවන් කරලා, බලලා ගෙවීම් කරන්න කියලා. ඒක සාධාරණයි නේ. නොකරපු දේවල්වලට ගෙවන්න එපා කියලා අපි කිව්වේ. ඔබතුමාගේ ආණ්ඩුවේ, ඔබතුමාගේම නිලධාරියෙක් කොන්ත්‍රාත්කාරයන්ට "අහවල් කම්ටුව නවත්වලා තිබෙන්නේ, අහවල් කම්ටුව කිව්වොත් දෙන්න පුළුවන්" කියලා කියන එක වැරැදි නැද්ද? එම නිසා ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිමින් මගේ කථාව මා අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Proceedings of the House will be suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Thanura Dissanayake. You have eight minutes.

[අ.භා. 1.00]

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ප්‍රවාහන, මහාමාර්ග අමාත්‍යාංශයට අදාළ පරිපූරක මුදල සම්බන්ධයෙන් වූ යෝජනාව ගැනයි කථා කරන්නේ. මේ ගැන කථා කරනකොට විශේෂයෙන් අපට කථා කරන්න දේවල් ප්‍රමාණයක් තිබෙනවා.

[ගරු තනුර දිසානායක මහතා]

අපේ රටේ ප්‍රවාහන පද්ධතිය, ඒ වාගේම මහා මාර්ග පද්ධතිය අපේ රටේ ජනතාවට ඉතාම වැදගත්. නමුත් රටක් විධියට අපට තව විශාල ගමනක් යන්න තිබෙනවා. විශේෂයෙන් දුම්රිය ඇතුළු පොදු ප්‍රවාහනය සම්බන්ධයෙන් ජනතාවට ඒ තරම් සතුටුදායක අත්දැකීම් නොවෙයි තිබෙන්නේ. එහි කාර්යක්ෂමතාව නැතිකම, නිසි වෙලාවන්වලට වැඩ නොකිරීම, පහසුකම්වල ප්‍රශ්න වැනි දේවල් ඉතාම දැඩි ලෙස තිබෙනවා. නමුත් ඒ ක්ෂේත්‍රයට පසුගිය ආණ්ඩුත්, පාලකයෝත් විශාල කාලයක් තිස්සේ මුදල් වෙන් කිරීම් කරලා තිබෙනවා. හැබැයි, අපට හිතලා බලන්න වෙනවා. ඒවා එහෙම කරලා තිබුණාට අවශ්‍ය ප්‍රයෝජනය, අවශ්‍ය ප්‍රමුඛතාව සහිතව ඒවා ඇවිත් නැති ප්‍රශ්නයකුත් තිබෙනවා. ඒ ව්‍යාපෘති ගොඩක් අත්හැරලා, නතර වෙලා තිබුණු අවස්ථාවක තමයි අපි මේ රජය භාර ගත්තේ. ඒ නිසා අපි අය වැයෙන් මුදල් වෙන් කරලා තිබුණාට විශේෂ සාකච්ඡා විශාල ප්‍රමාණයක් සිදු කරලා තමයි අතරමැද කාලය ඇතුළත නැවත ගිවිසුම්ගත වෙලා, නැවත ගිවිසුම් අලුත් කරලා අපට මේ එකඟතාවලට එන්න වුණේ.

උදාහරණයක් හැටියට ගත්තොත්, ගැටඹේ ගුවන් පාලම සහ කොහුවල ගුවන් පාලම, හංගේරියානු රජයේ මුදල් ආධාර එක්ක විදේශීය මූල්‍යකරණය යටතේ ක්‍රියාත්මක වෙන්න තිබුණු ව්‍යාපෘති. ඒ වාගේම මේකට ශ්‍රී ලංකා රජයේ -දේශීය- අරමුදල් ද වෙන් කෙරෙනවා. හැබැයි ශ්‍රී ලංකා රජයේ මුදල් වෙන් කළාට මේ සාකච්ඡා ඇතුළේදී -මේවා ගොඩක් කලින් පටන් ගන්න තිබුණු ඒවා- ඒවා ක්‍රියාවිරහිත වෙලා තිබුණු නිසා නව තත්ත්වයන් යටතේදී, ඇතැම් අවස්ථාවලදී ඒ රටවල් හෝ ඒ ආයතන, බැංකු ඒවා නැවත ආරම්භ කරන්න කැමැති නැහැ. ඒ වාගේම නැවත ඒ සාකච්ඡා සඳහා විශාල කාලයක් ගත වෙනවා. ඒ නිසා තමයි මේ ප්‍රශ්නය මතු වෙන්නේ. අපි මෙතැනදී රජයේ මුදල්වලට අමතරව වෙනත් ව්‍යාපෘති සඳහා යොදවපු මුදල් මාරු කරලා මේ ව්‍යාපෘති මේ වසරේ ඉදිරි කාලය ඇතුළත ආරම්භ කරන්න සැලසුම් කරලා තිබෙනවා.

ඒ වාගේම තමයි අපේ රටේ දුම්රිය සේවය. විශේෂයෙන් අපේ රටේ කාර්යාලවලට ගමන් කරන මගීන් විශාල පිරිසක්, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවකයින් විශාල පිරිසක් දුම්රිය පාවිච්චි කරනවා. අපේ රටේ දුම්රිය සේවය කියන්නෙත් ලෙහෙසි පහසු සේවාවක් නොවෙයි, දැවැන්ත සහ දීර්ඝ ඉතිහාසයක් තිබෙන දෙපාර්තමේන්තුවක් සහ සේවාවක්. නමුත්, මේ දුම්රිය සේවාවේ සමස්ත පද්ධතියේ වර්ධනය නිවැරදි ලෙස කර නැති නිසා ඒ පද්ධතියේ කාර්යක්ෂමතාව අද නිසි ලෙස ලබා ගන්න බැරි වෙලා තිබෙනවා. අපි මේ වසර තුළ සැලසුම් විශාල ප්‍රමාණයක් හදලා තිබෙනවා, මේ ක්ෂේත්‍රය ඉස්සරහට ගෙනියන්න. අපි නව දුම්රිය බලවේග කට්ටල පහක් සඳහා, ප්‍රසම්පාදන කටයුතුවලට අදාළ කටයුතු ආරම්භ කර තිබෙනවා.

ඒ වාගේම තමයි, දුම්රිය මැදිරිවල ගමන් කරන මගීන් සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම කරන්න ඕනෑ. මගීන් ගොඩක් වෙලාවට චෝදනා කරනවා, fans නැහැ, light එකක්වත් නැහැ, ඒවායේ තිබෙන toilets පාවිච්චි කරන්න බැහැ කියලා. ඒ වාගේ සංවේදී කාරණා සම්බන්ධයෙනුත් අපි හිතන්න ඕනෑ. එහෙම නැතිව මේ සේවාව මගී ජනතාවට වඩාත් සුව පහසු සේවාවක් බවට පත් වෙන්නේ නැහැ. අපි දැන් විදුලි පංකා 5,000ක් ආනයනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු කරගෙන යනවා. ඒ වාගේම සනීපාරක්ෂක කටයුතු වැඩිදියුණු කිරීමටත් කටයුතු කරනවා. ඒ වාගේම ගොඩක් කාලයකින් දුම්රිය මාර්ගවල පීලි අලුත් කරලා නැහැ. ටික ටික තමයි ඒවායේ කටයුතු සිදු කරලා තිබෙන්නේ. මුහුදුබඩ දුම්රිය මාර්ගයේ තිබෙන පීලි ඉක්මනින්ම දිරාපත් වෙනවා. ඒ නිසා පීලි විශාල ප්‍රමාණයක් අපට මිලදී ගන්න සිද්ධ වෙනවා. අපි මේ වෙනකොට රේල් පීලි 12,000ක් ආනයනය කරන්න සූදානම් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දුම්රිය රියැදුරන් විශාල කාලයක් දුම්රිය එන්ජින් සමඟයි ඉන්නේ. නමුත් අපේ රටේ හිටපු පාලකයින් ඒ රියැදුරන්ගේ පහසුව ගැන හිතලා නැහැ. එහෙම මානව දයාවක් තිබුණු පාලකයින් මේ රටේ බිහිවෙලා ඉඳලා නැහැ. රත්මලාන දුම්රිය වැඩපළ ගත්තත් එහෙමයි. එතැන ඉන්න සේවකයින්ට වැඩ කරන්න සිදුවෙලා තිබෙන්නේ ඉතා අපහසු තත්ත්ව යටතේයි. මේ දේවල් වෙනස් කරන්න ඕනෑ. එහෙම නැතිව ඒවායේ කාර්යක්ෂමතාව වැඩි වෙන්නේ නැහැ. ඒ නිසා දුම්රිය රියැදුරන්ගේ පහසුව සඳහා රියැදුරු මැදිරි වායුසමනය කිරීමට අවශ්‍ය කරන ප්‍රසම්පාදන කටයුතු අපි ආරම්භ කරලා තිබෙනවා.

මම දැක්කා, විපක්ෂය සහ ඇතැම් කණ්ඩායම් මේ කාරණය සුළුකොට හුවා දක්වනවා. අපි Dream Destination වැඩසටහන යටතේ වාගේම රජයේ මුදලුත් යොදවලා විවිධ දුම්රිය ස්ථාන නවීකරණය කරන්න පටන් ගෙන තිබෙනවා. ඒ වාගේම පිටකොටුව මධ්‍යම බස් නැවතුම්පොළත් නවීකරණය කරන්න පටන් ගෙන තිබෙනවා. ඒකට ගොඩක් අය කියනවා, තීන්ත ගානවා කියලා. තීන්ත ගානවාට වඩා ගොඩක් එහාට ගිය සංකල්පයක් ඒකේ තිබෙනවා. සමහර විට ඒගොල්ලන්ට ඒක තේරෙන්නේ නැති වෙන්න පුළුවන්. මොකද, හිටපු පාලකයින් කවදාවත් ඒවායේ යන්නේ නැහැ නේ. අපේ රටේ ජනතාව භාවිත කරන මධ්‍යම බස් නැවතුම්පොළ සහ කොටුව දුම්රිය ස්ථානය ඇතුළු දුම්රිය ස්ථාන සියයක් නවීකරණය කරනවා. නවීකරණය කරනවා කියලා කියන්නේ තීන්ත ගානවා කියන එකට විතරක් නොවෙයි. අපි මේ රටේ පාලනය භාරගෙන තිබෙනවා නම්, අපි පාලකයෝ විධියට හිතන්න ඕනෑ, ආණ්ඩුව විධියට හිතන්න ඕනෑ, මගී ජනතාවට අද ලෝකයට ගැළපෙන, ඉහළ තත්ත්වයේ සේවාවක් ලබා දෙන්න. ඒ වෙනුවෙන් තමන්ගේ වරප්‍රසාදත් අඩු කරලා පුළුවන් තරම් වැඩ කරන්න ඕනෑ මේ රට ගොඩ නඟන්න නම්. මේ රට පත්වෙලා තිබෙන තත්ත්වය ගත්තොත් ප්‍රවාහන ක්ෂේත්‍රයෙන්ම උදාහරණ ගන්න පුළුවන්. අපේ රටේ දීර්ඝ කාලයක් හිටපු පාලකයින් තම තමන්ගේ වරප්‍රසාද ගොඩ නඟා ගත්තා මිසක් ප්‍රවාහන ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාව ගැන හෝ දුම්රිය සේවාවේ ප්‍රවර්ධනය වෙනුවෙන් වැඩ කරලා නැහැ. මානව දයාව තිබුණු පාලකයින් අපේ රටේ ඉඳලා නැහැ.

මට මේ අවස්ථාවේදී විශේෂයෙන්ම කිව යුතු තවත් කාරණාවක් තිබෙනවා. අද ඔක්තෝබර් 8වැනි. අද "චේ" දිනය. සටන්කරුවෙක් විධියට, මානව දයාව පිරි නායකයෙක් විධියට "චේ"ව තරුණ පිරිස අතර විශේෂයෙන් ජනප්‍රිය වෙලා තිබෙනවා. අපි අද රටක් විධියට බැලුවොත්, අපේ රට නැවත ගොඩ නඟන්න නම් මේ රටේ පාලකයන්ට ඒ වාගේම වගකීම්, තනතුරු දරන මේ සියලුදෙනාටම "චේ" ගෙන් ගන්න පුළුවන් ආදර්ශ ගොඩක් තිබෙනවා. ඒ නිසා අපි හිතනවා, අද දවසේ මේ මාතෘකාව ඇතුළෙම, අපේ රටේ මේ ක්ෂේත්‍ර වෙනස් කර ගෙන යන එක තුළ, අපේ රට නැවත ගොඩ නඟන්න නම් පාලකයන් විධියට, ආණ්ඩුවක් විධියට, විවිධ තනතුරු දරන අය විධියට, වගකීම් දරන අය විධියට බල ලෝභීත්වයෙන් තොරව, තනතුරුවලින් ඔළුව උදුම්මා ගන්නේ නැතිව, මේවායින් ගන්න තිබෙන වරප්‍රසාද ගැන විතරක් හිතන්නේ නැතිව, "චේ" වාගේ ලෝකයේ මානව දයාව වෙනුවෙන් වැඩ කරපු මිනිස්සු ප්‍රමාණයක් ලෝකයේ බිහි කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මම හිතන්නේ නැහැ, ආණ්ඩුවකට විතරක්, එහෙම නැත්නම් රජයේ නිලධාරින්ට විතරක් සුපුරුදු විධියට වැඩ කරලා; පසුගිය පාලකයෝ වැඩ කරපු විධියට තමන්ගේ හැන්දෙන් තම තමන්ගේ ගොඩ වැඩි කර ගෙන මේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රයවත්, කිසිම ක්ෂේත්‍රයක්වත් ගොඩ නඟන්න පුළුවන් වෙයි කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Thanura Dissanayake, your time is up.

**ගරු තනුර දිසානායක මහතා**
**(மாண்புமிகு தனுர திசாநாயக்க)**
(The Hon. Thanura Dissanayake)

ඒ නිසා මේ රටේ ජනතාව, රජයේ නිලධාරින් ඇතුළු සියලුදෙනාට මම ඉතා කරුණාවෙන් සහ ආදරයෙන් කියන්නට කැමැතියි, අපේ දේශපාලන ව්‍යාපාරය ගොඩ නඟා තිබෙන්නේම මෙන්න මේ වාගේ සාමූහිකව වැඩ කරන්න පුළුවන්, තනතුරු බලාගෙනම වැඩ කරන්නේ නැති, වගකීම් ගන්න පුළුවන් පිරිසක් විධියටයි කියන එක. අද දවස වන විට මානව දයාවෙන් යුතු "චේ"ලා, "කැස්ත්‍රෝ"ලා වාගේ අය කියුබාව ගොඩ නඟා තිබෙනවා. අද දවසේ විශේෂත්වයත් එක්ක මේ පිළිබඳව අපි හිතන්න ඕනෑ. ජනතාවට සංවේදී ක්ෂේත්‍ර වර්ධනය කර ගන්නකොට තමන්ගේ පහසුකම් කැප කරලා වැඩ කරන්න පුළුවන් පිරිසක් අපි ගොඩ නඟන්න ඕනෑ. විශේෂයෙන් ඒ සඳහා තරුණ පිරිසක් ගොඩ නඟන්න ඕනෑ. ඒ වෙනුවෙනුත් කැප වෙමු. මේ ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ ජනතාවට කාර්යක්ෂම හා සුව පහසු සේවාවක් ලබා දීමට අපේ පහසුකම් කැප කරලා හරි අපි මේ කරන ආයෝජන, වෙනස්කම් කරන්න ඕනෑ කියන කාරණය ඉස්මතු කරමින් මම නවතිනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
**(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(The Hon. Deputy Speaker)

Next, the Hon. Chandana Sooriyaarachchi. You have nine minutes.

[අ.භා. 1.09]

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
**(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)**
(The Hon. Chandana Sooriyaarachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට අදාළව යම් පරිපූරක මුදලක් මාරු කිරීමට මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරපු යෝජනාව පිළිබඳව අදහස් දැක්වීම සිදු වෙනවා. ඒ සඳහා අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ දක්වා අදහස් දැක්වූ විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා මේ මුදල් දැන් මාරු කරන්නේ නැතිව කලින් සැලසුම් කරන්න තිබුණා නේ වාගේ අදහසක් කියන්න උත්සාහ කළා. විශේෂයෙන්ම කිව යුතුයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වත්මන් ආණ්ඩුවට මේ තීරණය ගන්න සිද්ධ වෙන්නේ මේ කාරණය නිසායි. පැවතිච්ච ආණ්ඩු; පැවතිච්ච ඒ පාලනය තුළ සැලසුම් කරපු විවිධ ව්‍යාපෘති සඳහා විදෙස් මුදල්, විදෙස් ණය ලබා ගැනීමට සැලසුම් කර තිබුණා. ඒ ණය ලබා ගන්න නම් ඊට අනුරූපීව සහ ඊට සාපේක්ෂව දේශීය මුදල් ප්‍රමාණයක් වෙන් කළ යුතුව තිබුණා.

නමුත්, පැවතිච්ච පාලන කාලය ඇතුළේ ඇති වුණු ආර්ථික බංකොලොත්භාවය, ඒ ඇති කරපු ආර්ථික විනාශය, ඒ ක්‍රියාදාමය නිසා ඒ ව්‍යාපෘතිවලට විදෙස් ණය ලබා දීම් අත්හිටෙවුවා. එහි ප්‍රතිඵලයක් විධියට ඒ වෙන් කරපු මුදල මුදලක් විධියට මේ වැය ශීර්ෂවල ඉතිරි වුණා. ඒ නිසා වත්මන් ආණ්ඩුව තවදුරටත් ඒ මුදල් ඉලක්කමක් විධියට පවත්වා ගෙන යනවා වෙනුවට වෙනත් ඵලදායී ව්‍යාපෘති සඳහා, වෙනත් ඵලදායී මූල්‍ය කළමනාකරණයක් වෙනුවෙන් ඒ අදාළ මුදල් මාරු කිරීමේ ක්‍රියාවලිය තමයි මේ යෝජනාව හරහා ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ එක්කම මහාමාර්ග අමාත්‍යාංශය මේ දක්වා - 2025.07.31වැනි දා වෙනකොට- අරගෙන තිබෙන ණය මුදල් ප්‍රමාණයෙන් -රුපියල් මිලියන 310,639ක් වන මුදල් ප්‍රමාණයෙන් - යම් කොටසක් අපි මේ පරිපූරක යෝජනාව මඟින් වෙන් කර ගන්නා මුදලින් ගෙවලා, මහාමාර්ග අමාත්‍යාංශය පෙර වසර ගණනාව තුළ ගෙන තිබෙන ඒ ණය ප්‍රමාණයෙන් යම් කොටසක් අඩු කර ගැනීමට ආණ්ඩුවක් විධියට අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවට මේ පරිපූරක යෝජනාව ගෙනෙන්න සිද්ධ වුණේ කලින් පැවති ආණ්ඩු විදේශ ණය සහිතව ක්‍රියාත්මක කරපු ඒ ව්‍යාපෘතිවල ගැටලුව, මා කලින් මතු කළා වාගේම පැවතිච්ච ආණ්ඩුවල තිබුණු ඒ මූල්‍ය විනය පිළිබඳ ගැටලුව නිසායි.

ඒ වාගේම, පැවතිච්ච ආණ්ඩු අවසානයේදී 2022 වනකොට අපේ රට බංකොලොත්භාවයට පත් කළා. ගත්තු විදෙස් ණයවල වාරික සහ පොලී ගෙවා ගන්න බැහැ කියලා අමාත්‍ය මණ්ඩලය තීරණය කරලා, විදෙස් ණයවල පොලී ගෙවීම නතර කරලා අපේ රටේ දැවැන්ත ආර්ථික අස්ථාවරත්වයක් සහ බංකොලොත්භාවයක් ඇති කරපු නිසා තමයි විදෙස් රටවල් අපේ රට වෙනුවෙන් ලබා දෙන්න බලාපොරොත්තු වෙච්ච ණය අත්හිටුවීමේ ක්‍රියාවලියකට ගියේ. ඒවායේ ඵලවිපාකවලට තමයි අද මේ මුහුණ දෙමින් ඉන්නේ. මූල්‍ය විනයක් නැති පැවතිච්ච පාලනයේ අසාර්ථකත්වය නිසා අද එහි පව් ගෙවන්න වෙලා තිබෙන්නේ මේ රටේ ජනතාවටයි. ඒවා තවත් පව් කඳු විධියට ගොඩගහගෙන අරගෙන යනවා වෙනුවට අපි නිවැරදි මූල්‍ය විනයක් සහ මූල්‍ය කළමනාකරණයක් ඇතුළේ මේ මුදල් නිසි පරිදි වෙනත් ඵලදායී ව්‍යාපෘතිවලට යොදවමින්, ඒ වාගේම මේ තිබෙන ණය ප්‍රමාණයන් අඩු කරමින්, ජනතාවට යම් සහනයක් ලබා දෙමින් ආණ්ඩුවක් විධියට අපට දෙන්න පුළුවන් නිවැරදි වැඩ පිළිවෙළට ප්‍රවේශ වීම තමයි මේ පරිපූරක යෝජනාවේ අරමුණ.

පැවැති ආණ්ඩුවල අසාර්ථකත්වයට මම එක උදාහරණයක් කියන්නම්. අපේ ගරු සභානායක බිමල් රත්නායක අමාත්‍යතුමාත් මේ සම්බන්ධයෙන් සිහිපත් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පැවතිච්ච පාලන කාලවල අරඹපු ව්‍යාපෘති බොහොමයක් අසාර්ථක වී තිබෙනවා. එදා අපි දැක්කා එක් ප්‍රසිද්ධ කාරණාවක්. රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයාගේ කාලයේ - ගිය අවුරුද්දේ- බණ්ඩාරනායක ගුවන්තොටුපළේ දෙවන මඟී පර්යන්තය සෑදීම සඳහා වූ ව්‍යාපෘතිය විදෙස් ණය සහිතවයි කරන්න ගියේ. නමුත් හිටපු ප්‍රවාහන ඇමති නිමල් සිරිපාල ද සිල්වා මහත්මයාට යම් චෝදනාවක් එල්ල වුණා, ඒ ව්‍යාපෘතිය සම්බන්ධයෙන්. අවසානයේ ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුණේත් නැහැ. ඒ ව්‍යාපෘතිය නතර වුණා, පැවතිච්ච ආණ්ඩුවල තිබුණු ඒ වැරදි ප්‍රතිපත්ති සහ මූල්‍ය විනය පිළිබඳ ගැටලුව, දූෂණය සම්බන්ධයෙන් එල්ල වෙච්ච චෝදනාව නිසා. එහි අවසාන ප්‍රතිඵලය විධියට සිදු වෙලා තිබෙන්නේ මොකක්ද? ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙලාත් නැහැ. හැබැයි, ප්‍රමාද ගාස්තු විධියට බිලියන 60කට ආසන්න මුදලක් එම ව්‍යාපෘතියේ ණය විධියට නොව ප්‍රමාද ගාස්තුව විධියට ගෙවන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. ඉතින්, මෙන්න මෙවැනි අසාර්ථකවීම් ඇතුළේ තමයි පසුගිය කාලයේ ආණ්ඩුව ඉස්සරහට ගියේ. විපක්ෂය අද ජනතාවට විවිධ කථා කිව්වත්, මොන මොන දේවල් කිව්වත්, එදා ඒ වැරදි ආර්ථික ප්‍රතිපත්තිය ඇතුළේ රට දැවැන්ත අර්බුදයකට ගෙන ගොස් තිබුණා. ජාතික ජන බලවේගය ආණ්ඩුව අද නිවැරදි ආර්ථික ප්‍රතිපත්තියක් අනුව ආර්ථික ස්ථාවරත්වය ගොඩනගමින්, ඒ වාගේම නිවැරදි මූල්‍ය විනයක් නිර්මාණය කරමින්, එදා පැවතිච්ච ආණ්ඩු මේ රට පත් කරපු තත්ත්වය වෙනස් කරමින් මේ රට යම් ස්ථාවරත්වයකට ගෙන එන වටපිටාවක තමයි ඒ මූල්‍ය කළමනාකරණය ඇතුළේ

[ගරු චන්දන සූරියආරච්චි මහතා]

මේ පරිපූරක යෝජනාව අද ගෙන එන්නේ. විපක්ෂය තමන්ට වාසි ගන්න මෙය මොන විධියට අර්ථකථනය කරන්න උත්සාහ කළත් නිවැරැදි කාරණාව ඒකයි. අද මේ මුදල් අපි වඩාත් නිවැරැදි ව්‍යාපෘතිවලට ආයෝජනය කරනවා; ඒවා ක්‍රියාත්මක කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මතකයි, 2023දී මාධ්‍යවල පළ වුණු දෙයක්. ඒක මාධ්‍යයේ විතරක් නොවෙයි විගණන වාර්තාවකිනුත් කියැවුණා. ඒ තමයි, 2023 අවුරුද්දේ ලංගමට බස් ගෙනෙද්දී, කෝටි 300ක් වැඩිපුර ගෙවා තිබෙනවා කියන කාරණය. ඒ බව විගණන වාර්තාවකිනුත් හෙළි වෙලා තිබෙනවා. එතකොට බස් එකට රුපියල් ලක්ෂ 60යි; බස් 500ට රුපියල් කෝටි 300යි. මහජන මුදල් සම්බන්ධව ඒ විධියට තමයි එදා රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාත්, හිටපු ප්‍රවාහන අමාත්‍යවරුත් කටයුතු කරලා තිබෙන්නේ. මහජන මුදල් ඒ ආකාරයෙන් අවභාවිත කරමින් මේ රටේ මහ ජනතාවට සලසන්න තිබෙන සේවාවන් සහ පහසුකම් බිඳ වැටෙන ආකාරයට තමයි ඒ වකවානුව තුළ කටයුතු කරලා තිබෙන්නේ. නමුත්, වත්මන් ආණ්ඩුව විධියට අපි මේ ආර්ථිකය ශක්තිමත් කරමින්, ඒ වාගේම පැවතිච්ච ආණ්ඩුවල කෙරුණු මූල්‍ය අවභාවිතාවන් අවසන් කරමින් නිවැරැදි මූල්‍යකරණයක් ඇතුළේ මේ රටේ මහ ජනතාවගේ පහසුකම් ටික වැඩිදියුණු කරන්න අවශ්‍ය කටයුතු කරමින් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා ඇතුළු මේ උත්තරීතර පාර්ලිමේන්තුවත්, මේ රටේ ජනතාවත් දන්නවා, ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ විශේෂයෙන්ම දුම්රිය දෙපාර්තමේන්තුව "සිහින ගමනාන්තය" වැඩසටහන ඇතුළේ අපේ රටේ දුම්රිය පොළ 32ක් නවීකරණය කරලා දුම්රිය පාවිච්චි කරන අපේ රටේ දුම්රිය මගී ජනතාවට අවශ්‍ය සුව පහසුව නිර්මාණය කරන්න කටයුතු කරලා තිබෙනවා, ඒකට අවශ්‍ය කටයුතු කරමින් තිබෙනවා කියලා. ඒ වාගේම මේ වසරේ විශේෂයෙන්ම පරන්තන්, කිලිනොච්චි, මුලතිව් පාරේ පිහිටි ඒ පාලම ඇතුළු පාලම් 27ක් අලුතින් සංවර්ධනය කරන්න, ඉදිකරන්න අවශ්‍ය කටයුතු කරමින් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, විශේෂයෙන්ම අද ලංගමය ගත්තොත්, එය ඉතාම දුක්ඛිත ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ලංගම ඩිපෝවකට ගියොත් පෙනෙනවා, එහි සේවකයන්ට කෑම ටික කන්න තැනක් නැති බව; යන්න වැසිකිළියක් නැති බව. ඒ ඩිපෝ අන්ත අපායක තත්ත්වයට පත් කරලායි තිබෙන්නේ. එදා පැවතුණු ආණ්ඩු ලංගමය පාවිච්චි කළේ තමන්ගේ දේශපාලන රැස්වීම්වලට සේවකයන් ටික අරගෙන එන්නයි, තමන්ගේ දේශපාලන රැස්වීම්වලට නොමිලයේ බස් ටික ගෙන එන්නයි. හැබැයි, ජාතික ජන බලවේගය ආණ්ඩුව අද වන විට අවුරුද්දක කාලයක් අවසන් කරමින් තිබෙනවා. නමුත් අපි එක ලංගම සේවකයෙකුවත් දේශපාලන වුවමනා වෙනුවෙන් පාවිච්චි කරලා නැහැ. ලංගම බස් එකක්වත් නොමිලයේ තෙල් ගහලා දේශපාලන වැඩවලට ගෙනැල්ලා නැහැ. අද අපි ප්‍රවාහන අමාත්‍යාංශය විධියට ලංගම සේවකයන්ගේ පහසුකම් ටික වැඩි කරන්න, ලංගම ඩිපෝ 25ක් කාපට් අතුරා සංවර්ධනය කරන්න කටයුතු කරමින් සිටිනවා. ඒ ඩිපෝ සංවර්ධනය කරලා සේවකයන්ට පහසුකම් වැඩි කරන්නත්, බස් කර්මාන්තය වැඩිදියුණු කරන්නත්, ඒ වාගේම රාජ්‍ය ප්‍රවාහන සේවය ශක්තිමත් කරන්නත් අවශ්‍ය පියවර අපි ආණ්ඩුව විධියට ගනිමින් ඉන්නවා. ඒ වැඩසටහන යටතේ විශේෂයෙන්ම පිටකොටුව බස් නැවතුම් පොළ නවීකරණ ක්‍රියාවලිය සිදු කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව එක විනාඩියක් දෙන්න.

ඒ වාගේම, ගරු සභානායකතුමා සඳහන් කළා වාගේ, Lanka Metro Transit (Pvt.) Limited අද ආරම්භ වෙනවා. මේ ආදි වශයෙන් අපේ විශේෂ වැඩසටහන් ඇතුළේ අද ඒ කටයුතු ටික සිදු කරමින් යනවා. නව දුම්රිය බලවේග කට්ටල 5ක් සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබෙනවා. අර කිව්වා වාගේ දුම්රිය මැදිරිවල මගී පහසුකම් වැඩිදියුණු කරන්න විදුලි පංකා 5,000ක් ආනයනය කිරීම, සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කරනවා. මේ ආදි වශයෙන් මේ රටේ පොදු මගී ප්‍රවාහන සේවය භාවිත කරන මගී ජනතාවට අවශ්‍ය කරන පහසුකම් වැඩිදියුණු කිරීම, ඒ ප්‍රවාහන සේවා ශක්තිමත් කිරීම වාගේම ග්‍රාමීය මාර්ග ඇතුළු මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම ආදි සියල්ල සිදු කරනවා. ආණ්ඩුව විධියට අපි දැන් ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගෙන යන අතරතුර, පැවැති ආණ්ඩුවල වැරැදි ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් ඇති වෙච්ච ගැටලු නිරාකරණය කිරීම වෙනුවෙන් තමයි අද මේ පරිපූරක මුදල පිළිබඳ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. මෙය සම්මත කිරීම සඳහා මේ පාර්ලිමේන්තුවේ සහාය අපි අපේක්ෂා කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Dr.) Elayathamby Srinath. You have seven minutes.

[பி.ப. 1.19]

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, 2025ஆம் நிதியாண்டில் நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சுக்கு மேலதிக நிதியைப் பெற்றுக்கொள்வதற்கான குறைநிரப்புத் தொகை பற்றிய பிரேரணைமீது உரையாற்றச் சந்தர்ப்பம் தந்தமைக்காக நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன். மிக முக்கியமாக வடக்கு, கிழக்குப் பகுதியில், குறிப்பாக மட்டக்களப்பில் நிறைய விடயங்கள் இந்த அரசாங்கத்தால் நிறைவேற்றப்பட வேண்டியிருக்கின்றது. எங்களுடைய வேண்டுகோளுக் கிணங்க கிரான் பாலம் அமைப்பதற்காக அடுத்த வரவு செலவுத்திட்டத்தில் நிதி ஒதுக்கீட்டைச் செய்து மிகப் பாரிய வேலைத்திட்டமாக அதன் ஆரம்பப் பணிகளை ஆரம்பிக்க உறுதியளித்து, அதற்கான சாத்தியவள ஆய்வுகளை ஆரம்பித்தமைக்காக உண்மையில் கௌரவ அமைச்சர் அவர்களுக்கு நான் இந்த இடத்தில் நன்றியைத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். அதற்கப்பால், சிறிய பாலங்களைப் புனரமைப்பதற்காகக் கடந்த மாவட்ட

அபிவிருத்திக் குழுக் கூட்டத்திலே 250 மில்லியன் ரூபாய் ஒதுக்கீட்டைச் செய்வதாகத் தெரிவித்தமைக்காகவும் கௌரவ அமைச்சர் அவர்களுக்கு நன்றி கூறுகிறேன்.

நான் முதலில் குறிப்பிட்டதுபோன்று எமது வடக்கு, கிழக்குப் பகுதிகளிலே பல விடயங்கள் செய்ய வேண்டி இருக்கின்றது. குறிப்பாக, மட்டக்களப்பு மாவட்டத்தின் பின்தங்கிய பகுதிகளில் யுத்தத்துக்குப் பின்னர் பாரியளவில் உட்கட்டுமானப் பணிகள் செய்யப்பட வேண்டியுள்ளது. உதாரணமாக, மட்டக்களப்பு மேற்குப் பகுதியில் அமைந்திருக்கும் படுவான்கரைப் பகுதிகளிலே பல வசதிகள் இன்மையால் மக்கள் துன்பப்படுகின்ற நிலைமை இருக்கின்றது. அவற்றையும் இந்தக் குறைநிரப்புத் தொகை பிரேரணையிலோ அல்லது அடுத்த வருடத்துக்கான வரவு செலவுத்திட்டத்திலோ உள்வாங்கிக் கொள்வதன்மூலம் அந்த மக்களின் அடிப்படைத் தேவைகளை நிறைவேற்றித் தருமாறு கேட்டுக் கொள்கிறேன்.

கடந்த வரவு செலவுத்திட்ட ஒதுக்கீட்டிலிருந்து பல பஸ் தரிப்பு நிலையங்களைப் புனரமைப்பதற்கான செயற்றிட்டம் செயற்படுத்தப்பட்டபோதும், மட்டக்களப்பு மாவட்டத்திலே பல பஸ்தரிப்பு நிலையங்கள் இன்னும் மிக மோசமான நிலையில் இருக்கின்றன. அந்தத் திட்டத்திலும் மட்டக்களப்பு மாவட்டம் உள்வாங்கப்பட வேண்டும். குறிப்பாக, வாழைச்சேனை பஸ் depot மீள் புனருத்தானம் செய்யப்பட வேண்டிய தேவை இருக்கின்றது. அதற்கப்பால், ஏற்கனவே இணங்கப்பட்டதன்படி வாகரைப் பகுதியிலே sub-depot ஒன்று அமைப்பதற்கான வேலைகளை ஆரம்பிப்பதாகக் கூறப்பட்டபோதிலும், இன்றுவரை போக்குவரத்துத் திணைக்களம் அதற்காக எந்தவிதமான நடவடிக்கைகளையும் மேற்கொள்ளவில்லை. அது பற்றி கேட்டபோது, அதை இலாபம் இல்லாமல்தான் செய்து தரவேண்டியிருப்பதாகக் கூறப்பட்டது.

அதற்கப்பால், எமது பகுதிக்கான புகையிரதப் போக்குவரத்தை எடுத்துக் கொள்கின்றபோது, அதன் நேர அட்டவணை மாற்றம் பாரிய பிரச்சினையாக இருக்கின்றது. அதை மாற்றித் தருவதாக உறுதியளிக்கப்பட்டு இருக்கின்றது; அது எந்தக் காலப்பகுதியில் மாற்றியமைக்கப்படுமென்று தெரியவில்லை. அதுபோல, கிழக்குப் பல்கலைக்கழகம் அமைந்திருக்கின்ற பகுதியிலே railway substation ஒன்றை அமைப்பதாகக் கடந்த அபிவிருத்திக் குழுக் கூட்டத்திலே சொல்லப்பட்டாலும் அதற்குரிய நடவடிக்கைகளும் எடுக்கப்படவில்லை.

நான் இங்கு குறிப்பிட்டவாறு சிறிய பாலங்களை நிர்மாணிப்பதற்காக ஒதுக்கப்பட்ட ரூபாய் 250 மில்லியனில், ரூபாய் 230 மில்லியன்தான் இந்த வேலைத்திட்டங்களுக்காகக் கொண்டுவரப்பட்டிருக்கின்றது. மிகுதி ரூபாய் 20 மில்லியனையும் இந்தக் குறைநிரப்புப் பிரேரணை மூலமாவது உள்வாங்க வேண்டிய தேவையிருக்கின்றது.

மேலும், படுவான்கரையையும் எழுவான்கரையையும் இணைக்கின்ற பிரம்படித்தீவு, கிண்ணியடிப் பிரதேசத்தில் புதிதாக ferry service ஆரம்பிக்கப்பட வேண்டும். அதேபோன்று, பளுகாமம் மற்றும் களுதாவளையை இணைத்தும் ferry service ஆரம்பிக்கப்பட வேண்டும். இந்த விடயங்களை மேற்கொள்வதன்மூலம் அந்தப் பகுதிக்குரிய போக்குவரத்து வசதிகளை மேம்படுத்திக் கொள்ளக்கூடியதாக இருக்கும்.

அதற்கப்பால், கடந்த எங்களுடைய மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் கிரான் பாலம் சம்பந்தமான விடயங்கள் கதைக்கப்பட்டபோது மண்டூர், குருமண்வெளி, நாசிவன்தீவு, பன்குடாவெளி, நரிப்புல்தோட்டம் போன்ற பகுதிகளில் பாலங்கள் அமைப்பதற்காக ஆலோசனைகள் முன்மொழியப்பட்டிருந்தது. அவற்றுக்கான சாத்தியவள ஆய்வுகள் பல வருடங்களுக்கு முன்பு ஆரம்பிக்கப்பட்டிருந்த போதிலும் இப்போது அவை கைவிடப்பட்ட நிலையில் இருக்கின்றது. ஆகவே, எதிர்வரும் காலங்களில் அந்தச் சாத்தியவள ஆய்வு நடவடிக்கைகளை மேற்கொண்டு, இவ்வாறான நடவடிக்கைகளைச் செயற்படுத்துவதன்மூலமே எமது மட்டக்களப்பு மாவட்டத்திலே யுத்தத்தால் பாதிக்கப்பட்டு மீள்கட்டுமானம் மிகக் குறைவாக இருக்கின்ற இடங்களை நகரப் பகுதிகளோடு இணைக்க முடியும்.

அதைவிட, இன்னும் பல இடங்களிலே பொதுப் போக்குவரத்து வசதிகள் சீரின்மையாக இருப்பது மிகப் பாரிய பிரச்சினையாக இருக்கின்றது. எங்களுடைய ஒவ்வொரு பிரதேச அபிவிருத்திக் குழுக் கூட்டத்திலும் இது பாரிய பிரச்சினையாக மக்களால் முன்வைக்கப்படுகின்றது. நாமும் இது சம்பந்தமாக ஒவ்வொரு மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்திலும் முன்வைத்திருக்கின்றோம். எதிர்வரும் காலத்திலே இவ்வாறான அடிப்படை விடயங்களைச் சீராக முன்னெடுத்து, வசதிகளைச் செய்து கொடுப்பதன்மூலமே மக்களின் நம்பிக்கையைப் பெற்றுக்கொள்ளக் கூடியதாக இருக்கும்.

மட்டக்களப்பு மாவட்ட மக்களும் உங்களுடைய ஆட்சியிலே மிக நம்பிக்கை வைத்திருக்கிறார்கள். போதைப்பொருளுக்கு எதிரான மற்றும் ஊழலுக்கு எதிரான உங்களுடைய நடவடிக்கைகளை உண்மையிலே நாங்களும் வரவேற்கின்றோம். அதேவேளை, அபிவிருத்தி என்ற விடயத்திலே இலங்கையிலே ஏனைய இடங்களில் செய்யப்படுகின்ற அபிவிருத்திகளை எமது மாவட்ட மட்டத்திலும், யுத்தத்தால் பாதிக்கப்பட்ட எமது சமூகம் வாழுகின்ற பிரதேசங்களில் அதற்கு மேலதிகமாவும் மேற்கொள்ள வேண்டும். சுமார் 30 வருட யுத்த காலத்திலும் அதற்குப் பின்னரான காலப்பகுதியிலும் -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
Hon. Deputy Speaker, one more minute, please.

அங்கு போதியளவு கட்டுமான வசதிகள், உட்கட்டமைப்பு வசதிகள் ஏற்படுத்தப்பட்டிருக்கவில்லை. அவற்றை போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சின் இக்குறைநிரப்புப் பிரேரணை ஊடாகவும் எதிர்வரும் வரவு செலவுத்திட்டத்திலும் முன்னெடுக்க வேண்டுமென்று உங்களிடம் கேட்டுக்கொண்டு, செய்த விடயங்களுக்காக நன்றியையும் கூறிக்கொண்டு, மிக விரைவாக இந்த விடயங்களிலே நீங்கள் கவனத்தைச் செலுத்துவீர்கள் என்ற நம்பிக்கையுடன் எனது உரையை முடித்துக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next the Hon. Chamara Sampath Dasanayake. You have 11 minutes.

[අ.භා. 1.25]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ විවාදයට අදාළ පරිපූරක ඇස්තමේන්තුව ගැන මම වැඩිය කථා කරන්නේ නැහැ. මොකද, ආණ්ඩුව කලින්ම කිව්වා, පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරන්නේ නැහැ කියලා. මේක අපේ වැරැද්දක් නොවෙයි, ආණ්ඩුව තමයි කිව්වේ පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරන්නේ නැහැ කියලා. නමුත් දැන් පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන්න වෙලා තිබෙනවා. මොකද, බිල් ප්‍රමාද වෙනකොට පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන්න වෙනවා. ඒක අපි පිළිගන්නවා. හැබැයි, ආණ්ඩුව පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරන්නේ නැහැ කිව්වත් දැන් ඉදිරිපත් කරන්න වෙලා තිබෙනවා. නමුත් මම ඒ ගැන කථා කරන්නේ නැහැ.

ජනාධිපති වැය ශීර්ෂය සම්බන්ධව ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය අනිල් ජයන්ත මැතිතුමා එදා කිව්වා, ජනාධිපති වැය ශීර්ෂය රුපියල් මිලියන 11,600ට ගිහිල්ලා තිබෙන්නේ, අලුතින් "Clean Sri Lanka" එකට සහ පර්යේෂණයකට රුපියල් මිලියන 6,000ක් වෙන් කර තිබෙන නිසා කියලා. 2024දී රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ කාලයේ ජනාධිපති වැය ශීර්ෂයට වෙන් කර තිබුණේ රුපියල් මිලියන 6,600යි. ඒ තුළ තිබුණා divisions 10ක්. උදාහරණයක් වශයෙන් කිව්වොත්, විදේශ කටයුතු, "උරුමය" ඔප්පු ඇතුළු divisions 10ක් තිබුණා. නමුත් මෙතැන තිබෙන්නේ අලුත් divisions 2යි. Divisions 10කට තමයි එදා රුපියල් මිලියන 6,600ක් වෙන් කර තිබුණේ. හැබැයි, ඒකට divisions 2ක් අලුතින් එකතු කරලා,- *[බාධා කිරීමක් ]* නැහැ, නැහැ, අරමුදලක් නේ හැදුවේ. "Clean Sri Lanka" එකට සල්ලි දෙනවා කිව්වා නේ; රට විරුවෝ සල්ලි දෙනවා කිව්වා, අරයා දෙනවා කිව්වා, මෙයා දෙනවා කිව්වා. චෙක් 2ක්ද, 3ක්ද ගෙනැත් දුන්නා මුලින්. ඊට පස්සේ චෙක් ලැබුණෙත් නැහැ. නමුත්, "Clean Sri Lanka" අරමුදලට රුපියල් මිලියන 5,000ක් දාගෙන. ඊළඟට පර්යේෂණ කියලා මොකක්දෝ එකක් හදාගෙන ඒකට තව රුපියල් මිලියන 1,000ක්ද, එක්දහස් ගණනක්ද වෙන් කරගෙන, ඔක්කොම රුපියල් මිලියන හයදහස් ගණනක් දාගෙන තිබෙනවා. ඒකට කමක් නැහැ. ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයට වෙන් කරන සල්ලිත් යවන්නේ ඔය රාජ්‍ය නිලධාරින්ම තමයි. අරහෙට යැව්වත් එකයි, මෙහෙට යැව්වත් එකයි. කොහෙන්හරි කෙරෙනවා නම් කමක් නැහැ. කෙරෙන්නේ නැති එක තමයි තිබෙන ප්‍රශ්නය. ඒ නිසා ජනාධිපති වැය ශීර්ෂය ගැන මම වැඩිය කියන්න යන්නේ නැහැ.

ඊළඟට, අපේ අගමැතිතුමියත් මේ වෙලාවේ සභාවේ ඉන්න නිසා දණ්ඩ නීති සංග්‍රහයට ගෙනාපු සංශෝධනය ගැන කියන්න ඕනෑ. දැන් බලන්නකෝ, "පුදනකොටම කාපි යකා" කියලා ලෝක ළමා දිනය දවසේ මොනරාගල ගුරුවරයෙකුට ගැහුවා, මේ පනත් කෙටුම්පත සම්මත කරන්නත් කලින්. මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා කිව්වා, "අපි මේ පනත් කෙටුම්පත සම්මත කිරීම නැවැත්වූවා" කියලා. ජනාධිපතිතුමා එදා අස්ගිරියේ අනුනායක හාමුදුරුවන්ගේ උත්සවයට ගිහිල්ලා කිව්වා, ඕනෑ නම් මේ පනත් කෙටුම්පත සම්මත වෙන එක අපි නවත්වන්නම් කියලා. නවත්වනවා නම් මොන එකකටද මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා මේ පාර්ලිමේන්තුවේ ඒ ගැන දවසක් කථා කරලා, වියදම් කළේ? එහෙම කරන්න පනත් කෙටුම්පත් ගෙනෙන්න එපා. එහෙම reverse කරන්න එපා. මේ පනත් කෙටුම්පත reverse කරන්න එකම හේතුව තමයි, මේ සම්බන්ධයෙන් ආණ්ඩුවට බලපෑම් ආපු එක. ගුරුවරුන්ගෙන්, රටේ ජනතාවගෙන් විශාල බලපෑමක් ආපු නිසා තමයි මේ පනත් කෙටුම්පත reverse කරගත්තේ. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළාට පස්සේ මොනරාගල ගුරුවරයෙකුට ගැහුවා, ළමයි වගයක් කසිප්පු බිව්වා.

ගරු අගමැතිතුමියනි, මම මේ කියන කාරණය අහගන්න. බදුල්ල මහා විද්‍යාලයේ ඉගෙන ගන්න මේ ඉන්න කැබිනට් ඇමතිතුමාගේ පුතා e-cigarette එකක් බීලා අහුවුණා. ඔයගොල්ලන්ගේ පක්ෂයේ කැබිනට් ඇමතිතුමාගේ පුතා තවත් ළමයි හතරදෙනෙක් එක්ක e-cigarettes බීලා අහුවුණා. අපිවත් දන්නේ නැහැ e-cigarettes ගැන. ඒ, switch cigarette ද, මොනවාද මඟුලක්. E-cigarettes බීලා අහුවෙලා තිබෙනවා කැබිනට් ඇමතිගේ පුතා. ඊළඟට, නියෝජ්‍ය ඇමතිගේ දුව බදුල්ල මහා විද්‍යාලයේ ශිෂ්‍ය නායක මණ්ඩලයට ගත්තේ නැහැ කියලා මානව හිමිකම් ගිහිල්ලා, ගරු අගමැතිතුමියනි. ඊට පස්සේ ප්‍රින්සිපල් අසරණ වෙලා ඇය ශිෂ්‍ය නායකකමකට අරගෙන. මේ පාර්ලිමේන්තුවේ ඔයගොල්ලන්ගේ නියෝජ්‍ය ඇමති කෙනෙකුගේ දුවෙක්.

මේක තමයි අද තත්ත්වය. ඉතින්, කොහොමද මේ පනත් කෙටුම්පත් ගෙනෙන්නේ තමන්ගේ ළමයි හදාගන්න බැරිව? ආණ්ඩුවේ ඇමතිගේ ළමයා හදාගන්න බැරිව, කොහොමද මේ පනත් කෙටුම්පත් ගෙනැල්ලා සම්මත කරලා ආණ්ඩුවක් ගෙනියන්නේ? ඉස්සරවෙලා ඒ ළමයි හදාගන්න කියන්න. ඒක තමයි මට කියන්න තිබෙන්නේ.

ඊළඟට, රංග දිසානායක මහත්මයාගේ නම කියලාම මම මේ කාරණය කියනවා. රංග දිසානායක මහත්මයාට මම අභියෝගයක් කරනවා. එතුමා ගැන නන්දනලා,ඒගොල්ලන්ගේ JVP එකේ කට්ටිය කියපුවා අපට වැඩක් නැහැ. 2017දී මේ රටේ වෙච්ච ලොකුම හොරකම මොකක්ද? සිංගප්පූරුවේ ඉන්න අර්ජුන මහේන්ද්‍රන් කරපු බැංකු හොරකම තමයි ලොකුම හොරකම. ඒ වෙලාවේ කවුද හිටියේ? දැන් මගේ passport එක නතර කරලා තිබෙන්නේ. රංග දිසානායක මහත්මයා පිරිසිදු නම්,- එයා දැන් මාධ්‍යයට එනවා. නමුත් DG හැටියට මාධ්‍යයට එන්නත් බැහැ. හැබැයි, මාධ්‍යයට ඇවිත් ලොකු සංදර්ශන දමනවා. සංදර්ශන දැම්මාට කමක් නැහැ, 2017දී කොටුව මහෙස්ත්‍රාත් කවුද කියන එකත් කියන්න ඕනෑ. එයා නොවෙයි නම් කමක් නැහැ. එයා කියන්න ඕනෑ, 2017දී අර්ජුන මහේන්ද්‍රන්ගේ passport එක release කළේ කවුද කියලා, කොටුව මහෙස්ත්‍රාත්වරයා හැටියට.

මම මේ කාරණයත් කියන්න ඕනෑ. රංග දිසානායක මහත්මයාගේ පළමු නෝනා මහ බැංකුවේ. දෙවැනි නෝනත් මහ බැංකුවේ. ඔහුගේ දෙවැනි නෝනා අර්ජුන මහේන්ද්‍රන්ගේ මොන තනතුරද දැරුවේ කියන එකත් කියන්න ඕනෑ. මොකද, මේවා රටේ මිනිස්සු දැනගෙන ඉන්න ඕනෑ.

"බුදු සරණයි" කියලා ගහගෙන අනුරාධපුරේ ඉඳලා ලොරියක් එනවා. "බුදු සරණයි" කියලා ගහපු ඒ ලොරිය ඇරලා බලනකොට, ඒ ලොරියේ හරක් ඉන්නේ; මරන්න ගේන හරක්. පිරිසිදු නම් හැම මිනිහාම පිරිසිදුව ඇවිල්ලා කථා කරන්න ඕනෑ. පිරිසිදුව තනතුරු දරන්න ඕනෑ. අනෙක් අයට ඇඟිල්ල දිගු කරන්න ඉස්සෙල්ලා තමන් පිරිසිදු වෙලා ඉන්න කියලා මේ DG මහත්තයාට මම මේ වෙලාවේදී මතක් කරනවා. මගේ නඩු තුනක් තිබෙනවා. දැන් මම මේක කිව්වාට පස්සේ අනිවාර්යයෙන් මට ලබන මාසයේ අධි චෝදනා ගොනු කරනවා කියලා මම දන්නවා. දැන් මම මේක කිව්වාට පස්සේ මගේ නඩු තුනටම මට අධි චෝදනා භාරදෙනවා. මට ඒක ප්‍රශ්නයක් නැහැ. මොකද, මේවා කවුරුත් දැනගන්න ඕනෑ.

ඊළඟ කාරණාව මෙයයි. ගරු අගමැතිතුමියනි, ස්විට්සර්ලන්තයේ ජිනීවාවල වෙළෙඳ සමුළුව පැවැත්වෙනවා. වෙළෙඳ ඇමතිතුමා මේකට යනවා. හැබැයි වෙළෙඳ ඇමතිතුමා එක්ක තව නවදෙනෙකුත් මේකට යනවා. ස්විට්සර්ලන්තයේ ජිනීවාවල තිබෙන වෙළෙඳ සමුළුවට නවදෙනෙක් යනවා. ඒ නම් ලැයිස්තුව මා ළඟ තිබෙනවා. මේ නවදෙනා අතරේ එක කාන්තාවකුත් ඉන්නවා. ඔවුන් දැන් යන්න සූදානම්. ලබන සතියේද කොහේද යනවා. කවුද මේ? PRO නිමෝදි වික්‍රමසිංහ. ඇමතිතුමාගේ PRO. ඇයත් මේ trip එක යන්න ඉන්නවා. මට තිබෙන ප්‍රශ්නය මේකයි. රාජ්‍ය නිලධාරින් ඒකට ගියාට කමක් නැහැ. මේ නිමෝදි වික්‍රමසිංහ යන්නේ ඇයි කියන එක පිළිබඳව අපිට ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, අපි මොකක් හරි රටකට ගියාම කී දෙනෙක් ගියාද, කවුද ගියේ, කවුද ආවේ කියලා අපෙන් ඇහුවා නේ. මේ වාගේ ප්‍රශ්න තිබෙනවා. ලබන සතියේද කොහේද තමයි මේකට යන්න තිබෙන්නේ. මේ PROsගේ නම ලැයිස්තුවේ තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ජනාධිපතිතුමාට යවපු ලියුමක් තිබෙනවා. අනුමත කරගත්ත ලියුමක් තිබෙනවා. මේ විධියට, නිමෝදි වික්‍රමසිංහ කියලා එක්කෙනෙකුත් යනවා.

අපි මේ වෙලාවේ මේකත් ආණ්ඩුවට කියනවා. ඊයේ ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේදී මගෙන් ඇහුවා, "සම්පත්, ඇයි අපේ ආණ්ඩුවට ලෙඩ දාන්නේ?" කියලා. නැහැ, අපි ලෙඩ දාන්නේ නැහැ, ජනාධිපතිතුමනි. ජනාධිපතිතුමා දූර්වල නැහැ, ජනාධිපතිතුමාගේ ගෝලයෝ දූර්වලයි. එතුමාගේ ගෝලයෝ පිස්සු කෙළිනකොට, ඒ පිස්සුව අපි පෙන්වලා දෙන්න ඕනෑ. විපක්ෂයක් හැටියට ඒ අඩුපාඩු අපි පෙන්වලා දෙන්න ඕනෑ. ඒකට තමයි විපක්ෂය ඉන්නේ. එහෙම නැතුව විපක්ෂයක් ඉන්නේ "පරිපූරක ඇස්තමේන්තුවක් දමන්න, ඒක හොඳයි" එහෙම කියන්න නොවෙයි. විපක්ෂය ඉන්නේ ඒ අඩුපාඩු පෙන්වලා දෙන්න. ඒක, එක කාරණයක්.

ඊළ කාරණය මේකයි. දොස්තර මහත්වරුත් එක්ක හැප්පෙන්න යන්න එපා. ඒ මිනිස්සු ස්ටිකර් බැරිනම් ඕනෑ එකක් ගහගෙන ගියදෙන්. දොස්තරලාගේ ස්ටිකර් ගලවන්න කියනවා, නීතිඥයන්ගේ ස්ටිකර් ගලවන්න කියනවා. දෙයි හාමුදුරුවනේ! ඔයගොල්ලන්ට තමයි සියයට 90ක් දොස්තරලා ඡන්දය දුන්නේ, proctorsලා ඡන්දය දුන්නේ. ඒ මිනිස්සු ඕක ගහගෙන ගියදෙන්කෝ. බදුල්ලේ ඉස්පිරිතාලෙට ඉන්නේ විශේෂඥ වෛද්‍යවරු තුන්දෙනායි, හතරදෙනායි. හදිසි ලෙඩෙක් ආවාම ඔවුන් රෑ දොළහටත් දුවගෙන එනවා. ඒ මිනිස්සු වැලිමඩට යන්න ඕනෑ, දියතලාවට යන්න ඕනෑ. ඉතින් ඒ මිනිත්සු ඕක ගහගෙන ගියාම මොකක්ද වෙන්නේ? මේ ඉල්ලන් කන ඒවා නේ. මේවා ගැන නේ, අපි කියන්නේ. අපි මේවාට විරුද්ධව මොකුත් කියන්නේ නැහැ නේ. ඕනෑ නැති දේවල් දාගන්න එපා.

ඊළඟට, සරත් ෆොන්සේකා ගැනත් මම කියන්න ඕනෑ. සරත් ෆොන්සේකා දැන් මහින්ද රාජපක්ෂ මහත්මයාව කකුල් දෙකෙන් එල්ලන්න හදනවා. මහින්ද රාජපක්ෂ මහත්මයාව එල්ලන එක සාධාරණයි කියමුකෝ. මොකද, මහින්ද රාජපක්ෂ මහත්මයා ෆොන්සේකාව හිරේ දාපු නිසා ඒක සාධාරණයි කියලා කියන්න පුළුවන්. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ජනාධිපතිවරණයෙන් දිනපු ගමන්ම සරත් ෆොන්සේකාව ෆීල්ඩ් මාර්ෂල් කළා. මාසයක් යනකොට තමන්ව ෆීල්ඩ් මාර්ෂල් කළ මිනිහාව -මෛත්‍රීපාලවත්- කකුල් දෙකෙන් එල්ලන්න ගියා නේ, සරත් ෆොන්සේකා. මාර පොරක් නේ. ඒ මදිවට ගිය සැරේ පොහොට්ටුවට රැල්ල ඇවිල්ලා තියෙද්දි, වැලේ වැල් නැතුව ඉඳලා සමගි ජන බලවේගයට ජේත්තු වුණා. වැලේ වැල් නැතුව හිටියේ. සමගි ජන බලවේගයෙන් ගිය සැරේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා සජිත් එක්කත් ඇරගත්තා. විපක්ෂයේ සජිත් එක්ක එකට ඉන්න බැරි වුණා. එතැන නායකයා වෙන්න ගියා.

ඊට පස්සේ මොකද වුණේ? ගරු අගමැතිතුමියනි, 2010දී ෆොන්සේකා පැරදිලා කොළඹ තරු පහේ හෝටලයක හැංගිලා හිටියේ. ෆොන්සේකාව ආරක්ෂා කරන්න රනිල් වික්‍රමසිංහ තමයි ගිහිල්ලා "බය නැතුව වරෙන් යකෝ" කියලා ෆොන්සේකාව කාමරයෙන් එළියට ඇදලා ගත්තේ. එහෙම තමයි ෆොන්සේකා එළියට ගත්තේ. ඒක මට හොඳට මතකයි. නැත්නම් ෆොන්සේකා 2010 ඡන්දෙන් පැරදිලා හැංගිලා හිටියේ. එහෙම මිනිහෙක් වෙච්ච ෆොන්සේකා රනිල්වත් එල්ලන්න ගියා, මෛත්‍රීවත් එල්ලන්න ගියා, සජිත්වත් එල්ලන්න ගියා. මහින්ද රාජපක්ෂ මහත්මයාව එල්ලන්න ගිය එක සාධාරණයි කියමුකෝ. හිර ගෙදර ඉන්න නෙවිල් ඔය ෆොන්සේකාගේ කතන්දර ඔක්කෝම දන්නවා. හිර ගෙදර ඉන්න නෙවිල්ට පින් සිද්ධ වෙන්න තමයි ෆොන්සේකා ඔය තැනට ගියේ. අපි ඒක හොඳට දන්නවා. නෙවිල් ආමි ඒකේ කැප්ටන්, කර්නල් වෙනතෙක්ම නෙවිල්ට උසස්වීම් දුන්නේත් ෆොන්සේකා. ඒකත් මම දන්නවා. ෆොන්සේකා තමයි ඒ කපුකම කරලා නෙවිල් එක්ක සම්බන්ධතා පවත්වාගෙන ගියේ. ඒකෙන් තමයි මහින්ද රාජපක්ෂ මහත්මයාව අල්ලා ගත්තේ. එහෙම මනුස්සයෙක් තමයි අද මේ මිනිස්සු එල්ලන්න හදන්නේ, ගරු කථානායකතුමනි.

ඊළඟ එක තමයි, සමලිංගික ප්‍රශ්නය. ඒක මේ අගමැතිතුමිය ගෙනාපු එකක්වත්, මේ මන්ත්‍රීවරු ගෙනාපු එකක්වත්, ජනාධිපතිතුමා ගෙනාපු එකක්වත් නොවෙයි. අපි ඒක දන්නවා. කොහේදෝ ඉන්න සභාපති කෙනෙකුට පුළුවන්ද තනි තීරණ ගන්න? එහි වගකීම සභාපතිට පැහැර හරින්න බැහැ, අගමැතිතුමියනි. සභාපති කෙනෙක් පත් කරන්නේ කවුද? ගරු නියෝජ්‍ය ඇමතිතුමා සභාවේ ඉන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, සභාපතිවරයා නම් කරලා ජනාධිපතිතුමාට යවන්න ඕනෑ. ජනාධිපතිතුමා තමයි සභාපති පත් කරන්නේ. සභාපති වගකීම් පැහැර හැරියා කියන්න බැහැ. සභාපති එළවන්න. සභාපතිට පුළුවන්ද තනියෙන් ආණ්ඩුවක තීරණ ගන්න? අනෙක් එක, ඔබතුමන්ලාගේ ආණ්ඩු පක්ෂයේ අය එකතු වනවා නේ. දැන් සමහර ප්‍රශ්නවලදී කියනවා, හොඳ යෝජනා ආවාම ඒවා ආණ්ඩුවේ. නරක යෝජනා ආවාම මොනවාද කියන්නේ? ගරු අගමැතිතුමියනි, ගම්වලට ප්‍රචාරය යවලා තිබෙන්නේ. නරක යෝජනා අගමැතිතුමියගේ. නරක යෝජනාවක් ආවාම කියනවා, "ඒක දාලා තිබෙන්නේ අගමැතිතුමියගේ කණ්ඩායම" කියලා. එහෙම තමයි ගම්වලට මෙතුමන්ලාගේ මූලස්ථානයෙන් ප්‍රචාරය යවන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chamara Sampath Dasanayake, your time is up.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මූලස්ථානයෙන් ප්‍රචාරය යවන්නේ එහෙම තමයි. ගම්වලට ගියාම අපටත් කට්ටිය හම්බ වෙනවා නේ. මේ ළඟදී මට වැලිමඩදී ගුරුවරයෙක් හම්බ වුණා. ඔහු කියනවා, "දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම අගමැතිතුමියගේ වැඩක් නේ" කියලා. දැන් අගමැතිතුමිය තමයි බිල්ලට දෙන්නේ. මෙහෙම කරන්න බැහැ. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කලින් ආණ්ඩු පක්ෂයෙන් රැස්වීමක් තියලා ඔබතුමන්ලා එතැනදී මේවා ඉදිරිපත් කරන්න. ඒ සභාපතිවරයාව එළවන්න කියන්න. සභාපතිවරයාව එළෙව්වා නම් ප්‍රශ්නය ඉවරයි නේ. ඒ වාගේ ඔබතුමන්ලා කර ගන්නා නොයෙකුත් දේවල්වලට අපට චෝදනා කරන්න එපා. ජනාධිපතිතුමා ඊයේ හම්බ වෙලා මට කියනවා, "මේ චාමර, ලෙඩ දාන්න එපා ආණ්ඩුවට" කියලා. අනේ ජනාධිපතිතුමනි, අපි ලෙඩ

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

දාන්නේ නැහැ. ඔබතුමන්ලා අවුරුදු පහක් කරගෙන යන්න. අපට ප්‍රශ්නයක් නැහැ. ලෙඩේ ඇදගෙන, වැඩේ නාගෙන, වට්ට ගත්තාම අපට නොවෙයි නේ ප්‍රශ්නය තිබෙන්නේ. වට්ට ගන්නේ ඔබතුමන්ලා නේ. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා ගරු සභාවේ ඉන්නවා. *[බාධා කිරීමක්]* ආ, එතුමා නොවෙයි, ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නේ. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයට මිලියන 750ක් දීලා තිබෙනවා. බොහොම හොඳයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chamara Sampath Dasanayake, your time is up.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මට තත්පරයක්, දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමාට විපක්ෂයෙන් විනාඩි දෙකක් දෙනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
එතුමා විනාඩි දෙකක් දුන්නා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මහා භාණ්ඩාගාරයෙන් කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයට මිලියන 750ක් දීලා තිබෙනවා. මාර සතුටුයි. හැබැයි, මේ රට ආර්ථික අර්බුදයට වැටුණු වෙලාවේ රාජ්‍ය ඇමතිවරයා හැටියට කටයුතු කරනකොට මිලියන 950ක් මහා භාණ්ඩාගාරයට දීපු මිනිහෙක් තමයි මේ චාමර සම්පත් දසනායක. අපිත් වැඩ කරලා තිබෙනවා. ඔබතුමන්ලාත් වැඩ කරන්න. වැඩ පුරුදු වෙන්න. පුරුදු වෙලා වැඩ ටික කරගෙන යන්න.

අද මිලියන තිස්හයදහස් ගණනක පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළා. එය සම්මත වනවා. දැන් පාරවල් ටික හදන්න. දැන් මම මෙතැන ඉන්න අපේ පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ ගරු අම්බිකා සාමුවෙල් මන්ත්‍රීතුමියගෙන් ඇහුවා, "කොහොමද මන්ත්‍රීතුමිය, වැඩ ටික එහෙම කරගෙන යනවාද?" කියලා. එතුමිය කිව්වා, "ඔව්" කියලා. බොහොම සතුටුයි. ගෝනමොටාව මාර්ගය කාපට් කරනවා. තවත් පාරවල් කාපට් කරනවා. අන්න, ඒවාට අපි සතුටුයි. අපි ඒවාට ඊර්ෂ්‍යා කරන්නේ නැහැ. අපි ඒවාට අකුල් හෙළන්නේ නැහැ. අපි උද්ඝෝෂණවලට ගිහිල්ලා පොහොර දාන්නේ නැහැ; අපි ගිහිල්ලා ලාම්පු තෙල් ගහන්නේ නැහැ; අපි පෙට්‍රල් ගහන්න යන්නේ නැහැ. ඔබතුමන්ලා වාගේ අපි එවැනි වැඩ කරන්නේ නැහැ. අපි දොස්තරවරු අවුස්සන්නවත්, ගුරුවරු අවුස්සන්නවත් යන්නේ නැහැ. අපි ඒ වාගේ දෙකයි පනහේ වැඩ කරන්නේ නැහැ. මම ගුරුවරියක්ව දණ ගැස්සුවා කියලා සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා ඒ වෙලාවේ මට ලොකුවට මඩ ප්‍රහාර එල්ල කළා. හැබැයි, කාගේවත් දරුවෙක් වෙනුවෙන් මම මහා විද්‍යාලයට යන්නෙත් නැහැ. මම ඒක අවුස්සන්නෙත් නැහැ. හැබැයි, දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත ගෙනාපු නිසා නම නොකියා හෝ මම මේ කාරණය කියන්න ඕනෑ.

තමන්ගේ ළමයි හදා ගන්න බැරි නම් අනුන්ගේ ළමයින් හදන්න දණ්ඩ නීති සංග්‍රහය වෙනස් කරලා බැහැ. තමන්ගේ ළමයි හදා ගන්න තමන් දැන ගන්න ඕනෑ. ආණ්ඩුව දැන ගන්න ඕනෑ. ඒ නිසා තමයි අපි මේ ආණ්ඩුවට කියන්නේ, කවුරු රට එක්කන් ගියත් අපට ප්‍රශ්නයක් නැහැ. එක්කරගෙන යන්න. අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, අනෙක් අයට අර විධියට කියන්න එපා. අනෙක් අයගේ වැරදි කියන්න එපා. දැන් ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, අපි පනත් කෙටුම්පතට අකුල් හෙළනවා ලු. පසුගිය ආණ්ඩුව ගැන දැන් කියලා වැඩක් නැහැ, මහත්තයෝ! ඒවා දැන් පරණ වෙලා, අද්භූත වෙලා, කුජීත වෙලා ඔක්කෝම වෙලා ඉවරයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chamara Sampath Dasanayake, your additional minutes are also over.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
දැන් අපේ කාලය ගැන කියලා වැඩක් නැහැ. දැනුත් කියනවා, "පසුගිය ආණ්ඩුවේ බර ලු, මේ අදින්න තිබෙන්නේ" කියලා. ගිය ආණ්ඩුවේ බර නොවෙයි. ආණ්ඩු බලය ගත්තාම ඕනෑම කෙනෙකුට මේක වෙනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව යවලා අපට බලය දුන්නත් අපටත් ඒකම වනවා. ඇයි? ඊළඟට Budget එක ඉදිරිපත් කරන්න ඕනෑ, මුදල් වෙන් කර ගන්න ඕනෑ. ඒ වන කල් කොයි ආණ්ඩුවටත් ඒක වනවා. ඒක තේරුම් ගන්න. ඔබතුමන්ලාට මාර්තු මාසය වනකොට Budget එක ඉදිරිපත් කරන්න සිද්ධ වුණා. ඒක අපි පිළිගන්නවා. හැබැයි, කවුරු බලය ගත්තත් කොයි ආණ්ඩුවටත් ඒක කරන්න වෙනවා. එම නිසා ඒවා තේරුම් අරගෙන වැඩ කරන්න කියන පණිවුඩය දෙමින්, මා නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Prime Minister. You have 14 minutes.

[අ.භා. 1.40]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
අද ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට අදාළව පරිපූරක මුදලක් වෙන් කිරීමේ යෝජනාව ගැන කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේක හරියට තේරුම් ගන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේක අය වැයට පිටින් යම් මුදලක් අනුමත කිරීමක් නොවෙයි. දැනට වෙන් කරපු මුදලක් වෙන කාර්යයක් සඳහා අනුමත කර ගැනීමක් සඳහා තමයි මේ පරිපූරක මුදල් යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඇත්තවශයෙන්ම අපි දකිනවා, මේ විධියට තමයි දේවල් සිද්ධ විය යුත්තේ කියන එක. ඒ කියන්නේ අමාත්‍යාංශයක විනිවිදභාවය පිළිබඳවත්, මුදල් පාලනය පිළිබඳවත් මේක හොඳ නිදර්ශනයක් කියලා මම හිතනවා. අවුරුද්ද අවසානයේදී යම් කිසි ව්‍යාපෘතියක් කිරීමට

බාධා තිබෙන විට ඒක මේ විධියට යෝජනාවක් හරහා වෙන අමාත්‍යාංශයකට යොමු කර ගැනීම තමයි මේ කරන්නේ. අපට මතකයි, ඉස්සර මේ දේවල් සිද්ධ වෙච්ච හැටි. අය වැය යෝජනා අනුව නොවෙයි බොහෝ වෙලාවට වැඩ කෙරුණේ. දැන් අපි ඒක වෙනස් කරලා තිබෙනවා. ඒ නිසා මේක ආණ්ඩුකරණය පැත්තෙන් ඉතාම හොඳ පියවරක් හැටියට මම දකිනවා.

අපි දන්නවා, සාමාන්‍යයෙන් මහජනතාව අතර පොදු ප්‍රවාහනයත්, මහාමාර්ග පිළිබඳවත් තිබෙන්නේ හොඳ ආකල්පයක් නොවෙයි කියා. "හොරුන්ගේ පාරාදීසයක්, සල්ලි හොයන අමාත්‍යාංශයක්, වංචාව හා දූෂණය ඉහළින්ම තිබෙන අමාත්‍යාංශයක්" හැටියට තමයි මේ අමාත්‍යාංශය සමාජගත වෙලා තිබෙන්නේ. නමුත්, මේ වෙනකොට ඒ ආකල්පය වෙනස් කරමින්, ඒ දූෂණ වංචාවලටත් එරෙහිව නැවත වතාවක් අතිශයින්ම වැදගත් වන කාර්යයන් දෙකක් ලෙස පොදු ප්‍රවාහනය සහ මහා මාර්ග කියන ජනතාවට අත්‍යවශ්‍ය යටිතල පහසුකම් ලබා දෙන මේ අමාත්‍යාංශය දැන් ක්‍රමානුකූලව ගොඩනඟමින්, ක්‍රමානුකූලව ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් ක්‍රියාත්මක වන අමාත්‍යාංශයක් බවට පත් වෙමින් තිබෙනවා. මෙහි ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. අපි දන්නවා, අපි බලාපොරොත්තු වෙන තැන නොවෙයි ඒ සේවා තිබෙන්නේ කියන එක. නමුත් ඒ ප්‍රශ්න හරියට හඳුනා ගෙන, හඳුනා ගත් ප්‍රශ්නවලට උත්තර හොයමින් යන ගමන මම හිතන්නේ ප්‍රශංසනීයයි.

පරිපූරක මුදලක් වෙන් කරන යෝජනාව සම්බන්ධව විවාද කරන මේ මොහොත ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය මීට වඩා ජනතාවාදී වෙන්නත්, ජනතාවට දෙනු ලබන සේවාව තව කාර්යක්ෂම කර ගන්නත් අදහස් කිහිපයක් එකතු කර ගන්න හොඳ අවස්ථාවක් හැටියට මා දකිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තවශයෙන්ම මේ පරිපූරක මුදල වෙන් කිරීමේ යෝජනාවත් ගෙනෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ මේ නිසායි. අපි ආර්ථික අර්බුදය ගැන කථා කරනකොට, ආර්ථික අර්බුදය නිසා මිනිස්සුන්ට, මේ රටට වෙච්ච හානිය ගැන කථා කරනකොට අපි දන්නවා, ආර්ථික අර්බුද ඇති වෙන්නත් ප්‍රධාන හේතු වුණේ මොනවාද කියලා. ඒ, මුදල් කළමනාකරණයේ තිබුණු දුර්වලතා, ව්‍යාපෘති හඳුනා ගැනීමත්, ව්‍යාපෘති කොන්දේසිවල තිබුණු දුර්වලතා නිසාත් තමයි අපට ආර්ථික අර්බුදවලට මුහුණ දෙන්න සිද්ධ වුණේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා තමයි අතිශයින්ම වැදගත් වන ප්‍රවාහන, මහාමාර්ග වැනි ක්ෂේත්‍රවලටත් මේ බලපෑම එල්ල වී තිබෙන ආකාරය අපට දකින්න තිබෙන්නේ. ඒ වාගේම අපට පසුගිය අවුරුද්ද පුරාම ඒ තත්ත්වය දකින්න තිබුණා. දුරදිග හිතා නොබලා කරපු දුර්වල ව්‍යාපෘති නිසා, එහෙම නැත්නම් ඒ ව්‍යාපෘතිවල තිබුණු දුර්වලතා, conditionsවල තිබුණු දුර්වලතා, රටේ ජනතාව ගැනවත්, රටේ මුදල් කළමනාකරණය ගැනවත් හිතන්නේ නැතිව ගත් තීන්දු-තීරණ නිසා, අතිශයින් පෞද්ගලික හේතු මත, එහෙම නැත්නම් වංචාව දූෂණය මුල් කරගෙන ගත් ඒ තීන්දු-තීරණ නිසා ඒ ව්‍යාපෘතිවල කටයුතු ඉදිරියට ගියේත් නැහැ, ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක වුණේත් නැහැ.

එවැනි ප්‍රශ්න ගණනාවක් තිබුණා. මම හිතන විධියට මේ අමාත්‍යාංශයේ විතරක් නොවෙයි, හැම අමාත්‍යාංශයක් තුළම අපි ඒ තත්ත්වය දැක්කා. මේ අවුරුද්ද පුරාම අපට සිද්ධ වුණා, අතරමං වෙච්ච ව්‍යාපෘති, නතර වෙච්ච ව්‍යාපෘති, හිර වෙච්ච ව්‍යාපෘති වෙනුවෙන් නැවත වතාවක් මුදල් වෙන් කරන්න. ඒ විතරක් නොවෙයි. සමාලෝචනය කරලා හෝ මොකක් හරි විධියකට මේ ව්‍යාපෘති ඉවර කරන්නත් අපට සිද්ධ වුණා. මේ සියල්ලම මේ ආර්ථික අර්බුදයේ තවත් එක පැතිකඩක් - වැඩිය කථා නොවන පැතිකඩක්. ආර්ථික අර්බුදයට හේතු වෙච්ච කාරණා ගණනාවක් මේ ව්‍යාපෘති තුළ අපි දකිනවා. ඒ නිසා මේ වෙලාවේත් අපි උත්සාහ කරන්නේ මෙම පරිපූරක මුදල් වෙන් කරගෙන ඒ ගොඩදාන්න බැරි වෙච්ච, ඉවර කරගන්න බැරි වෙච්ච, හැබැයි අපට ඇදගෙන යන්න සිදුවෙලා තිබෙන මේ ව්‍යාපෘති මේ රටට, මේ රටේ ජනතාවට අවම හානියක් වෙන විධියට අවසන් කරන්නයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහනය ගැන කථා කරනකොට පොදු ප්‍රවාහනය කියන එක ජනතාවට අතිශයින්ම වැදගත් ක්ෂේත්‍රයක් බව කිව යුතුයි. ඒ කියන්නේ, ජනතාවට තමන්ගේ ගමන් බිමන් යෑමට තිබෙන පහසුකම්වල ආරක්ෂිතභාවය, කාර්යක්ෂමතාව යන සියල්ල අතිශයින්ම වැදගත්. ඒ වාගේම මෙහිදී අපට විශේෂ වන කණ්ඩායම් ඉන්නවා. දරුවන්, කාන්තාවන්, වැඩිහිටියන්, ආබාධ සහිත ප්‍රජාව කියන සියලුදෙනාට ප්‍රවාහන පහසුකම් ලබාගන්න පුළුවන් විධියට, පොදු ප්‍රවාහනයට ප්‍රවේශයක් තිබෙන විධියට මේ ක්ෂේත්‍රය දියුණු වීම අතිශයින්ම වැදගත්. ඒ සඳහා මේ අමාත්‍යාංශය ගන්න පියවර අපි ඉතා අගයකොට සලකනවා.

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මේ වෙනකොට යෝජනා ගණනාවක් ප්‍රවාහන අමාත්‍යාංශයට ඉදිරිපත් කරලා තිබෙනවා. අධ්‍යාපනය දියුණු කරනකොට පාසල්වලට දරුවන්ගේ ප්‍රවේශයත් අපි තහවුරු කරන්න ඕනෑ. ඒ සඳහා සම අවස්ථා හදලා දෙන්න ඕනෑ. පාසල්වල යටිතල පහසුකම් දියුණු කරනවා කියන්නේ, බිල්ඩින් එකක් හදන එක විතරක් නොවෙයි. පාසලට එන මාර්ගය දියුණු කිරීම, ඒ පාසලට එන්න තිබෙන පොදු ප්‍රවාහන සේවය දියුණු කිරීම, ඒ පොදු ප්‍රවාහන සේවයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම, ඒ ප්‍රවාහන සේවයේ ආරක්ෂාව තහවුරු කිරීම ආදී සියලු දේ අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව යටිතල පහසුකම් දියුණු කිරීමේ කොටසක් හැටියට අපි දකිනවා. අපි සතුටු වෙනවා, ප්‍රවාහන අමාත්‍යාංශයත් එක්ක අපට මේ සාකච්ඡාව ආරම්භ කරන්න පුළුවන් වීම ගැන.

අපි යෝජනා ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. විශේෂයෙන්ම දුර පළාත්වල තිබෙන ගම්බද පාසල්වල, මාර්ග පහසුකම් හරියට නැති ප්‍රදේශවල පාසල්වල දරුවන්ගේ ප්‍රවාහන අයිතිය තහවුරු වෙන විධියට මේ ක්ෂේත්‍රය දියුණු වෙන්න ඕනෑ. අපි ඒ පාසල් හඳුනාගෙන, ඒ පාසල්වලට ප්‍රවේශ වෙන මාර්ග හරියට හඳුනාගෙන, ඒ මාර්ගවලට අවශ්‍ය පොදු ප්‍රවාහන සේවා හඳුනාගෙන ඒවා දියුණු කරන්න ප්‍රවාහන අමාත්‍යාංශය එක්ක මේ වෙලාවේ සාකච්ඡාවක් ආරම්භ කරලා තිබෙනවා. ඒ සම්බන්ධව ගරු අමාත්‍යතුමාත්, නියෝජ්‍ය අමාත්‍යවරුනුත් දක්වා තිබෙන ප්‍රතිචාර ගැන මම එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම පාසල් සේවා බස්රථවල එහෙම නැත්නම් දරුවන් පාවිච්චි කරන පොදු ප්‍රවාහන සේවාවල ආරක්ෂිතභාවය තහවුරු වෙන්න තිබිය යුතු අවම පහසුකම්, ගුණාත්මකභාවය, ඒවා නියාමනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම ගැනත් අපි සාකච්ඡා කරමින් යනවා. අපි හිතනවා, දරුවන් පාවිච්චි කරන ප්‍රවාහන පහසුකම් තුළ අවම කොන්දේසි කිහිපයක් අපි තහවුරු කර දිය යුතුයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉස්සර SLTB එකේ එහෙම ආකල්පයක් තිබුණු බව අපට මතකයි. දරුවන්ව ආරක්ෂා වෙන විධියට කටයුතු කරපු කොන්දොස්තරවරුන්, රියදුරන් හිටියා. ඒ ගුණාත්මකභාවය එදා ඔවුන් තුළ තිබුණා. ඒ රියදුරන් එදා කළේ පාරේ බස් එක පදවාගෙන ගිය එක විතරක් නොවෙයි. ඔවුන් ඒ බස් රථයේ ගමන් කළ මගීන් ආරක්ෂා කිරීමට කැපවුණා. ඒ ආකල්පය එදා ඔවුන් තුළ තිබුණා.

ඒ ආකල්පමය වෙනසත් අපට මේ වෙලාවේදී අවශ්‍යයි. තමන්ගේ බස් එකේ යන මගීන් වෙනුවෙන් දක්වන ඒ වගකීම,

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

කැපවීම සහ ආකල්පමය වෙනසත් අපට අවශ්‍යයි. අපි දකිනවා, ඒ ආකල්ප දියුණු කරන්න මේ වෙලාවේදී හොඳ උත්සාහයක් ගනිමින් සිටින ආකාරය. හැබැයි, අපට තව ප්‍රශ්න ගණනාවක් තිබෙන බව අපි දන්නවා. ආබාධ සහිත ප්‍රජාවට කොයි විධියේ පහසුකම්ද තිබෙන්නේ, අපේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට මොන වාගේ පහසුකම්ද තිබෙන්නේ, ඔවුන්ට බස්වල විතරක් නොවෙයි, දුම්රිය ස්ථානවල වාගේම දුම්රිය තුළත් මොන වාගේ පහසුකම්ද තිබෙන්නේ කියන මේ සියල්ලම දිහා අපි බලන්න ඕනෑ. ඒ වාගේම ඔවුන්ගේ සනීපාරක්ෂක පහසුකම් අපට තහවුරු කරන්න වෙනවා. අපි දන්නවා, මේ දවස්වල දුම්රිය ස්ථාන ගණනාවක පහසුකම් දියුණු කරන්නත්, ඒවා සංවර්ධනය කරන්නත් ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කරලා තිබෙන බව. ප්‍රවාහන අමාත්‍යාංශයෙන් මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා, ඒ දුම්රිය ස්ථාන දියුණු කිරීමේදී දරුවන්ගේත්, කාන්තාවන්ගේත්, වැඩිහිටි ප්‍රජාවගේත්, ආබාධිත ප්‍රජාවගේත් අවශ්‍යතා හරියට හඳුනා ගෙන ඒ වෙනුවෙන් විශේෂ මැදිහත්වීමක් කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහනය හා මහා මාර්ගය කියන්නේ, නිකම්ම නිකම් යටිතල පහසුකම් ටිකක්වත්, කොන්ක්‍රීට් ටිකක්වත්, රෝද හතරක්වත්, රෝද හයක්වත් නොවෙයි. මේක, ඊට වඩා ජනතාවට කිට්ටු, ජනතාවට අතිශයින්ම සංවේදී, ජනතාවගේ අයිතිවාසිකමත් තහවුරු වන අතිශය වැදගත් ක්ෂේත්‍රයක්. ඒ නිසා මේ ක්ෂේත්‍රය තුළ ක්‍රියා කරන නිලධාරින් සියලුදෙනාගෙන්ම අපි ඉල්ලා සිටිනවා, ජනතාව ගැන හිතලා, ජනතාවට සංවේදී වන විධියට මේ සේවා දියුණු කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ පක්ෂය ඇතුළේ සිද්ධ වන සාකච්ඡා, අපි ගන්න තීන්දු - තීරණ පිළිබඳව එක එක දේවල් කියන්න පුළුවන්. ඒවා gossip. මම හිතන්නේ gossipවලට අපි ප්‍රතිචාර දක්වන්න ඕනෑ නැහැ. හැම පාර්ලිමේන්තුවක් තුළම මම හිතන්නේ විහිළු සපයන පිරිසකුත් ඉන්න ඕනෑ. ඒකත් අවශ්‍යයි. එලෙස විහිළු සපයන පිරිසක් මේ පාර්ලිමේන්තුවේ විපක්ෂය තුළ සිටීම ගැන අපි ඇත්තටම සතුටු වෙනවා. මොකද, හැම තිස්සේම serious විධියට ඉන්නත් බැහැ නේ. ඒ නිසා gossipවලට ප්‍රතිචාර දක්වන්න ඕනෑත් නැහැ. ඒ විහිළු නිසා අපි enjoy කරනවා මිසක් ඒවාට උත්තර දෙන්න යන්න ඕනෑත් නැහැ කියලා මම හිතනවා.

මට මේ කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට මම බෙහෙවින් ස්තුතිවන්ත වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Namal Rajapaksa. You have nine minutes.

Order, please! The Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 1.53]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බෙහෙවින් ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

විශේෂයෙන්ම ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ පරිපූරක මුදල ඉදිරිපත් කර තිබෙන මේ වෙලාවේදී එක පැත්තකින් මම සතුටු වෙනවා, අද ඔබතුමන්ලාගේ ආණ්ඩුව අධිවේගී මාර්ග සහ අනිකුත් මාර්ග පද්ධතිය හදන්න ඕනෑය කියන තැනට ඇවිල්ලා තිබීම ගැන. මොකද, එදා ඔබතුමන්ලා හිතුවේ අධිවේගී මාර්ගයක් හැදුවාම බල්ලෝ, බළලුන්ට පාර මාරු වෙන්න විධියක් නැහැ කියන එක ගැනයි. එදා ඔබ අධිවේගී මාර්ග හැදීන්වූයේ, ඒවා හදන්නේ ඇඹුල් තියල් ගෙනෙන්න කියායි. පාරවල් හදන්න ගිය වියදම පෙන්වලා ඇහුවා, මේ පාරවල් හදන්නේ රත්රන්වලින්ද කියලා. නමුත් අද අපි දකිනවා, ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමාත් ගිහිල්ලා ණය අරගෙන අධිවේගී මාර්ගවල ඉතුරු වෙච්ච කොටස් හැදීමට කටයුතු කරන ආකාරය. හැබැයි, ඔය කොටස් ඉතුරු වෙන්නේත් නැහැ, ඔබතුමන්ලා එදා කුහකත්වයෙන් ඕවා දිහා බැලුවේ නැත්නම්. ඔබ විපක්ෂයේ හිටපු කාලයේ ඒ සංවර්ධන යෝජනා ක්‍රම වළක්වන්න කටයුතු කළේ නැත්නම් ඒ කිලෝමීටර් 37ක අධිවේගී මාර්ග කොටස සකස් කර ජනාධිපතිතුමාට විවෘත කරන්නත් තිබුණා. ඔබ අද ඒ මතයෙන් වෙනස් වෙලාද කියලා මම දන්නේ නැහැ. කෙසේ වෙතත්, මේ අධිවේගී මාර්ග වාගේම ගමේ මාර්ග හදන්න ඕනෑ කියන තැන ඔබතුමන්ලා අද වනකොට ඉන්නවා. එදා ඔබේ පක්ෂයේ අය ගමට ගිහිල්ලා ඇහුවා, ගමට කාපට් කන්නද කියලා.

පාර හැදුවත් වැඩක් නැහැ, අරක නැති හින්දා කියලා තව දෙයක් ගැන කිව්වා. එවැනි ඉතිහාසයක් තිබුණු ඔබතුමන්ලා දැන් පාරවල් ටික හදන්න මහන්සි වෙනවා. ඒක හොඳයි. ඒ වාගේම අපි විශ්වාස කරනවා, ඔබතුමන්ලා ඉතා කඩිනමින් මේ වැඩ කටයුතු කරයි කියලා. මොකද, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ප්‍රගතිය පිළිබඳව අපි හැමෝටම ප්‍රශ්නයක් තිබෙනවා. මේ වර්ෂයේ දැන් අන්තිම කාර්තුවට ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා අපි ආණ්ඩුවෙන් දැනගන්න කැමැතියි, මේ කාල සීමාව තුළ එක් එක් අමාත්‍යාංශවල ඔබ ලබපු ප්‍රගතිය මොනවාද කියලා. පසුගිය අය වැයෙන් සම්මත කරපු මුදල්වලින් කොච්චර ප්‍රමාණයක් ආයෝජනය කරලා තිබෙනවාද, ඒවායින් ජනතාවට මොන ප්‍රතිලාභද ලැබුණේ කියන කාරණා පිළිබඳවත් ඔබතුමන්ලා මේ පාර්ලිමේන්තුවට දැනුම් දෙන්න ඕනෑ. ඒ වාගේම, ඒ සම්බන්ධයෙන් රටේ ජනතාවත් දැනුවත් කරන්න ඕනෑ. මොකද, අපට දැනගන්න තිබෙන විධියට ඔබතුමන්ලාගේ සමහර සාකච්ඡා දිහා බැලුවාම දීපු මුදල් වියදම් කරලා ද, නැද්ද කියන කාරණය පිළිබඳව ප්‍රශ්නයකුත් තිබෙනවා. කෙසේ වෙතත් අපි විශ්වාස කරනවා, අඩුම ගාණේ මීළඟ මාස කීපයේදීවත් ඔබතුමන්ලා මැතිවරණ කාලයේ වෙච්ච පොරොන්දුවලට අනුව යම් සංවර්ධන යෝජනා ක්‍රමයක්වත් ඉෂ්ට කරන්න කටයුතු කරයි කියලා. මොකද, ඔබතුමන්ලා දැන් අමතක කරන්න එපා, මේ ඔබතුමන්ලා බලයට පත් වෙලා දෙවැනි අවුරුද්ද ගත වෙන්නේ කියන එක. දැන් පසුගිය අවුරුදුවල කරපු ඒවාට බැණ-බැණ කාලය නාස්ති කරලා හරියන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පොලිස් කොමිසම සම්බන්ධ කාරණය අදත් පාර්ලිමේන්තුවේදී ඉස්මතු වුණා. හෙට දිනයේදී මේ සම්බන්ධයෙන් විවාදයකුත් තිබෙනවා. පසුගිය කාලයේ පොලීසිය දේශපාලනීකරණය කිරීම පිළිබඳව

හැමෝම කථා කළා. අපි ආණ්ඩුවේ ඉන්නකොට ඒ සම්බන්ධයෙන් වැඩියෙන්ම කථා කළේ ඔබතුමන්ලා. ඒ හින්දා තමයි යහ පාලන ආණ්ඩුව පැවති වෙලාවේ පොලිස් කොමිසම ගේනකොට ඔබතුමන්ලා විපක්ෂය නියෝජනය කරලා, එදා ආණ්ඩුවට කඩේ ගියේ. ඔබතුමන්ලා ඒ කාලයේ විපක්ෂය පැත්තේ වාඩිවෙලා හිටියේ. හැබැයි, අනික් පැත්තේ තමයි වැඩ කළේ. අරලියගහ මන්දිරයේ තමයි කාර්යාලය තිබුණේ. එහෙම තමයි ඔබතුමන්ලා එදා කථා කරලා පොලිස් කොමිසමක් ඕනෑ, මේක ස්වාධීන වෙන්න ඕනෑය කිව්වේ. හැබැයි, එදා එහෙම කියපු ඔබතුමන්ලා අද ඇවිල්ලා ඒකේ ස්වාධීනකම අයින් කරලා, පොලිස්පතිවරයාට බලය ගන්න හදනවා. මොකක්ද ඔබේ බලාපොරොත්තුව? ඔබතුමන්ලා ඒකෙන් අපේක්ෂා කරන්නේ මොකක්ද? ජනතාවට සේවය කරන්නද? හොරු අල්ලන්නද?

පසුගිය දවසක සත්තු වත්තේත් සතුන් 32ක් හොරකම් කරගෙන ගිහිල්ලා. මම දැක්කා පත්තරේ තිබෙනවා, සත්තු වත්තේ සතුන් 32ක් හොරකම් කරගෙන ගිහිල්ලා කියලා. මේ රටේ පොලීසිය ස්වාධීන වෙන්න ඕනෑ. ඒ ගැන අපේ කිසිම තර්කයක් නැහැ. පොලිස් කොමිසම පත් කර ගත්තා නම්, ඒ පොලිස් කොමිසමට පොලීසියේ transfers ටික කරන්න දෙන්න. ඇයි, ඒකට දේශපාලනික වශයෙන් මැදිහත් වෙන්නේ? ඔබතුමන්ලා පසුගිය දවසක හිටපු නාවික හමුදාපති නිශාන්ත උළුගේතැන්න මහතාව අත්අඩංගුවට ගත්තා. එතුමාව අත්අඩංගුවට ගත්තේ කොහොමද? බී.එම්. විජේකාන්තන් කියන පුද්ගලයාගෙන් ඉස්සෙල්ලාම සිංහලෙන් ප්‍රකාශයක් ලියා ගන්නවා. ඒ ප්‍රකාශය ලියා ගත්තාට පස්සේ මොකක්ද වෙන්නේ? ඊළඟට, 127 ප්‍රකාශයක් දෙනවා. හැබැයි, අධිකරණය හමුවට ගියාට පසුව ඒක සාර්ථක වෙන්නේ නැහැ. ඊට පස්සේ ත්‍රිකුණාමලයේ එල්ටීටීඊ බුද්ධි අංශයේ භාරතී කියන පුද්ගලයාව අත්අඩංගුවට ගන්නවා. ඔහුව අත්අඩංගුවට අරගෙන පොල්ගහවෙල මහෙස්ත්‍රාත් හමුවට ඉදිරිපත් කරනවා. ඔහුව අධිකරණයට ඉදිරිපත් කරලා මොකක්ද කියන්නේ? හඳුනා ගැනීමේ පෙරෙට්ටුවකට දානවා. "සිංහල පුළුවන්ද?" කියලා ඔහුගෙන් ඇහුවාම ඔහු "බැහැ" කියනවා. හැබැයි පොලීසිය, CID එක සිංහලෙන් ප්‍රකාශය ලියාගෙන තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් ඔහුගෙන් ඇහුවාම මොකක්ද කියන්නේ? "මම අත්සන් කළාට මම නොවෙයි මේක ලිව්වේ" කියලා ඔහු කියනවා.

මෙහෙම තමයි ඔබතුමන්ලා පොලීසිය පාවිච්චි කරන්නේ. ඇයි, මේ? හිටපු නාවික හමුදාපතිවරයා අත්අඩංගුවේ තියා ගන්න ඕනෑ හින්දා තමයි මෙහෙම කරන්නේ. එල්ටීටීඊ ත්‍රස්තවාදී බුද්ධි අංශයේ කෙනෙක්, වසර ගණනාවක් තිස්සේ එල්ටීටී ත්‍රස්තවාදී බුද්ධි අංශය මෙහෙයවූවා කියලා නාවික හමුදාවෙන් සහ පොලීසියෙන් හොයපු කෙනෙක්ව ගෙනැල්ලා, හිටපු නාවික හමුදාපතිවරයාට විරුද්ධව සාක්කි දෙන්න දමනවා. ඊට පස්සේ ඔබතුමන්ලා මොකක්ද කරන්නේ? සී.අයි.ඒ.බී.එම්. පුෂ්පකුමාර කියන කළුතර OIC මහත්මයා කැඳවනවා. ඔහුව කැඳවලා CID එකට ඕනෑ විධියට ප්‍රකාශයක් ලියා ගන්න කටයුතු කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ, CID එකට ඕනෑ විධියට. සතියක් ඇතුළත තමන් ගෙනෙන යෝජනාවට - CID එකේ යෝජනාවට - එකඟ වුණේ නැත්නම් ඔහුව අත්අඩංගුවට ගන්නවාය කියනවා. කවුරු ගැනද මේ කියන්නේ? කළුතර හිටපු OIC මහත්මයා ගැන. ඔහු ගිහිල්ලා පොලිස් පොතේ minute එකක් ලියනවා, "මෙහෙම සිදුවීමක් මට සිද්ධ වෙනවා. මට බොරු කියන්න බැහැ." කියලා. ඊටපස්සේ ඔහු අධිකරණයට යනවා, රිට් එකක් ගන්න. අධිකරණයෙන් රිට් එකක් අරගෙන ඔහු අත්අඩංගුවට ගැනීම වළක්වා ගන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් මෙහෙම හැසිරෙන ආණ්ඩුවක් සහ පොලිස්පතිවරයෙකුට තමයි මේ ස්වාධීන පොලිස් කොමිසම අයින් කරලා, සම්පූර්ණයෙන්ම බලය ලබා ගැනීමට කටයුතු කරන්න උත්සාහ කරන්නේ. මොකක්ද මේකේ යටි අරමුණ? ඔබතුමන්ලාට ඕනෑ විධියට පොලීසිය හසුරුවලා, දේශපාලනික වශයෙන් ඔබතුමන්ලාට ඕනෑ ඕනෑ තැන්වලට නිලධාරින් දාලා කටයුතු කරන්නද එහෙම නැත්නම් අවංකව පොලීසිය හදන්නද? අවංකව පොලීසිය හදනවා නම් පොලිස් කොමිසම බාධාවක් නොවෙයි. අවංකව වැඩ කරනවා නම් ඒක බාධාවක් නොවෙයි. හැබැයි, ඔබතුමන්ලා අද මොකක්ද කරන්නේ? පොලිස් දෙපාර්තමේන්තුව සම්පූර්ණයෙන්ම පාවිච්චි කරනවා, ආණ්ඩුවේ අතකොළුවක් විධියට. දේශපාලන වේදිකාවල හිටපු අය ගෙනැල්ලා නිලධාරින් විධියට තනතුරුවලට පත් කරනවා.

ඒ දේශපාලන වේදිකාවෙන්ම ගෙනැල්ලා පත් කරපු නිලධාරින්ට ඔබ තමුන්නාන්සේලා දෙන වගකීම මොකක්ද? ආණ්ඩුවේ අවශ්‍යතාව ඉටු කර ගන්න, දේශපාලන වේදිකාවෙන් ගෙනැල්ලා ඉහළ තනතුරුවලට පත් කරනවා. පොලිස්පතිවරයාත් පත් වෙනවා. ඒ නිසා අපි පොලිස්පතිතුමාටත් කියන්නේ, ඔබ ඉතිහාසය අධ්‍යයනය කරලා බලන්න, ඔබට පෙර පොලිස්පතිවරුන්ට දේශපාලනික වශයෙන් කඩේ ගියාම වෙච්ච දේ පිළිබඳව. පොලිස්පතිතුමාත් ඒ ගැන අවධානය යොමු කරන්න. ඊට පස්සේ බලා ගන්න මේ කවුරුත් එන්නේ නැහැ. අපි ඒක අත්විඳලා තිබෙනවා, අපි දැකලා තිබෙනවා.

ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආණ්ඩුව උත්සාහ කරන්නේ, පොලීසිය පාවිච්චි කරලා මර්දනයක් සහ තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍රය පොලීසිය ඇතුළෙන් ඉෂ්ට කර ගන්නයි. එහෙම යුගයක් 1980 ගණන්වල තිබුණා. ඒක හරි. 1990 ගණන්වලත් තිබුණා. හැබැයි, අදට ඒක ගැළපෙන්නේ නැහැ. අද තමන්ට ඕනෑ විධියට පොලීසිය හසුරුවලා දේශපාලනය කළාට හරි යන්නේ නැහැ. ඒ නිසා කරුණාකරලා පොලීසිය දේශපාලනීකරණය කරන එක නවත්වන්න.

ජිනීවාවල Human Rights Council එක තිබුණා. මොකක්ද, ඔබ තමුන්නාන්සේලා කළේ? වාචිකව විරුද්ධ වෙනවා, හැබැයි, ඡන්දය ගන්නේ නැහැ. වාචිකව විරුද්ධ වෙනවා නම්, ඡන්දයක් ඉල්ලන්න බැරි ආණ්ඩුවට කොන්දක් නැද්ද? ලෝකයේ රටවල් බහුතරයක්, රටවල් ගණනාවක් ලංකාවේ සහායට ඉන්නවා. හැබැයි, වාචිකව විරුද්ධ වෙනවා. කවුරුන්ද, ඔබ තමුන්නාන්සේලා සතුටු කරන්න හදන්නේ? එක්තරා කණ්ඩායමක්ද? ඩයස්පෝරාවද? එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගේ හිතවාදීන්ද? එහෙම නැත්නම් අවංකව අපේ රටේ මේ ප්‍රශ්නයට විසඳුමක් හොයන්නද හදන්නේ? වාචිකව අපි විරුද්ධයි කියනවා, හැබැයි, ඡන්දයක් ඉල්ලන්නේ නැහැ. එහෙම නම් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කරුණාකරලා මේ දෙබිඩි පිළිවෙත නවත්වන්න කියන්න. අවංකව කටයුතු කරන්න.

අද රටේ ගොවියාගේ, ධීවරයාගේ, කම්කරුවාගේ ප්‍රශ්නවලට විසඳුමක් දෙන්න ආණ්ඩුව මැදිහත් වෙන්නේ නැහැ. ආයෝජකයෝ ලංකාවට එනවා කියලා කියනවා. නමුත්, ආපු ආයෝජකයෙක් නම් අපට පෙනෙන්න නැහැ. එහෙම ඉන්නවා නම් කියන්න. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාත් ඉන්නවා. ඔබතුමා කියන්න, ආයෝජකයෝ කොච්චර ආවාද, ඩොලර් බිලියන කීයක් ලංකාවට ගෙනාවාද කියලා. මොකද, ඔබතුමන්ලා ආණ්ඩුව පටන් ගන්නා විට බිලියන ගණන්වලින් පටන් ගත්තේ. ඔබතුමන්ලාගේ රැස්වීමක හිටපු කෙනෙක් කිව්වා, ජනාධිපති පත් වුණාම ඩොලර් මිලියනයක් එවනවා කියලා. ඒක ආවද කියලා කියන්න. ඩොලර් මිලියනයක් එවනවා කියලා කිව්වේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. හැබැයි, ඒවා ආවාද? ඒ නිසා කරුණාකරලා වැඩ පිළිවෙළක් එක්ක ඔබ තමුන්නාන්සේලා කටයුතු කරන්න. රටවලට යන්න පුළුවන්. රටවලට ගිහිල්ලා කථා පවත්වන්නත්

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

පුළුවන්. හැබැයි, ආයෝජකයෝ ලංකාවට ආකර්ෂණය කර ගෙන රැකියා උත්පාදනය කරන්න, විදේශ විනිමය ලංකාවට ගේන්න, අපේ රටේ වාතාවරණයක්, වැඩ පිළිවෙළක් ඔබ තමුන්නාන්සේලා සතුව තිබෙනවාද?

ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි පැහැදිලිවම ආණ්ඩුවට කියන්නේ, කරුණාකරලා මේ රටේ පොලිස් දෙපාර්තමේන්තුවේ ගෞරවය කෙලෙසන්න එපා. ගරු අග්‍රාමාත්‍යතුමිය කිව්වා, පක්ෂයේ අභ්‍යන්තර සාකච්ඡා තිබෙනවා කියලා. ඒ අභ්‍යන්තර සාකච්ඡාවේ කොටසක් බවට පොලීසිය පත් කර ගන්න එපා. ඒකට පක්ෂය පාවිච්චි කරන්න. මේ හැම පක්ෂයකම අභ්‍යන්තර සාකච්ඡා තිබෙනවා නේ. හැබැයි, ඒවාට පොලීසිය ගේන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
**(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)**
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දුන් කාලය අවසන්.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
**(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)**
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මට විනාඩියක් දෙන්න.

ඒකට පොලීසිය ගේන්න ඕනෑ නැහැ. ඒකට පොලිස්පතිවරයා එන්න ඕනෑත් නැහැ. CID එකේ ප්‍රධානියා මැතිවරණය කාලයේ ආවාට, දැන් එන්න ඕනෑ නැහැ. එහෙම එන්න ඕනෑ නම්, ඒ කියන්නේ පැහැදිලිවම ඒක දේශපාලනීකරණයක්. ඒ නිසා පක්ෂයේ අභ්‍යන්තර සාකච්ඡාවලින් පොලීසිය ඈත් කරලා, කරුණාකරලා මේ රටේ ජනතාවගේ ආරක්ෂාව සපයන්න කටයුතු කරන්න. අර සත්තු වත්තෙන් උස්සන් ගිය සතුන් තිස්දෙදෙනා ගෙනිච්චේ කවුද කියලාත් හොයන්න, එහෙම නැත්නම් ඒකත් මගේ පිටට එයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමියට ස්තුතිවන්ත වෙමින්, නැවත වතාවක් ආණ්ඩුවට මතක් කරන්නේ මේ දඩයමට ත්‍රිවිධ හමුදාව, පොලීසිය, බුද්ධි අංශ පාවිච්චි කරන්න එපා කියන එකයි. බුද්ධි අංශය කඩා ගෙන වැටුණොත්, කඩා ගෙන වැටෙන්නේ සමස්ත රටේ ජාතික ආරක්ෂාව. ජාතික ආරක්ෂාව කඩා ගෙන වැටුණොත්, රට පාලනය කරන්නේ කවුද කියන එක අදාළ වෙන්නේ නැහැ, සමස්ත රටම අනාරක්ෂිත වෙනවා කියන එකත් මතක තබා ගන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
**(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)**
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මංජුල සුරවීර ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.04]

**ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
**(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)**
(The Hon. Manjula Suraweera Arachchi)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ලංකාවේ නරුම දේශපාලන සංස්කෘතියක් ආරම්භ කරන්න පුරෝගාමීව කටයුතු කරපු; හිටපු අග්‍රවිනිශ්චයකාරතුමිය වන ශිරාණි බණ්ඩාරනායක මැතිනිය බලයෙන් පහ කරන්න කටයුතු කරපු; තාජුඩීන්ලා ඝාතනය කරන්න සැලසුම් කළා කියලා දැන් එළිපිට ඔප්පු වෙමින් තිබෙන, දූෂිත කල්ලියක් විසින් දැන් ඇවිල්ලා අපට උපදෙස් දෙන්න පටන් අරගෙන තිබෙනවා. අපි කියන්න කැමැතියි, මෙතුමන්ලාට අදාළ දේශපාලන විවේචන කරනවාට වඩා, අපට කරන්න තිබෙන්නේ න්‍යායාත්මකව විතරක් නොවෙයි භාවිතාවෙන් නිවැරැදිව මේ රට හදන වැඩේ කරන එකයි. ඒ සඳහා අදාළ පියවර අපි ගනිමින් තිබෙනවා. අපි අනිවාර්යයෙන්ම අපේ කාල සීමාව ඇතුළත මේ රට නිවැරැදි මාර්ගයට ගන්නවා. අපි විශ්වාස කරනවා අනිවාර්යයෙන්ම අපේ ආණ්ඩුවේ නියමිත කාල සීමාව ඇතුළත කටයුතු කරගෙන යන විට ගොඩක් දේවල් ඔබට දැන ගන්න ලැබෙයි; ගොඩක් දේවල් අහිමි කර ගන්න වෙයි; ශිෂ්ට සම්පන්නව රට ඉදිරියට යන ගමනට අනුගත වෙලා වැඩ කරන්න සිද්ධ වෙයි.

මම ගොඩක් දුරට ඒ ගැන කියන්න කැමැති නැහැ. බැඳුම්කර වංචාව සිද්ධ කරනකොට මුනිවත රැකපු උදවිය, බැඳුම්කර වංචාව කරලා මහ දවල් ඒ මංකොල්ලයට දායක වෙච්ච අයගෙන් වාහන ඉල්ලපු උදවිය, ඒ පැත්තට මේ පැත්තට හැම පැත්තටම හැරි හැරී ප්‍රතිපත්තියක් නැති දේශපාලනය කරන විපක්ෂයේ කණ්ඩායම් ගැන කථා කරන්න අපට ඇත්තටම ලජ්ජයි.

අද අපට ඇත්තටම කථා කරන්න තිබෙන්නේ, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට අදාළ පරිපූරක ඇස්තමේන්තුවක් පිළිබඳවයි. අපි දන්නවා, 2025 විසර්ජන පනත -අය වැය- හරහා ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට රුපියල් බිලියන 487ක මුදල් ප්‍රමාණයක් වෙන් කර ගත් බව. අපි දන්නවා, මේ වෙනකොට ඒ මුදල් පාවිච්චි කරගෙන රට තුළ විශාල වැඩ කොටසක් කරමින් ඉන්න බව. ඔබතුමන්ලා දන්නවා, මේ වෙනකොට පිටකොටුව දුම්රියපොළ සංවර්ධන කටයුතු වේගයෙන් සිද්ධ වෙමින් පවතින බව; පිටකොටුව බස් නැවතුම්පොළ වේගයෙන් සංවර්ධනය කරමින් පවතින බව. ඊට අමතරව අපි දන්නවා, මේ වෙනකොට "ඒ" ශ්‍රේණියේ සහ "බී" ශ්‍රේණියේ පාරවල් කිලෝමීටර 400කට ආසන්න ප්‍රමාණයක් කාපට් අතුරමින් සංවර්ධනය කරමින් තිබෙන බව. ඒ එක්කම "ඒ" ශ්‍රේණියේ සහ "බී" ශ්‍රේණියේ මාර්ගවල තිබෙන ප්‍රධාන පාලම් 78ක් ඉදිකරමින් පවතිනවා, මේ 2025 වසර ඇතුළත.

ඒ එක්කම ග්‍රාමීය සංවර්ධනයට ඉවහල් වන, අපේ නිෂ්පාදන ආර්ථිකයේ ප්‍රධාන අවශ්‍යතාවක් බවට පත් වෙලා තිබෙන ග්‍රාමීය මාර්ග පද්ධතියේ -මාර්ග 2,000කට ආසන්න ප්‍රමාණයක- මේ වෙනකොට සංවර්ධන කටයුතු සිදු වෙමින් තිබෙනවා. ඒ අනුව අපි විසර්ජන පනත හරහා ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට වෙන් කළ රුපියල් බිලියන 487න් විශාල වැඩ කොටසක් කරමින් සිටිනවා. ඒ අතරේ අපට නොවැළැක්විය හැකි, අපට මේ මොහොතේ කළමනාකරණය කර ගන්න බැරි කාරණාවක් මත රුපියල් බිලියන 36ක මුදල් ප්‍රමාණයක් ඉතුරු වෙනවා. අන්න ඒ මුදල් ප්‍රමාණය, මාර්ග සංවර්ධන අධිකාරිය ගත්ත මිලියන 310ක් වෙච්ච ණයෙන් පංගුවක් පියවීම සඳහා අපි පාවිච්චි කරන්නයි හදන්නේ. ඒ සඳහා තමයි මේ යෝජනාව අරගෙන ඇවිල්ලා තිබෙන්නේ. අපි දන්නවා, මේ ඉතිහාසය පුරාම ලොකු කථා පවත්වමින් මහා සන්දර්ශන පෙන්වන්න උත්සාහ කරන විපක්ෂයේ මහත්වරු වග කියන්න ඕනෑ කාරණා තිබෙන බව. ඒවා හිතා මතා අමතක කරලා, ඒවායින් පැනලා යන්න තමයි උත්සාහ කරමින් ඉන්නේ.

මම ජීවත් වන්නේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ. එහි පිහිටා තිබෙන ශ්‍රී පාදස්ථානය සිංහල, දෙමළ, මුස්ලිම් අපි හැමෝගේම ආගමික මධ්‍යස්ථානය, සමගියේ මධ්‍යස්ථානය බවට පත්වෙලා තිබෙනවා. පසුගිය කාල සීමාව තුළ ඒ පිළිබඳව හොයලා බැලුවේ නැති උදවිය, ඒ පිළිබඳව කථා නොකළ අය දැන් කිඹුල් කඳුළු

හෙළනවා, සංවර්ධනය ගැන කියමින්. ශ්‍රී පාදස්ථානයට යන්න තිබෙන මාර්ගවල -ප්‍රවේශ මාර්ග- දුර කිලෝමීටර 117ක් තිබෙනවා, දැනට. පසුගිය කාලය තිස්සේම සංවර්ධනය කරන මුවාවෙන් ඒකෙන් කිලෝමීටර 29කයි කාපට් අතුරා තිබෙන්නේ. තවත් විශාල ප්‍රමාණයක් කාපට් කරන්න තිබෙනවා. මේ විපක්ෂයේ අය අහනවා, ආණ්ඩුව මොනවාද කරන්නේ කියලා. අපි කියන්න කැමැතියි, ශ්‍රී පාදස්ථානයට යන මාර්ගවලින් -ප්‍රවේශ මාර්ග- කිලෝමීටර 25ක් මේ එක අවුරුද්දක් ඇතුළත සංවර්ධනය කරන්න අදාළ කටයුතු සූදානම් කර තිබෙන බව. මේ වෙනකොට එහි වැඩ පටන් අරගෙන තිබෙනවා.

දැන් අහනවා මොනවාද කළේ කියලා. අපි දන්නවා, අපේ දිස්ත්‍රික්කය, මධ්‍යම කඳුකරය කියන්නේ ඉතාම අනතුරුදායක ප්‍රදේශයක් බව. අනතුරුදායක ලෙස තමයි එහි මාර්ග පද්ධතිය පිහිටා තිබෙන්නේ. අපි දැක්කා ගැරඬි ඇල්ල සිද්ධියේදී, කොහොමද අනතුරු සිදු වෙන්නේ කියලා. ඒක සංවේදී කථාවක්; ඛේදවාචකයක්. නමුත් අපි නිකම් හිටියේ නැහැ. ඒ තත්ත්වයන් ඉතා හොඳින් කළමනාකරණය කර ගැනීම සඳහා මේ වෙනකොට අපි රුපියල් මිලියන 350ක මුදල් ප්‍රමාණයක් යොදවලා, අනාරක්ෂිත ස්ථාන 100ක් හඳුනාගෙන -විශේෂයෙන්ම කිලෝමීටර 10ක් දුරට තිබෙන ස්ථාන සියයක- අපි ආරක්ෂිත වැටවල් ඉදිකරමින් පවතිනවා. මේ ආණ්ඩුව විධියට අපි ජනතාවගේ ප්‍රශ්න ඉතා මැනවින් හඳුනාගෙන, ඔවුන්ගේ ජීවිතවලට වටිනාකම් දෙන්න ඕනෑ නිසා, තවත් ටිකක් පරිස්සමෙන් ජීවත් කරවන්න ඕනෑ නිසා ආරක්ෂිත වැටවල් හදමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නුවරඑළියට යන්න තිබෙන ප්‍රධාන මාර්ගයක් තමයි, හැටන්-කොළඹ මාර්ගය. ඒ මාර්ගය 1994-1998 කාලයේ සංවර්ධනය කළාට පසුව අවුරුදු 30ක් යනකල් සංවර්ධනය කරලා නැහැ. එය සංවර්ධනය කිරීම මේ වනකල්ම අමතක කරලා තිබුණා. පැවැති ආණ්ඩුවල ප්‍රබල ඇමතිවරු, මන්ත්‍රීවරු ඒ පාර පාවිච්චි කළා. හැබැයි, ඒ අය ඒ පාර සංවර්ධනය කරන්න කිසිදු මුදල් ප්‍රමාණයක් යොදවා නැහැ. නමුත්, මේ ආණ්ඩුව අභියෝගාත්මක කාර්යයකට අත ගහලායි තිබෙන්නේ. අපි ඒ පාරවල් අනිවාර්යයෙන් සංවර්ධනය කරනවා; ඊට අදාළ මුදල් යොදවා තිබෙනවා. නුවරඑළිය දිස්ත්‍රික්කය වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරියෙන් පමණක් රුපියල් මිලියන 2,600කට ආසන්න ප්‍රමාණයක් යොදා තිබෙනවා, ප්‍රධාන පාරවල් 16ක් සංවර්ධනය කරන්න. පේරාදෙණිය-නුවරඑළිය මාර්ගය, නුවර-හැටන් මාර්ගය, බලංගොඩ-හැටන් මාර්ගය, බදුල්ල -නුවරඑළිය මාර්ගය, නුවරඑළිය-හඟුරන්කෙත මාර්ගය ආදි වශයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයට ඇතුළු වන ප්‍රවේශ මාර්ග කිහිපයක්ම තිබෙනවා. මෙන්න මේ ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීම වෙනුවෙන් අදාළ මුදල් ප්‍රතිපාදන වෙන් නොකරපු අය තමයි අද අපට උපදෙස් දෙන්න එන්නේ; ඒ ගැන කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ගොබෙල්ස් න්‍යාය ගැන අහලා තිබෙනවා. වත්මන් විපක්ෂයේ කාර්යභාරය ගත්තොත්, ඇත්තටම මට මේ වෙලාවේ මතක් වෙන්නේ, ගොබෙල්ස් න්‍යායයි. බොරු මත සමාජගත කරලා, ඒවා අර්ධ සත්‍ය බවට පත් කරලා, සමාජ මතයක් ගොඩ නඟන්න උත්සාහ කරමින් ඉන්න කණ්ඩායමක් විපක්ෂයේ ඉන්නවා. පැරදිලා, වැලේ වැල් නැතිව එකිනෙකාට පසමිතුරු විධියට ජනතාව ඉස්සරහා රංගනයේ යෙදෙමින් හිටපු ඒ අය ඔක්කොම දැන් එකම වේදිකාවකට ඇවිල්ලා එක මිටට එකතු වෙමින්, ගොබෙල්ස් න්‍යායට අනුව බොරු පතුරුවමින් ඉන්නවා. ආණ්ඩුවක් විධියට අපි ඉතා වගකීම් සහගතව වැඩ කරන්න සූදානම්. අපි ඒ වෙනුවෙන් කැප වෙනවා. දිවා රෑ නොබලා මහන්සි වෙලා වැඩ කරමින් අපි අපේ රට ඉදිරියට ගැනීමට අදාළ සියලු ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා.

ආණ්ඩුවකින් අඩු පාඩු සිදු වෙන්න පුළුවන්, අතපසුවීම් සිදු වෙන්න පුළුවන්. ඒක තමයි ආණ්ඩුවක හැටි. හැබැයි, මේ ආණ්ඩුවේ නායකයාගේ ඉඳලා අපි කිසිම කෙනෙක් චේතනාන්විතව -හිතා මතා- කිසිදු ජනතා ද්‍රෝහී වැඩක් කරන්න කටයුතු කරන්නේ නැහැ. අපි අපෙන් සිදු වන වැරදි, අතපසුවීම් නිවැරදි කර ගන්නවා; ජන වරමට අනුව වැඩ කරනවා. ඒ නිසා මේ විපක්ෂයට ඉදිරි අවුරුදු 5 නොවෙයි, ඉදිරි අවුරුදු 10ක්ම විපක්ෂයේ ඉන්න නොව හිර ගෙවල්වලට යන්නයි සිදු වෙලා තිබෙන්නේ. ඒ කරපු අපරාධවලට, ඒ කරපු වංචා, දූෂණ, මිනී මැරුම්, හොරකම්වලට අදාළ දඬුවම් විඳින්න බලාගෙන කටයුතු කරන්න කියලා මම කියනවා.

අපි අපේ රටට ආදරෙයි. අපේ රට හදන්න කොන්දේසි විරහිත අරගළයක අපි යෙදී සිටිනවා. අපි මේ රට අනිවාර්යයෙන්ම සංවර්ධනය කරනවා, මේ රට වෙනුවෙන් යුක්තිය ඉටු කරනවා.

මට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.13]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම බොරුව සමාජගත කිරීමක් ගැන කියපු කාරණාවත් සමඟ මම කැමැතියි මේ විවාදයේ මේ පුංචි වෙලාව උපයෝගී කර ගන්න, අපේ රටේ ජන සමාජයේ ජනතාව බොරුවෙන්, රැවටීමෙන්, මුසාවෙන්, මුළාවෙන් ඇන්දවීමෙන්, සරලව කියනවා නම් පව දේශපාලනයෙන් අනාථ කළ ආකාරය ගැන කියන්න.

අපේ රටේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් දළ දේශීය නිෂ්පාදිතයට සියයට 50ක දායකත්වයක් ලබා දෙනවා, ලක්ෂ 40කට වැඩි පිරිසකට ආදායම් මාර්ග නිර්මාණය කර දෙමින්. ඒ අය පාස්කු ඉරු දින ප්‍රහාරය නිසා, කොවිඩ් වසංගතය නිසා, රටේ බංකොලොත්භාවය නිසා අන්ත අසරණභාවයට පත් වුණා. ඒ අයගේ ව්‍යාපාර 260,000කට වැඩි ප්‍රමාණයක් වැසී ගියා.

වර්තමාන ආණ්ඩුව විපක්ෂයේ ඉන්න කොට මොකක්ද කිව්වේ? "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට දුන් පොරොන්දු මොනවාද? පරාටේ නීතිය ඉවත් කරනවා කිව්වා. එකතු වෙලා තිබෙන පොලිය කපා හරිනවා කිව්වා. ප්‍රාග්ධන අරමුදල් කපා හරිනවා කිව්වා. සහන ටික ලබා දෙනවා කිව්වා. හැබැයි, මොකක්ද සිද්ධ වුණේ? පසුගිය රජය ජනාධිපතිවරණය ඉලක්ක කරගෙන පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම තාවකාලිකව නතර කළා. නමුත්, ණය බරින් පිරුණු ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණයේ කර්මාන්තකරුවන්ගේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමට කිසිම වැයමක් දැරුවේ නැහැ. එතැනත් කළේ ඇන්දවීමක්.

ඊට පස්සේ ඔබතුමන්ලාගේ රජය පළාත් පාලන මැතිවරණය ඉලක්ක කරගෙන පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම ආපහු

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

තාවකාලිකව අත්හිටුවූවා. නමුත්, ණය බරින් මිරිකුණු අපේ ව්‍යවසායකයන්ගේ, ව්‍යාපාරිකයන්ගේ ණය ප්‍රතිව්‍යුහගත කරන්නට කටයුතු කළේ නැහැ. ඉතින්, ගොබල්ස්ගේ ප්‍රතිපත්තිය අනුගමනය කරන්නේ කවුද කියන එක අද මුළු රටටම පැහැදිලියි.

අද අන්ත අසාධාරණ ක්‍රමවේදයකට අපේ රටේ ව්‍යවසායකයන්ගෙන්, ව්‍යාපාරිකයන්ගෙන් පළිගන්නවා. මම එයට උදාහරණ දෙකක් කියන්නම්. පළමුවෙනි උදාහරණය, කෝසල විදානආරච්චි මහත්මයාගේ කාරණය. ඔහු අරගෙන තිබෙනවා වසර 10ක ණයක්. ණය ප්‍රමාණය රුපියල් මිලියන 38යි. අද වන විට ඔහු ගෙවා තිබෙනවා මිලියන 52.4ක්. ගත්තු ණය මිලියන 38යි. අද වන විට ගෙවා තිබෙනවා මිලියන 52.4ක්. මිලියන 38 ණය මුළුමනින්ම settle කරන්න තවත් මිලියන 80ක් ඉල්ලනවා. මිලියන 38 ණයට දැන් ගෙවන්න ලු, මිලියන 137ක්. මා ළඟ තිබෙනවා ඒ සියලු documents, ඒ සියලු දත්ත. මම ඒවා **සභාගත*** කරනවා.

මේක සහගහන අපරාධයක්! කාටද මෙහෙම කරන්නේ? මේ රටේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ටයි. රටේ දළ දේශීය නිෂ්පාදිතයට - GDP එකට - සියයට 50ක දායකත්වයක් ලබා දෙන, ලක්ෂ 40කට ආදායම් මාර්ග ලබා දෙන ක්ෂේත්‍රයටයි මෙහෙම කරන්නේ. මම අහන්න කැමැ තියි, මේ රජය පොරොන්දු වුණු පොහොසත් රටේ ලස්සන ජීවිතයේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට ලබා දෙනවා කියපු ණය සහනය, ලබා දෙනවා කියපු පොලී සහනය කෝ කියලා. අද ඒවාට උත්තර නැහැ.

මේ මොහොත වන විට අපේ රටේ online ණය මාෆියාවක් ක්‍රියාත්මක වෙනවා. මේ online ණය මාෆියාව පිළිබඳව මේ සභා ගර්භය තුළ සහ ඉන් පිටත අපි කරුණු කාරණා එළි දක්වා තිබෙනවා. මේක පටන් ගත්තේ Cashwagon කියන ව්‍යාපෘතිය හරහා. මේ online ණය මාෆියාව ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වෙන්නේ නැහැ. මේ online ණය මාෆියාව මේ රටේ මහ බැංකුවේ ලියාපදිංචි වෙන්නේ නැතිව පෞද්ගලික ධනය උපයෝගී කරගෙන වෙනමම ක්‍රමවේද තුළින් ණය ලබා දීලා, ගිනි පොලියක් අය කරලා, ඉතාම නිර්දය ආකාරයට, අශික්ෂිත ආකාරයට, වැරැදි ආකාරයට ඒ ණය අය කර ගැනීමේ ක්‍රමවේදයක් අද ක්‍රියාත්මක කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එයට අමතරව මම තවත් විනාඩි 2ක් ගන්නවා.

ඇයි තුනෙන් දෙකේ බලය තිබෙන මේ ආණ්ඩුවට ඒකට විරුද්ධව පියවර ගන්න බැරි? ඇයි ඒ දේ කරන්න බැරි? මේ online ණය මාෆියාව ගසා කන්නේ, උදුරා ගන්නේ මේ රටේ වැඩ කරන ජනතාවගේ, සාමාන්‍ය ජනතාවගේ සල්ලි. නමුත්, ඒවාට උත්තර නැහැ. ඒවාට තිබෙන එකම උත්තරය තමයි, "ඒවා මහ බැංකුවේ ලියාපදිංචි නැහැ. ඒ නිසා පියවර ගන්න බැහැ" කියන එක. අපි කියනවා, මේ රටේ මත්ද්‍රව්‍ය ජාවාරම විනාශ කරන්න ඔබ යම්කිසි පියවරක් ගන්නවා නම්, ඒ හා සමාන අධිෂ්ඨාන ශක්තියකින් මේ online ණය මාෆියාව, මේ රටේ ජනතාවට කරන මේ මහා අපරාධය නතර කරන්නත් කටයුතු කරන්න කියලා.

Leasing එකක් දාලා වාහනයක් අරගෙන, ඒ leasing එක ප්‍රමාද වුණාම ඒ වාහනය ආපහු ගන්නා ක්‍රමවේදයක් තිබෙනවා. ඒක ශීලාචාර, ශිෂ්ටසම්පන්න ක්‍රමවේදයක් වෙන්නට ඕනෑ. ඒක රටේ නීතිය තුළ ක්‍රියාත්මක වන සාධාරණ ක්‍රමවේදයක් වෙන්නට ඕනෑ. නමුත් අද මොකක්ද වෙලා තිබෙන්නේ? 2000 අංක 56 දරන කල්බදු මූල්‍යාකරණ පනත අද සහමුලින් උල්ලංඝනය කරමින් තිබෙනවා. "සීසර්ලා" කියන කොට්ඨාසයක් ආරක්ෂක අංශ සමඟ එක්කහු වෙලා ඒ පනත සම්පූර්ණයෙන් උල්ලංඝනය කරමින්, මේ රටේ පොලිස්පතිවරුන් ලබා දුන්නු ක්‍රමවේද, නිර්දේශ සියල්ලක්ම පසෙක දමලා ගිහින් මැරකම, ජඩකම, මර්දනය උපයෝගී කරගෙන බලහත්කාරයෙන් ඒ වාහන අත්පත් කර ගන්නවා.

ඒ දේවල්වලට අදටත් විසඳුමක් නැහැ. අපේ රටේ අසරණ ජනතාවගේ අභිමානය සුරැකෙන ආකාරයට ඒවා නෛතිකව ක්‍රියාත්මක වන ශීලාචාර ක්‍රමයක් තිබෙන්නට ඕනෑ. අද ඒකත් නැහැ. අද එතැනදීත් කරන්නේ පොඩි මනුස්සයාගේ සම්පත ඉතාම කැත විධියට මහා පාරේදී උදුරා ගන්න ඒ මැර කණ්ඩායම් - ඒ සීසර්ලා - අත්තනෝමතික ආකාරයට කටයුතු කිරීමයි. ඇත්ත වශයෙන්ම ඒ පිළිබඳව අපි ලජ්ජා වෙන්නට ඕනෑ. ඉතින්, මම රජයට කියනවා, තුනෙන් දෙකක බලය සහ නීති අංශ උපයෝගී කරගෙන මේ මර්දනකාරී ප්‍රතිපත්තිය වහාම හකුළුවන්නට කටයුතු කරන්න කියලා.

මම විශේෂයෙන්ම කියන්නට කැමැතියි, විපක්ෂයක් හැටියට අපි අද උදේ ලොකු අරගළයක් කළා, ලොකු ඉල්ලීමක් කළා, ජාතික පොලිස් කොමිෂන් සභාවේ ස්වාධීනත්වය සුරක්ෂා කරන්න කියලා. ජාතික පොලිස් කොමිසමට නිර්දේශපාලනීකරණය වූ වාතාවරණයක් තුළ කටයුතු කරන්නට අයිතිය ලබා දෙන්න. එහි ස්වාධීනත්වය සුරක්ෂා කරන්න. යහපත් රාජ්‍ය පාලනය වෙනුවෙන් තමයි ජාතික පොලිස් කොමිෂන් සභාව නිර්මාණ කළේ. බලය එක තැනක කේන්ද්‍රගත කරන්නේ නැතුව, ඒ බලය බෙදලා දීලා සංවරණ සහ තුලන - checks and balances - හරහා ඉතාම ශක්තිමත් පොලිස් සේවාවක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පද්ධතිය ක්‍රියාත්මක කරන්න තමයි ඒ කොමිසම නිර්මාණය කළේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්, ගරු විපක්ෂ නායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අපි පැහැදිලිවම රජයෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා ජාතික පොලිස් කොමිෂන් සභාවේ ස්වාධීනත්වය සුරක්ෂා කරන්න කටයුතු කරන්න කියලා.

විශේෂයෙන්ම ඔබතුමිය ඇතුළු රජය නියෝජනය කරන 159දෙනාගෙන් අපි ඉල්ලීමක් කරනවා. අපි පිළිගන්නවා, අධ්‍යාපන ක්‍රමය වෙනස් වෙන්නට ඕනෑ කියලා. අපේ අධ්‍යාපන ක්‍රමයේ නූතන වෙනසක් ඇති වෙන්නට ඕනෑ. Science,

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

Technology, Engineering, Arts and Mathematics යනාදී ක්ෂේත්‍ර හරහා අපි STEAM educationවලට යන්නට ඕනෑ. Robotics and artificial intelligence වාගේ පැති හරහා දියුණු දරු පරපුරක් නිර්මාණය කරනවා සේම, අපි කවදාවත් අපේ අතීතය අමතක කරන්නට හොඳ නැහැ. එදා මේ රට ස්වයංපෝෂිත කරපු රජ සමය ගැන, ඒ රජ දරුවන් ඉෂ්ට සිද්ධ කරපු ඒ අභිමානවත් සේවාව ගැන අපේ රටේ දරු පරපුර දැන ගන්නට ඕනෑ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමනි, කාලය අවසන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට තව විනාඩියක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මට කාලය ගන්න පුළුවන්, ගැටලුවක් නැහැ.

අධිරාජ්‍යවාදී බලවේග මේ රට යටපත් කරනකොට, මේ රටේ රජ දරුවන් සියලු පුරවැසියන් එකතු කරගෙන ඒ අධිරාජ්‍යවාදය පරාජය කරන්නට කටයුතු කරපු ඉතිහාසය කාටවත් මකලා දමන්න බැහැ, කාටවත් ඩිලීට් කරන්න බැහැ, කාටවත් ඉවත් කරන්න බැහැ. එම නිසා මම රජයට යෝජනා කරනවා, නවීන මානව භූමියක් නිර්මාණය කිරීම සඳහා කුසලතාවෙන්, නිපුණතාවෙන්, දක්ෂතාවෙන්, වෘත්තියභාවයෙන් සවිබලගැන්වුණු දරු පරපුරක්, යොවුන් පරපුරක්, පුරවැසි පරපුරක් නිර්මාණය කරනකොට කරුණාකරලා අපේ රටේ ඉපැරණි සංස්කෘතිය, සභ්‍යත්වය, අපේකම, රටේකම, ගමේකම, නගරයේකම සුරක්ෂා වන ආකාරයට අනිවාර්යයෙන්ම ඉතිහාසය විෂයයත් හර විෂයයක් බවට පත් කරන්න කටයුතු කරන්න කියලා. මම මේ අවස්ථාවේ මේ රජයෙන් ඒ ඉල්ලීමත් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.24]

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇත්තටම විපක්ෂ නායකතුමාගේ කථාවෙන් පස්සේ මට කථා කරන්න ලැබුණු එක හොඳයි කියලා හිතෙනවා. මොකද, සදාකාලික විපක්ෂ නායකතුමා අපට දැන් කිව්වා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට මේ රජය මොකුත් කරලා නැහැ කියලා. ඔබතුමාගේ දේශපාලන ගමන මම පොඩි කාලයේ ඉඳලාම බලාගෙන ඉඳලා තිබෙනවා. අපේ රටේ සංවර්ධන බැංකු දෙක වහලා දමනකොට ඔබතුමා ඔච්චර ශක්තියකින් යුතුව කළ කථාවක් මම අහලා නැහැ. 2015 ඉඳලා 2019 වෙනකල් ඔබතුමා ශක්තිමත් අමාත්‍යාංශයක් දරනකොට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට නිශ්චිත වැඩ පිළිවෙළක්, ප්‍රාග්ධන සම්පාදන ක්‍රමයක්, equity fund එකක් වෙනුවෙන් සටන් කරනවා මම දැකලා නැහැ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට සිදු වුණු අර්බුදය අපි හැමෝම දන්නවා. අපේ රටේ මූල්‍ය ක්ෂේත්‍රයේ තිබෙන අසංවිධිතභාවය සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට සහාය දීමට අවශ්‍ය මූල්‍ය ක්‍රමයක් පෞද්ගලික බැංකුවලට නොමැති වීම තමයි ඒකට ප්‍රධානම හේතුව.

අපේ රටේ ණය දෙන්නේ ඇප තියාගෙන. ඇප තියාගෙන ණය දුන්නාට පස්සේ බැංකුවට ඒක recover කරගන්න පුළුවන් වන්නේත් ඒ ඇපය විකුණලාම තමයි. ඔබතුමන්ලා විපක්ෂයේ සිටියදී මහ බැංකුව ස්වාධීන කරනකොට ඉතාම උනන්දුවෙන් මැදිහත් වෙලා එකඟ වුණා. ඒ එකඟ වුණු එකේ ප්‍රතිඵලයක් විධියට තමයි, "මෙන්න මෙහෙම ණය ප්‍රතිව්‍යුහගත කරන්න" කියලා පෞද්ගලික බැංකුවලට නියෝගයක් නිකුත් කරන්නවත් අද මහ බැංකුවට බැරි වෙලා තිබෙන්නේ. නමුත් මේ රජය පත් වෙලා මේ කාලය ඇතුළත අපි circulars කිහිපයක් නිකුත් කරලා, මහ බැංකුව සහ අනෙකුත් බැංකු සියල්ල එකතු කරගෙන විවිධ ආකෘති ලබා දුන්නා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට. විපක්ෂ නායකතුමා දන්නේ නැති වුණාට අපි සතුටින් කියන්න කැමැතියි, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කරන විශාල ප්‍රමාණයක් සද්භාවයෙන් ඉදිරිපත් වෙලා මේ වනකොට කර්මාන්ත අමාත්‍යාංශය හරහා ඒ අයගේ ණය ප්‍රතිව්‍යුහගත කරගෙන තිබෙන බව. නමුත් ඔය කියන විධියේ මිලියන 38, මිලියන 40 වාගේ දැවැන්ත ණය ගත්ත අයට තවම ඒ අර්බුදය විසඳා ගන්න බැරුව තිබෙනවා. ඒ ගැන අපට අවබෝධයක් තිබෙනවා. නමුත් ඒ සඳහා බැංකු ක්ෂේත්‍රයෙන්ම විසඳුමක් ලබා ගන්නවා හැර, අපට සමස්තයක් විධියට තනි විසඳුමක් දෙන්න වෙන්නේ නැහැ.

අද අපි කථා කරන්නේ අපේ රටේ පළමුවෙනි වතාවට අපේ ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ සිද්ධ වෙන වෙනස ගැන. ඔබතුමන්ලාත් කාලයක් තිස්සේ දේශපාලනය කළා. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා මෙතැන කථා කළා අපි ආර්ථිකය වෙනුවෙන් මොකක්ද කරන්නේ කියලා. අපි ඒ මහත්වරුන්ට මේ ටික කියන්න කැමැතියි. ආර්ථිකය වෙනුවෙන් යමක් කරනවා නම් කළ යුත්තේ ප්‍රවාහන ක්ෂේත්‍රයෙන්ම තමයි. අපි උදාහරණයක් ගනිමු. අපේ ශරීරය තුළ රුධිරය එහා මෙහා ගෙනියන්නේ ධමනි සහ ශිරාවලින්. ඒ කොතැනක හෝ තැනක් block වුණොත් අපි malfunction වෙනවා; අපේ ක්‍රියාකාරීත්වය අඩු වෙනවා. මොළයට ලේ ගමන් කරන්නේ නැත්නම් අපේ බුද්ධිය අඩු වෙනවා. ඒ වාගේම තමයි රටේ ප්‍රවාහන පද්ධතියත්. Logistics කියන්නේ ඒකට තමයි. මගී ප්‍රවාහනය, නිෂ්පාදන ද්‍රව්‍ය ප්‍රවාහනය යනාදියේ කාර්යක්ෂමතාව මත තමයි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආර්ථිකයක් සංවර්ධනය වෙනවාද, නැද්ද කියලා කියන්නේ.

විශේෂයෙන්ම අද මේ පරිපූරක ඇස්තමේන්තුවට අදාළ යෝජනාව ඉදිරිපත් කිරීමෙන් සිදු කර තිබෙන්නේ මුදල් reallocation එකක් මිසක්, මේ අමාත්‍යාංශයට වැඩිපුර මුදල් ඉල්ලීමක් නොවෙයි. විවිධ හේතු මත අපට වියදම් කරගන්න බැරි වෙන රුපියල් බිලියන 36ක මුදලක් කල්තියා හඳුනා ගෙන, අපේ ණය ප්‍රමාණය අඩු කිරීම සඳහා ඒ මුදල යොදා ගැනීමට තමයි මෙම යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. මීට කලින් පැවති ආණ්ඩුවලදී පාර්ලිමේන්තුවට අමාත්‍යාංශවලින් මේ වාගේ ඇස්තමේන්තු ඉදිරිපත් කළේ, වෙන් කර තිබෙන සල්ලි නාස්ති කරලා, වියදම් කරලා ඉවර වුණාම, "අපට තව සල්ලි ටිකක් දෙන්න" කියලායි. ඒ ඇස්තමේන්තු සම්මත වුණේ කොහොමද කියලා හොයා බැලුවාම පෙනී යනවා ඒ අවස්ථාවලදී මේ වාගේ සාකච්ඡාවක්වත් කරලා නැහැ කියලා. එතකොට අපට බලන්න පුළුවන් අතීතයේ පාර්ලිමේන්තුව හරහාත් ධනය අවභාවිත වුණේ කොහොමද කියලා.

[ගරු චතුරංග අබේසිංහමහතා]

76 වසරක ශාපය කියලා අපි කියන්නේත් මෙන්න මේවාටම තමයි. 76 වසරක ශාපය නිසා තමයි අපේ ප්‍රවාහන ක්ෂේත්‍රය හදා ගන්නත් බැරි වුණේ. මීට කලින් පාරක කිලෝමීටරයක් හදන්න කොච්චර වියදමක් ගියාද, ඇයි එක පාරට ඒ වියදම වැඩි වුණේ? එහෙම වුණේ වංචාව, දූෂණය නිසා. ඒවා ගැන හොයන්න ඕනෑ. ඒ කාලයේ ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළ ජාත්‍යන්තර ව්‍යාපෘති ආපහු හැරිලා ගියේ ඇයි, කවුද කොමිස් ඉල්ලුවේ කියලා ඒ රටවල තානාපතිවරු පවා කිව්වා. ඊළඟට, නිෂ්පාදනය පදනම් කරගන්නේ නැතුව තමයි ඔබතුමන්ලා පාරවල් හැදුවේ. Highways හැදුවේ නිෂ්පාදනය සිද්ධ වෙන තැනට නොවෙයි; තමන්ගේ දිස්ත්‍රික්කයට යන්නයි highways හැදුවේ. බොහෝ නිෂ්පාදන සිද්ධ වෙන්නේ, කර්මාන්ත තිබෙන්නේ මධ්‍යම කඳුකර ප්‍රදේශයේ ඉඳලා පහළ තැන්වල. ඒක සුද්දාත් තේරුම් ගත්තා ඒ කාලයේ. තේ කොළ ටික ගෙනෙන්න තමයි උඩ ඉඳලා පහළට rail tracks හැදුවේ. නිෂ්පාදනය ප්‍රවාහනය කරන්න තමයි highways හදන්න ඕනෑ. නමුත් ඔබතුමන්ලා highways හැදුවේ තමන්ගේ ගෙදරට යන්නයි. එවැනි තත්ත්වයක පැවති මේ රටේ ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළව තමයි අද ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් ආර්ථික සංවර්ධනයටත් දායක වෙමින් මේ පෙරළියක් සිද්ධ කරගෙන යන්නේ.

අද මම නිර්ණායකයක් හඳුන්වා දෙනවා. මම හිතන විධියට, මේ පාර්ලිමේන්තුවේ පළමුවෙනි වතාවට තමයි මේ ගැන කථා කරන්නේ. අපේ රටට ආයෝජන ගෙනෙන එක ගැන කථා කළා, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ආයෝජන රටට එන්න නම් රටේ ආර්ථික ස්ථායීකරණයක් තිබෙන්න ඕනෑ; predictability එකක් තිබෙන්න ඕනෑ, රටේ ආර්ථිකය කොයි දිශාවටද යන්නේ කියලා.

දෙවන කාරණය තමයි, තරගකාරිත්වය. අපේ රට අනෙක් රටවලට සාපේක්ෂව කොච්චර තරගකාරිද? ඒ තරගකාරිත්වයේ මූලික අංගයක් තමයි ප්‍රවාහනය, logistic competitiveness එක. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ සඳහා දර්ශකයක් තිබෙනවා, Logistics Performance Index - LPI - කියලා. ඒක ලෝක බැංකුවෙන් හදන්නේ. ඒ දර්ශකයේ අපේ රටේ අගය 2.8යි. ඒ කියන්නේ 76 වසරක ශාපයේ ප්‍රතිඵල. අපි ඒකේ ඉන්නේ 73වැනි ස්ථානයේ. ඒකෙදි බලනවා, Sri Lanka Customsහි තිබෙන කාර්යක්ෂමතාව; ප්‍රවාහනය සඳහා යටිතල පහසුකම්වල තිබෙන කාර්යක්ෂමතාව; international shipmentsවල කාර්යක්ෂමතාව බලනවා; ඊළඟට, logisticsවල තිබෙන තරගකාරිත්වය බලනවා; tracking and traceability සහ time එක බලනවා; ඒ කියන්නේ, තමන්ගේ භාණ්ඩ හා සේවා ප්‍රවාහනය කර ගන්න කොච්චර වේලාවක් යනවා ද කියලා බලනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ නිර්ණායක සියල්ල ගත්තොත්, අපි ඉන්නේ පහළ. අපි දෙකයි දශම ගණනක ඉන්නේ. අපි ඉන්නේ හැත්තෑ තුන්වන ස්ථානයේ. අපිත් එක්ක ආයෝජනවලට තරග කරන රටවල් වන වියට්නාමය 3.3යි; ඉන්දියාව 3.4යි; තායිලන්තය 3.5යි; සිංගප්පූරුව 4.3යි. සිංගප්පූරුව තමයි ඉහළින්ම ඉන්නේ. 76 වසරක ශාපය කියලා කියන්නේ අන්න ඒකයි මහත්තයෝ! විපක්ෂයේ හිටියත්, ආණ්ඩු පක්ෂයේ හිටියත් ඔබතුමන්ලා අවුරුදු 30ක් මේ රට පාලනය කරලා ප්‍රවාහන ක්ෂේත්‍රයෙන් අපට අත්පත් කරලා දීපු දේ තමයි මේ.

ඒ වාගේම මේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ තරගකාරිත්වයට කර්මාන්ත අමාත්‍යාංශයෙන් සටන් කරන්නේ ප්‍රවාහන අමාත්‍යාංශයෙන් අපට දෙන සහයෝගය නිසා. මොකද, භාණ්ඩ හා සේවාවල පිරිවැය කොච්චරයිද කියලා තීරණය වෙන්නේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ තිබෙන කාර්යක්ෂමතාව මත. ඒ වාගේම සේවකයන්ගේ ඵලදායීතාව තීරණය වන්නේ ප්‍රවාහනය මත. භාණ්ඩයේ පිරිවැයට ඒකත් එකතු වෙනවා. ප්‍රවාහන ක්ෂේත්‍රය තුළින් කොච්චර වේගයෙන්, කොච්චර පහසුවෙන්, කොච්චර කැමැත්තෙන් ජනතාව තමන්ගේ රැකියාවලට එනවාද කියන එක මත සේවක ඵලදායීතාව තීරණය වෙනවා.

නිෂ්පාදන දාමයේ සමස්ත කාර්යක්ෂමතාව තීරණය කරන්නේත් ප්‍රවාහන ක්ෂේත්‍රය. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ පළමුවැනි වතාවට පෙන්නුම් කරමින් තිබෙනවා, සමස්ත ප්‍රවාහන ක්ෂේත්‍රයම, ඒ කියන්නේ වරායේ ඉඳලා, SLTB bus එකේ ඉඳලා, පෞද්ගලික බස් එකේ ගමන් කරන මගියාගේ ඉඳලා, පාරවල් ටික හදන එකේ ඉඳලා මේ දැවැන්ත අමාත්‍යාංශය දැවැන්ත කාර්යභාරයක් මේ රටේ ආර්ථිකය වෙනුවෙන් සිදු කරන බව. මම දන්නේ නැහැ, මේ පරිපූරකය සම්මත කරන්න ඡන්දයක් තිබෙනවාද කියලා. පක්ෂ, විපක්ෂ හැමෝම මේකට සහයෝගය දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

මේ අමාත්‍යාංශය කරන්න හදන්නේ, තමන්ගේ ණය පිරිවැය අඩු කර ගන්න එක. අද අපි සම්මත කරන මුදල්වලින් ණය පොලී ගෙවන එක සියයට 12 ඉඳලා සියයට 10 දක්වා අඩු කර ගන්න අපට පුළුවන් වෙනවා. මේක ප්‍රාග්ධන වියදමක්. අපි ණය කොටසක් ගෙවලා ඉවර කළාම average පොලිය අඩු කරලා දෙන්න බැංකු කථා කරලා තිබෙනවා. මේ වාගේ දේවල් මීට කලින් සිදු වුණේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මුදල් අවභාවිත කරලා, පාර්ලිමේන්තුවට ඇවිල්ලා තව මුදල් සම්මත කරගෙන, ඒ සම්මත කරපු මුදල්වලට මුදල් අච්චු ගහලා භාණ්ඩාගාරය ණය කරපු ඉතිහාසයක් තමයි අපට තිබෙන්නේ. IMF framework එක ඇතුළේ, වියදම් කළමනාකරණය කිරීමේ ක්‍රියාවලිය ඇතුළේ, ඒ අමාත්‍යාංශය ඇතුළේ මාස හතරකට කලින් විද්‍යාත්මක පුරෝකථනය කරලා තමන්ට allocate කරපු ප්‍රාග්ධනය වඩාත් සුදුසු විධියට කළමනාකරණය කරගන්නේ කොහොමද කියලා පළමුවැනි වතාවට මේ පාර්ලිමේන්තුවේ අත්දැකීමක් ලබා දෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
ඒක නිසා, මෙච්චර කාලයක් කරපු ශාපයන් - සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට කරපු ශාප, ප්‍රවාහන ක්ෂේත්‍රයට සිදු කරපු ශාප - විසඳන්න තමයි ජාතික ජන බලවේගය ඉදිරිපත් වෙලා ඉන්නේ කියන එකත් අවසාන වශයෙන් සඳහන් කරමින්, මගේ වචන ස්වල්පය නිමා කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මට විනාඩි 12ක් තිබුණා නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
වෙලාව අඩු වෙලා තිබෙන්නේ.

[අ.භා. 2.34]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට කලින් කථා කරපු ගරු නියෝජ්‍ය ඇමතිතුමා ශාපයක් ගැන කථා කළා. ඇත්ත වශයෙන්ම ඇස් දෙක ඇරලා බැලුවොත් එතුමාට පෙනේවි, ඒක එච්චරම සාධාරණ කථාවක් නොවෙයි කියලා. අපේ රට කුඩු පට්ටම් වෙලා, වැටිලා, කන්න බොන්න නැති, ඉතාම දුගී තැනක තිබෙන රටක් නොවෙයි. අපේ රට යම් කිසි ආර්ථික වර්ධනයක් ලබා ගෙන තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඒක දකින්නේ නැත්නම් ඒක කුහකකමක් කියලා තමයි මම විශ්වාස කරන්නේ. කාටත් එහෙමයි. අනෙක් කාරණය මෙයයි. 2020දී තමයි අපි ඉහළ මැදි ආදායම් රටක ඉඳලා, පහළ මැදි ආදායම් රටකට පරිවර්තනය වුණේ. 2019 වෙනකොට අපි upper middle-income රටක් බවට පරිවර්තනය වෙලා තිබුණා. කවුද, ඒක නැහැයි කියන්නේ? බලන්න, මේ තිබෙන්නේ ඊයේ ඉදිරිපත් කරපු ලෝක බැංකුවේ වාර්තාව. ඒකට අනුව අපි 2020දී හිටපු තැන හිටියා නම්, අද මේ ආණ්ඩුවේ වැඩ කටයුතුවලට අනුව අපේ රටේ දරිද්‍රතාව සියයට 67.5යි. ඒ ශාපයට වගකියන්න ගොඩක් කට්ටිය ඉන්නවා. මේකෙන් කියන්නේ, අපේ රටට ආර්ථික වර්ධනයක් ලබා ගන්න ඕනෑ නම් ආර්ථික ප්‍රතිසංස්කරණ කරන්න ඕනෑ කියලායි. මේ ප්‍රතිසංස්කරණ කරන්න ඉඩ දුන්නේ නැත්තේ කවුද කියන එක කණ්ණාඩියක් ඉස්සරහට ගිහිල්ලා බැලුවා නම් පෙනෙයි.

මම අද කථා කරන්න කැමැතියි, මධ්‍යම අධිවේගී මාර්ගය සඳහා එක්සිම් බැංකුවෙන් ගත් ණය පොලිය ගැන. මොකද, ඒ ගැන සාකච්ඡා බොහොමයක් ඇති වෙච්ච නිසා. අපි බංකොලොත් වුණාට පස්සේ අලුත් පනතක් සම්මත කර ගත්තා. ඒක තමයි 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත. ඉස්සරහට යනකොට මේ පනතට අනුව තමයි ණය ගන්න ඕනෑ. එතකොට restructure එකෙන් පස්සේ පළමුවැනි වතාවට ගන්න ප්‍රධාන ණය තමයි මේ. ඒක ඩොලර් මිලියන 500ක ණයක්. එහෙම නම් ඒ ණය ගන්න ඕනෑ මේ පනතට අනුකූලවයි. මේ පනතේ 8වන වගන්තියේ තිබෙනවා, රාජ්‍ය ණය සම්බන්ධීකරණ කමිටුවක් තිබෙන්න ඕනෑ, ඒ රාජ්‍ය ණය සම්බන්ධීකරණ කමිටුව මාසයකට වතාවක් රැස්වෙලා, ගන්න ණය සම්බන්ධයෙන් සාකච්ඡා කරලා වාර්තාවක් දෙන්න ඕනෑ කියලා. මම ඉස්සෙල්ලාම මුදල් ඇමතිවරයාගෙන් අහන්න කැමැතියි, මේ රාජ්‍ය ණය සම්බන්ධීකරණ කමිටුව පත් කළාද, ඒ කමිටුව පත් කරලා මාසයකට සැරයක් රැස්වෙලා මේ ණය සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගය මොකක්ද කියලා.

මේ වෙලාවේ ගරු සභාවේ ආණ්ඩුව පැත්තේ පළමුවැනි row එකේ කිසිම ඇමතිවරයෙක් නැහැ. දෙවැනි row එකේ එක් කෙනෙක් ඉන්නවා. මම දන්නේ නැහැ, එතුමා ඇමතිවරයෙක්ද නියෝජ්‍ය ඇමතිවරයෙක්ද කියලා. වැදගත් සාකච්ඡාවක් මෙතැන කරන්න වෙන්නේ මෙහෙමද? මේකද වෙනස? මේකද system change එක? කවුද ඉන්නේ? මෙතැන එක ඇමතිවරයෙක්වත් නැහැ. මහාමාර්ග ඇමතිත් නැහැ, මහාමාර්ග නියෝජ්‍ය ඇමතිත් නැහැ. සමාවෙන්න, මහාමාර්ග නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා. සමාවෙන්න, මට එතුමාව හඳුනාගන්න බැරි වුණා. හැබැයි, මෙතැන මුදල් ඇමතිත් නැහැ, මුදල් නියෝජ්‍ය ඇමතිත් නැහැ. ඒ කවුරුවත්ම නැහැ. එහෙම නම් මේ ගැන කථා කරන්නේ මොනවාටද? ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මට කියන්නකෝ මේක හම්බ වුණාද කියලා. හැබැයි, මේක එතුමා දන්නේ නැහැ. එතුමා ඉන්නේ මුදල් අමාත්‍යාංශයේ නොවෙයි නේ. ඊළඟට 21වන වගන්තියේ තිබෙනවා, "ආණ්ඩුව විසින් එළඹෙන ලද සැපයුම්කරුගේ ණය ගිවිසුම්" කියලා. එහි තිබෙනවා, "...එම ගිවිසුම්වලට එළඹීමට පෙර, කාර්යාලය විසින්, එම ගිවිසුම්වලට එළැඹීමේ දී ආණ්ඩුවට ඇතිවන වියදම තක්සේරු කරනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයාට නිර්දේශ යවනු ලැබිය යුතු ය" කියලා. හරි නේ. ඒ නිර්දේශය මම කියවන්නම්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඩොලර් මිලියන 500ක් ගන්න අවස්ථාවේදී අපට කලින් තිබුණේ සියයට,-

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
No, I am not yielding; මම එතුමාට කාලය දුන්නේ නැහැ.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
ගරු මන්ත්‍රීතුමනි, උදේ වරුවේදී ගරු ඇමතිතුමා මේ පනත ගැන පැහැදිලි කරනකොට ඔය පිළිබඳව සම්පූර්ණ විස්තරයක් කළා, ඒ ගැන සාකච්ඡා පැවැත්වුණේ කොහොමද, සාකච්ඡා කීයක් පැවැත්වුවාද, ඒකට සහභාගී වුණේ කවුද යනාදී වශයෙන්. ඔබතුමා ඒ වෙලාවේ සභාවේ හිටපු නැති නිසා ඒ ගැන දැනුවත් නැතිව ඇති.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම අහගෙන හිටියා. හැබැයි, එතුමා රාජ්‍ය ණය කළමනාකරණ කමිටුව ගැන කථා කළේ නැහැ. එහෙම දෙයක් කිව්වේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ ගැන කථා කළේ නැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඒ ගැන කථා කළේ නැහැ. එතැන තිබෙන අවුල මේකයි. අපට ඇමෙරිකන් ඩොලර්වලින්, ඩොලර් මිලියන 990ක ණයක් තමයි තිබුණේ. ඒකට පොලිය තිබුණේ, ස්ථාවරව සියයට 2.5යි. හරි නේ. ඊට පස්සේ මේක renegotiate කරනකොට, මොකද වුණේ?

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

මම කිව්වා නේ, පනතට අනුව රාජ්‍ය ණය කළමනාකරණ කමිටුවෙන් වාර්තාවක් දෙන්න ඕනෑ කියලා. එම වාර්තාව මා ළඟ තිබෙනවා. එම වාර්තාවේ මෙන්න මෙහෙම දෙයක් සඳහන් වෙනවා. ඒ කට්ටිය මෙහෙම කියනවා:

> "A fixed interest rate initially agreed upon under the Preferential Buyer's Credit Agreement i.e. 2.5 % be retained under the current financing arrangement."

ඒ කියන්නේ කලින් ගත් සියයට දෙකහමාරේ ණය පොලිය ඒ විධියටම තියා ගන්නවා කියන එකයි. ඊට පස්සේ මෙහෙම කියනවා, I quote:

> "The proposed variable interest rate structure, which includes a floor of 2.5 per cent and a cap of 3.5 per cent, appears to create asymmetrical benefits. Specifically, it is beneficial to the borrower when interest rates are increasing as the rate may rise only up to 3.5 per cent. However the borrower does not stand to gain from any reduction in the Loan Prime Rate (LPR), as the 2.5 per cent floor effectively eliminate such potential benefits. This means even though the interest rate reduces more than 2.5 per cent, the borrower is bound to pay 2.5 per cent…"

ඒ කියන්නේ මොකක්ද? සියයට දෙකහමාරත්, තුනහමාරත් අතර band එකකට එකඟ වෙලා තිබෙනවා, හැබැයි යම් විධියකට මේ පොලිය දෙකහමාරට වඩා අඩු වුණෝතින් අපට ඒ වාසිය ලැබෙන්නේ නැහැ කියන එක තමයි මේ කියන්නේ. මේක asymmetric, අසමමිතිකයි. That is the word used, I think. මොකද, පොලී අනුපාතය ඉහළ යනකොට බැංකුවට වාසියි. පොලී අනුපාතය පහළට එනකොට එහෙම නම් අපට වාසි වෙන්න ඕනෑ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මේකේ කියන්නේ එහෙම වෙන්නේ නැහැ කියලා. අසමමිතිකයි. ඒ නිසා මොවුන් කියනවා, සමමිතිකතාවක් තබා ගන්න ඕනෑ නම්, බැංකුවටත්, ලංකාවටත් එක විධියට benefit එකක් ලැබෙන්න නම් interest rate එක ඉහළට, පහළට යනකොට සියයට එකහමාරත්, තුනහමාරත් අතර පොලියකට එකඟ වෙන්න කියලා. මේක තමයි අර මම කියපු රාජ්‍ය ණය කළමනාකරණ පනතට අනුව රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයෙන් ලබා දීපු නිර්දේශය. මම ඒ නිර්දේශය ඇතුළත් ලේඛනය **සභාගත*** කරනවා.

දැන් මොකද වුණේ? ඒ නිර්දේශය භාර ගත්තේ නැහැ. ඒ නිර්දේශය භාර ගන්නවා වෙනුවට ඔබතුමන්ලාගේ කණ්ඩායම ගිහිල්ලා මොකක්ද කිව්වේ?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මට තව විනාඩි තුනක් ලබා දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට තව විනාඩි දෙකහමාරක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ස්තුතියි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එතකොට ඔබතුමන්ලා මොකක්ද කිව්වේ? ඔබතුමන්ලා කිව්වා, නැහැ, චීන කොම්පැනියේ අය කියලා තිබෙනවා, "අපට fixed rate එකකට යෑමේ හැකියාවක් නැහැ, floating rate එක තමයි දෙන්න පුළුවන්, ඒ නිසා අපි floating rate එකකට එකඟ වෙනවා" කියලා. Floating rate එකකට එකඟ වුණාම ඇති වන ප්‍රශ්නය මම කියන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙන්න මේක තමයි interest rate එක. මම චීන බැංකුවෙන් දැන් මේ document එක ගත්තේ. මේකේ මොකක්ද තිබෙන්නේ? මේකට තමයි Loan Prime Rate කියන්නේ. මේක 2020දී තිබුණේ සියයට 4.8ට. පහළට ඇවිල්ලා, ඇවිල්ලා, ඇවිල්ලා අද වෙනකොට ඒක සියයට 3.5යි. ඊළඟට මම බැලුවා, එන අවුරුද්ද වෙනකොට ඒගොල්ලන්ගේ forecast එක මොකක්ද කියලා. එන අවුරුද්ද වෙනකොට forecast එක සියයට 3.3යි. මේක වැදගත් වෙන්නේ ඇයි? ඔබතුමන්ලා එකඟ වුණු floating rate එක තමයි මම කියපු මේ 5-year Loan Prime Rate එක වන ඍණ දශම 8. එතකොට 3.5න් දශම 8ක් අඩු කළාම 2.7යි. හැබැයි, එන අවුරුද්ද වෙනකොට මේක සියයට 3.3යි. ඒකෙන් දශම 8ක් අඩු කළාම 2.5යි. එහෙම නම් මේක සියයට 2.5ට වඩා පහළ ගිය ගමන් මොකක්ද වෙන්නේ? අපට ඒ වාසිය ලැබෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම චීන බැංකුවෙන් ගත් එම documents ටික මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

එහෙම නම් ඔබතුමන්ලාට කළ යුතුව තිබුණේ දැන් තිබෙන, එහෙමත් නැත්නම් බලාපොරොත්තු වන Loan Prime Rate එක වටේට සමමිතික විධියට මේ loan එක structure කර ගන්න එක. ඒ කියන්නේ, දැනට තිබෙන්නේ සියයට 2.7 නම්, - මොකද, 3.5න් ඍණ දශම 8ක් අඩු වෙනවා කියන්නේ 2.7යි - ඒ සියයට 2.7 වටේට අපි හිතමු සියයට 1ක් කියලා, එහෙම නම් 1.7යි. ඊළඟට 2.7 වටේට තව ගානකට සමමිතිකව එකඟ වෙන්න තිබුණා. නමුත්, ඒක වෙලා නැහැ.

කවුරු මොනවා කිව්වත්, ගෙවන්න තිබෙන ණය සම්බන්ධයෙන් අපිත් බලන්න ඕනෑ. ඔබතුමන්ලා මේ අවුරුදු තුන හතරේ බලයේ ඉඳීවි. ඊළඟට අපි බලයට ආවාම ඒක අපට තමයි කරන්න වෙන්නේ. ඒ නිසා කරුණාකරලා තේරුම් ගන්න, මේවා intergenerational. අද පාර්ලිමේන්තුවේ හිටියා කියලා මේ අය කියනවා, එතුමන්ලාට fixed rate එකකට එකඟ වෙන්න බැරි වුණා කියලා. ඒක තමයි negotiation කියන්නේ. Prof. Kapila Perera එක්ක අපි සාකච්ඡා කරනකොට එතුමා අපට කිව්වේ මහා ලොකු ජයග්‍රහණයක් ලබා ගත්තා වාගේ කියලායි. එහෙම නැහැ. මෙතැන ජයග්‍රහණයක් නැහැ. මෙතැන තිබෙන්නේ පරාජයක්. Because when you negotiate a loan, you must particularly

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*


* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

have expertise to do that. එතකොට, ඒ expertise එක කොහෙන්ද ගෙනාවේ?

අනික් කාරණය මෙයයි. ඔබතුමන්ලා පාර හදන්න පටන් ගත්තා. හැබැයි, පාර හදන්න පටන් ගත්තාට චීන කොම්පැනි එකෙන් තව ගෙවීම් වගයක් ඉල්ලා තිබෙනවා, ඒ ගෙවීම් තවම confirm කරලාත් නැහැ. අපි ලේකම්තුමාගෙන් ඇහුවාම loan එක confirm කරලාද කියලා, loan එක confirm කරලාත් නැහැ. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ආ වෙලාවේත් මම සභාපති හැටියට ඇත්තවශයෙන්ම කිව්වා, මම කැමැතියි, loan එක confirm කරලා නැහැයි කියන එක පිළිබඳව, මොකද එහෙම නම් ඔබට තවත් අවස්ථාවක් තිබෙනවා, මේක හරි තැනට ගේන්න කියලා. එතකොට එක කණ්ඩායමක් මෙතැනට ඇවිල්ලා එකක් කියනවා, තව කණ්ඩායමක් ඇවිල්ලා තව එකක් කියනවා. මෙහෙම කරන්න හැකියාවක් නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට පෙන්වන්න ඕනෑ කළේ මේකයි. මේ තමයි ගන්න පළමුවෙනි loan එක. අපට ප්‍රශ්නය වුණේ loan ගෙවා ගන්න බැරි වෙච්ච එක. ඒගොල්ලන් දෝෂාරෝපණ කරනවා, තමන්ගේ ගෙවල්වලට යන්න පාරවල් හදාගත්තා කියලා. දැන් මෙතැන වෙලා තිබෙන්නේ මොකක්ද? ගන්න loan එක අපි ගන්න ඕනෑ, minimum cost එකට. ඒ විධියට minimum cost එකට ගන්නේ නැතුව ඇයි වෙන cost එකකට ගන්නේ කියන සාධාරණ ප්‍රශ්නය අපි ඔබට යොමු කරනවා. ඒ නිසා ඔබට හැකියාවක් තිබෙනවා නම් ඇයි මේ ණය අසමමිතික විධියට structure කළේ කියන එක පිළිබඳව දැනුවත් කරන්න කියා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු සුනිල් රත්නසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.47]

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට අදාළ පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳ විවාදයේදී මම විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ, 2024 වර්ෂයට අදාළවත් මේ හා සමාන පරිපූරක ඇස්තමේන්තු 9කට ආසන්න ප්‍රමාණයක් ඉදිරිපත් වෙලා තිබුණු බව. මේ ඇතැම් පරිපූරක ඇස්තමේන්තුවල පොදු ලක්ෂණයක් තිබෙනවා. තමන්ගේ අමාත්‍යාංශයට වෙන් කරපු මුදල ප්‍රමාණවත් නැහැ කියලා අතරමගදී නැවත මුදල් ඉල්ලුම් කර තිබෙනවා. විශේෂයෙන් අපි දැක්කා, 2024දී රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ගුවන් ගමන් සඳහාත් පරිපූරක ඇස්තමේන්තු දාලා මුදල් ඉල්ලීම් කළ ආකාරය. හැබැයි, අද තිබෙන්නේ එවැනි තත්ත්වයක් නොවෙයි. විපක්ෂය විසින් දීර්ඝ කාලයක් තිස්සේ ගෙන ආ වැරදි මූල්‍යමය ප්‍රතිපත්ති නිසා අත් වෙච්ච ඛේදවාචකයන්ගෙන් මිදීමේ පියවරක් විධියට තමයි අද මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම විශේෂයෙන් ප්‍රකාශ කරන්නට ඕනෑ, මංගල අය වැය ඉදිරිපත් කරලා අපි පෙන්වා දුන්නා, මේ වසරේ අපට ලබා ගන්න පුළුවන් උපරිම රාජ්‍ය ආදායම රුපියල් බිලියන 4,990ක් කියලා. මේ රුපියල් බිලියන 4,990 බදු ආදායම්, බදු නොවන ආදායම් සහ ප්‍රදාන විධියට අපි උපයා ගන්න කටයුතු කළා. ඒ අනුව බදු ආදායම රුපියල් බිලියන 4,550ක්, බදු නොවන ආදායම රුපියල් බිලියන 370ක් සහ ප්‍රදාන රුපියල් බිලියන 30ක් විධියට තමයි ආසන්න වශයෙන් රුපියල් බිලියන 4,990 හැදුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හැබැයි අපි ඇස්තමේන්තු කළා, රාජ්‍ය වියදම කොච්චරද කියලා. රාජ්‍ය වියදම බැලුවාම රුපියල් බිලියන 8,835කට ආසන්නයි. ඒකෙන් විශේෂයෙන්ම රුපියල් බිලියන 1,600ක ප්‍රමාණයක් ණය ගෙවීම සඳහාත්, රුපියල් බිලියන 2,950කට ආසන්න ප්‍රමාණයක් පොලී වාරිකය ගෙවීම සඳහාත් යොදවන්නට සිද්ධ වෙනවා. ඊට අමතරව, රාජ්‍ය සේවකයන්ගේ වැටුප් සහ වේතන ගෙවීම සඳහා රුපියල් බිලියන 1,232ක්, විශ්‍රාම වැටුප් ගෙවන්න රුපියල් බිලියන 431ක්, අස්වැසුම ප්‍රතිලාභ ගෙවන්න රුපියල් බිලියන 233ක්, වෙනත් පුනරාවර්තන වියදම් සඳහා රුපියල් බිලියන 1,073ක් සහ ප්‍රාග්ධන වියදම් ලෙස රුපියල් බිලියන 1,315ක් වැය වෙනවා කියලා අපි නිශ්චය කර ගත්තා. මේ ඔක්කෝම ගත්තාම මේ වසරේ මුළු රාජ්‍ය වියදම රුපියල් බිලියන 8,835කට ආසන්නයි. ලැබෙන්නේ රුපියල් බිලියන 4,990යි. අපට වියදම් වෙනවා, රුපියල් බිලියන 8,835ක්. ආසන්න වශයෙන් ගත්තොත්, රුපියල් බිලියන 4,000කට ආසන්න අය වැය පරතරයක් තිබෙනවා. එවැනි අය වැය පරතරයක් තිබියදී, අපි දැඩි මූල්‍යමය විනයක් පවත්වා ගනිමින් පසුගිය කාලය තුළ විවිධ ක්ෂේත්‍ර ඇතුළේ රාජ්‍ය ආදායම වැඩි කර ගන්න සමත් වුණා.

විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරය හරහා පසුගිය සැප්තැම්බර් මාසය අවසාන වෙනකොට 17 ලක්ෂයකට ආසන්න සංචාරකයන් පිරිසක් අපේ රටට ගෙන්වා ගන්න අපි සමත් වුණා. ඒ මඟින් ඩොලර් මිලියන 2,000 ඉක්මවපු ආදායමක් රට ඇතුළේ ඉතිරි කළා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වාගේම විදෙස්ගත ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ ඩොලර් මිලියන 4,430ක් දක්වා ඉහළ අගයක් කරා ගෙන එන්නට අපි සමත් වුණා. එමෙන්ම අපි සෘජු විදේශීය ආයෝජන ලෙස ඩොලර් මිලියන 4,000 ඉක්මවපු විදේශීය ආයෝජන ගෙන එන්නට සමත් වුණා. ඒ වාගේම, ඉතිහාසයේ පළමුවන වතාවට අපේ අපනයන ආදායම ගෙවුණු මාස 7 ඇතුළත ඩොලර් මිලියන 9,992 දක්වා ඉහළ නංවා ගන්නට අපි සමත් වුණා. එමෙන්ම, අපේ රේගුවේ ආදායම රුපියල් බිලියන 1,272ක් දක්වා වැඩි කර ගන්නටත් අපි සමත් වුණා. එහි ඉහළම තත්ත්වය වාර්තා කරමින් ජූලි මාසයේදී රුපියල් බිලියන 231ක් උපයන්නට අපි සමත් වුණා. ඒක සාමාන්‍යයෙන් අපේ සමස්ත අස්වැසුම ප්‍රතිලාභ ලබා දෙන මුදල් ප්‍රමාණයට සමානයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඒ වාගේම, අපේ වරාය මෙහෙයුම් කටයුතුවලින් රුපියල් මිලියන 24,000කට වැඩි මුදලක් උපයා ගන්නට අපි සමත් වුණා, මාස 6ක් ඇතුළත. ආර්ථික ඔස්තාර්ලා හිටපු විපක්ෂය මේ රට පාලනය කරනකොට 2024 අවුරුද්දටම වරාය මෙහෙයුම්වලින් උපයා තිබුණේ රුපියල් මිලියන 14,000යි. හැබැයි, අපි මාස 6ක් ඇතුළත රුපියල් මිලියන 24,000ක් උපයා තිබෙනවා. Ceylon Petroleum Corporation එක පළමු මාස 6 ඇතුළත රුපියල් බිලියන 18ක ලාභයක් ලබා තිබෙනවා. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය පළමු මාස 6 ඇතුළත රුපියල් මිලියන 3,600ක ලාභයක් ලබා තිබෙනවා. එහෙම තමයි පසුගිය කාලයේ අපි මේ රට ආර්ථික වශයෙන් ස්ථාවර කර ගත්තේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ උපයපු මුදල් අපි රටේ විශාල සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් සඳහා දායක කරගෙන තිබෙනවා. එහි ප්‍රමුඛතම අවස්ථාවක් තමයි, මේ මාර්ග සංවර්ධනය.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි කුඩා කාලයේ ඉගෙන ගෙන තිබෙනවා, Bermuda Triangle එක ගැන.

[ගරු සුනිල් රත්නසිරි මහතා]

Bermuda Triangle එක උතුරු අත්ලාන්තික් සාගරයේ බටහිර කොටසේ පිහිටා තිබෙනවා. මේකට ඉහළින් යන ගුවන් යානා අතුරුදහන් වෙනවා. ඒ වාගේම මේ ආසන්නයෙන් යන නෞකා අතුරුදහන් වෙනවා. ඒ නිසා මේකට කිව්වා, Devil's Triangle කියලා. පොළොන්නරුව දිස්ත්‍රික්කයේත් තිබුණා, ඒ වාගේ Devil's Bridge එකක්. ඒකට කිව්වා, කොටලීය පාලම කියලා. 2023 ජූනි මාසයේ 09වැනි දා බස් රථයක් වැටුණා, මේ පාලමෙන් පහළට. ඒ සිදු වුණු අනතුරින් විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක් ඇතුළු 11දෙනෙක් මරුමුවට පත් වුණා. ඒ අවස්ථාවේදී මාධ්‍යවේදියෙක් බන්දුල ගුණවර්ධන හිටපු අමාත්‍යවරයාගෙන් ඇහුවා, "මේ පාලම හදන්නේ නැද්ද?" කියලා. හැබැයි, එතුමා කිව්වා, "මේ පාලම් හදන්න අපට සල්ලි නැහැ. කොහේ තිබෙන සල්ලිද? පාලම් හදන්න අපට සල්ලි ඇත්තේ නැහැ" කියලා. හැබැයි, අපේ ගරු බිමල් රත්නායක අමාත්‍යතුමා සහ නියෝජ්‍ය අමාත්‍යතුමා මැදිහත් වෙලා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ විශාල සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් මේ වනවිට කරගෙන යනවා. ඔක්තෝබර් 01වැනි දා අපි කොටලීය පාලම සහ ඒ ආසන්නයේ තිබෙන ගල්ලැල්ල පාලම ඉදිකරන්නට කටයුතු ආරම්භ කර තිබෙනවා. ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රුපියල් ලක්ෂ 7,300ක්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. හැබැයි, ටෙන්ඩර්කරු මේක ගන්නේ රුපියල් ලක්ෂ 5,410කට. ඒ නිසා රුපියල් ලක්ෂ 1,890කට ආසන්න මුදලක් ඉතුරු වෙනවා. මොකක්ද, මේ මුදල ඉතුරු වෙන්න හේතුව?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මේ විපක්ෂයේ මහත්වරු බලයේ සිටියදී කොන්ත්‍රාත්කරුවෙක් ටෙන්ඩරයක් ගන්නකොට මන්ත්‍රීට වෙන් කරනවා, සියයට 10ක්. ඒ සියයට 10 තමයි අර කොටලීය පාලම හදනකොටත්, ගල්ලැල්ල පාලම හදනකොටත් රුපියල් ලක්ෂ 7,300 සිට රුපියල් ලක්ෂ 5,410 දක්වා අඩු කරගන්න සමත් වුණේ. රට පුරාම විශාල ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක වෙනවා. අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා, එතුමා හයෙන් ඉන්නේ කියලා, අපි ගන්නා ණය එතුමන්ලාට ගෙවන්න වෙයි කියලා. අපි සහතික කරලා, සපථ කරලා කියනවා, ගරු මන්ත්‍රීතුමනි, කල්පයක් ගියත් ඔයගොල්ලන්ට නැවත බලය ගන්න අපේ රටේ ජනතාව ඉඩ තබන්නේ නැහැ කියලා. ඒක සහතිකයි.

බොහොම ස්තුතියි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමා කිව්ව කාරණයක් සම්බන්ධයෙන් මම පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. එතුමා කිව්වා, contract කරනකොට ඒ කාලයේ පැවති ආණ්ඩුවල හිටපු අදාළ මන්ත්‍රීවරයාට සියයට 10ක් වෙන් කරනවා කියලා. එහෙම කර තිබෙනවා නම් මම හිතන විධියට ඒක නීතිය ඉදිරියට යා යුතු කාරණාවක්. මොකද, මෙතැන මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් ඉන්නවා. සමහර මන්ත්‍රීවරු, සමහර වෙලාවට එහෙම කරන්න ඇති. නමුත්, බොහෝ දෙනෙක් එහෙම කරලා නැහැ. ඒ නිසා මම හිතන විධියට එතුමා එවැනි කථාවක් කිව්ව එක අසාධාරණයි. එම නිසා එතුමා කිව්ව ඒ කාරණය ඉල්ලා අස්කර ගන්න ඕනෑ. එහෙම නැත්නම් එතුමා නම් කරන්න ඕනෑ, කවුද එහෙම කළේ කියලා. එතුමාට නම් කරන්න කියන්න, කවුද එහෙම කළේ කියලා.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේකට මම උත්තරයක් දුන්නේ නැත්නම් ඒක හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට කරන අසාධාරණයක් වෙනවා. 2011, 2012 අවුරුදුවල උතුරු මැද පළාතේ පාරවල් 53ක් ප්‍රතිසංස්කරණය කරන්න රුපියල් ලක්ෂ 30,000ක් වෙන් කරනවා. කාන්ති කන්ස්ට්‍රක්ෂන් සමාගම තමයි මේ ව්‍යාපෘතිය ගන්නේ. කාන්ති කන්ස්ට්‍රක්ෂන් සමාගම මේ ව්‍යාපෘතිය අරගෙන මේ වැඩ අවසන් කරන්නේ නැතුව අයුතු විධියට මුදල් පරිහරණය කරලා තිබෙනවා. ඒ අවස්ථාවේදී හෙළි වෙනවා, එවකට හිටපු මහ ඇමතිවරයා මේ කොන්ත්‍රාත් සමාගම්වලින් මුදල් ලබා ගත්තා කියලා. තව ඕනෑ තරම් දේවල් කියන්නම්. *[බාධා කිරීම්]* හරි, ඒ නිර්දේශය ලබා දීලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, COPA එකේදී ඒ නිර්දේශය අපි ලබා දීලා තිබෙනවා. *[බාධා කිරීම්]* ඒ නිර්දේශය අපි ලබා දීලා තිබෙනවා. COPA එකේදී අපි ඒ නිර්දේශය ලබා දීලා තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඒක හොඳයි, ගරු මන්ත්‍රීතුමනි. මොකද, නැත්නම් එක බුරුසුවෙන් හැමෝම පාට කරන එක හොඳ නැහැ. මොකද, වැදගත් මිනිස්සු මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඔබතුමන්ලා හිතන්න එපා, ඔබතුමන්ලා විතරයි ශුද්ධ කියලා. එහෙම නැහැ. හැම පක්ෂයකම හොඳ කට්ටියත් ඉන්නවා, නරක කට්ටියත් ඉන්නවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.58]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ අය වැරදි කියලා හැමෝටම ඇඟිල්ල දිගු කරනවා. දැන් මේ අය තමයි පිරිසිදු එකම කණ්ඩායම. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම ඉතා පැහැදිලිව මේ කාරණය කෙරෙහි ඔබතුමියගේ අවධානය යොමු කරවනවා.

හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා වාගේ මෙවැනි දෙයක් පොදුවේ කිව්වාම, ඒක පිරිසිදු දේශපාලනඥයන් සියලු දෙනාටම බලපානවා. ඒක නිසා ඔබ විතරක් නොවෙයි පිරිසිදු. මේ රටට අවංකව සේවය කරපු, අවංකව වැඩ කරපු විශාල ප්‍රමාණයක් දැනුත් ඉන්නවා; ඉස්සරත් ඉඳලා තිබෙනවා.

දැන් තමුන්නාන්සේලා අවුරුදු 76ක ශාපය ගැන කථා කරනවා නේ. රුපියල් කෝටි ගණනක් මුදල් වෙන් කළා කියාත් දැන් කියනවා නේ. රුපියල් කෝටි ගණනක් මුදල් වෙන් කළාය කියලා දැන් කිව්වාට, ජනතා විමුක්ති පෙරමුණේ තමුන්නාන්සේලා එදා ලංගම බස් රථ 553ක් ගිනි තැබුවා. ලංගම බස් රථ 553ක් ගිනි තැබුවා. බස් ඩිපෝ 15ක් ගිනි තැබුවා. ලංගම වැඩ පොළවල් ගිනි තැබුවා. දුම්රිය ස්ථාන 24ක් විනාශ කළා. දුම්රිය මාර්ග විනාශ කළා. දැන් මෙතුමන්ලා ඔක්කොම රහත් වෙලා වාගේ කථා කරනවා. ඒක නිසා කරුණාකරලා මේ අවුරුදු 76ක ශාපය ගැන කථා කරනකොට තමුන්නාන්සේලාගේ ඒ අතීතය ගැනත් අමතක කරන්න එපා.

ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, දැන් මෙතුමන්ලා 2010දී, 2011දී වෙච්ච හොරකම් ගැන කථා කරනවා. කවුද මහින්ද රාජපක්ෂ මැතිතුමාව ජනාධිපති විධියට පත් කළේ? අපිද? හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා, ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා, සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා ඇතුළු අපි එතුමාගේ වේදිකාවට නැග්ගාද? අපි එතුමාගේ වේදිකාවට නැග්ගේ නැහැ. අපි මහින්ද රාජපක්ෂ මැතිතුමාව ජනාධිපති හැටියට පත් කළේ නැහැ. තමුන්නාන්සේලා තමයි ගිහිල්ලා, මහින්ද හොඳායි කිව්වේ. තමුන්නාන්සේලා තමයි, මහින්ද තරම් වෙන කෙනෙක් නැහැ කිව්වේ. මහින්ද රාජපක්ෂ මැතිතුමාව මේ රටේ ජනාධිපති කරන්න තමුන්නාන්සේලා තමයි වැඩියෙන්ම මහන්සි වුණේ. යාළුකම්ද, නෑද්ද කියලා මම දන්නේ නැහැ. අපි ඒ වේදිකාවට ගිහිල්ලා, කඩේ ගියේ නැහැ. අපි ඒ වේදිකාවට ගිහිල්ලා, එතුමාව ජනාධිපති හැටියට පත් කළේත් නැහැ. අපි ප්‍රතිපත්තියක් අනුව හැමදාම ඊට විරුද්ධව කටයුතු කළා.

ඒ විතරක් නොවෙයි. තමුන්නාන්සේලාගේ ඉතිහාසය අරගෙන බලන්න. 1994 ඉඳන් හැම ආණ්ඩුවක්ම හදන්න පිටුපස ඉඳලා, ඉස්සරහ ඉඳලා -දෙපැත්තේම ඉඳලා- වැඩ කටයුතු කළේ ජනතා විමුක්ති පෙරමුණ. වෙන කවුරුවත් නොවෙයි. ඔබතුමන්ලා චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ කැබිනට් මණ්ඩලයේ හිටියා. මහින්ද රාජපක්ෂ මැතිතුමාව ජනාධිපති හැටියට පත් කළා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව ජනාධිපති කරන්න ඕනෑකමට ඒ ජනාධිපතිවරණයට තමුන්නාන්සේලා ඡන්දය ඉල්ලුවේ නැහැ. සරත් ෆොන්සේකා මැතිතුමාගේ වේදිකාවට නැග්ගා. මේ දේවල් කවුද කළේ?

මේ හැම දෙයක්ම පිටිපස්සේ තමුන්නාන්සේලාගේ දේශපාලනය තිබුණා. එකපාරටම මැරිලා ඉපදුණා නොවෙයි. 1988-89 කාලයේ කියපු දෙවල් තමයි මේ. 1988-89 කාලයේ වෙච්ච දේවල් තමයි මේවා. මේ විනාශයට තමුන්නාන්සේලා වග කියන්න ඕනෑ. අපි සතුටු වෙනවා, තමුන්නාන්සේලා ප්‍රජාතන්ත්‍රවාදී මඟට ආපු එක ගැන. ඒ ගැන කිසිම සැකයක් නැහැ. ඒ අවි ආයුධ ඔක්කෝම බිම තියලා, ඒ විප්ලවීය අදහස් අමතක කරලා දැන් ප්‍රජාතන්ත්‍රවාදී වැඩකටයුත්තකට ඇවිල්ලා තිබෙනවා. දැන් අවුරුද්දක් ගත වෙලා තිබෙනවා, මේ ආණ්ඩුව පත්වෙලා. කරුණාකරලා අරයාගේ, මෙයාගේ වැරදි, පසුගිය ආණ්ඩුවේ වැරදි කියන්න එපා.

දැන් මේ කෝටි ගණනක මුදල් අමාත්‍යාංශවල වැඩ ටික කරගන්න බැරුව ආපහු යනවා. දැන් මේ සාකච්ඡා කෙරෙන අමාත්‍යාංශයේ විතරක් නොවෙයි -ඉදිරි අය වැය විවාදයේදී අපි ඒක දැනුවත් කරන්නම්- ඉතා පැහැදිලිවම අති දැවැන්ත මුදල් ප්‍රමාණයක් ආපහු යනවා වැඩ කරන්නේ නැතුව. ඒක තමුන්නාන්සේලාගේ හෘදය සාක්ෂිය දන්නවා. වැඩ කරන්නේ නැතුව ඒ මුදල් යන එකට මොකක්ද කියන්නේ? හොරකම් කරන්නේ නැති හින්දා ලු. ඔය විහිළු කථා කියන්න එපා, ගරු මන්ත්‍රීතුමා. විහිළු කථා කියන්න එපා. මුදල් ටික ආපහු යවන්න නොවෙයි, හොරකම් කරන්නේ නැතුව වැඩ ටික කරන්න. ඒකයි දක්ෂකම කියන්නේ. දැන් තමුන්නාන්සේලා කියන්නේ "හොරකම් කරන්නේ නැහැ. ඒක හින්දා අපි වැඩ කරන්නේත් නැහැ" කියලා. ඇත්තටම රටට වෙලා තිබෙන්නෙත් ඕකම තමයි. හොරකම් කරන එක සම්පූර්ණයෙන්ම වැරදියි. හැබැයි හොරකම් කරන එක නතර කළා කියලා වැඩ නොකර ඉන්නවා කියන එකට අපි එකඟ වෙන්නේ නැහැ. හොරකම් කරන්නත් එපා, වැඩත් කරන්න. හොරකම් කරන්නත් එපා ඒත් වැඩත් කරන්න. අපි හොරකම් කරනවාට සම්පූර්ණයෙන් විරුද්ධයි. කිසිම සැකයක් නැහැ. හොරකම් කරලා තිබෙන යම් පුද්ගලයෙක් ඉන්නවා නම් - දැන් තමුන්නාන්සේලා කිව්වා නේ, 2010, 2011 කාලයේ මොකක්ද කථාවක් - කිසි ගැටලුවක් නැහැ, ඒ අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්න. දැන් අවුරුද්දක් කියවා කියවා හිටියා මදැයි. අවුරුද්දක් තිස්සේ "අරයා හොරා. මෙයා හොරා" කියලා කිව්වාට වැඩක් නැහැ. නීතිය ක්‍රියාත්මක කරන්න.

තමුන්නාන්සේලා අවුරුදු 76ක ශාපයක් ගැන කථා කරමින් ඉන්නේ නැතිව මේ වසන්ත සමරසිංහ ඇමතිතුමාගෙන් ඉගෙන ගන්න, අවුරුදු 76 තුළ කොහොමද දියුණු වෙලා තිබෙන්නේ කියලා. තමුන්නාන්සේලාගේ කරුමයට එතුමා වග කියන්නේ නැහැ. දියුණු වෙන්න පුළුවන් අය දියුණු වුණා. දියුණු වෙන්න හැකියාව තිබෙන අය දියුණු වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා දන්නවා වසන්ත සමරසිංහ ඇමතිතුමා හොඳට දියුණු වෙලා තිබෙන බව. අපි සතුටු වෙනවා ඒ ගැන. ඒ ගැන කිසිම කුහකත්වයක් නැහැ. කිසිම ගැටලුවක් නැහැ. ඒ දියුණු වෙන්න පුළුවන් ආකාරයට දියුණු වෙන්න. හැබැයි මම ඉතා පැහැදිලිව කියනවා, මේ වර්ෂය තුළ මේ මුදල් වෙන් කරලා තිබෙනවා නම් ඒ වෙන් කරලා තිබෙන මුදල් උපරිමයෙන් මේ රටේ ජනතාවට වැඩ කරන්න පුළුවන් විධියට වියදම් කරන්න කියලා. ආපහු හරවලා යවන එක නොවෙයි වැඩේ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)*rose.*
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සෑම මන්ත්‍රීවරයෙකුම සිය අදහස් ප්‍රකාශ කිරීමේදී සාකච්ඡාවට භාජන වන විෂයට සීමා විය යුතුයි කියලා සඳහන්ව තිබෙනවා, ස්ථාවර නියෝග 91 (ඉ) යටතේ. දැන් මෙතුමා විෂය කරුණුවලට අමතරව වෙනත් කරුණු ගණනාවක්; හැම දාම පට්ට ගහන 1988-89 කාලය ගැන නැවත ඇද බෑවා. මෙතුමාගේ තාත්තා ඇමති

[ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා]

ධුරයේ ඉන්නකොට තාත්තා බෙහෙත් ගන්නත් පාවිච්චි කරලා තිබුණා, ජනාධිපති අරමුදල. මෙතුමාට උගන්වන්නත් පාවිච්චි කරලා තිබුණා, ජනාධිපති අරමුදල. ගරු මන්ත්‍රීතුමනි, ලජ්ජා වෙන්න ඕනෑ තමුන්නාන්සේ. තාත්තා ඇමතිවරයාව ඉන්නකොට-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව පටන් ගන්න. *[බාධා කිරීම්]* ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා. *[බාධා කිරීම්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
දැන් විෂයට අනුව කථා කරන්න කියලා කියපු එක්කෙනා මේ කථා කරන්නේ විෂය ගැනද? මොකක්ද මේ point of Order එක?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Point of Order එක මොකක්ද කියලා අහන්න. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව පටන් ගන්න.

[අ.භා. 3.05]

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මගේ කථාව ආරම්භ කරන්න පෙර විපක්ෂයෙන් නැඟුණු කාරණා ටිකකට උත්තරත් දීලා කථාව ආරම්භ කරන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා. 76 අවුරුදු ශාපය ගැන කිව්වාම අපේ ආර්ථික ඔස්තාර් මැතිතුමා කියනවා, මේක කන්න, බොන්න නැතුව තිබ්බ රටක් නොවෙයි කියලා. නැහැ, තෙල් පෝලිම්, ගෑස් පෝලිම් ඇති වෙලා, විදුලිය නැතුව නන්නත්තාර වෙච්ච රටක් තිබුණේ. ඒ විතරක් නොවෙයි. මහ බැංකුවේ අධිපති නන්දලාල් මැතිතුමා 2022 අප්‍රේල් 12වැනි දා මාධ්‍යයට ඇවිල්ලා ලෝකයටම කිව්වා, අපේ රට ණය ගෙවාගන්න බැරි රටක් කියලා. වතුරවත් පෙවෙන්නේ නැති රටක් කියලා කිව්වේ. එදා ඉඳලා ණය ගෙව්වේ නැහැ. එහෙම රටක් මහත්තයෝ. ඒකට තමයි 76 වසරක ශාපය කියන්නේ. දැන් විපක්ෂයේ ඉඳගෙන මාර දර්ශනයක් දාන්නේ. පුදුම උපදෙස් ටිකක් නේ දෙන්නේ. අනේ, පව්! ඔය ටික පෙට්ටගමේ දාලා තියා ගන්න. මොකද, ඔබතුමන්ලා හිතනවා නේ ඔබතුමන්ලාට ආණ්ඩුවක් එයි කියලා. එන්නේ නැහැ. බැරි වෙලා හෝ ආවොත් ක්‍රියාත්මක කරන්න තියා ගන්න.

ඊළඟට, අපේ අනෙක් බේබී. ඒ බේබී කථා කරලා යනවා. බේබී මොකද කියන්නේ? ස්වාධීන කොමිෂන් සභා ගැන කියනවා. හිටපු පොලිස්පතිතුමාම කිව්වා, එතුමන්ලාගේ පසුගිය ආණ්ඩුව කාලයේ පොලිස් ස්ථානවලට පත් කළ ස්ථානාධිපතිවරු දෙදෙනෙක් හැරෙන්න අනෙක් ඔක්කෝම දේශපාලන පත්වීම් කියලා. එහෙම ආණ්ඩුවක හිටපු බේබී තමයි ජාතික පොලිස් කොමිසමේ ස්වාධීනත්වය ගැන අද කථා කරන්නේ; අපි ගැන කියන්නේ. ඒ විතරක් නොවෙයි. සත්තු වත්තේ සත්තු තිස්දෙදෙනෙක් ගැන කථා කළා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කරුණාකරලා සත්තු වත්තේ CCTV check කරන්න කියන්න. මැදමුලනෙන් එදා ආවා ද, නැත්නම් පොහොට්ටුවෙන් කවුද ඇවිල්ලා තිබෙන්නෙ කියලා බලන්න. සත්තු තිස්දෙදෙනෙක් නොවෙයි, ඔක්කෝම සත්තු අතුරුදහන් වෙන්න පුළුවන්. කෞතුකාගාරයේ තිබුණු කඩුවට කෙළවපු අය. ඒ විතරක් නොවෙයි. ශ්‍රී පාදස්ථානයේ සණ්ටාරයත් උස්සපු අය නේ මේ සත්තු ගැන කථා කරන්නේ. ලජ්ජයි, ස්වාධීන කොමිෂන් සභා ගැන කියනවා. ඒ විතරක් නොවෙයි. OICලා මාරු කිරීම් ගැන කියනවා. පොලිස්පතිවරයා පත් කිරීම ගැන කියනවා.

අපි දැක්කා හිටපු පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්ගේ ක්‍රියාකලාපය. වෙච්ච දේ දන්නවා නේ. ඔහුව පත් කළේ කවුද? ඒ විතරක් නොවෙයි. ඒගොල්ලෝ පත් කරලා අරගළයට ගහනකොට, ඝාතන කරනකොට, විවිධ විවිධ දේවල් කරනකොට, ආයුධ පෙන්වන්න ගිහිල්ලා මදුෂ්ව මරණකොට මේ විපක්ෂ නායකතුමාගේ ශ්‍රී මුඛය ඇරුණේ නැහැ. එතුමාම කියනවා, ශ්‍රී මුඛය ගැන. ඒ ශ්‍රී මුඛය එතැනදී ඇරුණේ නැහැ නේ, ගරු ගයන්ත මන්ත්‍රීතුමනි. ඒ ශ්‍රී මුඛය ඇරුණේ නැත්තේ ඇයි? එතුමාම තමයි කිව්වේ. ඇඹිලිපිටියට ගිහින් කිව්වා, "මම නම් සක්විති රජකම හම්බ වුණත් රනිල් එක්ක එකතු වෙන්නේ නැහැ" කියලා. දැන් එකට එකතු වෙලා ඉන්නේ. සජිත් ප්‍රේමදාසගේ ඒ ශ්‍රී මුඛය ඇරුණේ නැහැ නේ ඒ කාලයේ, අර පොලිස් කොමිසමේ ස්වාධීනත්වය ගැන කථා කරන්න. ඒ විතරක් නොවෙයි. හිටපු අගවිනිසුරුතුමිය ඉවත් කරන්න මේ පාර්ලිමේන්තුවේ දවසක් නිදි වරාගෙන -එහෙම නේද- නඩු අහලා දොට්ට දමනකොට අනේ ඒ ශ්‍රී මුඛය ඇරුණේ නැහැ නේ, ස්වාධීනකම ගැන කියන්න. අනේ, ලජ්ජයි සජිත් මහත්තයෝ. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඔබතුමාවත් උත්තර දෙන්න.

අපේ ගරු අගමැතිතුමිය කිව්වා වාගේ, ඊළඟට විපක්ෂයේ විහිළුකාරයා කියන්නේ මොනවාද? ඔව්. ඇත්තටම විහිළුකාරයෝ ඉන්න ඕනෑ. විහිළුකාරයා කියනවා, අපි දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කරන්න පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පත ගෙනෙනකොට එම සංශෝධන ගෙනා දවසේ ගුරුවරයෙකුට පහර දීලා ලු. එතුමා ඌව පළාත් සභාවේ මහ ඇමති වෙලා හිටියා. මම අහනවා, දණ්ඩ නීති සංග්‍රහයේ මොන වගන්තියට අනුවද අර බදුල්ලේ දෙමළ බාලිකා විද්‍යාලයේ භවානි රගුනාදන් කියන විදුහල්පතිනිය දණ ගැස්සුවේ කියලා අපි අහනවා, විහිළුකාරයාගෙන්. ඒ, මොන පනත් සංශෝධනයෙන්ද, මොන වගන්තියට අනුවද කියලා අහනවා. නිකන් විහිළු සපයන්න එපා!

ඒ විතරක් නොවෙයි. උත්සාහ කරනවා අප අතර පොඩි බෙදීම් තිබෙනවා කියලා පෙන්වන්න. ගම්වල ගිහිල්ලා අගමැතිතුමිය ගැන කථා කියනවාලු. "ආ, ඒවා අගමැතිතුමිය නේ ගෙනෙන්නේ. දණ්ඩ නීති සංග්‍රහයට සංශෝධන ගෙනාවේ අගමැතිතුමිය" කියලා කියනවා ලු. ඒ විහිළුකාරයාට විතරක් නොවෙයි, මුළු විපක්ෂයටම

සහ මුළු රටටම අපි කියනවා, ජනාධිපතිතුමා, අගමැතිතුමිය ඇතුළු කැබිනට් මණ්ඩලය, ඒ අපේ 159ම කරන කියන දේවල් වෙනුවෙන්, ඒ සියලු දේ වෙනුවෙන් අපි වග කියනවා. 159දෙනාම වග කියනවා. ඒ විතරක් නොවෙයි, රකිනවා. ජනාධිපතිතුමාව රකිනවා. අපේ අගමැතිතුමියව රකිනවා. අමාත්‍ය මණ්ඩලය රකිනවා. ඇයි අපි ඒ අය රකින්නේ? අවුරුදු ගණනක්, සියවස් ගණනක් අපේ රටේ මිනිස්සු ජීවිත පරිත්‍යාග කරලා ඇස්, ඉස්, මස් දන් දීලා මේ වෙනස කළේ මහ ජනතාව අසීමිත බලාපොරොත්තුවක් තබලා. ලක්ෂ 69කට ආසන්න ප්‍රමාණයක් ජන වරමක් දුන්නේ ඒ වෙනුවෙන්. ලෝකයේ වැරදි නොකරන සහ වැරදි සිදු නොවන පිරිස් නැහැ. වැරදි නොකරන මිනිසුන් නැහැ. වැඩිපුර වැරදි කරන සහ අඩුවෙන් වැරදි කරන මිනිසුන් ඉන්නේ. අපි රටට කියනවා, අපේ බලාපොරොත්තුව හැම වෙලේම වැරදි අඩුවෙන් කිරීමයි කියලා. අපෙන් වැරදි වෙන්න පුළුවන්. හැබැයි, අපට වැරදුණාම අපි ඒවා නිවැරදි කර ගන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මොනවාද, මේ ගොල්ලන් අප ගැන කියන වැරදි? ජනාධිපතිතුමාගේ බොත්තම එහේ මෙහේ වෙච්ච එක ගැන කථා කරනවා. හැබැයි, මහ බැංකුව මහ දවල් කඩපු එක - ඒක මේ ගොල්ලන්ට වැරැද්දක් නොවෙයි. ජනාධිපතිතුමාගේ බොත්තම එහේ මෙහේ වෙච්ච එක වැරදියි. ඒ වාගේම, අපේ තවත් කෙනෙකුට භාෂාවේ වචනයක් එහේ මෙහේ වුණාම, ඒකත් වැරදියි. හැබැයි, අර දකුණු පළාතේ අයිස්ලන්තයේ කුඩු අහුවෙන එක - ඒක වැරදි නැහැ. ඒ වෙනුවෙන් මුළු විපක්ෂයම එකතු වෙලා ඉන්නවා. ඒවා වැරදි නැහැ. අපේ ඇමතිවරයෙකුගේ, මන්ත්‍රීවරයෙකුගේ වචනයක් එහේ මෙහේ වෙන එක වැරදියි. වැරැද්ද සාපේක්ෂයි නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මා හිතන්නේ, ඒකට ඊට වඩා උත්තර දෙන්න ඕනෑ නැහැ කියලායි.

මෙහිදී ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය අපේ ගරු බිමල් රත්නායක මැතිතුමාටත්, ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍ය ගරු ප්‍රසන්න ගුණසේන මැතිතුමාටත්, වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍ය ජනිත ගරු රුවන් කොඩිතුවක්කු මැතිතුමාටත් -එතුමන්ලා තුන්දෙනාටම- අපි ස්තුති කරන්න ඕනෑ.

විපක්ෂයේ සමහරු කියන තවත් දෙයක් තිබෙනවා. අදාළ වියදම් ටික කර ගන්න අපේ ආණ්ඩුවට බැරි ලු. මම කියන්නම්, සංවර්ධන වියදම් ගැන. අපි එක පැත්තකින්, දුම්රිය සේවය සංවර්ධනය කරනවා. නවීකරණය වන දුම්රිය ස්ථාන 32ක් තිබෙනවා, කොළඹ කොටුව, මරදාන, ගාල්ල, කොම්පඤ්ඤ වීදිය, ත්‍රිකුණාමලය, Jaffna ආදි වශයෙන්. එහෙම කියාගෙන යන්න ගියොත්, railway station එකේ loudspeaker එක වාගේ වෙනවා. ඒ නිසා මම ඒ කීම එතැනින් නවත්වනවා.

ඒ විතරක් නොවෙයි, අපි මඟී බස්රථ සේවයත් සංවර්ධනය කරනවා. පිටකොටුවේ මධ්‍යම බස් නැවතුම් පොළ අවුරුදු ගණනාවකට පසුව අද නවීකරණය වෙනවා. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝ 25ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවා. විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් සඳහාම වෙන් වෙච්ච බස් 10ක් ආනයනය කරනවා. නව සුඛෝපභෝගී බස්රථ 200ක් ගේන්න ප්‍රසම්පාදන කටයුතු අවසන් කර තිබෙනවා. ඔන්න, වියදම් කරන විධිය. ඒ වාගේම, නව දුම්රිය බලවේග කට්ටල 5ක් සඳහා වන ප්‍රසම්පාදන කටයුතු අවසන් කර තිබෙනවා. දුම්රිය මැදිරිවල මඟී පහසුකම් වැඩි දියුණු කිරීමට විදුලි පංකා 5,000ක් ආනයනය කරනවා. දුම්රිය ධාවනයෙහි වේගය වැඩි කරන්න රේල් පීලි 12,000ක් ගේනවා. දුම්රිය රියැදුරන්ගේ පහසුකම් තකා රියැදුරු මැදිරි වායුසමීකරණය කරනවා.

ඒ විතරක් නොවෙයි, "පුනරුදයට මඟ" ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය, කාලයක් තිස්සේ නැවතිච්ච, නවත්වපු iRoad ව්‍යාපෘතිය, ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන ICDP ව්‍යාපෘතිය කියන ව්‍යාපෘති තුන යටතේ මාර්ග 2,000ක් සංවර්ධනය කිරීමේ කටයුතු අපි ආරම්භ කර තිබෙනවා. ඒවා යටතේ මගේ දිස්ත්‍රික්කයේ යෝජිත සංවර්ධන කටයුතු ගැන මම කියන්නම්. මේ වනකොට රත්නපුර දිස්ත්‍රික්කයට විතරක් රුපියල් මිලියන 7,200ක් වෙන් කරලා දැන් ඒ වැඩ කටයුතු කරමින් පවතිනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලබා දී තිබුණු කාලය අවසන්.

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)
මට තවත් විනාඩි දෙකක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

රත්නපුර දිස්ත්‍රික්කය ගැන කිව්වොත්, සූරියකන්ද, ඇරැපෝරුව මාර්ග කිලෝමීටර් 10ක් සංවර්ධනය සඳහා සෞදි සහ OPEC අරමුදලින් කෝටි 100ක් -බිලියනයක්- සහ ඊට අමතරව තවත් බිලියන 4ක් අපේ ආණ්ඩුවෙන් වෙන් කරනවා. ඒ විතරක් නොවෙයි, අපි ආරම්භ කර තිබෙනවා පාලම් ව්‍යාපෘති 32කට වඩා. ඒ යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේත් අත්‍යවශ්‍ය පාලම් 4ක් නිර්මාණය වෙනවා. පාලම් 27ක්- රත්නපුර දිස්ත්‍රික්කය ගත්තොත්, දෙණියාය - මාදම්පේ 106/13, මාදම්පේ - දෙණියාය 106/14, මාදම්පේ - දෙණියාය 93/4, මාදම්පේ - දෙණියාය 106/4 කියන පාලම් ටික නිර්මාණය වෙනවා. සංවර්ධනය පැත්තේ කරුණු ගත්තොත් එහෙමයි. හැබැයි, මේ පරිපූරකය කියන්නේ, වියදම් කරන්න බැරි එකක් නොවෙයි.

ආර්ථික අර්බුදය ද, අර අර්බුදය ද, මේ අර්බුදය ද, හැම අර්බුදයම මේ ගොල්ලන්ම කරපු වැරදි නිසයි. මට මතක් වෙනවා, ධම්ම පදයේ එන "... චක්කං ව වහතො පදං" කියන ගාථා පාඨය. ගොනු පිටුපස කරත්ත රෝදය එන්නා වාගේ මේ ගොල්ලන්ම කරපු ඒවායේ විපාක තමයි මේ ලැබී තිබෙන්නේ. ඒක තමයි ඇත්ත, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.15]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நன்றி!

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කලින් අහන්න ගිය කාරණය දැන් අහන්න.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ගරු ඇමතිතුමනි, කන්කසන්තුරේ වරායේ මඟී පර්යන්තයේ පහසුකම් ඉතාම අඩු බව ඉන්දියාවෙන් පැමිණෙන සංචාරකයන් කියනවා අපට ඇහෙනවා. ඔබතුමාගෙන් මා අහන්න හිටියේ ඒ ගැනයි. ඒ නිසා ඔබතුමා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියා ඉල්ලන්නයි මා ඒ වෙලාවේ නැඟී සිටියේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමනි, ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමාගේ අවසරයකින් තොරව උත්තර දෙන්න හොඳ නැති නිසා තමයි මම ඒ වෙලාවේ ඒක ප්‍රතික්ෂේප කළේ. මම දැන් ඔබතුමාට කිව්වා, ඒක අහන්න කියලා. අපි ඒ කාරණය පිළිගන්නවා. මට නුවර මහාචාර්යවරයෙකුත් මේ ප්‍රශ්නය ගැන දන්වා එවා තිබුණා. අපි ඒ සඳහා මුදල් වෙන් කරලා, මඟීන්ට පහසුකම් ලැබෙන විධියට කන්කසන්තුරේ ජැටිය renovate කරනවා.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් "පරිපූරක මුදල" පිළිබඳ යෝජනාවට අදාළ මේ විවාදයේදී මම විශේෂ කාරණයක් කියන්න ඕනෑ. ගරු ඇමතිතුමා කථා කරද්දී කනගාටුවෙන් වුණත් කිව්වා, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයත්, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවත් ගොඩ ගන්නම බැරි තත්ත්වයක තිබෙන බව. අපිත් ඒක පිළිගන්නවා. නමුත්, අපේ ගරු හර්ෂණ රාජකරුණා මැතිතුමාගේ කථාව ඇහුවා නම්, දුම්රිය සේවය ගොඩ ගන්න බැරි තත්ත්වයට ඔබතුමන්ලාත් වග කියන්න ඕනෑ කියන එක පිළිගත යුතු වෙනවා. ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා කිව්වා, ඒ කාලයේ බස් 500ක් ගිනි තැබුවා කියලා; ඒ වාගේම ඩිපෝ 15කට වඩා ගිනි තැබුවා කියලා. එතකොට ඒවාටත් වර්තමාන ආණ්ඩුවේ අය වග කියන්න ඕනෑ කියන කියන එකත් මා සඳහන් කරනවා.

ගරු ඇමතිතුමන්ලා කිව්වත් සමහර නිලධාරින් වැඩ කරන්නේ නැහැ. රිදීතැන්න බස් ඩිපෝව විශේෂයෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ පොළොන්නරුව ආසන්නයේම තිබෙන ඩිපෝවක්. ඒ ඩිපෝවේ වැඩ සාර්ථකව කරගෙන ඇවිල්ලා, හොඳින් ලාභ පෙන්වා, විශේෂයෙන්ම රිදීතැන්න-කොළඹ බස් සේවාව හොඳටම කරගෙන යද්දී ඒ ඩිපෝව වහලා ඒ ඔක්කොම බස් ටික වාලච්චේන ඩිපෝවට ගත්තා. ඒ අසාධාරණය පිළිබඳව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ගරු හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා ඇතුළු අනෙකුත් මැති ඇමතිවරු කථා කරද්දී, ඒ සම්බන්ධව ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා, අපේ ගරු සභානායකතුමා ඇතුළු ඇමතිතුමන්ලා කියලාත්, වාලච්චේන ඩිපෝව කළමනාකරණය කරන අයත්, ඒක භාරව ඉන්න මඩකලපුවේ ප්‍රධානීනුත් "ඕක කරන්න බැහැ" කියලා ප්‍රතික්ෂේප කරනවා. ඉතින් ඒ වාගේ තත්ත්වයක් තුළ කොහොමද, අපේ ලංගම සේවාව ගොඩ නඟන්නේ? ඉතින් ඒ වාගේ ප්‍රශ්න තිබෙන බවත් මා මතක් කළ යුතුයි.

මේ කාරණා ගැන කියද්දී, අපේ දිස්ත්‍රික්කයේ තිබෙන අබලන් වෙච්ච පාරවල් කිහිපයක් පිළිබඳව මා කථා කළ යුතුව තිබෙනවා. විශේෂයෙන්ම පේරාදෙණිය, ගලහ දෙල්තොට පාර iRoad ව්‍යාපෘතියට අයත් පාරක්. ඒ පාර ගලහෙන් එහා දෙල්තොට දක්වා සම්පූර්ණයෙන් අබලන් වෙලා තිබෙන බව මා මෙතැනදී මතක් කළ යුතුයි. අමාත්‍යාංශය ඒ පිළිබඳවත් අවධානය යොමු කළ යුතුයි. ඒ වාගේම පිළිමතලාව, මුරුතලාව-අලදෙණිය පාර විශාල ලෙස අබලන් වෙලා, නොයෙක් තැන්වල ප්‍රවාහන කටයුතු කරන්න බැරි තත්ත්වයක් තිබෙන බවත් මා මතක් කළ යුතුයි. ඒ වාගේම, වෙලම්බොඩෙන් එහා වටදෙණියේ සිට ගම්පොළ දක්වා යන පාර සැහෙන දුරට අබලන් තත්ත්වයක පවතින බව මතක් කළ යුතුයි. ඒ වාගේම අංකුඹුර-ගල්හින්න පාරත් සැහෙන්න දුරට අබලන් වෙලා තිබෙන බවත් අපි දකිනවා. මේවා පිළිබඳව අමාත්‍යාංශය, විශේෂයෙන්ම මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය තමන්ගේ අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානයටත් මා ඒ කරුණු යොමු කරනවා.

මම දැන් මේ පරිපූරක මුදල පිළිබඳ යෝජනාව ගැන කථා කරන්නම්. නොයෙකුත් ව්‍යාපෘතිවලින් ඉතිරි කර ගත් ප්‍රතිපාදන වෙනත් වැය ශීර්ෂයකට වෙන් කරන්නයි මේ පරිපූරක මුදල පිළිබඳ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ කියලා කිව්වා. ඒ පිළිබඳව මම විශේෂයෙන්ම මතක් කළ යුතුයි. There is the Kandy Multimodal Transport Terminal Development Project. ඒකෙන් රුපියල් බිලියනයකට ආසන්න මුදලක් ගන්නවා. ඒ වාගේම iRoad Project එකෙන් තවත් රුපියල් බිලියනයකට ආසන්න මුදලක් ගන්නවා. ඒත් එක්කම කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් ඉදි කිරීමේ ව්‍යාපෘතිවලින් රුපියල් මිලියන 8,000ක් වැනි මුදලක් ගන්නවා. ගැටඹේ ගුවන් පාලම දැන් තිබෙන තත්ත්වය මත විශාල වාහන තදබදයක් ඇති වෙනවා. ගරු ඇමතිතුමාත් මේ ගැන සඳහන් කළා. විශාල කණු ටිකක් හිටවලා තිබෙනවා විතරයි. වෙනත් කිසි දෙයක් කරලා නැහැ. විශේෂයෙන්ම එතැන railway crossing එකක් තිබෙනවා. ඒ එක්කම විලියම් ගොපල්ලව මාවතේ හැම වෙලේම වාහන තදබදයක් පවතින තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ පිළිබඳවත් අවධානය යොමු කළ යුතුයි. ඒ විදේශ ණය මුදල් ලැබුණේ නැත්නම්, අඩුම වශයෙන් රජයේ අරමුදල් හරි පාවිච්චි කරලා, ඒ ප්‍රශ්න කඩිනමින් විසඳිය යුතුයි කියලා මම කියා සිටිනවා.

ඒ වාගේම Kandy Multimodal Transport Terminal Development Project එක පිළිබඳවත් කියන්න ඕනෑ. The Kandy Multimodal Transport Terminal Development Project includes three bus terminals: one in Getambe, one in Katugastota and the other in Pallekele. ඉතින් ඒ bus terminals පිළිබඳවත් කිසිම වැඩක් කරන බවක් අපට පෙනෙන්නේ නැහැ. ඒ bus terminals නැති වුණාම Multimodal Transport hub එකේ එක වුවමනාවක් සම්පූර්ණයෙන්ම ව්‍යර්ථ වෙනවා. ඒ නිසා ඒ bus terminals පිළිබඳව කුමක්ද වෙන්නේ කියලා අපි වහාම යම් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

ඒ එක්කම මේ කාරණයත් කියන්න ඕනෑ. I must mention that we expect the Central Expressway to go up to Galagedara. From Pothuhera to Rambukkana, there have been several packages given to local contractors and that work is getting completed now. But from Rambukkana to Galagedara, still, nothing has been done. So, we would like to see some end to this issue. This matter came up before the Committee on Public Finance - I raised this issue - but no decision had been taken. Also, I saw an interview with the Hon. Deputy Minister, where he says that they are willing and keen to do it. However, we want some urgent action taken regarding that.

Then, from Galagedara up to Kandy, we know that we cannot have a highway because of the cost, but, at least, we must know how the widening of the road is going to

be done, whether it is going to be a two-lane or thee-lane road. The widening of that road has to be done for this entire project to be fruitful and for vehicles to reach Kandy within a shorter time.

Now, I would like to refer to some of the issues that the Hon. (Dr.) Harsha de Silva mentioned. After the negotiations with the contractor with regard to the Central Expressway, several matters are still pending. This is what the Report of the Committee to Analyse the Claims to be Paid to the Contractor and the Adverse Impact on the Government of Sri Lanka - Central Expressway Section 1 states, I quote:

> " b. Whether the Contractor claims interest for the delayed period
>
> The negotiation committee inquired from the Contractor whether the Contractor Company intends to claim interests from RDA for the delaying period of the payment of IPCs of US $ 189.48.
>
> The Contractor replied that Company is not in a position to determine it at this juncture and their decision will be informed after the re-commencement of the Project.
>
> c. Whether the Contractor claims damages for the period that project was delayed The negotiation committee specifically inquired...."
>
> "The Contractor replied that Company is not a in a position to determine it at this juncture and their decision will be informed after the re-commencement of the Project."

So, without any of these matters being finalized, you all are taking the loan and are awarding the contract.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසන්. කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
We know that if we do not award this to the contractor, there will be various other problems. It is all right, but these pending matters must be properly finalized before this whole loan project is approved. That is our request.

Thank you.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දේවානන්ද සුරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.24]

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)
විනාඩි 8ක් නම් මදි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය අද රුපියල් මිලියන 36,609ක පරිපූරක ඇස්තමේන්තුවක් සභාව ඉදිරියේ තබා තිබෙනවා. ඒ පිළිබඳව තමයි අද මේ සංවාදය යන්නේ. හැබැයි උදේ ඉඳලා මේ වෙනකල් මේ සංවාදය බලාගෙන, අහගෙන මේ පාර්ලිමේන්තුව තුළ ඉන්නකොට දැනෙන දේ තමයි ඇත්තටම අපේ රටේ විපක්ෂය "අන්ද කයිප්පු" කාලාද ඉන්නේ කියලා. මොකද, "යන්නේ කොහේද - මල්ලේ පොල්" න්‍යාය භාවිත කරමින් කථා කරනවා මිස, මේ පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳව අදහසක් නැහැ. හැබැයි, පළපුරුදු විපක්ෂය ලු. මේ රට පාලනය කරපු අය ලු. ඒගොල්ලන්ට බලය දෙන්න ලු. නමුත් අනේ මම දන්නේ නැහැ, මේ පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳව ඒ අයට අදහසක් නැහැ. ඒ සමහර අයගේ නම් ගම් කියන්න බැහැ. මොකද, මේ ස්ථාවර නියෝගවලට මුවා වෙලා නැගිටිනවා නේ. ඒ නිසා, ඒ නම් ගම් මම කියන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම මේ පොදුවේ කියන්නේ, විපක්ෂය මේ පරිපූරක ඇස්තමේන්තුව ගැනවත් මොකක්වත් දන්නේ නැතුව තමයි කථා කළේ. මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරලා තිබෙන්නේ ඇයි? ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය මේ වෙනකොට මුළු රටම වැඩ බිමක් බවට පත් කරලායි තිබෙන්නේ. මුළු රටේම පාලම් ඉදිවෙනවා; බෝක්කු ඉදිවෙනවා; මහාමාර්ග ඉදිවෙනවා; අධිවේගී මාර්ග ඉදිවෙනවා. ඊට අමතරව ග්‍රාමීය මට්ටමෙන් පාරවල් හැදෙමින් පවතිනවා, සංවර්ධනය වෙමින් පවතිනවා. 2025 වසර සඳහා අපි මේ වැඩවලට රුපියල් මිලියන 435,100ක මුදලක් වෙන් කරලා, ඒ මුදල මේ 2025 වසර ඇතුළේ වියදම් කිරීම ඉලක්ක කරගෙන සැලසුම්සහගතව වැඩ කරනකොට තමයි නිරීක්ෂණය වෙන්නේ, ඒ වෙන් කරපු මුදල්වලින් කොටසක් ඉතුරු වෙන බව. ඒ, ඉතුරු කරන්න ඕනෑකම නිසා නොවෙයි. ඔබතුමියට මතක ඇති, බිමල් රත්නායක ගරු ඇමතිතුමා උදේ ප්‍රකාශ කළා, 2012 ඉඳලා ණය ගොඩක් අරගෙන තිබෙනවා, බිලියන ගණන්වලින් ණය අරගෙන තිබෙනවා කියලා ජනතාව ඇන්දවීම ඉලක්ක කරගෙන. 2025දී අපි මාර්ග සංවර්ධනයට රුපියලක්වත් අරගෙන නැහැ. විවිධ රාජ්‍යයන් ඒ ඒ මුදල් දෙන්නේ නිශ්චිත ව්‍යාපෘතියකට. හැබැයි ඒ ව්‍යාපෘති නතර වෙලා තිබෙනවා, 2022දී. 2022දී ඒවා නතර වෙන්නේ, මේ රට වැටුණු නිසා ආර්ථික වශයෙන්. රටේ දැවැන්ත අර්බුදයක් ආවා. ඒක අපි ගෙනාපු එකක් නොවෙයි. ඔය, අන්ද කයිප්පු කාපු විපක්ෂයේ අය බලයට පත් වෙලා, කාලයක් තිස්සේ රට පාලනය කරපු එකේ ප්‍රතිඵලය. ඒකෙන් රටට දැවැන්ත බලපෑමක් සිද්ධ වුණා. ඒ කතන්දරත් එක්ක, ඒ සිද්ධි දාමයත් එක්ක තමයි සමහර ව්‍යාපෘතිවලට වෙන් කරපු මුදල් වියදම් කර ගන්න අපට බැරි වෙලා තිබෙන්නේ. මුදල් රෙගුලාසිවල ඒවාට බලය නැහැ. මේගොල්ලන් 2012 ඉඳලා 2024 දක්වා ලබා ගත් දේශීය ණය ගෙවීම් ඉලක්ක කරගෙන තමයි මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කර තිබෙන්නේ. එහෙම නැතිව, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට වැඩ කරන්න බැරිව නොවෙයි. අපට වැඩ කරන්න පුළුවන්. වැඩ කරන්න පුළුවන් team එකක් තමයි අපි පත් කරගෙන ඉන්නේ. ඒ සංවර්ධන වැඩ පිළිවෙළ රට පුරා ක්‍රියාත්මක වනවා. මේක තේරුම් ගන්නේ නැතිව උදේ ඉඳලා හැම කෙනෙකුම - විපක්ෂ නායකතුමා ඇතුළු හැම කෙනෙක්ම, හැම මන්ත්‍රීවරයෙකුම - කියනවා, "වැඩ කර ගන්න බැහැ, මුදල් ටික යවනවා, මුදල් ටික යවනවා, එහෙමයි, මෙහෙමයි" කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මාලිමාව ආණ්ඩුව -වර්තමාන ආණ්ඩුව- පිළිබඳව වාගේම, ඒ ආණ්ඩුව යටතේ වැඩ කරන සමහර නිලධාරින් පිළිබඳව විපක්ෂයට භීතිකාවක් ඇති වෙලා තිබෙනවා. ඒ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් රංග දිසානායක මැතිතුමා පිළිබඳ භීතිකාව. ඒ වාගේම තමයි ආණ්ඩුව පිළිබඳ භීතිකාවක් තිබෙනවා. මේ අය මේ භීතිකාව ගොඩ නඟලා තිබෙනවා. ප්‍රවාහනය සහ ගමනාගමනය විතරක් නොවෙයි, සමස්ත රටම විනාශ කරලා දැම්මේ මේගොල්ලන් තමයි. ඒ විනාශ කරපු රට තමයි දැන් අපි ගොඩනඟමින් ඉන්නේ.

[ගරු දේවානන්ද සුරවීර මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමියත් දන්නවා, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය විධියට අපි මේ රටේ ගැටලු හඳුනා ගනිමින් සිටින බව. විශේෂයෙන්ම ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ ප්‍රමාණාත්මක ප්‍රවාහන පහසුකම් නොමැති බව අපි කවුරුත් දන්නා කාරණාවක්. ප්‍රමාණාත්මක ප්‍රවාහන පහසුකම් නැහැ. අද සමහර ඩිපෝ අධිරාජ්‍යයන් බවට පත් වෙලා. ඒ ඩිපෝ ඇතුළේ සමහර අධිරාජ්‍යයන් ගොඩ නැඟිලා තිබෙනවා. මහ ජනතාව වෙනුවෙන් ගොඩ නැඟුණු ප්‍රවාහන සේවයක් නොවෙයි දැන් තිබෙන්නේ. මේක මාෆියාවක් බවට දැන් පත් වෙලා තිබෙනවා. අපි ඒවා හඳුනාගෙන තිබෙනවා.

මේ අම්පාර දිස්ත්‍රික්කය, මොනරාගල දිස්ත්‍රික්කය, අනුරාධපුරය දිස්ත්‍රික්කය, හම්බන්තොට දිස්ත්‍රික්කය ගැන කථා කරනවා නොවෙයි. කොළඹ දිස්ත්‍රික්කය ඇතුළේ බොරලුතැන්න-හංවැල්ල බස් නැහැ, කුරුඳුවත්ත-පිළියන්දල බස් නැහැ. මාවත්ගම -පිටකොටුව බස් නැහැ, වේවැල්පනාව-හංවැල්ල අතර බස් නැහැ. මාර්ග අංක 112, මහරගම-කොටහේන බස් නැහැ. රුක්මලේ-පිටකොටුව බස් නැහැ, කොට්ටාව-මාලබේ බස් නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේක තමයි ප්‍රවාහන ක්ෂේත්‍රය මුහුණ දෙන ප්‍රධාන ගැටලුව. මිනිසුන්ට ප්‍රමාණවත් පරිදි ප්‍රවාහන පහසුකම් නොමැතිවීම කියන කාරණාව අපි හඳුනාගෙන තිබෙනවා. ජාතික ජන බලවේගය ආණ්ඩුව අරමුණක් සහිතව තමයි මේ රට භාර ගත්තේ. අපට ඕනෑ, ස්ථාවර ආර්ථිකයක් සහිත රටක් ගොඩ නඟන්නයි. ඒ වාගේම සෞඛ්‍ය සම්පන්න ජනතාවක් සහිත රටක් ගොඩ නැඟීමේ වුවමනාව අපට තිබෙනවා. ඒ වාගේම පාරිසරික වශයෙන් තිරසර සංවර්ධනයක් සහිත රටක් ගොඩ නඟන්න ඕනෑ. ඒ රට ඇතුළේ තිරසර ප්‍රවාහන පද්ධතියක්, ප්‍රවාහන සේවාවක් ලබා දීමේ වුවමනාව සහිතව තමයි වර්තමාන ජාතික ජන බලවේගය ආණ්ඩුව ක්‍රියා කරමින් සිටින්නේ. ඉතිහාසයේ දවසක ලොකු ආස්වාදයක් බවට පත් වෙච්ච ප්‍රවාහනය, මෝටර් රථය අද වනකොට පරිසරයට, රටට, රටේ ජනතාවට විවිධ බලපෑම් කරන තත්ත්වයක් ඇති කරලා, අනතුරු වැඩි කරන තත්ත්වයට පත් වෙලා තිබුණාට, මේ ප්‍රවාහනය කොතැනටද අරගෙන යන්න ඕනෑ කියන එක සම්බන්ධයෙන් ජාතික ජන බලවේගයේ අපට දැක්මක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. 2029දී ජනාධිපති වෙන්න සිහින දකින කුමාරයෙක් ඉන්නවා. මට ඒ කුමාරයාට උත්තරයක් දෙන්න ඕනෑ. එතුමාට කියන්න ඕනෑ, මේ අපරාධ රාජ්‍යය ගොඩ නැඟුවේ අපි නොවෙයි කියන එක. ජාතික ජන බලවේගයේ අපි කවුරුවත් අධිවේගී මාර්ග හදනවාට, මේ රට සංවර්ධනය කරනවාට විරුද්ධ වුණේ නැහැ. හැබැයි, රාජපක්ෂලා අධිවේගී මාර්ග සෑදීම හරහා ගහපු කොමිස්වලට අපි විරුද්ධ වුණා. එයාගේ බාප්පොච්චා වන බැසිල්ට කිව්වේ, "Mr. Ten Percent" කියලා. හැම ව්‍යාපෘතියකින්ම සියයට දහයක කොමිස් මුදලක් ගැහුවා. දැන් අපට උගන්වන්න එනවා. පොලීසිය පාවිච්චි කරලා මිනී මැරුවේ ඒගොල්ලන්; හමුදාව පාවිච්චි කරලා මිනී මැරුවේ ඒගොල්ලන්. මේ රටේ අපරාධ රාජ්‍යයක් ඇති කළේ ඒගොල්ලන්. ඔවුන් මේ රටේ කිසිම දෙයක වටිනාකම දන්නේ නැති, මිල දන්නේ නැති කණ්ඩායමක්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)
මම ඉක්මනින් අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඒ රාජ්‍යයේ ඒගොල්ලන්ගේ ජීවන දර්ශනය වුණේ බුවාලා නිර්මාණය කරන දේශපාලන සංස්කෘතිය. ඒ දේශපාලනය තුළ දර්ශනය බවට පත් වුණේ, "දැක්කොත් බුවා - නොදැක්කොත් එබුවා" වාගේ එකක්. ඒ බුවා දේශපාලන සංස්කෘතිය ඇතුළේ තමයි මේ සියල්ල වළ පල්ලට ගිය රටක් නිර්මාණය වුණේ. දැන් අපට ඇඟිල්ල දිගු කරන්න එන මහත්වරුන්ට ජාතික ජන බලවේගය විධියට අපි කියන්න කැමැතියි, "ඔබලා කරපු සියලු අපරාධවලට රටේ ජනතාව තීන්දුව දීලා තිබෙනවා" කියලා. අනාගතයේ දීත් ඒ සම්බන්ධයෙන් තීන්දු ගනීවි කියන විශ්වාසය අපට තිබෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.34]

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විනාඩි 9ම බෙරලා දුන්නාට බොහොම ස්තුතියි.

මම අද ඔබතුමියගේ අවසරය ඇතිව මේ සභාවේ අවධානයට, ආණ්ඩුවේ අවධානයට හදිසි ප්‍රශ්නයක් යොමු කරන්න මම කැමැතියි. This morning, I received a letter from the Hon. President Anura Kumara Dissanayake in response to my letter to him on the abolishment of the New Villages Development Authority for Plantation Region. අපි, 2018 අංක 32 දරන වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පනත අනුව වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පිහිටුවා ගත්තා. ආණ්ඩුව මේ සම්බන්ධව විවිධ අවස්ථාවල විවිධාකාර උත්තර දුන්නා වුණාට, කරුණාකරලා මේ අධිකාරිය අහෝසි කරන්න එපා කියලා අපි පුන පුනා කියා සිටියා. මොකද, ආණ්ඩුව කමිටු පත් කරලා ineffective ආයතන ටික අහෝසි කරන්නට, නැත්නම් duplicate ආයතන ටික අහෝසි කරන්නට, ඒකාබද්ධ කරන්නට තීරණයක් අරගෙන තිබෙනවා. ඒක හොඳයි; මම කියන්නේ ඒක හොඳයි. ආණ්ඩුවේ අනවශ්‍ය වියදම් ටික අඩු කරගෙන හරියාකාරව මේ දේවල් ක්‍රියාත්මක කරන එක හොඳයි. නමුත් ඒ ලැයිස්තුව තුළට මේ අධිකාරිය තෝරා ගත්ත එක තමයි වැරදි.

ආණ්ඩුව පැත්තේ මැති ඇමතිවරු කථා කරනකොට කිව්වා, "ආණ්ඩුවේ අයටත් සමහරවිට වැරදි වෙනවා තමයි, වැරදි පෙන්වලා දුන්නාම වැරදි හදා ගන්නවා" කියලා. හොඳයි, ඉතින් මේක හදා ගන්නකෝ. ඇයි මෙච්චර පරක්කු වුණේ? මම ජනාධිපතිතුමාට මේ ලියුම ලිව්වේ සැප්තැම්බර් මාසයේ 9වෙනි දා. දවස් 20කට පසුව අදයි පිළිතුර ලැබිලා තිබෙන්නේ. ඇයි පරක්කු වුණේ දන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේක හොඳට අහ ගන්න. මේ වෙලාවේ සභාවේ ඇමතිවරු නැති එක ගැන මම කනගාටු වෙනවා. මම දකිනවා රාමලිංගම්

චන්ද්‍රසේකර් ඇමතිතුමා වාඩි වෙලා ඉන්නවා. මේක එතුමාටත් අදාළ වැඩක්. ඒ නිසා කරුණාකරලා මේකට ඇහුම්කන් දෙන්න කියලා මම කියනවා. මොකද, එතුමන්ලා මේක අරගෙන යන්න ඕනෑ. මලෙයහම් ජනතාව නියෝජනය කරන වෙනත් මන්ත්‍රීවරු මේ වෙලාවේ සභාවේ ඉන්නවාද කියලා දන්නේ නැහැ, මට පෙනෙන්නේ නැහැ. එතුමා යාපනයේ වුණාට එතුමාගේ මුල් ගම බදුල්ල. ප්‍රශ්නයක් නැහැ, එතුමා national වැඩ කරනවා; කරපුවාවේ. මම කියන්නේ පණිවුඩය අරගෙන යන්න කියලා. ජනාධිපතිතුමාට වැඩ ගොඩයි, ලොකු වැඩ එතුමාට යනවා. අගමැතිතුමියටත් එහෙමයි. විෂය භාර අමාත්‍ය සමන්ත විද්‍යාරත්න මැතිතුමා මේ අවස්ථාවේ සභාවේ නැහැ. පුන පුනාම මම මේ කාරණය ගරු සභාවේ කියලා තිබෙනවා; පිටතදීත් කියලා තිබෙනවා; මාධ්‍යවලත් කියලා තිබෙනවා. ඇයි මේක වරද්දා ගත්තේ? රටේ කවුරුත් පිළිගන්න ඕනෑ මේ කාරණය. කඳුකරයේ, වතුකරයේ ලක්ෂ 10ක් විතර ජනතාවක් ජීවත් වුණත් කම්කරුවන් ඉන්නේ ලක්ෂ එකහමාරයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. හැබැයි වතුකරයේ ලක්ෂ 10ක් ජනතාව ජීවත් වෙනවා. ඒගොල්ලන් මේ රටේ ඉතාම අඩු දියුණුවක් තිබෙන, කොන් වෙච්ච ජන කණ්ඩායමත්. ඒ ගැන අවධානයට යොමු කරලා තමයි අපේ ආණ්ඩු කාලයේ එම අධිකාරිය ගෙනාවේ. ඒක කරගෙන යන්න බැරි වුණා, අපට ආණ්ඩුව නැති වුණු නිසා. අඩු දියුණුවීම කියන එක හැම තැනම තිබෙනවා. අධ්‍යාපනය වේවා, සෞඛ්‍ය වේවා, ඉඩම් සම්බන්ධයෙන් වේවා, හැම අංශයේම ඒක තිබෙනවා. ඒ නිසා සෑම අමාත්‍යාංශයක් සමඟම සාකච්ඡා කරලා, මැදිහත් වෙලා, සම්බන්ධීකරණය - coordinate - කරන්න අපට අධිකාරියක් අවශ්‍ය වෙලා තිබුණා. ඒක තමයි මේ අධිකාරිය පිහිටුවීමේ අරමුණ වුණේ. ඒ නිසා මේ අධිකාරිය හරියාකාරව පාවිච්චි කරන්න; ඒක අහෝසි කරන්න එපා. I thank the Hon. President for responding to me. On behalf of the President, Mr. Gunaratne, Senior Additional Secretary to the President clearly states in the letter, I quote:

> "Please be informed that the status of the New Villages Development Authority for Plantation Region (NEVIDA) is presently under review."

ඇත්තටම අපි මේක ගැන සතුටු වෙනවා. මේ සම්බන්ධයෙන් ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමාත් කාරණයක් කියනවා. එතුමාගේ අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිවරයා තමයි, සුන්දරලිංගම් ප්‍රදීප් මැතිතුමා. එතුමා පාර්ලිමේන්තුව තුළදීත්, එළියේදීත් සම්පූර්ණයෙන්ම අසත්‍ය කියන්නේ. එතුමා කිව්වා, මෙහෙම දෙයක් වෙලා නැහැ කියලා. දැන් බලන්න, ජනාධිපති කාර්යාලයෙන් නිකුත් කරපු ලිපියෙන් ඔප්පු වෙනවා, එවැනි ප්‍රශ්නයක් තිබෙන බව. ඒක පිළිගත්ත එක ගැන අපි ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒක හොඳයි. වැරැද්දක් තිබෙනවා නම්, පිළිගන්න ඕනෑ. පිළිගෙන ඒක හදාගන්න ඕනෑ. පිළිගන්නේ නැතුව, එහෙම දෙයක් නැහැ කියලා කියන එක වැරදියි නේ. අසත්‍ය කීම පිළිබඳව අර නියෝජ්‍ය ඇමතිවරයා ලජ්ජා වෙන්නට ඕනෑ.

මම තව කාරණයක් කියන්න කැමැතියි. මේක හොඳට අහගන්න. අමාත්‍යාංශ ලේකම්වරයෙක් ඉන්නවා, ප්‍රභාත් චන්ද්‍රකීර්ති කියලා. ඒ වාගේම development සම්බන්ධයෙන් කටයුතු කරන අතිරේක ලේකම්තුමියක් - Additional Secretary කෙනෙක් - ඉන්නවා, දීප්තිකා ගුණරත්න කියලා. ඒ වාගේම නීති නිලධාරිනියක් - Legal Officer කෙනෙක් - ඉන්නවා, ජී.ඒ.සී. දිල්හානි කියලා. මේ තුන්දෙනාම ඇමතිවරුන්ට වඩා, ජනාධිපතිට වඩා, අගමැතිනියට වඩා, ආණ්ඩුවට වඩා බලවත්ද කියන්න මම දන්නේ නැහැ. ඒ තුන්දෙනා ජාතිවාදය මත ඉඳගෙන කටයුතු කරනවාද කියලා මම දන්නේ නැහැ, මේ අධිකාරිය අහෝසි කරන්න ඕනෑම කියන තැන ඒ අය ඉන්නවා. ඒගොල්ලන් කොහොමද ඒක කරන්නේ? නිලධාරින්ට ප්‍රතිපත්ති හදන්න බැහැ, නීති හදන්න බැහැ. ජන වරම හරහා ආණ්ඩුව තමයි ප්‍රතිපත්ති හදන්නේ. දැන් තිබෙන්නේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව. ආණ්ඩුව තමයි ප්‍රතිපත්ති හදන්න ඕනෑ. ඒවා ඉදිරිපත් කරන්නේ කැබිනට් මණ්ඩලයෙන්. ආණ්ඩුව නීති හදන්න ඕනෑ. ඒ නීති ගෙනැල්ලා සම්මත කරන්නේ පාර්ලිමේන්තුවෙන්. එහිදී පක්ෂ, විපක්ෂ වෙන්න පුළුවන්. නමුත්, පාර්ලිමේන්තුව තමයි නීති සම්මත කරන්නේ. ඒ නීති තමයි නිලධාරින් විසින් ක්‍රියාත්මක කරන්න ඕනෑ. එහෙම නැතුව නිලධාරින්ට ඕනෑ ඕනෑ විධියට වැඩ කරන්න බැහැ.

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා, "මලෙයහම්" කියන වචනය අපි ඒ ජනතාව වෙනුවෙන් පාවිච්චි කරන බව. ඒක හොඳයි. ඒක අපි කවුරුත් පාවිච්චි කරනවා. "ඉන්දියානු දමිළ" කියන වචනය මාරු කරලා "මලෙයහම්" කියන වචනය දාලා ලාංකිකත්වය ගේනවා. ඒක හොඳයි. සමහර නිලධාරින් ඒකටත් විරුද්ධ වෙනවා ලු. මට ඒක ආරංචි වුණා. ඒ අයට ඒවා තේරුම් ගන්න බැහැ. මම ඒ නිලධාරින්ට කියන්න කැමැතියි, ආණ්ඩුවේ ප්‍රතිපත්ති, පාර්ලිමේන්තුවේ සම්මත කරන නීති අනුගමනය කරමින් වැඩ කරන්න බැරි නම් කරුණාකරලා ගෙදර යන්න කියලා. කමක් නැහැ. කොයි ආණ්ඩුව වුණත් එහෙමයි කියන්න ඕනෑ. මොකද, මේක වැරදියි නේ. අපේ අඩුදියුණු ජනතාව වෙනුවෙන් ගෙනැවිත් තිබෙන මේ අධිකාරිය අහෝසි කරන්න -නැති කරන්න- උත්සාහ කරන්න එපා කියලා මම ඒ අයට කියන්න කැමැතියි. මොකද, මෙම අධිකාරිය අහෝසි කරන්න කියන එක වැරදියි.

මම තව කරුණක් කියන්න කැමැතියි. ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා ගරු සභාවේ ඉන්නවා. ඒ වාගේම ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් ඇමතිතුමියත් ඉන්නවා, විෂය භාර අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිවරයාත් ඉන්නවා. එතුමාවත් මම නම් කළා. ඒ වාගේම බදුල්ල දිස්ත්‍රික්කයේ තවත් මන්ත්‍රීවරුන් දෙදෙනෙක් ඉන්නවා, නුවරඑළිය දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් ඉන්නවා. මේ අය ඔක්කෝම එකතුවෙලා කරුණාකරලා මේ සම්බන්ධයෙන් තීරණයක් අරගෙන අභ්‍යන්තරව ආණ්ඩුවත් එක්ක කථා කරන්න. ඒකට නේ ජනතාව ඔබතුමන්ලාව පාර්ලිමේන්තුවට එවලා තිබෙන්නේ. නමුත්, කථා කරන්නේ නැහැ. මම ජනාධිපතිතුමාට දොස් කියනවා නොවෙයි. ඒ වාගේම විෂය භාර ඇමතිතුමාට දොස් කියනවා නොවෙයි. මම එතුමාට කථා කළා. එතුමා පොරොන්දු වුණා, මේ අධිකාරිය අහෝසි කරන්නේ නැහැ කියලා. නමුත්, මේ සම්බන්ධයෙන් ජනතාවගේ වුවමනාව මොකක්ද, ජනතාව වෙනුවෙන් ඔබතුමන්ලාගේ තිබෙන කැක්කුම මොකක්ද කියලා හිතලා, උනන්දුවක් දක්වලා ආණ්ඩුව විධියට මේ ගැන කථා කරන්න ඕනෑ. නිහඬව ඉඳලා වැඩක් වෙන්නේ නැහැ. පාර්ලිමේන්තුවේදී කථා කරන්නේත් නැහැ, එළියේදී කථා කරන්නේත් නැහැ වාගේ තමයි මට පෙනෙන්නේ. එහෙම ඉඳලා වැඩක් නැහැ නේ. මම මෙතැනදී කී වතාවක් මේ ගැන කථා කළාද? මම පුන පුනා කිව්වා, කරුණාකරලා මේ අධිකාරිය අහෝසි කරන්න එපා, එය වැඩිදියුණු කරන්න කටයුතු කරන්න කියලා. ඒ සඳහා මෙවර අය වැයෙන් ලොකු මුදලක් වෙන් කරන්න. දැනුත් ඒ සඳහා අවකාශ තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. අවකාශ නැත්නම් අවකාශ හදාගන්න. එහෙම නැතුව නිලධාරින්ට වුවමනා විධියට මේ අධිකාරිය අහෝසි කරන්න ඉඩ දෙන්න එපා. එහෙම කරන්න කටයුතු කරන නිලධාරින් කවුද?

මහජනතාවගේ ඡන්දයෙන් පත්වෙලා - ජන වරම අරගෙන - ආපු ආණ්ඩුවක් තමයි ඔබතුමන්ලාගේ ආණ්ඩුව. පාර්ලිමේන්තුව ඒ විධියටයි හැදිලා තිබෙන්නේ. එම නිසා ඒ පාර්ලිමේන්තුව හදන නීති ක්‍රියාත්මක කරන්න තමයි නිලධාරින් ඉන්නේ. එහෙම නැතුව

[ගරු මනෝ ගනේසන් මහතා]

ඒ අයට ඕනෑ විධියට වැඩ කරන්න බැහැ. අමාත්‍යාංශයට වෙලා ඒ අයට නිකම් ඉන්න බැහැ. වැඩ කරන්න ඕනෑ. ඒකට තමයි නීති හදන්නේ. එහෙම නැතුව නිලධාරින් කියන කියන පළියට ඇමතිවරුන් වැඩ කරන එක වැරදියි. මම මේක කියන්නේ සද්භාවයෙන්. මේක අපේ යහ පාලන ආණ්ඩුව කාලයේ ජනතාව වෙනුවෙන් නිකම් දුන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. එතකොට මේ විෂය භාර ඇමතිවරයා වශයෙන් කටයුතු කළේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා. අපි රණ්ඩු කරලා තමයි මේක කර ගත්තේ. පක්ෂ, විපක්ෂ වේවා, ආණ්ඩුවේ සිටියත්, පිට සිටියත් අපි රණ්ඩු කරලා තමයි හැම දේම කර ගත්ත; රණ්ඩු කරලා, සටන් කරලා තමයි අපි මේ දේවල් කරගත්තේ. ඒ නිසා මෙහෙම කරන්න එපා. එසේ ලබා ගත් මේ අධිකාරිය කරුණාකරලා ආරක්ෂා කර දෙන්න. ආරක්ෂා කරගෙන ඉස්සරහට අරගෙන යන්න. එම පණිවුඩය අරගෙන යන්න. මේකට අදාළ කැබිනට් ඇමතිවරයෙක් ඉන්නවා. එතුමා සුදුසුකම් තිබෙන ඇමතිවරයෙක්. ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමාට මම කියනවා, කරුණාකර මෙම අධිකාරිය ඉදිරියට අරගෙන යන්න කියලා. මේ කරන්න යන වැඩේ නවත්වන්න. මම කලින් නම් කළ නිලධාරින් තුන්දෙනා ඉන්නවා නේද? එම නිලධාරින් තුන්දෙනාට මේකෙන් ඇත් වෙන්න කියන්න. ඇත් වෙලා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යන්න. ජනාධිපතිතුමා අපට පොරොන්දුවක් දීලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එම පොරොන්දුව ඇතුළත් ලියුම මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා, බොහොම ස්තුතියි.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මනෝ ගනේසන් මන්ත්‍රීතුමා මතු කළ ප්‍රශ්නය සම්බන්ධයෙන් යමක් සඳහන් කළ යුතුයි. අපි NEVIDA එක අහෝසි කරන්නේ නැහැ. අගමැතිතුමියගේ මූලිකත්වයෙන් තිබෙන කමිටුවේදී අපි තීන්දුවක් ගත්තා, එම අධිකාරිය තවදුරටත් වැඩිදියුණු කරන්න ක්‍රියාමාර්ග ගන්නවා කියලා.

நாங்கள் பெருந்தோட்டப் பிராந்தியங்களுக்கான புதிய கிராமங்கள் அபிவிருத்தி அதிகாரசபையை எந்தக் காரணம் கொண்டும் இல்லாதொழிக்கப் போவதில்லை. அதை மேலும் விரிவாக்கம் செய்வதற்கு, develop பண்ணுவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும் என்றுதான் கௌரவ பிரதம அமைச்சர் தலைமையிலான குழு முடிவெடுத்து இருக்கின்றது. கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் குறிப்பிட்ட குறித்த செயலாளர் அவ்வாறானதொரு நபர் அல்ல. ஏனென்றால், நான் அவரோடு கூடுதலாகப் பழகி இருக்கின்றேன்; இது சம்பந்தமாகப் பேசி இருக்கின்றேன். உண்மையிலேயே அவர், இவ்விடயம் சம்பந்தமாக positiveஆக நோக்குகின்ற, மலையக மக்களுக்கு வேலை செய்ய வேண்டும் என்று நினைக்கின்ற ஒரு நபர்! எனவே, நீங்கள் அவர் சம்பந்தமாகக் கூறிய விடயம் தவறானது. எது எவ்வாறு இருந்தபோதிலும், நாங்கள் பெருந்தோட்டப் பிராந்தியங்களுக்கான புதிய கிராமங்கள் அபிவிருத்தி அதிகாரசபையை இல்லாதொழிக்கப் போவதில்லை.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
கௌரவ அமைச்சர் அவர்களே, பெருந்தோட்டப் பிராந்தியங்களுக்கான புதிய கிராமங்கள் அபிவிருத்தி அதிகாரசபையை இல்லாது ஒழிப்பதில்லை என்ற உத்தரவாதத்தை நீங்கள் அளித்தீர்கள். அதையிட்டு நான் மகிழ்ச்சி அடைகின்றேன். ஆனால், மாண்புமிகு சனாதிபதி அவர்கள் எனக்கு அனுப்பிய கடிதத்தில், that it "is presently under review" என்று கூறப்பட்டு இருக்கின்றது. இவ்விடயம் சம்பந்தமாகப் பிரச்சினையொன்று இருக்கின்றது என்பதை அவர் ஏற்றுக்கொண்டு இருக்கிறார். அதை சனாதிபதி அவர்கள் எனக்குச் சொல்லியிருக்கிறார். அந்தக் கடிதம் என்னிடம் இருக்கின்றது. அதன் பிரதியை நான் சபைக்குச் சமர்ப்பித்து இருக்கிறேன். தயவுசெய்து, நீங்கள் இது சம்பந்தமாகப் பேசி, இன்னும் அதிகமாக முன்னெடுங்கள்! ஏற்கெனவே, இது சம்பந்தமாகப் பதிலளித்த துறைசார்ந்த பிரதி அமைச்சரைப்போல நீங்கள் இதை அணுக மாட்டீர்கள் என்ற நம்பிக்கை எனக்கு இருக்கின்றது. ஆகவே, தயவுசெய்து இதனைச் செய்யுங்கள்!

එම ලියුම මා ළඟ තිබෙනවා. ජනාධිපතිතුමා කියා තිබෙනවා නේ, පිළිගෙන තිබෙනවා නේ, ඒකේ ප්‍රශ්න තිබෙන බව. ඒක හොඳයි. ඒ ගැන අපි සතුටු වෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
පොදුවේ අපි ආණ්ඩුවක් හැටියට ප්‍රතිපත්තියක ඉන්නවා, මේ අධිකාරිය අහෝසි කරන්නේ නැහැ කියලා. ඒ, පළමුවෙනි කාරණය. ඒ ආයතනය වැඩිදියුණු කරලා ඉස්සරහට ගෙනියන්න තමයි අපි තීන්දුවක් අරගෙන තිබෙන්නේ. නමුත් පොදුවේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒක පොදු ප්‍රශ්නයක් මිස මේකට විතරක් සීමා වෙච්ච ප්‍රශ්නයක් නොවෙයි. ඒ සියලු ප්‍රශ්න අපි සැලකිල්ල යොමු කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔය කාරණය විවාදයක් කර ගන්න එපා, ගරු මන්ත්‍රීතුමන්ලා. කාලය කළමනාකරණය කරගන්න ඕනෑ.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා දන්නවා නේ, පසුගිය කාලයේදී මේවා පිළිබඳව කථා කරනකොට,

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඔබතුමන්ලාත් හිටියා නේ. මම කියන්නේ මේකයි. ඔබතුමන්ලාට මේ ගොඩක් දේවල් වෙනස් කරන්න අවස්ථාව තිබුණා, නමුත් ඒවා කරන්න බැරි වුණා නේ. හැබැයි අපි අනිවාර්යයෙන්ම කියන්න කැමැතියි, කඳුකරයේ ජනතාවට යම් කිසි සේවයක් ලබා දෙන කිසිදු ආයතනයක් අහෝසි කරන්නේ නැති බව. අපි ඒවාත් ආරක්ෂා කරගෙන, කඳුරට ජනතාවත් ආරක්ෂා කරනවා. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා, ඔබතුමාට තත්පර 30ක් ලබා දෙන්නම්.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. ප්‍රශ්නයක් නැහැ. යහ පාලන ආණ්ඩුව කාලයේදී අපිත් ආණ්ඩුව තුළ ඉඳිමින්ම විපක්ෂයක් වාගේ තමයි වැඩ කළේ. ඒක තේරුම් ගන්න. ඔබතුමන්ලාත් ඒ ගැන දන්නවා ඇති. අපි වැඩ කළා. අපි කරපු වැඩ කටයුතු ගත්තොත්, ලොකු ලැයිස්තුවක් තිබෙනවා. කරුණාකරලා ඒ වැඩ කටයුතු ඉස්සරහට අරගෙන යන්න. එච්චරයි මම කියන්නේ. වෙන මොනවත් නැහැ. ඔබතුමාගේ ස්ථාවරය හරි. අර නිලධාරින් සම්බන්ධයෙන් මට සැකයක් තිබෙනවා. මම තුන්දෙනෙක් නම් කළා නේ. මේක අහගෙන ඉන්නවාත් ඇති නේ. ඒගොල්ලන් අනිවාර්යයෙන් යන්න ඕනෑ නිසා තමයි මම නම් කළේ. නැත්නම් නම් කරන්නේ නැහැ. කරුණාකරලා ඒක අවබෝධ කරගන්න. එච්චරයි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු ධනුෂ්ක රංගනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 3.48]

**ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට අදාළව ඉදිරිපත් කර තිබෙන රුපියල් මිලියන 36,609ක පරිපූරක ඇස්තමේන්තු යෝජනාව පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේදී, ඊට සම්බන්ධ වන්න මටත් වෙලාවක් වෙන් කර දීම පිළිබඳව ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදයට ප්‍රවිෂ්ට වෙන්න කලින් මම පොඩි කාරණයක් සඳහන් කරන්න ඕනෑ. අපේ විපක්ෂ නායකතුමා හැම දාම කරන්නේ මොකක්ද? එක්කෝ, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මුල් පිටුව විතරක් photocopy ගහගෙන එනවා. එහෙම නැත්නම් එම ප්‍රකාශනය තුළ සඳහන් කර තිබෙන පොඩි වචනයක් අල්ලාගෙන සමස්ත ප්‍රතිපත්ති ප්‍රකාශනයම විකෘති කරනවා. මම එතුමාට කියන්න කැමැතියි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය එතුමා හිතන විධියේ සරල ප්‍රතිපත්ති ප්‍රකාශනයක් නොවන බව. අපේ බලාපොරොත්තුව පොහොසත් මිනිසෙකු නිර්මාණය කරලා, අන්න ඒ පොහොසත් මිනිසා හරහා මේ රට වඩා පොහොසත් රටක් බවට පත් කිරීමයි. හැබැයි එතුමාට අවබෝධයක් නැහැ, මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අන්තර්ගතය පිළිබඳව.

අපි කොහොමද පොහොසත් මිනිසෙක් නිර්මාණය කරන්නේ? පොහොසත් මිනිසෙක් නිර්මාණය කරන්න, මිනිස්සුන්ගේ ආර්ථික තත්ත්වය වාගේම රටේ ආර්ථික තත්ත්වයත් ස්ථාවර වෙන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, ජනතාවගේ ජීවන තත්ත්වය වඩා හොඳින් තිබෙන්න ඕනෑ; ජනතාවට වඩා හොඳ සෞඛ්‍ය සම්පන්නභාවයක් තිබෙන්න ඕනෑ; ජනතාවගේ අධ්‍යාපනය වඩා හොඳට තිබෙන්න ඕනෑ; ඒ වාගේම ජනතාවගේ ආචාර ධර්ම පද්ධතියත් වඩා හොඳට තිබෙන්න ඕනෑ. මේ සියල්ල එකතු වුණු තැන තමයි, පොහොසත් මිනිසෙකු නිර්මාණය වෙන්නේ. පොහොසත් මිනිසෙකු නිර්මාණය කරගෙන, ඉන් අනතුරුව පොහොසත් රටක් නිර්මාණය කරන එකයි අපේ අපේක්ෂාව. ඒක තමයි, අපි බලාපොරොත්තු වන සමාජ පරිවර්තනය. අපි බලාපොරොත්තු වන සමාජ පරිවර්තනය තමයි මේ තිබෙන්නේ. එතුමා හැම දාම කොළයක් අරගෙන ඇවිල්ලා එහෙන් මෙහෙන් කියවනවා වාගේ නොවෙයි. අපේ හෘදය සාක්ෂිය වාගේම ප්‍රතිපත්ති ප්‍රකාශනයක් තමයි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියලා අපි මේ අන්තර්ගත කරලා තිබෙන්නේ. එතුමාට තේරෙන්නේ නැත්නම් සභා ගර්භයෙන් එළියට යන වෙලාවක මෙතැනින් වාඩි වුණොත් පොඩි "කුප්පියක්" දාලා තවත් සවිස්තරාත්මකව කියලා දෙන්න පුළුවන්. අපි මේ රටේ ජනතාවට බලාපොරොත්තු ටිකක් දුන්නා. ඒවා තමයි, "හොරකම, දූෂණය, වංචාව, නාස්තිය නතර කරනවා. ඉන් එහාට ගිහිල්ලා අලුත් දේශපාලන සංස්කෘතියක් ගෙනෙනවා, හොරුන්ට, දූෂිතයන්ට දඬුවම් දෙනවා. නීතිය, නීතියේ විධානයේ ආධිපත්‍ය තහවුරු කරනවා" කියන එක. මේ සියල්ල අපි මේ වෙනකොට ආරම්භ කරලා ක්‍රියාත්මක කරමින් යනවා. ඒ සියල්ල සම්පූර්ණ වෙමින් පවතිනවා. හැබැයි, නීතිය, නීතියේ විධානයේ ආධිපත්‍යය තහවුරු වෙද්දී ප්‍රභූ වුණත් තමන්ටත් නීතිය ක්‍රියාත්මක වෙනවා කියනකොට විපක්ෂයේ ඉන්න සමහර උදවිය කලබල වෙනවා. ඒ අය එහෙම කලබල වෙන්න එපා යැ.

ඒ විතරක් නොවෙයි, නීතිය හා නීතියේ විධානයේ ආධිපත්‍යය තහවුරු වෙලා ඒ ආයතන ස්වාධීනව වැඩ කරගෙන යනකොට තව අය කලබල වෙලා. පසුගිය දවස්වල එක්තරා රූපවාහිනී

[ගරු ධනුෂ්ක රංගනාත් මහතා]

නාළිකාවකුත් මුල් කරගෙන, "දවසේ වෙඩිල්ල" කියලා දවස ගණනේම ප්‍රවෘත්ති දුන්නා මතක ඇති. දැන් ඒක නැහැ නේ. දැන් ඒක නැහැ. හැබැයි, දැන් හැම තැනම තිබෙන්නේ මොකක්ද? පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ සුවඳ හමාගෙන එනකොට දවසේ වෙඩිල්ල නොවෙයි, දවසේ ඇඩිල්ල පටන් ගන්නවා. පාර්ලිමේන්තුවෙන් එළියේදිත් දවසේ ඇඩිල්ල තමයි ඒ මහත්වරුන්ට තිබෙන්නේ. ජනතාව බලාපොරොත්තු වෙච්ච නිවැරැදි මාර්ගයට අපි අද මේ රට ගෙනැල්ලා තිබෙනවා.

ජනතාවට මේ සියල්ල දැනෙමින් ඉන්න වෙලාවක මේ රට වඩාත් හොඳින්, සාර්ථකව ක්‍රියාත්මක වෙනවා කියන එක මෙහෙයවන්න පුළුවන් තවත් අමාත්‍යාංශයක් තිබෙනවා. ඒ අමාත්‍යාංශය තමයි, ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය. මේ රට හරියාකාරව ඉදිරියට යනවා කියලා ජනතාවට දැනෙන්නේ ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ඔවුන්ට වරප්‍රසාද ලැබෙන විටයි. විශේෂයෙන්ම ජනතාවට වඩාත් ගුණාත්මක ප්‍රවාහන පද්ධතියක්, ප්‍රවාහන සේවයක් ලබා දීම වෙනුවෙන් මේ අමාත්‍යාංශය මැදිහත්වීම් කරගෙන යනවා. අධිවේගී මාර්ග, මහා මාර්ග, පාලම්, ග්‍රාමීය මාර්ග, වරාය, ගුවන් සේවා, දුම්රිය ඇතුළු ප්‍රවාහන සේවය පිළිබඳව මේ අමාත්‍යාංශය වැඩි අවධානයක් යොමු කරලා, ඒකට අදාළව මැදිහත්වීම් කරගෙන යනවා.

මෙහිදී මම මතක් කරන්න ඕනෑ, ග්‍රාමීය මාර්ග පිළිබඳවත්. විශේෂයෙන්ම අපි ජීවත් වන ග්‍රාමීය ප්‍රදේශ ගත්තාම ඒ ජනතාවගේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ ඒ ප්‍රදේශවල ග්‍රාමීය මාර්ග ගොඩනහා ගන්න එක වාගේම ග්‍රාමීය මාර්ග පද්ධතිය හදාගෙන ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරගන්න එකයි. ඒ අනුව ග්‍රාමීය මාර්ග සංවර්ධනය වෙනුවෙන් මේ ආණ්ඩුව වැඩ පිළිවෙළ රැසක් ක්‍රියාත්මක කළා. විශේෂයෙන් මේ අමාත්‍යාංශය යටතේ ආරම්භ කළා, "පුනරුදයට මග" කියලා ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහනක්. අපේ රටේ ග්‍රාමීය මාර්ග පද්ධතියෙන් වැඩි ප්‍රමාණයක් -සියයට 90ක් විතර- ප්‍රාදේශීය සභාවට පැවරෙන පාරවල් තිබෙන්නේ. ඒ පාරවල් ප්‍රාදේශීය සභාවලට තනියම නඩත්තු කරගන්න බැහැ. එවැනි අවස්ථාවල මාර්ග සංවර්ධන අධිකාරිය ඒ මාර්ග සංවර්ධනයට මැදිහත් වෙනවා. ඒ අනුව "පුනරුදයට මග" ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාර්ග 1,619ක් සංවර්ධනය කිරීමට මේ වසරේ හඳුනාගෙන තිබෙනවා. ඒ සඳහා වැය වන මුදල රුපියල් බිලියන 25ක්. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ මෙම මාර්ග සංවර්ධනය වෙනවා. එයින් මාර්ග 192ක වැඩ කටයුතු මේ වනවිට අවසන්කොට ඇති අතර, 613ක වැඩ කටයුතු මේ වනවිට ආරම්භ කරලා තිබෙනවා. අනෙකුත් සියල්ලේ වැඩ කටයුතු මේ වසරේ ඇරඹෙන අතර, ලබන වසර සඳහාත් රුපියල් බිලියන 25ක් ඒ සඳහා වෙන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, iRoad ව්‍යාපෘතිය ගැනත් මම කරුණු කීපයක් කියන්න ඕනෑ. iRoad ව්‍යාපෘතියෙන් රට පුරා කිලෝමීටර 500ක් සංවර්ධනය කරන්න බලාපොරොත්තු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ iRoad ව්‍යාපෘතිය මුළු රටටම පිළිකාවක් බවට පත් වෙච්ච ව්‍යාපෘතියක්. විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ මාර්ග 24ක් මේ ව්‍යාපෘතිය යටතේ අපි සංවර්ධනය කරනවා. මේ iRoad ව්‍යාපෘතිය 2016 වර්ෂයේ තමයි ආරම්භ කළේ කියන එක ඔබතුමන්ලාට මතක ඇති. නමුත්, අවුරුදු 9ක පමණ කාලයක් මේක අතරමඟ නතර කරලා තිබුණේ. මේ හිටපු ඇමතිවරු අතරේ දයා ගමගේ කියන කිසිම දයාවක් නැති කැබිනට් ඇමතිවරයෙක් හිටියා. එතුමා කිසිම දයාවක් තිබුණේ නැති ඇමතිවරයෙක්. එතුමාට කොන්ත්‍රාත් සමාගමක් තිබුණා. ඒ කොන්ත්‍රාත් සමාගමෙන් කළුතර දිස්ත්‍රික්කයේ සිදු කළ පාරවල් රැසක ඉදිකිරීම් කටයුතු අතරමඟ නතර කරලා වසර 9කට වැඩි කාලයක් ඒ ප්‍රදේශවල ජනතාව පීඩාවෙන් පීඩාවට පත් කළා. ඒගොල්ලන්ගේ කැබිනට් මණ්ඩලයේ තමයි එතුමා හිටියේ. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට අමතක ඇති, ඒගොල්ලන්ගේ කැබිනට් මණ්ඩලයේ තමයි දයා ගමගේ හිටියේ. ඒ නමත් ඒකට ඇතුළත් කර ගන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

මට තව තත්පර කීපයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ ඇමතිවරු අතරමඟ නතර කර දැමූ ඒ ව්‍යාපෘති අපි ආරම්භ කරනවා. විශේෂයෙන්ම ඒවායේ ප්‍රසම්පාදන කටයුතු අවසන් වෙලා තිබෙන්නේ. මේ වසර අවසන් වෙන්න කලින් ඒ ව්‍යාපෘති ආරම්භ කරලා, ඉතා කෙටි කාලයක් තුළ ඒවා නිම කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. මෙය, මේ රට ඉදිරි ගමනකට මෙහෙයවන්න මැදිහත්වෙන අමාත්‍යාංශයක් කියන එක ඉතා පැහැදිලියි. ඒ නිසා මේ රටේ ජනතාවට අපි වගකීමෙන් කියනවා, ඔබ අපට දුන් ඒ වගකීම අපි නිසියාකාරයෙන් ඉටු කරන බව. මට කථා කරන්න කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.56]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට අදාළ පරිපූරක ඇස්තමේන්තුව සම්බන්ධයෙන් අද සිදු කරන විවාදයට සම්බන්ධ වෙමින් මම මුලින්ම එක් කාරණාවක් මතු කරන්න කැමැතියි. අද මේ සභාවේ ඉදිරිපත් වුණු අදහස්වලින් මතු වෙච්ච අදහසක් තමයි, පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳව අද විවාද කරන්නේ ආණ්ඩුවට යම් වැඩ ප්‍රමාණයක් කර ගන්න බැරි වෙච්ච නිසා වෙන කාරණයකට - ණය ගෙවීම සඳහා - මේ මුදල් යොදවා ගන්න කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අපේ රට 2022 වර්ෂයේදී බංකොලොත්භාවයට පත් වුණා. ඒ ගැන කථා කරද්දී අපේ රටේ ගෑස් පෝලිම් ඇති වීම, විදුලිය කප්පාදු වීම, ආහාර හා බෙහෙත් හිඟකම්වලට ජනතාවට මුහුණ දීමට සිදු වීම සහ ජනතාවට ඇති වූ පොදු අපහසුතා සම්බන්ධයෙන් විශාල සාකච්ඡාවක් අපි ඇති කරගෙන තිබෙනවා. නමුත් අපි බංකොලොත්භාවය ගැන කථා කරද්දී කථා නොකරන කොටස තමයි, රටක් බංකොලොත්භාවයට පත් වනවිට, ඒ කියන්නේ

බාහිරව ලබා ගෙන තිබෙන ණය ගෙවා ගැනීමට නොහැකි බව රටක් ප්‍රකාශ කරන විට ඒ රටට ආයෝජන ගලා ඒමේදී, එහෙම නැත්නම් ඒ රට එතෙක් අරගෙන තිබුණු ණයවලින් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වීමේදී මොනතරම් අපහසුතාවකට එම රට පත් වෙනවාද කියන එක. අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු මේ ගැන දිගින් දිගටම සාකච්ඡා කළා. 2022 අප්‍රේල් 12වැනි දා ලංකාව බංකොලොත්භාවය ප්‍රකාශ කිරීමත් සමඟ අපේ රටට ව්‍යාපෘති සඳහා ලබා දී තිබුණු මූල්‍යාධාර, ණය රට තුළට ගලා ඒම නැවතුණා. එහි ප්‍රතිඵලයක් හැටියට තමයි එතෙක් ක්‍රියාත්මක කරගෙන ගිය සංවර්ධන ව්‍යාපෘති ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යෑමට අපට නොහැකි වුණේ. ඒවා ඉදිරියට ක්‍රියාත්මක කරලා කාලයට අනුව අවසන් කර ගැනීමට නොහැකි වෙනවා විතරක් නොවෙයි, ඒ කාලය තුළදී ණය අරගෙන වැඩ කරගෙන ගිය ඒ ව්‍යාපෘතිවල කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන්න තිබුණු මුදල් වෙනුවෙන් ගෙවීමට අපට පොලී ප්‍රමාණයකුත් එකතු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද ගොඩක් මන්ත්‍රීවරු කථා කළා, මධ්‍යම අධිවේගී මාර්ගය - Central Expressway එක - ගැන. මධ්‍යම අධිවේගී මාර්ගය වෙනුවෙන් මේ කාලය තුළදී පොලිය සඳහා පමණක් ඩොලර් බිලියන 34ක් එකතු වෙලා තිබෙනවා, ගෙවන්න. මම දන්නේ නැහැ, මේ කාරණය නොදැන කථා කරනවාද එහෙම නැත්නම් මේ සභාව තුළ මේ වාගේ විෂයක් - subject එකක් - ගැන කථා කරද්දී ඒක සිල්ලර කිරීමේ අරමුණින් කථා කරනවාද කියලා. සමහර මන්ත්‍රීවරු කියනවා, මේ ව්‍යාපෘති නැවතුණේ එක එක්කෙනා විරුද්ධ වෙච්ච නිසා, එහෙම නැත්නම් පාරිසරික කරුණුවලට විරුද්ධ වෙච්ච නිසා, එහෙමත් නැත්නම් අධිවේගී මාර්ගයට විරුද්ධ වෙච්ච නිසාය කියලා. එහෙම එකක් නැහැ. නිශ්චිතවම මේ මධ්‍යම අධිවේගී මාර්ගයේ - Central Expressway එකේ - ඉදිකිරීම් කටයුතු නවතින්නේ බංකොලොත්භාවය නිසායි. 2022න් පස්සේ Exim Bank එක අපට සල්ලි ලබා දීම නවත්වා දමනවා. මොකද, අපි ණය ගෙවන්න බැරි රටක් හැටියට ප්‍රකාශ කරපු නිසා. මේවායේ මූලික යථාර්ථය සම්බන්ධයෙන් මෙතැන බොරු කියන ගමන් අපේ විපක්ෂ නායකතුමා කියනවා, අපි බොරු කිය කියා ඉස්සරහට යනවා කියලා. මම දන්නේ නැහැ ඇයි, මේක නිතර නිතර කියන්නේ කියලා. මෙතැනට ඇවිල්ලා තමන්ට අවංකව දේශපාලන කරුණු සාකච්ඡා කරන්න බැරි නම් අඩු ගණනේ ආණ්ඩුව ගැන බොරු කියන එකවත් නවත්වා දමන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි කාරණය මෙයයි. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා - හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා - කිව්වා, Central Expressway එක සඳහා ගත්ත ණය ගැන. ඉතාම කනගාටුවට කාරණයක් තමයි, රටක් බංකොලොත්භාවයට පත් වුණාට පස්සේ මෙච්චර අමාරුවෙන් නැවතත් රට තුළට මුදල් ප්‍රවාහ අරගෙන ඇවිල්ලා, ආයෝජන හෝ මේ වාගේ ණය ව්‍යාපෘති අරගෙන ඇවිල්ලා සංවර්ධන කටයුතු පටන් ගන්නවා කියන්නේ පහසු කාරණයක් නොවෙයි. බංකොලොත්භාවය කියන එක රටක දීර්ඝ කාලීන ආර්ථික අවපාතවලට හේතු වෙනවා. අපේ රටේ ඒ තත්ත්වය ඇති වීම නවත්වා ගැනීම සඳහා මෙවැනි සංවර්ධන කටයුතු පටන් ගැනීම අනිවාර්යයයි. එහෙම තිබෙද්දී හර්ෂ ද සිල්වා මහත්මයා කියනවා, අපි මේ කටයුත්ත සද්දේ දාලා පටන් ගත්තාට මේකේ ණය පොලිය සියයට 2.5 සිට 3.5 දක්වා floating interest rate එකක තමයි තිබෙන්නේ, ඒ නිසා අපට මේකේ සම්පූර්ණ වාසිය ලබා ගැනීමට හම්බ වෙන්නේ නැහැ කියලා.

මෙහිදී පළමුවැනි කාරණය මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2015 වර්ෂයේදී චීන රජයත් සමඟ, චීනයේ Exim Bank එකත් එක්ක මේ සාකච්ඡා පටන් ගන්නකොට ඩොලර් ණය පහසුකමක් යටතේ තමයි අපට මේ ව්‍යාපෘතිය හම්බ වෙන්නේ. නමුත්, ඒ කාලය තුළදී -2015 සිට 2019 දක්වාම- ණය පහසුකම සඳහා Exim Bank එකත් එක්ක ගිවිසුම් අත්සන් කර ගැනීමට අපට හැකි වෙන්නේ නැහැ. 2019 වසරේ මේ ගිවිසුම අත්සන් කරද්දී ඩොලර් ණයකට තමයි එය අත්සන් කළේ. 2022දී අපි බංකොලොත් වීම නිසා අද දවස වෙනකොට චීන රජය තවදුරටත් ඒ ඩොලර් ණය පහසුකම ලබා දෙන්නේ නැහැ. ඒ අනුව මේ වෙනකොට යුවාන් ණය පහසුකමක් තමයි ලබා දී තිබෙන්නේ. එතකොට ඩොලරය සහ යුවාන් විනිමය අතර යම් කිසි වෙනසක් තිබෙනවා. ඒ අනුව තමයි සියයට 2.5 සිට සියයට 3.5 දක්වා floating interest rate එකකට රජයට එකඟතාව පළ කරන්නට සිද්ධ වුණේ. මේක මේ රට තුළට මූල්‍ය කැඳවා ගැනීම සඳහා රජය කරන දෙයක්. ඇත්තටම අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ, මේ ණය ලබා දීමට Exim Bank එක එකතු වීම සහ මේක නැවතත් රට තුළට ගෙන ඒමට රජයට හැකි වීම සම්බන්ධයෙන්. එවැනි කිසිදු ප්‍රශංසනීය කථාවක් කරන්නේ නැතිව, ඒක ඇඟයීමට ලක් කරන්නේ නැතිව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා දැන දැනම තමයි මේවා කියන්නේ. මේවා නොදැන කියන කථා නොවෙයි. මොකද, එතුමා 2015- 2019 කාලය තුළ, ඒ කියන්නේ Exim Bank එකත් එක්ක,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමියට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මට මතක හැටියට, 2015-2019 කාලය තුළදී යහ පාලන රජයේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය ඇමති - State Minister of National Policies and Economic Affairs - ලෙස හිටියේ හර්ෂ ද සිල්වා මහත්මයා. මෙහිදී පැහැදිලිව කිව යුතු කාරණය මේකයි. ඒ කාලය තුළදී මේ ගිවිසුමට එළැඹෙන්නට, මේ ගිවිසුමට එකඟතාව පළ කර ගන්නට නොහැකි වෙනවා විතරක් නොවෙයි, 2019දී මේ ගිවිසුම අත්සන් කරද්දී 2015 තිබුණු dollar rate එකට අනුව තමයි අත්සන් කළේ. ඒ කියන්නේ, අපි මේ ණය රුපියල්වලින් ගෙවන හැම අවස්ථාවකදීම, මුහුණ පාන ගැටලුවක් තිබෙනවා. අද වෙනකොට රුපියල අවප්‍රමාණය වෙලා ඩොලරය රුපියල් 300ක පමණ අගයක තමයි තිබෙන්නේ. නමුත්, අපට ඒ වාසියවත් ගන්න විධියක් නැහැ. ගරු ඇමතිතුමා බොහොම පැහැදිලිව ඒක විස්තර කළා. රුපියල්වලින් කරන වැඩවලට අපි ගෙවන්න ගියාම ඩොලරය රුපියල් 135ට තමයි තක්සේරු කරලා තිබුණේ. දැන් negotiate කරන්න පුළුවන් ලු. මේවා වාසි සහගත කර ගන්න පුළුවන් ලු. බංකොලොත්භාවයක් තිබුණේ නැති, බංකොලොත් වෙලා තිබුණේ නැති රටට ආයෝජන,- මම හිතන විධියට, මේක මහින්ද රාජපක්ෂ මහත්මයාගේ රජය යටතේ හෝ ඊට පෙර තිබිච්ච රජය යටතේ කථා කරපු ව්‍යාපෘතියක්; පෙර පැවති රජයක් විසින් කථා කරලා තිබිච්ච ව්‍යාපෘතියක් වෙන්නට ඕනෑ. රට තුළ බංකොලොත්භාවයක් නැතුවත් අඩු ගණනේ අපට වාසි සහගත විනිමය අනුපාතයකට සාකච්ඡා කරලා මේ ව්‍යාපෘතිය ගන්න එතුමන්ලාට බැරි වුණා. එහෙම කරපු අය තමයි අද අපට මේවා කියන්නේ. මේ සියල්ල පසු කරලා ඇවිල්ලා, මේ ව්‍යාපෘති නැවතිලා, මේවායේ පොලිය වැඩි වෙලා, මේවායේ ණය වැඩි වෙලා, මේවායේ සංවර්ධන කටයුතු හැටියට විශාල පාරිසරික අර්බුද, ප්‍රජාව අතර අර්බුද ඇති කරලා, සංවර්ධනය අඩාළ වෙලා තිබෙන අවස්ථාවකදී මේක නැවත පටන් ගන්න එකට අකුල්

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

හෙළමින් කියනවා, "නැහැ, මේක තව negotiate කරන්න තිබුණා" කියලා. අපිත් කැමැතියි, තව negotiate කරන්න අවස්ථාවක් තිබුණා නම්. නමුත්, අපි වාගේ දුර්වල ආර්ථික තත්ත්වයක සිටින, බංකොලොත්භාවය තුළින් එළියට එමින් සිටින රටකට තිබෙන negotiating space එක ඉතාම දුර්වලයි. ඒක ඕනෑ කෙනෙකුට පැහැදිලිව තේරෙනවා.

අනෙක් කාරණය මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමියට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මට විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ කාරණය කියන්නටම අවශ්‍යයි. මොකද, ජාතික පොලිස් කොමිෂන් සභාව සම්බන්ධයෙන් අද මෙතැන දිගටම කථා කරපු නිසා.

ජාතික පොලිස් කොමිසම කියන්නේ ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කර තිබෙන ආයතනයක්. ජාතික පොලිස් කොමිසමට තමන්ට තිබෙන බලය delegate කිරීමේ අයිතිය ව්‍යවස්ථාවෙන්ම ලබා දීලා තිබෙනවා. එතකොට පොලිස්පතිවරයාට යම් බලයක් පොලිස් කොමිසම ලබා දෙන්නේ ජනාධිපතිවරයාගේ නියෝගයකින්වත්, පාර්ලිමේන්තුවේ නියෝගයකින්වත් නොවෙයි. ඒක පොලිස් කොමිසම විසින්ම ගන්නා තීරණයක් අනුව තමයි සිද්ධ වෙන්නේ. ජාතික පොලිස් කොමිසමේ අද වෙනකොට අපි පත් කරපු එක සාමාජිකයෙක් විතරයි ඉන්නේ. මීට පෙර රජය, ඒ කියන්නේ රනිල් වික්‍රමසිංහ මහතාගේ රජය යටතේ පත් කරපු සමාජිකයන් තමයි පොලිස් කොමිසමේ අදටත් බහුතරයක් ඉන්නේ. ඒ නිසා විකාර කථා කිය කියා ඇත්තටම මේ වාගේ ප්‍රශ්නයක් පාර්ලිමේන්තුවේ සාකච්ඡා කිරීමම තමයි පොලිස් කොමිසමට කරන බලපෑම වෙන්නේ; පොලිසිය අද කරන ක්‍රියාකාරිත්වයට කරන බලපෑම වෙන්නේ. ඒ නිසා අපි මේවා නිවැරදිව තේරුම්ගත යුතුයි කියන කාරණය මතක් කරමින් මම කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ. සුජීත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

**ගරු කේ. සුජීත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
විනාඩි 4 නොවෙයි, විනාඩි 7ක්. විනාඩි 4න් කථා කරන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 4ක් තමයි වෙන් කර තිබෙන්නේ.

[අ.භා. 4.05]

**ගරු කේ. සුජීත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මට විනාඩි 7ක් තිබෙන්න ඕනෑ. නැත්නම් ඉතින් කථා කිරීමේ තේරුමක් නැහැ. මට විනාඩි 6ක්වත් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ ගෙන එන පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳ යෝජනාව ඉදිරිපත් කර ඇති අවස්ථාවේදී විශේෂයෙන්ම මම මහාමාර්ග ක්ෂේත්‍රය ගැන කථා කරන්න බලාපොරොත්තු වෙනවා. මට ඉස්සෙල්ලා කථා කරපු මන්ත්‍රීවරු ගණනාවක් කිව්වා, මේ වෙනකොට මේ රට සම්පූර්ණ වැඩ බිමක් බවට පත් වෙලා තිබෙනවා කියලා. මහාමාර්ග හැදෙනවා; අධිවේගී මාර්ග හැදෙනවා; පාලම් හැදෙනවා; බෝක්කු හැදෙනවා කිව්වා. මේ වාගේ විශාල සංවර්ධන කටයුතු ආරම්භ වෙලා තිබෙනවා, ඒ වාගේම කරලාත් තිබෙනවා කියලා තමයි ප්‍රකාශ කළේ. මම හිතන විධියට එතුමන්ලා කථා කෙරුවේ, මේ ශ්‍රී ලංකාව ගැන නම් වෙන්න බැහැ. මොකද, අපිත් මේ ලංකාවේ තමයි ජීවත් වෙන්නේ. අපේ ප්‍රදේශවල නම් මේ කියන සංවර්ධනයක් ඇති කරන්න ආණ්ඩුව තවමත් සමත් වෙලා නැහැ කියන එකත් මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මීට ඉස්සෙල්ලා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදීත් මේ කරුණු ගැන කථා කෙරුවා. විශේෂයෙන් iRoad ව්‍යාපෘතිය ගැන. ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් සභාවේ ඉන්න අවස්ථාවේ ඒ ගැන කියන්න මම කැමැතියි. තමුන්නාසේලාගේ මන්ත්‍රීවරුත් මේ සම්බන්ධව කථා කළා. ඇත්ත වශයෙන්ම මේ iRoad ව්‍යාපෘතිය ගත්තොත්, විවිධ කොන්ත්‍රාත්කරුවන් විසින් ගත්තා වූ තීරණ නිසා, ඒ වාගේම කොන්ත්‍රාත්කරුවන්ගේ නොහැකියාව නිසා දැන් අවුරුදු ගණනාවක් තිස්සේ මහාමාර්ග ටික නිසියාකාරව හදා ගන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. ඉතින් විශේෂයෙන්ම දැන් ඔබතුමන්ලාගේ අවධානය මේ ගැන යොමු වෙලා තිබෙන නිසාත්, ඒ වාගේම මුදලුත් වෙන් වෙලා තිබෙනවා නම්, අනිවාර්යයෙන්ම මේ ව්‍යාපෘති ටික සම්පූර්ණ කරන්න කටයුතු කරන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. මොකද, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම නියෝජනය කරන යටියන්තොට මැතිවරණ කොට්ඨාසයේ විතරක් පාරවල් 10කට ආසන්න සංඛ්‍යාවක් වැඩකටයුතු අතරමග නතර වෙලා තිබෙනවා. ඒ වාගේම කෑගල්ල දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශවලත් ඒ හා සමාන පාරවල් ප්‍රමාණයක් සංවර්ධනය කරන්න, කාපට් කරන්න තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලාගේ මේ වැඩකටයුත්තේදී ඒ සම්බන්ධයෙන් ප්‍රමුඛතාවක් ලබා දීලා මේ කටයුත්ත සාර්ථක කර ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ කරලා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් කාරණාවක් මම මතක් කරනවා. ඒ, පසුගිය රජය ගත් තවත් අසාර්ථක පියවරක් ගැන. ඒක ගැන මම කියන්න ඕනෑ, කවුරු කෙරුවා වුණත්. පසුගිය කාලයේ "මහාමාර්ග ලක්ෂයේ වැඩසටහන" කියලා එකක් ආරම්භ කෙරුවා. නමුත් ඒ තුළින් එකම පාරක්වත් නිසියාකාරව සංවර්ධනය කරගන්න හම්බ වුණේ නැහැ. මා දන්නා තරමින් පාරවල්වලින් සියයට 5කවත් ඒ කටයුතු කෙරුණේ නැහැ. අපි දන්නවා, එහිදී විශාල මුදල් නාස්තියක් වුණු බව. අදටත් ඒ මාර්ගවලට ගියොත් ඔබතුමන්ලාට බලා ගන්න පුළුවන්, පාරවල්වල ABC ගොඩගහලා තිබෙන හැටි. ඒ වාගේම තාර, සහ වෙනත් උපකරණ ගෙනැල්ලා ඒවා ගොඩගහලා තිබෙනවා. නමුත් කිසිම සංවර්ධන කටයුත්තක් සිද්ධ වෙලා නැහැ, ගරු නියෝජ්‍ය

ඇමතිතුමනි. මේවා සම්බන්ධවත් ඔබතුමන්ලාගේ කාරුණික අවධානය යොමු කරන්න. මොකද, සංවර්ධන කටයුතු අතරමග නතර වෙච්ච පාරවල් තව කිහිපයක් තිබෙනවා. අපේ ප්‍රදේශවලත් තිබෙනවා. ඒවා ගැනත් ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න කියලා මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අද ප්‍රවාහනය ගැන කථා කරනවා. හුඟක් අවස්ථාවලදී මාධ්‍ය මඟින් මම දැක්කා, ගරු ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් මේ ප්‍රවාහනය නිසි අයුරින් කළමනාකරණය කරන්න කටයුතු කරනවා. ඒ වාගේම ප්‍රවාහනයට අදාළව තිබෙන ප්‍රශ්න සම්බන්ධව යම් යම් ක්‍රියාමාර්ග ගන්න, සාධනීය ක්‍රියාමාර්ග ගන්න යම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරපු බවක් පෙනෙනවා. නමුත් මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ එක කාරණාවක්. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපි නියෝජනය කරන ප්‍රදේශ බොහෝ දුෂ්කර ප්‍රදේශ. ඉතින්, මේ දුෂ්කර ප්‍රදේශවල ප්‍රවාහනය සඳහා, මඟී ප්‍රවාහනය සඳහා ඉතාම අඩු ප්‍රවාහන පහසුකම් තමයි තිබෙන්නේ. මා දන්නා තරමින් ඒ ප්‍රදේශවලට යොදවා තිබෙන බස් රථ අවුරුදු 20, 30 පරණ බස් රථ. ඒ ප්‍රදේශවල තිබෙන දුෂ්කර මාර්ග, වතු ක්ෂේත්‍රයට ගමන් කරන මාර්ග ඉතාම අබලන් තත්ත්වයේ තිබෙන්නේ. ඉතින් මම හිතන විධියට, මේ මාර්ගවල ගමනාගමනයට හොඳ බස් රථ යොදන්න ඕනෑ. හුඟක් අවස්ථාවලදී කථා කරනවා, ලොරි බස් රථ යොදවලා තමයි මෙතෙක් කල් කටයුතු කෙරුවේ කියලා. ඒක සම්පූර්ණයෙන් මිථ්‍යාවක්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මා දන්නා තරමින් ඉන්දියාවෙන් ගෙනෙන ටාටා, එහෙම නැත්නම් අශෝක් ලේලන්ඩ් ලොරි බස් රථ සාමාන්‍යයෙන් මේ රළු මාර්ගවලට ඔරොත්තු දෙන ආකාරයට තමයි හදලා තිබෙන්නේ. එහෙම නැතුව චීනයෙන් ගෙනෙන අධි සුඛෝපභෝගී වාහන අපේ ප්‍රදේශවලට, එහෙම නැත්නම් වතු ක්ෂේත්‍රයේ මාර්ගවලට යොදවන්න පුළුවන්කමක් නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමා. ඒ නිසා මම හිතන විධියට, ඒවාට ඔරොත්තු දෙන්නෙත් මේ ඉන්දියන් වාහන තමයි. අර බස් රථයක් ගන්නකොට ඒ මුදලින් මේ බස් රථ 4ක්, 5ක් ගන්න පුළුවන්. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, බස් රථ ආනයනය කරන්න කටයුතු කරනවා නම්, අනිවාර්යයෙන් කුඩා මාර්ගවලට කුඩා බස් රථ, ඒ කියන්නේ තනි දොර තිබෙන බස් රථ යොදවන්න කටයුතු කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම තව එක් කාරණයක් ගැන කථා කරනවා. එම කාරණය ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට අදාළ නැහැ. මේ අවස්ථාවේ අපේ වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් ඇමතිතුමා මේ සභාවේ සිටියා නම් හොඳයි. අපි දන්නවා, පසුගිය දවස්වල විශාල වශයෙන් කථාබහට ලක් වුණා, මේ රටේ තේ තොගයක් ජපානයේ පැවැති වාර්ෂික පුණ්‍යාධාර තේ වෙන්දේසියේදී ඉතා ඉහළ මිලකට අළෙවි වුණා කියලා. මෙතැනදී ලංකා ඉතිහාසයේ පළමු වතාවට මේ සා විශාල මුදලක්, ඒ කියන්නේ ඩොලර් 8,343ක් වාගේ මුදලකට මේ තේ තොගය අළෙවි කරන්න අවස්ථාව ලැබුණා කියලා තමයි ආණ්ඩුවත්, ශ්‍රී ලංකා තේ මණ්ඩලයත් පෙන්නුම් කෙරුවේ. අපි දන්නා තරමින් එක්තරා ඇමතිවරයෙක් කිව්වා, මේකට නොබෙල් ත්‍යාගයක් ලබාගන්න පුළුවන් මිලක් ලැබුණාය කියලා. කෙසේ වෙතත්, යම්කිසි වැරදීමක් එතුමාට සිද්ධ වුණා. නමුත්, මේක ගිනස් වාර්තාවක් හැටියට තමයි පෙන්නුම් කර තිබුණේ. මම කියන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක පළමු වතාවට නොවෙයි සිදුවෙලා තිබෙන්නේ කියන එක. මා දන්නා තරමින් මීට ඉස්සරවෙලා අවිස්සාවේල්ල තේ කර්මාන්තශාලාව මඟිනුත් 2024 වසරේ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ - BMICH එකේ - තිබුණු මේ පුණ්‍යාධාර තේ වෙන්දේසියේදී ඩොලර් 8,655ක මුදලකට ඒ තේ තොගය අළෙවි වී තිබෙනවා. එදා අළෙවි කර තිබෙන්නේ ඩොලර් 8,655කට. මෙදා ජපානයේදී අළෙවි වෙලා තිබෙන්නේ ඩොලර් 8,343කට. මම හිතන හැටියට වඩා වැඩිම මුදල ලැබී තිබෙන්නේ, එහෙම නැත්නම් ගිනස් වාර්තාවට හිමිකම් කියන්න ඕනෑ අවිස්සාවේල්ල තේ කර්මාන්තශාලාවයි. මෙතැනදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය යම්කිසි වරදක් සිද්ධ කර තිබෙනවා. ඔවුන් හරියට හඳුනාගෙන නැහැ, කොයි කර්මාන්තශාලාවෙන්ද මේ සා විශාල මුදලකට තේ අළෙවි කෙරුවේ කියලා. මට කියන්න තිබෙන්නේ, එතැනදී අවිස්සාවේල්ල තේ කර්මාන්තශාලාවට අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා බවයි. මොකද, අවිස්සාවේල්ල තේ කර්මාන්තශාලාව තමයි වැඩිම මුදලකට ඒ තේ තොගය වෙන්දේසියෙන් විකුණන්න කටයුතු කර තිබුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ අඩුම ගණනේ පාර්ලිමේන්තුවේදී ඔබතුමා හෝ මැදිහත් වෙලා, එහෙම නැත්නම් අදාළ අමාත්‍යාංශයේ ඇමතිතුමා මැදිහත් වෙලා මේක නිවැරදි කරන්න කියායි. ශ්‍රී ලංකා තේ මණ්ඩලයට උපදෙස් දෙන්න, කොයි කර්මාන්තශාලාවෙන්ද වැඩියෙන්ම තේ විකුණන්න කටයුතු කෙරුවේ කියා නිසියාකාරව හඳුනාගන්න කියලා. ඒ සඳහා ගෞරවය අවිස්සාවේල්ල තේ කර්මාන්තශාලාවට ලැබෙන්න ඕනෑ කියලා තමයි මට මේ අවස්ථාවේ කියන්න තිබෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කේ. ඉලංකුමාරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[පි.ව. 4.12]

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றையதினம் நடைபெறுகின்ற குறைநிரப்புத் தொகை சம்பந்தமான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு பெருமகிழ்ச்சி அடைகின்றேன். அரசாங்கங்கள் ஒதுக்கிய நிதிகளைச் சிறந்த முறையில் பயன்படுத்தாமல் விட்டதைத்தான் நாங்கள் கடந்த காலங்களில் பார்த்திருக்கிறோம். அதேபோல், வேலைத்திட்டங்களை ஆரம்பித்துவிட்டு திரும்பவும் நிதி தேவையெனக் கேட்பதையும் நாங்கள் பார்த்திருக்கிறோம். ஆனால், எமது அரசாங்கம் முன்னெடுத்த வேலைத்திட்டங்களில் சில நடைமுறைப்படுத்தப்படாமல் இருக்கும்போது, மாற்று ஏற்பாட்டைச் செய்து, அதனூடாக மக்கள் பயன்பெறக்கூடிய வகையில் அந்த நிதி ஒதுக்கீடு செய்யப்படுவதை நாங்கள் இந்தக் குறைநிரப்புப் பிரேரணைமூலம் பார்க்கலாம். அதையிட்டு நான் பெருமகிழ்ச்சி அடைகின்றேன்.

நான் வட மாகாணத்தைப் பிரதிநிதித்துவப்படுத்துபவன். எங்களுடைய வட மாகாணத்துக்கு ஒதுக்கப்பட்ட நிதி திறம்பட பயன்படுத்தப்பட்டு வருகின்றது. தேசிய மக்கள் சக்தியினராகிய நாங்கள் ஆட்சி அமைத்து ஒரு வருடமாகின்றதெனக் கூறுகின்றார்கள். ஆனால், எமது அரசாங்கம் அபிவிருத்திப் பணிகளை முன்னெடுக்கத் தொடங்கி 5 மாதங்களே ஆகின்றன. ஏனென்றால், கடந்த மார்ச் மாதம்தான் வரவு செலவுத்திட்டம் நிறைவேற்றப்பட்டது. அதன் பிறகு, உள்ளூர் அதிகாரசபைத் தேர்தல் நடைபெற்றது. அந்த வேளையில், அபிவிருத்திப் பணிகள் அனைத்தும் இடைநிறுத்தப்பட்டு இருந்தன. தேர்தல் முடிந்த பிறகு,

[ගරු කේ. ඉලංකුමාරන් මහතා]

அபிவிருத்திப் பணிகள் துரிதமாக நடைபெற்று வருகின்றன. எனவே, நாங்கள் அபிவிருத்திப் பணிகளைத் தொடங்கி 5 மாதங்களே கடந்திருக்கின்றன.

இன்று வடக்கில் பாரிய அபிவிருத்திப் பணிகள் நடைபெற்று வருகின்றன. யுத்தத்தால் பாதிக்கப்பட்ட வட்டுவாகல் பாலமானது, யுத்தம் முடிவடைந்து 16 ஆண்டுகளாகியும் அவ்வாறே காணப்பட்டது. ஆனால், இப்பொழுது அந்தப் பாலத்தின் புனரமைப்புப் பணிகள் துரிதமாக நடைபெற்று வருகின்றன. அதற்கான நிதியை அரசாங்கம் விடுவித்து இருக்கிறது. அந்தப் பாலத்தின் புனரமைப்புக்கு அமைச்சினால் எவ்வளவு தொகை estimate பண்ணப்பட்டு இருக்கிறதோ, அதைவிடக் குறைந்த தொகைக்கே ஒப்பந்ததாரர்களுக்கு வழங்கப்பட்டு இருக்கின்றது. இதிலிருந்து தெரிகின்றது, நாங்கள் ஊழல் செய்யாமல் அபிவிருத்திப் பணிகளை மேற்கொள்கின்றோம் என்று. நாங்கள் செய்யும் ஒவ்வோர் அபிவிருத்திப் பணியும் மக்களைத் தனிப்பட்ட வாழ்க்கையில் முன்னேற்றும் விதமாகவே அமைந்துள்ளது. மேலும், வட மாகாணத்திலுள்ள நயினா தீவு இறங்குதுறையைப் புனரமைப்பதற்கான ஆரம்பப் பணிகளை மேற்கொண்டுள்ளோம். முதற்கட்டமாக, அங்கிருக்கின்ற ஒற்றையடிப் பாதையை இருவழிப் பாதையாக மாற்றியமைப்பதற்கான பணிகளை ஆரம்பித்து இருக்கின்றோம். ஏனெனில், அங்கு அதிகளவான சுற்றுலாப் பயணிகள் வருகை தருகின்றனர்.

எங்களுடைய போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர் அவர்கள் வட மாகாணத்தில் யாழ்ப்பாணத்தை மட்டும் கவனத்திற்கொள்ளாமல் தீவுப் பகுதியையும் கவனத்திற்கொண்டுள்ளார். தீவுப் பகுதியில் வாழ்கின்ற மக்கள் கடல் கடந்து வந்துதான் பொருட்களைக் கொள்வனவு செய்கின்றார்கள். தீவுப் பகுதியில் உள்ளவர்கள் யாழ்ப்பாணத்திலுள்ள விலையிலும் பார்க்க அதிக விலைக்கே பொருட்களை வாங்குகின்றார்கள். இலங்கை முழுவதும் பொருட்களின் விலைகள் ஒரேமாதியாக இருக்க வேண்டும் என்பதுதான் எங்களுடைய நோக்கமாகும். அந்த வகையில், எமது அரசாங்கம் நெடுந்தீவில் எரிபொருள் நிரப்பு நிலையமொன்றை ஆரம்பித்து இருக்கின்றது.

கடந்த 5 மாதங்களாக அபிவிருத்திப் பணிகள் நடைபெற்ற வண்ணமே இருக்கின்றன. எங்களது அரசாங்கம் ஆட்சிக்கு வந்து ஓராண்டு முடிவடைந்து இரண்டாவது ஆண்டு ஆரம்பித்து இருக்கின்றது. எனினும், பலர் எமது அரசாங்கத்தை விமர்சிக்கின்றார்கள். எமது அரசாங்கமானது, ஊழல் இல்லாமல் அபிவிருத்திப் பணிகளை மேற்கொள்கின்றது. முன்னைய அரசாங்க காலத்தில் புனரமைக்கப்பட்ட வீதிகளை எடுத்துக் கொள்வோம். உதாரணத்துக்கு, நல்லாட்சி அரசாங்க காலத்தில் புனரமைக்கப்பட்ட மருதங்கேணி - பருத்தித்துறை வீதியை எடுத்துக் கொள்வோம். அதைப் புனரமைத்துக்கொண்டு இருக்கும்போதே ஆரம்பத்தில் புனரமைக்கப்பட்ட பகுதி சேதமடைந்தது. இப்போது அது தொடர்பான விசாரணை நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. அவ்வாறான அபிவிருத்திப் பணிகளைத்தான் இப்போது எதிர்க்கட்சியில் இருப்பவர்கள் செய்தார்கள். குறித்த வீதியை மீளவும் செப்பனிட வேண்டிய தேவை இருக்கின்றது. பரந்தனில் இருந்து பூநகரி ஊடாகச் செல்லும் வீதியும் சேதமடைந்து இருக்கின்றது. அதையும் புனரமைப்பதற்கு எண்ணியிருக்கிறோம். எதிர்வரும் காலத்தில் எமது அபிவிருத்திப் பணிகள் வடக்கு மாகாணம் உட்பட ஒட்டுமொத்த நாட்டையும் முன்னேற்றும் விதமாகத்தான் இருக்கும்.

எங்களுடைய கொள்கைப் பிரகடனத்தில் குறிப்பிடப்பட்டுள்ள விஷயங்களை இன்று நாங்கள் நிறைவேற்றி வருகின்றோம். இன்று எதிர்க்கட்சியில் இருக்கின்ற ஒரு சிலர் கடந்த காலத்தில் பிள்ளையான் ஊடாகத் தேர்தலில் களமிறங்கியவர்கள். அவ்வாறு பிள்ளையான் ஊடாகத் தேர்தலில் களமிறங்கியவர், வடக்கில் 36 வருட காலமாக இராணுவத்தினர் கையகப்படுத்தி வைத்திருந்த பாடசாலையை நாங்கள் ஆட்சிக்கு வந்த பிறகு விடுவித்தவுடன், தாங்கள் கூறித்தான் அது விடுவிக்கப்பட்டதாகக் கூறுகின்றார். அவ்வாறு யாழ்ப்பாணத்திலும் ஒருவர் இருக்கிறார். எங்களுக்குத் தெரியும்! முன்னைய காலத்தில் பாதைகள் விடுவிக்கப்படும்போது, அந்த இடத்துக்கு ஓடிப்போய் தாங்கள் கூறித்தான் இவை விடுவிக்கப்படுவதாக அவர் கூறுவார். அவர், நல்லாட்சி அரசாங்க காலத்தில் இராணுவப் பாதுகாப்புடன் வலம்வந்தவர்.

எங்களுடைய கொள்கைப் பிரகடனத்தில் வட மாகாணம் தொடர்பில் கூறப்பட்டுள்ள அனைத்து விடயங்களும் நிறைவேற்றப்படும் என்ற திடமான நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது. நாங்கள் அபிவிருத்திப் பணிகளைத் தொடங்கி 5 மாதங்களே ஆகின்றது. கிழக்குப் பிரதேசத்தின் அபிவிருத்திக்கு நிதி விடுவிக்கப்படவில்லை என்று கூறுகின்றார்கள். எங்களுடைய மட்டக்களப்பு மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் கேட்டதற்கு இணங்க, அடுத்த வருடத்துக்கான 'பட்ஜெட்'இல் அதிகளவான நிதி ஒதுக்கீட்டைச் செய்வதற்கு எமது அரசாங்கம் தீர்மானித்திருக்கிறது. எதிர்வரும் காலத்தில் வடக்கு, கிழக்கின் அனைத்துப் பிரதேசங்களிலும் அபிவிருத்திப் பணிகள் வேகமாக இடம்பெறும். ஏனென்றால், இரண்டாவது வருடத்தில் எங்களுக்கு அனுபவம் கூடியிருக்கும். அதனூடாக நாங்கள் வடக்கிலும் கிழக்கிலும் அபிவிருத்திப் பணிகளை மென்மேலும் மேற்கொள்வோமெனக் கூறி விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දිනේෂ් හේමන්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.17]

**ගරු දිනේෂ් හේමන්ත මහතා**
(மாண்புமிகு தினேஷ் ஹேமந்த)
(The Hon. Dinesh Hemantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

අද දවසේ ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා විසින් "පරිපූරක මුදල - ශීර්ෂය 117" මැයෙන් ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් වන විවාදයටයි අප මේ සම්බන්ධ වී ඉන්නේ. මේ පරිපූරක ඇස්තමේන්තුව කියන එකේ සරල අදහස ගත්තොත්, මුදල් වර්ෂයකට වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය අදාළ මුදල් වර්ෂය අවසන් වෙන්න කලින් ඉවර වුණොත්, ඉදිරි කාලයේ ඒ වැඩ ටික කරගෙන යන්න අදාළ

අමාත්‍යවරයා විසින් මුදල් අමාත්‍යතුමාගෙන් මුදල් ඉල්ලා පාර්ලිමේන්තුව තුළින් සම්මත කරගන්නා ඇස්තමේන්තුව තමයි පරිපූරක ඇස්තමේන්තුවක් කියලා සාමාන්‍යයෙන් කියන්නේ. අද දවසේ ඉදිරිපත් කර තිබෙන ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ මේ පරිපූරක ඇස්තමේන්තුව සාමාන්‍යයෙන් අතීතයේ තිබුණාට වඩා විශේෂත්වයක් ගන්නවා. එහෙම කියන්න හේතුව මා සරලව කියන්නම්. මේ වර්ෂය සඳහා වැඩ කරන්න කියලා ප්‍රවාහන අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙන මුදලින් යම්කිසි මුදල් ප්‍රමාණයක් වසර අවසන් වන විට ඉතිරි වේ යැයි ඒ ගරු ඇමතිතුමාට හැඟී ගිහින් තිබෙනවා. එසේ මුදල් ඉතිරි වීමට බලපාන හේතු විධියට අප හඳුනාගෙන තිබෙන ප්‍රධාන හේතු 3ක් කියන්නම්. පළමු හේතුව, ණය ප්‍රතිපාදනය කරන ලද ආයතන සමඟ පැවැති ගැටලු මෙතෙක් නිරාකරණය වෙලා නැති එක. දෙවැනි හේතුව, කොන්ත්‍රාත් ආයතන සම්බන්ධයෙන් පැවැති යම් ගැටලු තවමත් නිරාකරණය වෙලා නොමැති වීම. තුන්වැනි හේතුව, සමහර ව්‍යාපෘති සඳහා අපේක්ෂිත බිල්පත් වටිනාකමට වඩා අඩු වටිනාකමකින් එම ව්‍යාපෘති අවසන් කර ගැනීමට පුළුවන් වීම. ඒ කියපු හේතු නිසා සාමාන්‍යයෙන් රුපියල් මිලියන 36,600ක් වාගේ මුදලක් මේ වර්ෂය තුළ ඉතිරි වෙයි කියා අපේක්ෂා කරනවා.

සාමාන්‍යයෙන් අතීතයේ වුණේ නම් මේ වාගේ මුදලක් ඉතිරි වුණාම ඒක යළිත් භාණ්ඩාගාරයට යවන එක. ඊළඟ වර්ෂයේදී යළි ඇස්තමේන්තු හදලා මුදල් වෙන් කර ගැනීමක් තමයි වෙන්නේ. හැබැයි, දූරදර්ශී විධියට හිතන ආණ්ඩුවක් හැටියට මේ වෙලාවේ අපි කල්පනා කළා, කවදා හරි ගෙවන්න තිබෙන ණයක පොලිය සහ වාරිකය ගෙවන්න මේ මුදල් ටික අපට මේ අවස්ථාවේ යොදවා ගන්න හැකියාව ලැබුණොත්, ඒකෙන් අපට තවත් විශාල ප්‍රයෝජන ප්‍රමාණයක් ලබා ගැනීමේ හැකියාව තිබෙනවා කියලා. ඒකේ පළමුවැනි වාසිය ගැන අපට මේ විධියට හිතන්න පුළුවන්. අනාගතයේ දවසක ගෙවන්න තිබෙන ණයක වාරික සහ පොලිය ගෙවීම තුළින් අපේ ණයබර යම් ප්‍රමාණයකින් පහළට ගේන්න අපට හැකියාව ලැබෙනවා. දෙවන කාරණය හැටියට අපට මෙහෙම හිතන්න පුළුවන්. මේ උත්තරීතර පාර්ලිමේන්තුව ඇතුළේදී විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් නිතර නිතර මතු වෙච්ච චෝදනාවක් තමයි, සාකච්ඡාවකට ගිහිල්ලා, මීට වැඩිය හොඳ කොන්දේසි යටතේ මේ පොලී අනුපාත අඩු කර ගන්න හැකියාවක් නොලැබුණේ ඇයි කියන කාරණය. අපට කියන්න වුවමනාව තිබෙන්නේ මෙයයි. ඒ වාගේ සාකච්ඡා මාර්ගයෙන් ගිහිල්ලා ඒ ගැටලු විසඳා ගන්න නම්, ජාත්‍යන්තර විශ්වාසනීය බව අපට තිබෙන්න ඕනෑ. මෙන්න මේ ණය මුදල කල්තියා ගෙවීම තුළින් අන්න ඒ ජාත්‍යන්තර විශ්වාසය අපට ලැබෙනවා.

විපක්ෂයෙන් එල්ල වෙච්ච තවත් එක් චෝදනාවකට අද උත්තර දෙන්නම්. මීට සුළු මොහොතකට කලින් කළ කථාවකදී විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් චෝදනාවක් කරමින් කිව්වා, "ලංකාවේ නම් වැඩ වෙනවා ඇති, මේ කියන විධියට පොතේ නම් වැඩ වෙනවා ඇති, මේ කියන විධියට මේ පාර්ලිමේන්තුවේ කථා අස්සේ නම් වැඩ වෙනවා ඇති. හැබැයි, අපේ ගමේ-රටේ නම් කිසිම වැඩක් වෙන්නේ නැහැ" කියලා. මම අනෙකුත් දිස්ත්‍රික්ක ගැන කියන්න යන්නේ නැහැ. ඒකට හේතුව, මාතලේ දිස්ත්‍රික්කයේ සිද්ධ වෙන සංවර්ධන යෝජනා ගැන විතරක් කථා කළාම ලංකාව සම්බන්ධයෙන් චිත්‍රයක් මවා ගන්න පුළුවන් නිසා. එතෙක් මෙතෙක් සංවර්ධනය කරන්න බැරි වෙච්ච අපේ ග්‍රාමීය පාරවල් 25ක් කාපට් කිරීම අපි ආරම්භ කරලා තිබෙනවා. ඒ පාරවල් 15ක වැඩ මේ අවස්ථාවේදී සිද්ධ වෙනවා. ඉතිරි පාරවල්වල වැඩත් මේ මාසය අවසන් වෙන්න කලින් අපි පටන් ගන්නවා. රිවර්ස්ටන් මාර්ගය සංචාරක ආකර්ෂණය දිනාගත් ඉතා වැදගත් ස්ථානයක් බව අපි දන්නවා. එම ස්ථානයේ වාහන තදබදයක් තිබෙනවා. ඊයේ අපි එතැන නව වාහන නැවතුම්පොළක් ඉදිකරන්න අවශ්‍ය මූලික පියවර අරගෙන තිබෙනවා. මාතලේ ඉඳලා ගලේවෙල දක්වා වන කිලෝමීටර 30ක මාර්ගය ගමන් කරන්න සාමාන්‍යයෙන් පැය එකහමාරක, දෙකක කාලයක් ගතවෙනවා. සාමාන්‍යයෙන් ගලේවෙල මිනිස්සු කියන්නේ, ලංකාවේ හෙමින්ම වාහන යන, බස් රථ යන පාර තමයි අපේ පාර කියලා. අපි මේ වසරේ එක කොටසකුත්, 2026 වසර අවසන් වෙනකොට තවත් කොටසකුත් විධියට අපි මේ පාර හදලා ඉවර කරන්න තීන්දු අරගෙන තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය දැන් අවසානයි.

**ගරු දිනේෂ් හේමන්ත මහතා**
(மாண்புமிகு தினேஷ் ஹேமந்த)
(The Hon. Dinesh Hemantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

අපට කියන්න තිබෙන්නේ මෙයයි. සංවර්ධනය වුණාය, පාරවල් හැදුණාය කියලා ඉදිරිපත් කරන තර්ක අස්සේ, ප්‍රමුඛතා හඳුනා ගන්නේ නැතිව කරපු සංවර්ධන යෝජනා නිසා අද වන විට ලාභ ලැබූ පාරවල්වලට පෞද්ගලික බස් රථ යොදවලා, ලංගම කියන අපේ රාජ්‍ය ආයතනය පාඩු ලබන තැනට පත් කර තිබෙනවා. පාරවල් හදද්දී යහළුවන්ගේ, හිතවතුන්ගේ පාරවල් හැදුවා මිසක්, ගමේ ඇත්ත පාර හදන්න අවශ්‍යතාවක් කලින් හිටපු ඒ පාලකයන්ට තිබුණේ නැහැ. නමුත්, අද අපි ගමට අවශ්‍ය පාර හදනවා. ගමේ අවශ්‍ය ස්ථානවලට බස් රථ යොදවනවා. බස් රථ බලඇණිය හදන්නේ නැතිව ඩිපෝ හදලා තිබෙනවා. එහෙම නැත්නම් බිල්ඩින් හදලා තිබෙනවා. නමුත්, අවශ්‍ය පහසුකම් සපයලා නැහැ. අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ මෙයයි. ප්‍රවාහනය ක්ෂේත්‍රය ගත්තත්, වෙනත් ක්ෂේත්‍රයක් ගත්තත් ජාතික ජන බලවේගයේ ආණ්ඩුවේ අවසාන ඉලක්කය සපුරා ගන්න, ජනතාවගේ ජීවිතය සුවපත් කරන්න ඕනෑ කරන වැඩ පිළිවෙළ අදත් ක්‍රියාත්මක වෙනවා. අපි ආණ්ඩුවක් විධියට දිගින් දිගටම එය ක්‍රියාත්මක කරමින් යනවාය කියන පැහැදිලි කිරීම කරමින්, මට කාලය ලබා දීම වෙනුවෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.ඒ.එම්. තාහීර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[ပි.ප. 4.23]

**ගරු එම්.ඒ.එම්. තාහීර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் விவாதிக்கப்படுகின்ற குறைநிரப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மகிழ்ச்சி அடைகின்றேன்.

நாங்கள் எல்லோரும் போக்குவரத்துத் துறைக்கு ஒதுக்கப்படுகின்ற நிதியை வீதிகளை மையப்படுத்தி மாத்திரம்தான் பார்க்கின்றோம். வீதிகள் அமைக்கப்படுவதன் நோக்கம், மக்கள் அவற்றைப் பயன்படுத்த வேண்டும் என்பதுதான். மக்கள் தங்களுடைய தேவைகளை நிவர்த்தி செய்வதற்காக வீதிகளைப் பயன்படுத்துகின்றார்கள்.

[ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා]

அவ்வாறு பயன்படுத்துவதற்குப் பொருத்தமான வீதிகள் கடந்த காலங்களில் அமையப் பெறவில்லை என்ற குற்றச்சாட்டு பொதுவாக எல்லோராலும் முன்வைக்கப்படுகின்றது. அதில் உண்மைகள் இல்லாமலும் இல்லை. அதை நாங்கள் ஏற்றுக்கொள்ள வேண்டியவர்களாக இருக்கின்றோம். இவ்வாறான சூழலில், இப்போதைய அரசாங்கம் ஆட்சியைப் பொறுப்பேற்று பல்வேறு வேலைத்திட்டங்களை முன்னெடுத்து வருகின்றது. அதேநேரம், அவற்றில் செய்ய முடியாமல் இருக்கின்ற வேலைகளுக்காக ஒதுக்கப்பட்டு இருக்கக்கூடிய நிதிகளை மாற்றி, ஏனைய வேலைத்திட்டங்களை முன்னெடுப்பதற்கான நடவடிக்கைகளையும் மேற்கொள்கின்றது. அவ்வாறானதொரு சந்தர்ப்பத்திலே எனக்கு இது சம்பந்தமாகப் பேசுவதற்கு வாய்ப்புக் கிடைத்திருக்கின்றது.

எங்களுடைய பிரதேசங்களில் பொதுமக்கள் கூடுதலாகப் பொதுப் போக்குவரத்தையே பயன்படுத்துகின்றார்கள். தனியாரிடம் வாகனங்கள் இருந்தாலும்கூட, அவற்றைப் பெருமளவில் பயன்படுத்த முடியாமல் இருக்கின்றது. ஏனெனில், நாட்டில் எரிபொருள் விலை அதிகமாகக் காணப்படுகின்றது. பொதுப் போக்குவரத்தில் ஈடுபடுகின்ற இலங்கை போக்குவரத்துச் சபைக்குரிய வாகனங்களிலே அரச உத்தியோகத்தர்கள் தூர இடங்களுக்குத் தங்களுடைய வேலை நிமித்தம் பயணிக்கிறார்கள். அவர்கள் அழகாக ஆடைகளை அணிந்து, அலுவலகங்களுக்குச் சென்று, கடமைகளைச் செய்வதற்கு ஏற்ற வகையில் அந்த வாகனங்கள் இருக்கின்றதா என்பதை நாங்கள் பார்க்க வேண்டும். மேற்கத்திய நாடுகளில் போன்று எங்களுடைய நாட்டிலும் பொதுப் போக்குவரத்துக்குச் சிறந்த வாகனங்களை வழங்கினால் பாதைகளில் வாகன நெரிசலைக் குறைக்க முடியும். அத்துடன், எரிபொருளுக்கான செலவினத்தையும் கட்டுப்படுத்த முடியும். மேலும், பொதுப் போக்குவரத்தை மேம்படுத்தினால் தனியார் தமது சொந்த வாகனங்களைப் பயன்படுத்துகின்ற நிலை மாறி, அவர்களும் தங்களுடைய சொந்தத் தேவைகளுக்கு, அலுவலகம் செல்வதற்கு, இயற்கையோடு இணைந்த ஏனைய விடயங்களை மேற்கொள்வதற்குப் பொதுப் போக்குவரத்தைப் பயன்படுத்துவார்கள்.

கொழும்பு கோட்டையிலிருந்து பி.ப. 3.15 மணிக்குப் புறப்படுகின்ற புகையிரதம் இரவு 11.00 மணிக்கே மட்டக்களப்பைச் சென்றடைகின்றது. அங்கிருந்து பொத்துவில், அம்பாறை, கல்முனை, காத்தான்குடி போன்ற இடங்களுக்குச் செல்கின்றவர்கள் அந்த நேரத்தில் போக்குவரத்து வசதியின்மையால் அவதிப்படுகின்றார்கள். எனவே, இதனைக் கவனத்தில் எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

நிலாவெளி - திருகோணமலை - அறுகம்பே - பானம வரை சுற்றுலாத்துறையை மேம்படுத்தும் வகையில், குறிப்பாக சுற்றுலாப் பயணிகளுக்கு இலகுவான போக்குவரத்து வசதியை ஏற்படுத்திக் கொடுக்கும் வகையில், இந்த அரசாங்கமாவது அப்புகையிரத சேவையை விரிவுபடுத்த வேண்டும். அதனூடாக எங்களுடைய பிரதேச மக்களும் அந்தப் புகையிரத சேவையைப் பயன்படுத்துவதற்கான சந்தர்ப்பத்தை ஏற்படுத்திக் கொடுக்க வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன். அரச நிதியை மிகச் சிக்கனமாகக் கையாண்டால், இவ்வாறான திட்டங்களை மேற்கொள்ளலாம்.

நான் இச்சந்தர்ப்பத்தில் கௌரவ அமைச்சர் அவர்களுக்கு நன்றி கூற வேண்டும். ஏனெனில், கடந்த வெள்ள அனர்த்தத்தின்போது பாதிக்கப்பட்ட மாவடிப்பள்ளி பாலத்தின் புனரமைப்பு வேலைகளை அவர் ஆரம்பித்து வைத்திருக்கிறார்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

அதேபோன்று, கிட்டங்கிப் பாலத்தின் புனரமைப்பு வேலைகளையும் உங்களுடைய காலத்தில் ஆரம்பித்து வைத்தால் சிறப்பாக இருக்கும். கடந்த 76 வருடகால ஆட்சியை நாங்கள் அரசியல் ரீதியாக குறைகூறினாலும்கூட, உங்களுடைய அரசாங்கம் மிகச் சிறப்பாகச் செயற்படும் என்ற நம்பிக்கையோடு மக்கள் காத்திருக்கிறார்கள். உங்களுக்கு இன்னும் நான்கு வருடங்கள் இருக்கின்றன. எனவே, நீங்கள் கிட்டங்கிப் பாலத்தைப் புனரமைத்துத் தர வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, கல்முனை பஸ் 'டிப்போ'ஆனது, அம்பாறை, மட்டக்களப்பு உட்பட கிழக்குப் பிராந்தியத்தில் மிகவும் பெயர்போன ஒரு டிப்போ'ஆகக் காணப்படுகின்றது. எனினும், அதற்கு அலுவலகக் கட்டிடம் ஒன்று இல்லாமல் உள்ளது. அந்த 'டிப்போ' வளாகத்தைப் பார்க்கும்போது, மிகவும் அசிங்கமாக, garage போன்று காணப்படுகின்றது. Clean Sri Lanka திட்டத்தின்மூலம் அதனைச் சுத்தப்படுத்தினார்கள். இருந்தாலும், அதனை மிகவும் பயனுள்ளதாக மாற்ற வேண்டும். சம்மாந்துறை பஸ் 'டிப்போ' சம்பந்தமாக நாங்கள் பிரதேச அபிவிருத்திக் குழுக் கூட்டங்களிலும் மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டங்களிலும் பேசியும் தீர்வுகள் இல்லாமல் இருக்கின்றது. அதற்கான காணிகளைப் பெற்றுத் தருவதாக அந்தப் பிரதேசத்தில் இருக்கின்றவர்கள் கூறியிருக்கிறார்கள். எனவே, இந்த விடயத்தைக் கவனத்திற்கொள்ள வேண்டும். நிந்தவூரில் குறிப்பாக, அட்டப்பள்ளம் வீதி, 2ஆம் குறுக்குத் தெரு, 3ஆம் குறுக்குத் தெரு, மீராநகர் வீதி என்பவற்றின் புனரமைப்புப் பணிகள் குறையில் விடப்பட்டு இருக்கின்றன. இந்த நிதிமூலம் அந்தப் பணிகளைச் செய்வதற்கான வாய்ப்பு இருந்தால், அதனைச் செய்து தருமாறு கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුහම්මද් ෆයිසාල් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.28]

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

அஸ்ஸலாமு அலைக்கும், ஆயுபோவன், வணக்கம்!

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இங்கே பேசுகின்றவர்கள் யார் என்ன சொன்னாலும், உலக அளவில் பேசப்படும் வகையில் தேசிய மக்கள் சக்தி அரசாங்கம் மிகச் சிறப்பான, முன்னேற்றமுடைய ஓர் அரசாங்கமாக இன்று நாட்டில் விளங்கிக்கொண்டிருக்கின்றது; அது நாளுக்கு நாள் முன்னேற்றமடைந்து கொண்டிருக்கின்றது.

அதேபோல், எதிர்க்கட்சிகள் நாளுக்குநாள் பலவீனமடைந்து பின்னடைந்து செல்கின்றன. சென்ற அரசாங்கங்கள் இந்த நாட்டு மக்களின் சுமைகளை அதிகரித்தன. இன்று வரையில் ஒரு வருட காலமாக ஆட்சிசெய்து வருகின்ற எமது அரசாங்கம் எல்லா வகையிலும் மக்களுக்கான அதிகமான சேவைகளை வழங்குவதுடன், போக்குவரத்து, நெடுஞ்சாலைகள் அமைச்சின் ஊடாகச் சிறப்பான ஒரு சேவையை வழங்கிக் கொண்டிருக்கின்றது.

2022ஆம் ஆண்டு எமது நாடு பாரியளவிலான பொருளாதார நெருக்கடியை எதிர்நோக்கியது. அவ்வாறு இருந்த காலகட்டத்தில்தான் இன்னுமொரு நெருக்கடியும் எமது நாட்டுக்கு வந்து சேர்ந்தது. அதாவது, 2022ஆம் ஆண்டு எமது நாட்டின் முன்னாள் சனாதிபதி கோட்டாபய ராஜபக்ஷ அவர்களுக்கு வாக்களித்த 69 இலட்சம் மக்களால் அவர் விரட்டியடிக்கப்பட்டதையடுத்து நடைபெற்ற இடைக்கால சனாதிபதிக்கான பாராளுமன்ற இரகசிய வாக்கெடுப்பில் SLPPஇன் அதிகமான supportஇன் ஊடாக ரணில் விக்கிரசிங்க அவர்கள் சனாதிபதியாகத் தெரிவுசெய்யப்பட்டார். அப்போது அவரோடு டளஸ் அழகப்பெரும, எமது இன்றைய சனாதிபதி அநுர குமார திஸாநாயக்க ஆகியோரும் போட்டியிட்டார்கள். அதேநேரம், இன்று எதிர்க்கட்சித் தலைவராக இருக்கின்றவருக்கு அதில் போட்டியிடுவதற்கான சந்தர்ப்பம் கிடைக்காமற்போனது. ஐயோ பாவம்! அவர் ரணில் விக்கிரமசிங்க அவர்களுக்கு support செய்தாரோ தெரியவில்லை, அல்லது வெற்றிபெற முடியாது என்று அவர் நினைத்தாரோ தெரியவில்லை. ஆனால், அன்று மூன்று பிரதிநிதிகளைக் கொண்டிருந்த நாங்கள் அதில் தைரியமாகப் போட்டியிட்டோம்.

அன்று அமைக்கப்பட்ட ரணில் - ராஜபக்ஷ அரசாங்கம் வெளிநாடுகளிலிருந்து அதிகமான கடன்களை வாங்கி நாட்டு மக்களின் வாழ்க்கைச் சுமையை அதிகப்படுத்தியது மட்டுமல்லாமல், நாட்டில் விலைவாசியையும் அதிகப்படுத்தியது. இன்று இங்கு பேசிய சிலர், எமது கட்சியைச் சேர்ந்தவர்கள் பஸ்ஸுக்கு நெருப்பு வைத்தார்கள், வீட்டுக்கு நெருப்பு வைத்தார்கள் என்று சொன்னார்கள். அன்று அவர்களுடைய அரசாங்கம்தான் இருந்தது. அன்று அவர்களால் பஸ்ஸுக்கு நெருப்பு வைத்தவர்களைக் கண்டுபிடிக்க முடியாற்போனது. அதுமட்டுமல்லாமல், அன்று அவர்களது வீடுகளுக்கு நெருப்பு வைத்தமைக்கு நட்டஈடென்று கோடி கோடியாகப் பெற்று, இந்த நாட்டிலிருந்த பணத்தை வீண் விரயமாக்கினார்கள்.

அதுமட்டுமல்லாமல், முன்னைய அரசாங்கங்களின் காலத்தில் காட்டு யானைகளால் காட்டுப் பகுதியில் வாழுகின்ற மக்களின் வீடுகள் சேதமாக்கப்பட்டபோது, காட்டு யானை அதிகமான வீடுகளைச் சேதமாக்கியதென்றும் இத்தனை பேரைச் சாகடித்ததென்றும் செய்திகளில் அதிகமாகக் காட்டுவார்கள். தங்களுடைய வீட்டை எரித்துவிட்டார்கள் எனக்கூறி பல கோடி ரூபாயை வாங்கியவர்களால் அந்த மக்களுக்கு ஒரு வீட்டைக்கூட கட்டிக்கொடுக்க முடியாற்போனது. ஆனால், எமது அரசாங்கம் யானைத் தாக்குதலிலிருந்து மக்களைப் பாதுகாப்பதற்கான வேலைகளைச் சிறப்பாகச் செய்து கொண்டிருக்கின்றது.

இன்று புத்தளம் - மன்னார் பாதையைத் திறக்கவேண்டுமெனக் கோஷம் போடுகிறார்கள். ஆனால், அந்தப் பாதையில் இருக்கின்ற மீ-ஓயா பாலம் உடைந்து 5 வருடங்களாகியும் யாராலும் கவனிக்கப்படாதிருந்த நிலையில், இரண்டு வருடங்களுக்கு முன்னர் தற்காலிக fittings பாலமொன்றை அமைத்து மக்களுக்குப் போக்குவரத்து வசதி செய்து கொடுக்கப்பட்டிருந்தாலும், போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சினூடாக 375 மில்லியன் ரூபாயை ஒதுக்கி, சென்ற மாதம் அந்தப் பாலப் புனரமைப்புப் பணிகளை எமது அரசாங்கம் ஆரம்பித்திருக்கின்றது. அதேபோல, புத்தளம் பகுதியில் இருக்கின்ற 45 கிலோமீற்றர் நீளமான பத்துலு ஓயா - கரம்பை வீதியின் 9 கிலோமீற்றர் தூரம் வரை ஏற்கனவே புனரமைப்பு செய்யப்பட்டிருக்கின்றது. மீதமாக இருக்கின்ற வீதியைப் புனரமைப்பதற்கான அனுமதி தற்போது வழங்கப்பட்டிருக்கின்றது. இதுபோன்று போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சினூடாக அதிகமான பாலங்களும், வீதிகளும், கிராமிய வீதிகளும் இப்போது புனரமைக்கப்பட்டு வருகின்றன. அதுபோல், மக்களின் இன்னோரன்ன தேவைகளும் எமது அமைச்சினூடாக நிறைவேற்றப்படுமெனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමා විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.33]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට අදාළව පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන තිබෙන වෙලාවේ අපේ සභානායකතුමා මේ සභාවේ හිටියා නම් හොඳයි. ආ, එතුමා ඉන්නවා. පැහැදිලිවම පෞද්ගලික අංශයටත් වඩා වැඩිම ආයෝජනයක් කරන්නේ අපේ ආණ්ඩුව කියලා පසුගිය අය වැය විවාදයේදී එතුමා කිව්වා මට මතකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු සභානායකතුමනි, ඔබතුමා එහෙම කිව්වා; මේ රටේ සංවර්ධනය සඳහා රජයක් හැටියට වැඩිම ආයෝජනයක් කරලා, විශාල ජයග්‍රහණ කරා යන්න පුළුවන් වෙයි කියලා කිව්වා. එතකොට අපිත් සතුටු වුණා. නමුත් අද ඉදිරිපත් කරන මේ පරිපූරක ඇස්තමේන්තුවෙන් රුපියල් බිලියන ගණනක් පරණ මොකක් හරි කරුණු ගණනාවකට වෙනස් කරනවා. මෙතුමාගේ අමාත්‍යාංශයේ විතරක් නොවෙයි මෙහෙම කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු සභානායකතුමනි, මේ යෝජනාවල ප්‍රගතිය තිබෙන්නේ සියයට 20යි, සියයට 15යි, සියයට 25යි කියන එක දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීම්වලට ගියාම අපිට පෙනෙනවා. මේක ලොකු ප්‍රශ්නයක්. අපි මොනවා කථා කළත්, අපි අය වැයෙන් මොන යෝජනා ගෙනැල්ලා මුදල් වෙන් කළත්, මේ වැඩ ටික හරියට කළමනාකරණය කරගන්න බැරි වුණොත් ඒකෙන් ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ලොකු ගැටලුවක් තිබෙනවා කියන එක පැහැදිලිව කියන්න ඕනෑ. ඔබතුමන්ලා බලයට පත් වෙලා වසරක් ගෙවුණා. ඊළඟ අය වැය එනවා, නොවැම්බර් මාසයේ. අඩු ගණනේ ඊළඟ අවුරුද්දටවත් නිශ්චිත කාරණාවලට මුදල් වෙන් කරලා, ඒ මුදල් වෙන් කරන දේ ක්‍රියාත්මක කරන්න ඔබතුමන්ලාට හැකි වෙන්න ඕනෑ.

මට කථා කරන්න දිගු වෙලාවක් නැහැ. මට තිබුණු කාලය ගොඩක් අඩු වෙලා තිබෙනවා. ඒ නිසා මම කරුණු දෙකක් ගැන පමණක් කියන්නම්. ඉන් පළමුවැනි කාරණය මෙයයි. විශේෂයෙන්ම එදා අග්‍ර විනිශ්චයකාරතුමියට විරුද්ධව දෝෂාභියෝගය ගෙනෙන වෙලාවේ අපිත් ඒකට සහාය දුන්නා

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

කියලා එක මන්ත්‍රීතුමෙක් කියනවා මම දැක්කා. මේවා කරුණු නොදැන කරන කථා කියලායි මම හිතන්නේ. අපි තමයි ඒ සම්බන්ධයෙන් විශේෂයෙන් පාර්ලිමේන්තුව තුළත්, එළියේදීත් විශාල විරෝධයක් දැක්වුවේ. ඔබතුමන්ලාත් ඒ විරෝධයේදී අපිත් එක්ක හිටියා. ඒ නිසා මේ සමහර මන්ත්‍රීතුමන්ලා කරුණු දන්නේ නැතුව තමයි මේ ගැන කථා කරන්නේ. ඒ ගැන අපි කනගාටු වෙනවා.

ඔබතුමන්ලාගේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශය සම්බන්ධයෙන් කථා කිරීමේදී විපක්ෂ නායකතුමා හැම දාම ඇවිල්ලා ඒකේ පළමුවැනි පිටුව පෙරළනවා කියලා තව මන්ත්‍රීතුමෙක් කිව්වා. ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය සම්බන්ධයෙන් විපක්ෂ නායකතුමා කරුණු ඉදිරිපත් කිරීම ගැන ඔබතුමන්ලා සතුටු වෙන්න ඕනෑ. ඒක ගැනත් මතක් කරන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මට තව පොඩි වෙලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද බලන්න, 2024දී සියයට 24.9ක්ව තිබුණු මේ රටේ දුප්පත්කම දැන් තව සියයට 10කින් වැඩි වෙලා කියලා ලෝක බැංකුව කියනවා. ඒ ගැන වාර්තාවකුත් තිබෙනවා. අපේ රට පොහොසත් රටක් කරනවා නම් අපේ දරිද්‍රතා සීමාව ඉහළට යන්න බෑ. ඒක අඩු වෙන්න ඕනෑ. එහි ප්‍රගතියක් තිබෙන්න ඕනෑ. මේ රටේ ජනතාව ජීවත් කරවන්න තමයි තමුන්නාන්සේලාට ජන වරමක් දුන්නේ. 2022දී මේ රට බංකොලොත් වෙද්දී තමුන්නාන්සේලාගේ තුන්දෙනායි පාර්ලිමේන්තුව නියෝජනය කළේ. දැන් ඒ සංඛ්‍යාව 159ක් දක්වා ජනතාව වැඩි කරලා දීලා තිබෙනවා. මේ ජනවරම ලබා දුන් ඒ ජනතාව වෙනුවෙන් තමුන්නාන්සේලා වැඩ කටයුතු කරන්න ඕනෑ.

ගරු සභානායකතුමා මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා. එතුමාට පාර්ලිමේන්තුවේ හොඳ පළපුරුද්දක් තිබෙනවා. මොකද, එතුමා පාර්ලිමේන්තුවේ ටික කාලයක් ඉඳලා තිබෙනවා. ඔබතුමන්ලාගේ ඔබතුමන්ලාගේ විවේචන අවශ්‍යයි, හොරු අල්ලන්න අවශ්‍යයි. අපි ඒවාට අත් දෙකම උස්සනවා. හැබැයි ඒ වාගේම තමුන්නාන්සේලා ජනතාව ජීවත් කරවන වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න ඕනෑ. එහෙම නැත්නම් ජනවරම සුරැකෙන වැඩ පිළිවෙළක් තමුන්නාන්සේලා ආරම්භ කරන්න ඕනෑ.

මට තව එක විනාඩියක් දෙන්න, මූලාසනාරූ ගරු මන්ත්‍රීතුමනි. එදා -2022, 2023 වෙනකොට- සමුපකාර ඡන්ද ඔක්කෝම තමුන්නාන්සේලා දිනුවා. අපි ඒක දැක්කා. දැන් අද මොකද වෙන්නේ? මේ වෙනකොට තිබුණු හැම සමුපකාර ඡන්දයකින්ම සමගි ජන බලවේගය ප්‍රමුඛ විපක්ෂය දිනනවා. මේක ලෙහෙසි කාරණාවක් නොවෙයි. මේක තමයි ජනතාව දක්වන ප්‍රතිචාරය.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හිරියාල,-

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මම හිරියාල නොවෙයි, දැන් මාවතගම ඉන්නේ. තවම එහි ඡන්දය තිබුණේ නැහැ. තිබුණු ගමන් අපි දිනනවා. ප්‍රාදේශීය සභාව පිහිටුවා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ආ, මම හිතුවේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා නැහැ කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අපට සීමාසහිත කාලයක් තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මට තව පොඩි වෙලාවක් දෙන්න.

මම පැහැදිලිව කියනවා, මේ සම්බන්ධව තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරන්න කියලා. ඔබතුමන්ලාට මේ ජන වරම දීලා තිබෙන්නේ ඇයි කියන එකත් පැහැදිලි කරගෙන කටයුතු කළොත් තමයි රටේ ජනතාවගේ අපේක්ෂාත් ඉටු කරමින්, ඔබතුමන්ලා හිතන විදියට මේ රට ඉස්සරහට ගෙන යන්න අවස්ථාව ලැබෙන්නේ. ඒ බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අද කාලය සීමාසහිතයි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තත්පර කිහිපයක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, කියන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේ වෙලාවේ අපේ සභානායකතුමාත් ඉන්න නිසායි, මා මේ ඉල්ලීම කරන්නේ. විවාදයකදී සාමාන්‍යයෙන් එතුමාගේ කථාව කරනකොට විනාඩි 30ක්, 40ක් එතුමාත් වෙලාව එහාට මෙහාට කර ගන්නවා. අපට තිබෙන්නේ විනාඩි 4ක් හෝ 5ක්. එම නිසා දෙගොල්ලන්ගේම කැමැත්තෙන් විනාඩි 10ක් හෝ විනාඩි කිහිපයක් අපට ලබා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා. *[බාධා කිරීමක්]* බණින්න නොවෙයි. ඇත්තටම අපි ඉල්ලීමක් කරන්නේ. මොකද, එතුමා කාලය ගන්නකොට සාමාන්‍යයෙන් පැය භාගයක් විතර ගන්නවා. අපටත් විනාඩි 10ක් විතර දෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අද නොවෙයි, හෙට දෙන්නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

අපි විවාදයට යොමු වෙමු. ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.39]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි සාකච්ඡාවට බඳුන් කළේ ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට අදාළ පරිපූරක ඇස්තමේන්තුවක් පිළිබඳවයි. විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් එය වැරදි විධියට අර්ථ කථනය කළා. පරිපූරක ඇස්තමේන්තුවක් කියන්නේ, අපි අය වැයෙන් මුදල් වෙන් කර ගත්තාට අමතරව පසුව කරන මුදල් වෙන් කර ගැනීමක්. එය ආකාර දෙකකට සිදු වන්න පුළුවන්. එකක්, පාර්ලිමේන්තුවට යෝජනාව ඉදිරිපත් කරලා අතිරේකව මුදල් වෙන් කර ගැනීම. ඊට අමතරව, වැය ශීර්ෂ අතර මුදල් ප්‍රතිපාදන මාරු කරද්දි මුදල් රෙගුලාසි 66 අනුව තාක්ෂණිකව මාරු කර ගන්න බැරි කරුණු අරබයාත් පාර්ලිමේන්තුවේ අවසරය ලබා ගැනීම. අද අපි මෙම අමාත්‍යාංශය යටතේ ඉදිරිපත් කරන්නේ අතිරේකව ඉදිරිපත් කළ වෙන් කිරීමක් නොවෙයි, එම අමාත්‍යාංශයට වෙන් වූ මුදල්වලින් ඉතිරි වූ මුදල් මාරු කිරීමක්. විවිධ වූ හේතු නිසා සමහර අමාත්‍යාංශවලට වෙන් කරන මුදල් ප්‍රතිපාදන ඉතිරි වනවා. ඇත්තටම අපට පාලනය කර ගන්න බැරි වුණු හේතුත් ඒ අතර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අතීතයේ කරගෙන ආ ව්‍යාපෘති තිබෙනවා. එම ව්‍යාපෘති සම්බන්ධයෙන් අපට විකල්ප දෙකක් තිබුණා. එක්කෝ, එම ව්‍යාපෘති අත්හැර දමන්න ඕනෑ. එහෙම නැත්නම් එම ව්‍යාපෘති ඉදිරියට කරගෙන යන්න ඕනෑ. අපි විමර්ශනය කර බැලුවා, රට වෙනුවෙන් වඩාත් හොඳ දේ මොකක්ද කියලා. ඒ අනුව සමහර ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න යෝජනා කරලා එම කටයුතු කරගෙන එද්දි ඒ සමහර ව්‍යාපෘතිවලට ණය ලබා ගැනීමේ නොහැකියාවක් තිබුණා. එම නිසාත් අපට මුදල් ඉතිරි වුණා. ඒ වාගේම අපි අපේක්ෂා කළ බිල් අගයට වඩා ගෙවන්න තිබුණු බිල් අගය අඩු වීම නිසාත් මුදල් ඉතිරි වුණා. එවැනි ඉතිරි කිරීම් නිසාත් අපට අවශ්‍ය කරනවා, වේගයෙන් මුදල් කළමනාකරණය කරලා මේ රුපියල් බිලියන 36 අමාත්‍යාංශයේ අදාළ වැඩකටයුතුවලට යොදා ගැනීමට.

විපක්ෂයෙන් විවේචන ඉදිරිපත් කරද්දි කිව්වා, ඔක්කෝටම මේ විධියට පරිපූරක ඇස්තමේන්තු ගන්න වෙනවා කියලා. අපි ඇත්තටම අතිරේකව කිසිම මුදලක් අරගෙන නැහැ. අය වැයේ සඳහන් කළා වාගේම අපි අතිරේකව මුදල් ගත්තේ නැහැ. හැබැයි, එහෙම කියපු කණ්ඩායම්වලට මෙතැනදී මම ඉදිරිපත් කරන්නම්, ඉතාම වැදගත් දත්තයක්. මේකත් එක්කම ගැට ගැහෙනවා, අපේ 2026 විසර්ජන පනත් කෙටුම්පතත්.

2026 විසර්ජන පනත් කෙටුම්පතේ ජනාධිපති වැය ශීර්ෂයේ අගය රුපියල් මිලියන 11,385යි. එම අගය 2024 සහ 2025 වර්ෂ සමඟ වැරදි විධියට සංසන්දනය කළා. ඒකට හේතුව, 2025 වසරට විසර්ජන පනත් කෙටුම්පත ඉදිරිපත් කරනකොට අපි වෙන් කළේ රුපියල් බිලියන 2.9ක්. නමුත්, අය වැය යෝජනා මඟින් ඒකට තවත් රුපියල් බිලියන 6.1ක් එකතු වෙලා රුපියල් බිලියන 9ක් වුණා. ඇත්තටම ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය සම්බන්ධයෙනුයි මම මේ අදහස් ඉදිරිපත් කරන්නේ. ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂයේදී, 2025 වැය ශීර්ෂය වෙන්නට ඕනෑ රුපියල් බිලියන 9ක්. 2026ට අපි රුපියල් බිලියන 11.385ක් වෙන් කර තිබෙනවා. ඒ කියන්නේ, රුපියල් බිලියන 2.365ක වැඩිවීමක්. හැබැයි, 2024 වසරේ තත්ත්වය කිව්වොත්, එම වසරේ කොටසක අපි හිටියා, කොටසක රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා ඇතුළු කලින් කණ්ඩායම හිටියා. ඒගොල්ලන් විසර්ජන පනත් කෙටුම්පතේ මුලින් ඇස්තමේන්තු කරලා තිබුණේ රුපියල් බිලියන 6.6ක්. ඒක තමයි විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිව්වේ. ඇත්තටම එය වැඩි කරලා, සංශෝධනය කරලා රුපියල් බිලියන 39 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒක ඇතුළේ රුපියල් බිලියන 10,250ක් අලුතෙන් සංවර්ධන ව්‍යාපෘති කියලා තිබුණා. එයිනුත් අතිරේක පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් රුපියල් බිලියන 8.75ක් අරගෙන තිබුණා. ඒ විධියට විශාල මුදල් ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. ඒවා තමයි ඇත්තටම මුදල් අවභාවිත කිරීම්. අපේ ආණ්ඩුව යටතේ කිසිම ආකාරයකින් එවැනි අවභාවිතයක් වෙන්නේ නැහැ. නිසි ආකාරයට මේ සංසන්දනය කිරීම් සිදු කරනවා.

ඊළඟට, ණය සම්බන්ධවත් වැරදි දත්ත ගොඩක් ඉදිරිපත් කළා. අපි කිසිම අවස්ථාවකදී කියලා නැහැ, ණය ගන්න එපා කියලා. ණය අපට අවශ්‍යයි. හැබැයි, වැරදි විධියට ණය ගත්තොත් ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. අපි කවදාවත් highways වැනි මහා ව්‍යාපෘති එපා කියලා නැහැ. ඒවා ඕනෑ. හැබැයි ආණ්ඩුවක් කරනකොට ඒ ආණ්ඩු බලය දරන අයට පුළුවන්, ඒ බලය පාවිච්චි කරලා මේ ව්‍යාපෘති තමන්ගේ පෞද්ගලික ප්‍රතිලාභ වෙනුවෙන් පාවිච්චි කරන්න. ඒ, ණය ගැනීම්, මහා පරිමාණ ව්‍යාපෘති ආදිය. අපි එහෙම නිරපේක්ෂව මේ දේවල්වලට විරුද්ධ වෙලා නැහැ. සාපේක්ෂව බැලුවොත්, හැම තිස්සේම ඒගොල්ලන් ණය ගත්තේත්, ව්‍යාපෘති ක්‍රියාත්මක කළේත් මෙන්න මේ රට හදන සමාජ සංවර්ධන මූලධර්ම සහ මහජනතාවගේ ඇල්මෙන් පිට ගිහිල්ලා. ඒකටයි අපි විරුද්ධ වෙලා තිබෙන්නේ. එහෙම නැතිව අපි කිසිම ආකාරයකින් මේ දේවල්වලට විරුද්ධ වෙලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ණය පිළිබඳව දැන් මිථ්‍යාවකුත් හදනවා. මොකද, අපට දැන් රාමුවක් ඇතුළේ ණය කළමනාකරණය කර ගන්න වෙනවා. ණය වැඩි වෙලා, වැඩි වෙලා, වැඩි වෙලා කියලා දැන් කියනවා. ඇත්තටම අපේ ආණ්ඩුව යටතේදී ණය වැඩි වෙලා නැහැ. ණය කළමනාකරණය වෙලා තිබෙනවා. අපට තිබෙන රාමුවට - frame එකට - අනුව 2032දී රාජ්‍ය ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 95ට වඩා අඩු කිරීම කියන එකට අපි යන්න ඕනෑ. හැබැයි, අපි දැන් ණය කළමනාකරණය කරලා ඒ ප්‍රමාණය සියයට 90කට වඩා පහළ මට්ටමකට ගෙනැල්ලා තිබෙනවා.

ඒත් එක්කම මේ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙනුත් මම විශේෂයෙන්ම සඳහන් කරන්න කැමැතියි. පරිපූරක ඇස්තමේන්තුව සහ ඒ සඳහා සම්බන්ධ වන මධ්‍යම අධිවේගී මාර්ගයේ කොන්ත්‍රාත්කරුට ගෙවන්න වෙච්ච මුදල් සම්බන්ධයෙන් අපට විශේෂයෙන් negotiate කරන්න සිද්ධ වුණා. ඒ අනුව විශාල මුදල් ප්‍රමාණයක් ගෙවන්න වුණා. එතැනදීත් අපට තිබුණේ විකල්ප දෙකයි. එකක්, මේ ව්‍යාපෘතිය අත්හැර දමන එක. අනික, මේක දිගටම අරගෙන යන එක. අපි තීන්දු කළා, මේ ව්‍යාපෘතියේ කටයුතු වේගවත් කරලා මේ අවුරුද්දේදී මේ මාර්ග පද්ධතිය හදාගන්න. මෙහිදී Exim Bank එකත් එක්ක කරපු ගනුදෙනුවක් පිළිබඳව වැරදි අදහස් ඉදිරිපත් කළා. රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් අවස්ථා අටකදී රැස්වීම් පවත්වා මේ පිළිබඳව දැනුම් දීලා තිබෙනවා. ඔවුන් කියා සිටියා, ඔවුන්ගේ පැත්තෙන් fixed rate එකට දැන් යන්න බැහැ කියලා. මේ ව්‍යාපෘතිය විවෘත වෙළෙඳ පොළෙන් ණය අරගෙන කරන එකක්

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

නොවෙයි. අපේ වැඩේ කරන්න තිබෙන හොඳම ක්‍රමයට තමයි අපි ගියේ. අපි අවදානම් අඩු වෙන විධියට අවමය සියයට 2.5ත්, උපරිමය සියයට 3.5ත් වන විධියට තමයි කරන්නේ. ඒගොල්ලන්ගේ ණය ගැනීමේ විචල්‍ය අනුපාතය අපි බැලුවා. ඇත්තටම ඒක දැනට තිබෙන්නේත් සියයට 3.5ක. ඒකෙන් දශම 8ක් අඩු වුණාම -දැනට තිබෙන අනුපාතය ගත්තත්-ඇත්තටම අපි ගෙවන්නේ 2.7ක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ දත්ත ඉදිරිපත් කිරීම ඉතාම වැරදි සහගතයි. අපට කියන්න තිබෙන්නේ මෙයයි. අපි මේ කියන තත්ත්වයන් කළමනාකරණය කරන්නේ මේ අර්බුදයෙන් රට ගොඩගන්නයි. අපි භාර ගත්තේ සාමාන්‍ය තත්ත්වයක ආණ්ඩුවක් නොවෙයි. බිඳ වට්ටලා තිබුණු රටක් ගොඩ ගන්නයි අපි මේ හදන්නේ. ඒ නිසා ඒ කටයුතු කිරීමේදී මේ යටිතල පහසුකම් ඉතාම වැදගත් වනවා. වරාය, ගුවන් තොටුපොළ, මහා මාර්ග, ග්‍රාමීය මාර්ග, අධිවේගී මාර්ග යනාදියෙහි වැඩකටයුතු තමයි මේ අමාත්‍යාංශයෙන් කරන්නේ. ඒ අනුව අපේ රටේ භාණ්ඩ නිෂ්පාදනය වැඩි වෙනකොට ඒවා ප්‍රවාහනය කිරීම, මහජනතාව ඉක්මනින් ඒ ඒ ස්ථානවලට ගෙනයෑම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් නිර්මාණය කිරීම සඳහායි මේ කටයුත්ත කරන්නේ. ඒත් එක්කම ජාතික සහ ජාත්‍යන්තර වශයෙනුත් දැන් මේ විශ්වාසය ගොඩනැඟිලා තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත්, ලෝක බැංකුවත් අවසාන වශයෙන් කරපු පුරෝකථන අනුව 2025 වර්ෂය සඳහා අපේ ආර්ථික වර්ධන වේගය සියයට 3.5යි කිව්වා. ඒක ප්‍රමාණවත් නැහැයි කියලා දැන් විවිධාකාරයේ චෝදනා අපට ඉදිරිපත් කරනවා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ලෝක බැංකුව ජනවාරියේදී කිව්වා, අපේ ආර්ථික වර්ධන වේගය සියයට 3.5යි කියලා. අප්‍රේල්වලදීත් කිව්වා, අපේ ආර්ථික වර්ධන වේගය සියයට 3.5යි කියලා. එහෙම නම්, අපි දුෂ්කරතා හා ගැටලු මැද්දේත් මේ ආණ්ඩුව කරගෙන යනකොට ඔක්තෝබර් මාසයේදීත් ලෝක බැංකුව කියා තිබෙනවා, ඔවුන්ගේ පුරෝකථනය අනුව අපේ ආර්ථික වර්ධන වේගය සියයට 4.6ක් කියලා. ඇත්තටම ආර්ථිකය පිළිබඳව පුරෝකථන ඉදිරිපත් කරන්නේ ඒ ඒ කාලවල පවතින තත්ත්වයන් අනුව. ඒ නිසා මම මේ ගරු සභාවට විශේෂයෙන්ම කියනවා, අපේ ආණ්ඩුව ගනු ලබන ක්‍රියාමාර්ගයන්ගෙන් නිසියාකාරව මුළු ලෝකයේත්, හැම කෙනෙකුගේත් විශ්වාසය තහවුරු වෙමින් පවතිනවා කියලා. මේ රට ගොඩ ගන්න නම් අපි එකට එකතු වෙලා වැඩ කටයුතු කරන්න ඕනෑය කියලා යෝජනා කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Hon. Presiding Member)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට ලැබෙන්නේ විනාඩි 4ක කාලයක්.

[අ.භා. 4.47]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
**(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)**
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේක ඉතාම හොඳ වැඩක්. මම ඒ සඳහා ස්තුතිවන්ත වෙනවා. මේක නතර කර දාලා තිබුණු වැඩක්. මම හිතනවා, බල්ලන්නට පනින්න පුළුවන් විධියේ සහ එහා ගෙදර ඉන්න අයට මෙහා ගෙදරට පනින්න පුළුවන් විධියේ උමං සහිතව මේ මාර්ගය අපේ ඇමතිතුමා හදාවි කියලා. මොකද, ඒක අනුර දිසානායක මැතිතුමා අධිවේගී මාර්ග ගැන දිගින් දිගටම කියපු කථාවක්. මට කියන්න තිබෙන්නේ අවසානයේ දී පඬු කරඳ ගහේ ශාපය තමයි මේ ආණ්ඩුවට අද අත් වෙලා තිබෙන්නේ කියන එකයි. හේතුව, සියයට 2.5ක පොලියේ ඉඳලා සියයට 3.5ක පොලියකට ණය ගන්න පුළුවන් තැනකට දැන් මේ ව්‍යාපෘතිය තල්ලු වෙලා තිබීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ගරු හර්ෂ ද සිල්වා මැතිතුමාගේ සාකච්ඡාව බැලුවා. කරන්න තිබුණු වැඩවලින් රුපියල් බිලියන 33ක් එළියට අදිනවා, තමුන්නාන්සේලාගේ මේ අවුරුද්දේ සල්ලිවලින්. ඒකෙන් අදහස් කරන්නේ වෙන එකක් නොවෙයි. Road developmentවලට තිබුණු මුදල්වලින් රුපියල් බිලියන 33ක්, රුපියල් බිලියන 8ක් වශයෙන් එක එක තැන්වලින් මේ විධියට ඇදලා තමයි ඒ මුදල් ණය ගෙවන්න පාවිච්චි කරන්නේ. එතකොට, මේ මුදල ණය ගෙවන්න පාවිච්චි කළාම මේ අවුරුද්දේ රට ඇතුළට යන්න තිබුණු මුදල් ටික නතර වෙනවා. දැන් ඒ මුදල් ටික රට ඇතුළට යන්නේ නැතුව නතර වෙලා තිබෙන්නේ. එතකොට ගමේ මිනිසුන්ට, නැත්නම් ගමට යන්න තිබුණු මුදල් ටික මේ ආණ්ඩුව යටතේ වැඩ කෙරෙන්නේ නැති නිසා, වැඩ කරන්න විශාල අර්බුදයක් තිබෙන නිසා ඉතුරු වෙනවා. ඒ සල්ලි අරගෙන ණය ගෙවපු ලංකා ඉතිහාසයේ පළමුවැනි ආණ්ඩුව බවට මේ ආණ්ඩුව පත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බන්දුල ගුණවර්ධන හිටපු අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ අත්සන් කළ විස්තීර්ණ ණය ගිවිසුම පිළිබඳ තාක්ෂණික සහාය වාර්තාව හදලා තිබෙනවා. මම ඊට අදාළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් සමන්විත පොත් දෙක මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මේ අවස්ථාවේදී මෙම ගරු සභාවේ අපේ අනිල් ජයන්ත ඇමතිතුමාත් ඉන්න නිසා මම එතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ පොත් දෙක මුද්‍රණය කරලා හැම මන්ත්‍රීවරයෙකුටම කියවන්න ලබා දෙන්න කියලා. මොකද, ඔබතුමන්ලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක එකඟ වුණු සියලුම කරුණු මෙහි සඳහන් වෙලා තිබෙනවා.

ඊළඟට, මම තවත් කාරණයක් කියන්න කැමතියි. අපේ බිමල් රත්නායක ඇමතිතුමා යෝජනාවක් කරලා තිබුණා, ලංකාවට පැමිණෙන සංචාරකයින්ට ගුවන් තොටුපළේදී රුපියල් 2,000කට රියදුරු බලපත්‍ර ලබා දෙන්න කියලා. මේ රියදුරු බලපත්‍ර ලබා ගත් සංචාරකයින් අද මොකද කරන්නේ? අද ලංකාවේ 40,000ක් විතර ඉන්නවා, වාහනයක් තියාගෙන සංචාරකයන් එහාට මෙහාට අරගෙන යන අය. දැන් මේ අයට අද මොකද වෙලා තිබෙන්නේ? මම පසුගිය සතියේ දැක්කා, backpackersලා ත්‍රී වීලර් එකක් අරගෙන එනවා. මම හිතන විධියට බිමල් රත්නායක ඇමතිතුමාත් දන්නවා, සංචාකරයින්ගේ පැමිණීම සියයට ගණනකින් වැඩි වෙලා තිබෙන බව. හැබැයි, සංචාරක ආදායම සියයට 8.2කින් අඩු වෙලා තිබෙනවා. මොකද, ඔක්කොම එන්නේ backpackersලා. ඒ අය hotelsවල ඉන්නේ නැහැ. ඒ අය Airport එකට ආපු ගමන් ත්‍රී වීලර් එකක්, නැත්නම් වෑන් එකක් ගන්නවා. ඒ වෑන් එකට 10දෙනෙක්, 15දෙනෙක් දමා ගන්නවා. ඒගොල්ලන්ම තැන් තැන්වලට ගිහින් කාලා බීලා ආපහු අපේ රටින් යනවා. ඇත්තටම මම මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. මේක හොඳ වැඩක් වුණාට, මේ නිසා ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ නිරත වෙලා

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඉන්න කට්ටියට විශාල අගතියක් සිද්ධ වෙනවා. ඒ නිසා කලින් තිබුණු විධියට වෙරහැරින් රියදුරු බලපත්‍ර දුන්නා නම් මේ කවුරුවත් driving licence එක ගන්න වෙරහැර යන්නේ නැහැ. කාර්යභාරය හොඳ වුණාට මේකෙන් පහර වැදිලා තිබෙන්නේ අපේ අහිංසක මිනිසුන්ට. එම නිසා ඒක ගැනත් සොයා බලන්න කියලා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටවල් 40කට දැන් ඔබතුමන්ලා visa- free පහසුකම ලබා දීලා තිබෙනවා. *[බාධා කිරීමක්]* මම බිමල් රත්නායක ඇමතිතුමාත් එක්ක හෙමිහිට ඒ ගැන කථා කර ගන්නම්. රටවල් 40කට visa- free වැඩ පිළිවෙළක් හඳුන්වා දීලා තිබෙනවා. අපට ඩොලර් මිලියන ගණනක් අහිමි වන වැඩක් මේ වෙන්නේ. අපි සාමාන්‍යයෙන් ඉතිහාසයේ කටයුතු කළ විධියක් තිබෙනවා. අපට යම්කිසි රටක් visa- free සහනයක් දුන්නොත් ඔවුන්ට කරන සැලකීමක් විධියට අපිත් ඒ ක්‍රියාවලිය කරනවා. දැන් රටවල් 40කට මේ පහසුකම දීලා තිබෙනවා. මේ නිසා සමහර තැන්වල විශාල අර්බුද ඇති වෙලා තිබෙනවා. අද ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ අයට Airport එකේදී මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න සිදුවෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මේ කාරණයත් ඉතාම වැදගත්.

ඒ වාගේම තවත් කාරණයක් මම කියන්න කැමතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ආණ්ඩුව පැහැදිලිව ජිනීවා යෝජනාවලට විරුද්ධයි කියලා කිව්වාට බෙදීමක් නොඉල්ලීමේ ප්‍රතිඵලයක් ලෙස ලෝකයේ අපට සහයෝගය දුන් රටවල් එකක්වත් අද අපට නැති වෙලා තිබෙනවා. බෙදීමක් ඉල්ලා මේ යෝජනාවට ඡන්දයක් ගන්න තිබුණා, අපේ රට විධියට මේ ක්‍රියාවලිය සම්බන්ධව යම් විරෝධයක් තිබෙනවාය කියලා. මේ ආණ්ඩුව දූෂණය තුරන් කිරීම සම්බන්ධවත්, නීතියේ ආධිපත්‍යය පිහිටුවීම සම්බන්ධවත් යම් යම් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරගෙන යනවා. ඒක නැහැයි කියන්න හොඳ නැහැ. හැබැයි, එවැනි තත්ත්වයක් තිබියදී මානව හිමිකම් කවුන්සලය ගෙනා මේ යෝජනාවට විරෝධතාව දක්වලා ප්‍රකාශයක් කරනවා අපි දැක්කා. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ බෙදීමක් ඉල්ලා කථා නොකිරීමයි. අද රුසියාව අපිත් එක්ක නැහැ; චීනය අපිත් එක්ක නැහැ; ඉන්දියාව අපිත් එක්ක නැහැ. මේවා අපට සහයෝගය දෙන්න හිටපු රටවල්. අපට සහයෝගය දුන් රටවල් අද එකින් එක ඉවත් වෙලා ගිහින් තිබෙනවා. මම අවසාන වශයෙන් කියන්න කැමතියි, ලංකාවේ ආර්ථිකය වර්ධනය වෙන්නේ නැහැ, නමුත් ආණ්ඩුවේ වෛරය වර්ධනය වෙලා තිබෙනවාය කියලා. ඒක තමයි අපට අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.52]

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ලංකාවට පැමිණෙන සංචාරකයන්ට driving licences දීම සම්බන්ධයෙන් කියපු කාරණයට පිළිතුරක් ලබා දෙමින් මගේ කථාව පටන් ගන්නම්. සැප්තැම්බර් මාසය අවසන් වනවිට ලංකාවට සංචාරකයින් 1,725,494ක් ඇවිත් තිබෙනවා. ඒක පසුගිය වසරට සාපේක්ෂව සියයට 30.3ක වර්ධනයක්. සාමාන්‍යයෙන් දවසකට සංචාරකයින් එන්නේ 6,000ක් පමණයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ආදායම කීයද?

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ආදායම වැඩි වෙලා තිබෙනවා. ඒ අනුව ඩොලර් බිලියන 2.30ක් ලැබී තිබෙනවා. පසුගිය අවුරුද්දේ මුල් මාස නවයට ඩොලර් බිලියන 1.88යි ලැබිලා තිබෙන්නේ. දවසකට සංචාරකයෙකු වියදම් කරන්නේ ඩොලර් 172ක් වාගේ ප්‍රමාණයක්. ඒ වාගේම සංචාරකයෙක් සාමාන්‍යයෙන් දින අටහමාරක් පමණ තමයි මේ රටේ ඉන්නේ. දත්ත ඇතුවයි මම මේ කථා කරන්නේ, ගරු මන්ත්‍රීතුමනි. ඒ හින්දා ඔබතුමා අසත්‍ය කියන්න එපා. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. දවසකට සංචාරකයන් එන්නේ 6,000ක් විතර වාගේ ප්‍රමාණයක්. උපරිම වශයෙන් ආවේ අටදහස් ගණනක් වාගේ ප්‍රමාණයක්. හැබැයි, Airport එකෙන් licences issue වුණේ උපරිම වශයෙන් දවසකට 100ක වාගේ ප්‍රමාණයක්. 2024 අවුරුද්ද ගත්තොත්, Airport එකෙන් licences issue කරන්නේ නැතුවත් ඒගොල්ලන් වෙරහැරට ගිහිල්ලා licences 2,954ක් අරගෙන තිබෙනවා. මේ කියන තරම් යකෙක් මවන්න එපා. ඒක අපේ tourismවලට හොඳ නැහැ. ඒක වැරදි මතයක්. සංචාරක ව්‍යාපාරයේ යෙදෙන රියදුරු මහත්වරු එක්කත් අපි මේ ගැන කථා කළා. ඒගොල්ලන්ටත් පැහැදිලි කර දුන්නා, සංඛ්‍යාලේඛන අනුව. ඒගොල්ලන් ඒක පිළිගත්තා.

ගරු මරික්කාර් මන්ත්‍රීතුමාත් ප්‍රශ්න කිහිපයක් යොමු කළා, වරාය පිවිසුම් ගුවන් මාර්ගයේ වැඩ අවසන් නොකිරීම සම්බන්ධයෙන්. මේකේ ඉතුරු වැඩ කොටස් සඳහා වූ විචලන නියෝගය ඒ කියන්නේ Variation Order 60 - Variation Order 60 කියනකොට හිතා ගන්න පුළුවන් - කොච්චර කාලයක් මේක ඇදුණාද කියන එක. ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාව ලබා දීමට වසරකට ආසන්න කාලයක් ගතවීමෙන් පසු අගෝස්තු මාසයේ එකඟතාව ලැබුණා. ඒ අනුව ඉදිරි වැඩ කොටස - Ramps 3 and 4 - මාස 8ක් වාගේ කාලයක් තුළ අවසන් කිරීමට බලාපොරොත්තු වෙනවා.

ඊළඟට, වැලිකඩ - කොහිලවත්ත මාර්ගයේ බුත්තලගමුව පාලම සංවර්ධනය කරන්න සැලසුම් කළා. ඒක designing stage එකේ දැනට තිබෙන්නේ. අකුරේගොඩ, පොතුආරාව මාර්ගය සංවර්ධනය කිරීමට පටන් ගත්තා. ඒක මංතීරු දෙකේ මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීමට අදාළ සැලසුම් සකස් කරලා තිබෙනවා. ඒ සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු මේ වෙනකොට ආරම්භ කරලා තිබෙනවා.

ඊළඟට, පාමංකඩ - පැපිලියාන මාර්ගය සම්බන්ධයෙන් ගත්තොත්, ඒක මංතීරු 4ක මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීමට සැලසුම් කර ඒ කටයුතු අවසන් කර තිබෙනවා. ඒ සඳහා ඉඩම් අත්පත් කිරීමේ කටයුතුත් අවසාන අදියරේ තමයි තිබෙන්නේ. කොළඹ නාගරික ප්‍රදේශයේ මාර්ග අවහිරතා ඇති ස්ථාන 300ක් සම්බන්ධව ගැටලුවක් ඉදිරිපත් කළා. එහි ITS සැකසීම සඳහා කොළඹ ගරු නගරාධිපතිතුමිය විසින් විශේෂඥ කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒ වාගේම අපි හඳුනාගෙන තිබෙනවා, බේස්ලයින් මාර්ගයේ මංසන්ධි 10ක් widen කරන්න. ඒ කියන්නේ, වංගු - bends - තිබෙන තැන් widen කරලා traffic congestion එක අඩු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒක 2026 අය වැය සඳහා යෝජනා කරලා තිබෙනවා.

[ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා]

ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමාත් ප්‍රශ්න කිහිපයක් යොමු කළා. එතුමා පේරාදෙණිය ගලහ - දෙල්තොට මාර්ගය අබලන් වීම ගැන කිව්වා. මේ මාර්ගයේ මුළු දිග කිලෝමීටර 53යි. මේ වෙනකොට ගලහ නගරය දක්වා කිලෝමීටර 22ක් සංවර්ධනය කරලා තිබෙනවා. ළඟදී තමයි ඒ වැඩ ටික ඉවර කළේ. ඒ වාගේම කිලෝමීටර 25-28 දක්වා සංවර්ධනය කර ඒ කටයුතු අවසන් කළා. මේ වසරේදී කිලෝමීටර 22-25 දක්වා හා කිලෝමීටර 28 කණුවේ ඉඳලා 35 කණුව දක්වා කාපට් අතුරා සංවර්ධනය කරනවා. ඒ වාගේම ඉතුරු කොටස 2026 සහ 2027 අවුරුදුවල සංවර්ධන සැලැස්මට ඇතුළත් කර තිබෙනවා. ඊළඟට, පිළිමතලාව, මුරුතලාව - අලදෙනිය මාර්ගය සම්බන්ධයෙනුත් ගැටලුවක් මතු කළා. මෙම මාර්ගයේ අලදෙනිය - ඊරියගම මාර්ගය මංතීරු දෙකේ මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කරලා තිබෙනවා. මේ ආකාරයෙන් තමයි ගැටලු ටික යොමු වුණේ.

ඊළඟට, මම මේ කාරණයත් කියන්න ඕනෑ. මේ පරිපූරක ඇස්තමේන්තු පිළිබඳව සමහරුන්ට වැරදි අවබෝධයක් තිබෙනවා. මීට පෙර කථා කරපු මන්ත්‍රීතුමාත් කිව්වා, මුදල් වියදම් කරගන්න බැරි කථාවක්. කවුරුත් මේක තේරුම් ගන්න ඕනෑ. අපි භාර ගත්තේ නැවතුණු රටක්. නොයෙක් ණය ගනුදෙනු පටන්ගෙන තිබුණා. 2022න් පසුව ඒ ණය ගනුදෙනු ටික සම්පූර්ණයෙන්ම අතරමඟ නතර වෙලා තිබුණේ. එතකොට ඒ පිළිබඳ සාකච්ඡා කර ගත යුතුයි. ඒ සාකච්ඡාවලටත් යම්කිසි කාලයක් ගත වෙනවා.

රවුෆ් හකීම් මන්ත්‍රීතුමා තව ප්‍රශ්නයක් මතු කළා, ගැටඹේ පාලම සම්බන්ධයෙන්. ඇයි ඒක ඉදිකරන්නේ නැත්තේ, ඒ මුදලුත් යවන්නේ ඇයි කියලා එතුමා ඇහුවා. උදාහරණයක් විධියට මම මේක කියන්නේ මේ සම්පූර්ණ කථාව තේරුම් ගන්නයි. ගැටඹේ පාලම හදන්නේ Hungarian loan එකක් මත. හංගේරියාවෙන් ඒ යුරෝ ණය දෙන්නේ ගැටඹේ පාලම සහ කොහුවල පාලම හදන්නයි. ආර්ථික අර්බුදය නිසා ඒක නතර වෙලා, දැන් ඒ බැංකුවෙන් ණය දෙන්නේ නැහැ. හැබැයි, විදේශීය ණය ගන්නකොට විදේශීය පංගුව වාගේම දේශීය පංගුවත් තිබෙනවා. දේශීය පංගුව පොඩියි, විදේශීය පංගුව ලොකුයි. හැබැයි, අපි අවුරුද්ද මුලදී අය වැය ලේඛන සකස් කරනකොට විදේශීය පංගුව හම්බ වෙයි කියන බලාපොරොත්තුව මත දේශීය පංගුව වෙන් කරනවා. ඒ පංගුව සියයට 10ක් වෙන්න පුළුවන්, සියයට 15ක් වෙන්න පුළුවන්, සියයට 20ක් වෙන්න පුළුවන්. හැබැයි, වර්ෂය අවසාන වෙනකොට සාකච්ඡා මට්ටමෙන් අපට දැනගන්න පුළුවන්, ආර්ථික අර්බුදය නතර වෙච්ච නිසා විදේශීය ණය ලැබෙන්නේ නැහැ කියලා. ඒක, අපි වියදම් නොකර ඉතුරු වූ ප්‍රමාණයක්. ඒ ප්‍රමාණය තමයි මේ සම්පූර්ණ වියදම වන රුපියල් බිලියන 33ක් කියන්නේ. අපි අයින් කරන සම්පූර්ණ මුදල රුපියල් බිලියන 36ක්. රුපියල් බිලියන 36න්, රුපියල් බිලියන 33ක්ම විදේශීය මූල්‍යකරණය යටතේ මේ අවුරුද්දේ ඉතුරු වන ප්‍රමාණය, අර විධියේ ණය ගනුදෙනු නිසා. ඉතින්, මේක කාගේවත් වැරැද්දක් නොවෙයි. අපි, ආර්ථික අර්බුදයේ දිගු කාලයක් ඇදී යන වින්දිතයෝ. සමහර වෙලාවට අපට ලබන අවුරුද්දේත් ඔය ප්‍රශ්නයට මුහුණ දෙන්න සිද්ධ වේවි. ඒ අනුව මූල්‍ය කළමනාකරණයක් කිරීමට තමයි අපි මේ මුදල මාරු කරන්නේ. මේක තේරුම් ගත්තේ නැත්තේ ඇයි කියන එක මට හිතා ගන්න අමාරුයි. ඒ, ඉඳගෙන හිටපු හින්දාද මන්දා. හිටගෙන අහගෙන හිටියා නම් සමහර විට මේවා තේරෙන්නත් ඉඩ තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රධාන වශයෙන් කාරණා පහක් යටතේ මුදල් වෙන් කරනවා. අධිවේගී මාර්ග සංවර්ධනය සඳහා මුදල් වෙන් කරනවා. මාර්ග සංවර්ධනය - road development - සඳහා මුදල් වෙන් කරනවා. පාරවල් පුළුල් කිරීම සහ දියුණු කිරීම - widening and improvement - සඳහා මුදල් වෙන් කරනවා. ඊළඟට, construction of bridges and flyovers සඳහා මුදල් වෙන් කරනවා. ඊළඟට, operational activities සඳහා මුදල් වෙන් කරනවා. මේ අනෙක් කාරණා ගැන ගොඩක්දෙනෙක් කථා කරපු නිසා, මම widening and improvement ගැන පොඩ්ඩක් කථා කරන්නම්. අපි මේ සඳහා රුපියල් බිලියන 12ක් මේ අවුරුද්දේ වෙන් කර තිබෙනවා. අපි ඒ මඟින් "ඒ" සහ "බී" ශ්‍රේණියේ මාර්ග කිලෝමීටර 397ක්, projects 83ක් යටතේ සංවර්ධනය කරන්න මේ අවුරුද්දේ සැලසුම් කරලා තිබුණා. ඒකෙන් සෑහෙන්න ප්‍රමාණයක් මේ වන විට පටන් ගෙන තිබෙනවා. මේ අවුරුද්ද අවසාන වෙනකොට අපට එයින් සෑහෙන්න ප්‍රමාණයක් අවසන් කර ගන්න පුළුවන්. මේ යටතේ බස්නාහිර පළාතේ කිලෝමීටර 75ක් සංවර්ධනය වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තවත් විනාඩියක කාලයක් පමණක් ඔබතුමාට දෙන්න පුළුවන්.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ඊළඟට, මධ්‍යම පළාතේ කිලෝමීටර 80ක් සංවර්ධනය වෙනවා. දකුණු පළාතේ කිලෝමීටර 59ක්, උතුරු පළාතේ කිලෝමීටර 42ක්, උතුරු මැද පළාතේ කිලෝමීටර 16ක්, සබරගමුව පළාතේ කිලෝමීටර 70ක්, ඌව පළාතේ කිලෝමීටර 21ක් සංවර්ධනය වෙනවා. ඒ ආකාරයට පළාත් වැඩි ප්‍රමාණයක පාරවල් සංවර්ධනය වෙනවා. ඒ වාගේම පාලම් ගත්තොත්, මේ අවුරුද්දේ පාලම් 78ක වැඩ සම්පූර්ණයෙන් අවසන් කරනවා. එයින් 31ක වැඩ කටයුතු අපි මේ වන විට පටන් ගෙන තිබෙනවා. ඊළඟට, ICDP එක යටතේ ඉතිරි පාලම් 47 ඉදි කරනවා. ඒ ආකාරයට පාලම් 78ක් මේ අවුරුද්දේ ඉදි කරලා අවසන් කරනවා.

ඊළඟට ග්‍රාමීය මාර්ග සංවර්ධනය ගත්තොත්, ප්‍රධාන ව්‍යාපෘති තුනක් යටතේ ඒ කටයුතු කරගෙන යනවා. ඒ තමයි, "පුනරුදයට මග" ව්‍යාපෘතිය, iRoad Project සහ ICDP Project එක. මේ අවුරුදු දෙක ඇතුළත මේ ව්‍යාපෘති තුන යටතේ පාරවල් 2,000ක් සම්පූර්ණයෙන් සංවර්ධනය කරලා අවසන් කරනවා. මේ ආකාරයට අපි වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් ප්‍රවාහන, මහාමාර්ගය, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාරවල් ගැන විතරක් නොවෙයි, සමහර අමාත්‍යාංශ ඒකාබද්ධ කරගෙන වැඩ කෙරෙන්නේ නැහැ කියලා කලිනුත් කථා කළා. උදාහරණයක් විධියට ගත්තොත්, රාජ්‍ය හිමිකාරිත්වය සහිත ව්‍යවසායන්ගේ කර්මාන්ත කඩා වැටිලා කිව්වා. නමුත් අපි කියන්න ඕනෑ, ඒ සමහර ආයතන පසුගිය අවුරුද්දේ පාඩු ලබපු ආයතන බව. සීමාසහිත ලංකා ඛනිජ වැලි සමාගම ගත්තොත්, ගිය අවුරුද්දේ පළමුවැනි මාස හයට රුපියල් මිලියන 77ක් පාඩුයි. ඒක මේ අවුරුද්දේ රුපියල් මිලියන 480ක් ලාභයි. මිල්කෝ පෞද්ගලික සමාගම ගත්තොත්, ගිය අවුරුද්දේ රුපියල් මිලියන 43ක් පාඩුයි, මේ අවුරුද්දේ රුපියල් මිලියන 627ක් ලාභයි. සීමාසහිත ජාතික කඩදාසි සමාගම ගත්තොත්, ගිය අවුරුද්දේ රුපියල් මිලියන 65ක් පාඩුයි, මේ අවුරුද්දේ මිලියන 7.76ක් ලාභයි. කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම ගත්තොත්, රුපියල් මිලියන 10ක් ගිය අවුරුද්දේ පාඩුයි, රුපියල් මිලියන 39ක් මේ අවුරුද්දේ ලාභයි. ගල්ඔය වැවිලි පෞද්ගලික සමාගම ගිය අවුරුද්දේ රුපියල් මිලියන 839ක් පාඩුයි, මේ අවුරුද්දේ මිලියන 968ක් ලාභයි. මේ ආකාරයට පැය දෙකක් යනතුරු ඕනෑ නම් කියා ගෙන යන්න පුළුවන්. ඊළඟට පැවැත්වෙන්නේ ප්‍රාදේශීය සහ

මැතිවරණය වෙන්න පුළුවන්, පළාත් සභා මැතිවරණය වෙන්න පුළුවන්. ඒ මැතිවරණවලට ඉදිරිපත් වෙන්න අපේ මන්ත්‍රීවරුන්ට වෙන මොනවත් එපා, අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේදී මයික් එකක් ඉස්සරහට ගිහිල්ලා, කරපු වැඩ ගැන පැය දෙකක් කියන්න පුළුවන් list එකක් අපි හදලා දෙනවා. වෙන මොනවත් වල්පල් නැහැ, list එකක් කියවන්න පුළුවන් විධියට අපි වැඩ කරලා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම තමයි අපි මැතිවරණවලට ඉදිරිපත් වෙන්නේ. ඒ නිසා එක් අමාත්‍යාංශයක් නොවෙයි, සම්පූර්ණයෙන්ම අමාත්‍යාංශ එක්ක, ප්‍රාදේශීය සභා එක්ක ඒකාබද්ධ වෙච්ච සංවර්ධනයක් රට තුළ අපි ඇති කරනවා. අවසාන වශයෙන්, මේ පරිපූරක ඇස්තමේන්තුව සකස් කිරීම සඳහා මැදිහත් වෙච්ච අපේ අමාත්‍යාංශයේ සියලු රාජ්‍ය නිලධාරින්ට, ඒ වාගේම ගරු ඇමතිතුමා, ලේකම්තුමා ඇතුළු පෞද්ගලික කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු රොෂාන් අක්මීමන මහතා, ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු ඉඩම් පදිංචිකරුවන්ට නිදහස් කිරීම
## திருகோணமலை மாவட்டத்தில் இலங்கை துறைமுக அதிகாரசபையின் காணிகளைக் குடியிருப்பாளர்களுக்கு விடுவித்தல்
## RELEASE OF SRI LANKA PORTS AUTHORITY LANDS IN TRINCOMALEE DISTRICT TO SETTLERS

[අ.භා. 5.01]

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නගර හා කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 11ක රජයේ ඉඩම් 1984.09.12 දිනැති අංක: 314/10/1984 දරන ගැසට් පත්‍රයට අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අංක: 81/1979 දරන පනත යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත පවරා ගෙන ඇත.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු ඉඩම්වල පදිංචි මෙම ජනතාවගේ ඉඩම් ඔවුන් වෙත නිදහස් කර ගැනීම සම්බන්ධව කිහිප අවස්ථාවකදීම සාකච්ඡා පවත්වා ඇති නමුත්, මේ වන තෙක් අදාළ ඉඩම් නිදහස් කිරීම සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොමැත. ඒ අනුව 2025.02.26 දින ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී සහ ඊට පෙර අවස්ථා කිහිපයකදී මෙම ඉඩම් නිදහස් කර ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡාවට භාජනය වී ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු මුළු ඉඩම් ප්‍රමාණය දළ වශයෙන් හෙක්ටෙයාර 2,555ක් ලෙසත්, හෙක්ටෙයාර 1,219ක් පමණ වරාය අධිකාරියට අත්‍යවශ්‍ය ඉඩම් ලෙසත් හඳුනාගත් අතර, එම ඉඩම්වල පවුල් 800කට ආසන්න ප්‍රමාණයක් පදිංචිව සිටී. වරාය අධිකාරිය සඳහා අත්‍යවශ්‍ය නොවන ඉඩම් ලෙස හෙක්ටෙයාර 790ක ප්‍රමාණයක් හඳුනාගත් අතර, එම ඉඩම්වල ආසන්න වශයෙන් පවුල් 4,672ක් පමණ පදිංචිව සිටී. එම ඉඩම් ප්‍රමාණය නිදහස් කර එහි පදිංචි ජනතාව වෙත පවරා දීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතු බවට මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නගර හා කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කියන්නේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වැඩිම ජන සංඛ්‍යාවක් ජීවත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය. එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලින්ගනගර්, මඩ්කෝ, පුම්බුහාර්, සිංහපුර, සුමේධංකරපුර, කප්පල්තුරයි, මුත්තුනගර්, කාවඩ්ඩිකුඩා, චීන වරාය, නාච්චිකුඩා, වෙල්ලයිමනල් කියන ග්‍රාම නිලධාරි වසම් 11ක පවුල් 5,500ක් පමණ ජීවත් වන ඉඩම් ප්‍රමාණයක් තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1984දී වරාය අධිකාරියට පවරා තිබෙන්නේ. ඒ වෙනකොටත් පවුල් විශාල සංඛ්‍යාවක් ඒ ඉඩම්වල ජීවත් වුණා. සමහර ඉඩම්වලට රජය මඟින් ලබා දීපු යම් දීමනා පත්‍ර, අවසර පත්‍ර පවා තිබෙනවා. නමුත් දැන් අවුරුදු 40ක් පමණ ගතවෙලා තිබෙනවා. ඒ පසුගිය අවුරුදු 40ක පමණ කාලය පුරාවටම ඒ ජනතාව තමන්ට ඒ ඉඩම්වලින් කවදා යන්න වෙයිද, තමන්ට ඒ ඉඩම් කවදා අහිමි වෙයිද කියන අවිශ්වාසයෙන් තමයි ජීවත් වෙන්නේ. ඒ නිසාම ඔවුන් තමන් හරිහම්බ කර ගන්නා මුදල් ඒ ගේ හදා ගන්න වියදම් කරන්න මැළි වෙනවා. මොකද, ඒ ඉඩම් තමන්ගේ දරුවෙකුටවත් කවදාවත් ලැබෙයිද කියන අවිශ්වාසය තමයි ඔවුන්ට තිබෙන්නේ.

ඒ නිසා පසුගිය කාලය පුරාවටම ඒ ජනතාවගේ විශාල ඉල්ලීමක්, අරගළයක්, සටනක් තිබුණා, එම ඉඩම් -තමන් අවුරුදු 40ක් තිස්සේ පදිංචි වෙලා ඉන්න ඉඩම්- නිදහස් කර දෙන්න කියලා. ඉතින් ආණ්ඩුවක් විධියට අපි බලයට පත් වුණාට පස්සේ ඒ සම්බන්ධයෙන් සාකච්ඡා වට කිහිපයක් පැවැත්වූවා. මූලික වශයෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නගර හා කඩවත්සතර ප්‍රාදේශීය ලේකම්තුමා, දිසාපතිතුමා, වරාය අධිකාරිය එක්ක මේ ගැන සාකච්ඡා කළා. පසුව අපි වරාය ඇමති ගරු බිමල් රත්නායක මැතිතුමාත් එක්ක සාකච්ඡා කළා. ඉතාම සතුටුයි, ඒ සාකච්ඡා සාර්ථකව අවසන් කරන්න අපට පුළුවන් වුණා. ඒ සාකච්ඡාවල ප්‍රතිඵලයක් විධියට වරාය අධිකාරියට අත්‍යවශ්‍ය නොවන, ඒ කියන්නේ ඉදිරියේදී ත්‍රිකුණාමලය වරාය සංවර්ධනය කරනකොට ඒ වෙනුවෙන් අත්‍යවශ්‍ය නොවන ඉඩම් විශාල ප්‍රමාණයක් අපි හඳුනා ගත්තා. ඒ අනුව ඒ අත්‍යවශ්‍ය නොවන ඉඩම්වල පදිංචි පවුල් 5,000කට ආසන්න පිරිසක් සඳහා ඒ ඉඩම් නිදහස් කිරීමට හැකි බව ගරු ඇමතිතුමා සහ වරාය අධිකාරිය විසින් ප්‍රකාශ කරලා, ඊට එකඟ වෙලා තිබෙනවා. ඉතින් ඒක විශාල ජයග්‍රහණයක්, ඒ ජනතාව ලැබූ. අපි ඒ දේශපාලන තීන්දුව අරගෙන තිබෙන්නේ. ඒ නිල ක්‍රියාවලිය අවසන් කරන්නයි යම් කිසි කාලයක් ගත වෙන්නේ. ඉතින් මම ඉල්ලා සිටිනවා, මම

[ගරු රොෂාන් අක්මීමන මහතා]

යෝජනා කරනවා, ඒ නිල ක්‍රියාවලිය ඉතා ඉක්මනින් අවසන් කරලා, අවුරුදු 40ක් තිස්සේ පීඩාවට පත්වෙලා ඉන්න, තමන් පදිංචි ඉඩම්වල, තමන් ජීවත් වෙච්ච ඉඩම්වල අයිතිය අහිමි වෙච්ච ඒ ජනතාවට ඒ ඉඩම්වල අයිතිය ලබා දෙන්න පුළුවන් තරම් ඉක්මනින් කටයුතු කරන්න කියලා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු අබූබකර් අතම්බාවා මන්ත්‍රීතුමා.

[பி.ப. 5.06]

**ගරු අබූබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ ரொஷான் அக்மீமன அவர்களால் கொண்டு வரப்பட்ட இந்தப் பிரேரணையை நான் ஆமோதிக்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.07]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ජීවත් වන සියලුම ජන කොට්ඨාසවල ජනතාව මුහුණ දීලා තිබෙන ගැටලුවක් සම්බන්ධයෙන් සභාව කල් තබන අවස්ථාවේදී මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව මුලින්ම මගේ හෘදයංගම ස්තුතිය පළ කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සමාවෙන්න ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තමයි තිබෙන්නේ.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මම හිතුවා, වෙලාව වැඩි කරන්න යනවාය කියලා.

මම හිතන විදියට, ඒ ප්‍රදේශයේ ජීවත් වන සියලු ජන කොට්ඨාසවල ජනතාව මේ ගැටලුවට මුහුණ දීලා තිබෙනවා. 1984දී ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා වරාය ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේදී තමයි ඊට අදාළ ගැසට් නිවේදනය පළ කරලා තිබෙන්නේ. සමහර විට ඒ වකවානුවේදී ත්‍රිකුණාමල වරාය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියක් තිබෙන්න ඇති. ඒ පිළිබඳව වැඩි විස්තර මම කළ researchesවලින් සොයා ගන්න බැරි වුණා. නමුත් විශාල ප්‍රශ්නයක් මතු වුණා. ඒ වෙන මොකක්වත් නිසා නොවෙයි, ඒ ජනතාව ජීවත් වුණු ඉඩම් විතරක් නොවෙයි, ඒගොල්ලන්ගේ කුඹුරු ඉඩම් පවා පවරා ගන්න කටයුතු කරලා තිබෙන නිසා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා දන්නවා ඇති, 1984දී ඔය ගැසට් එක නිකුත් වුණාට පස්සේ ඒ කට්ටියට ඒ භූමියේ කිසිම සංවර්ධන කටයුත්තක් කරන්න දෙන්නේ නැහැ කියලා. අඩුම ගානේ toilet එකක්වත් හදන්න දෙන්නේ නැහැ. මේක විශාල ප්‍රශ්නයක්. අපේ හිටපු නායක අෂ්රෆ් මැතිතුමාත් වරාය කටයුතු ඇමතිවරයා වශයෙන් කටයුතු කළා. අපේ වර්තමාන නායකතුමාත් වරාය කටයුතු ඇමතිවරයා වශයෙන් කටයුතු කළා. නමුත් අවාසනාවට වාගේ ඒ කාලයේ යුද්ධයක් තිබුණා. යුද්ධය පැවති වකවානුව තුළ වරාය අවට ප්‍රදේශ පිළිබඳ නැවත අවසාන තීරණයක් ගැනීමේදී විශාල ප්‍රශ්නයක් මතු වුණා. ඒකට ඉඩ දුන්නේ නැහැ. ආණ්ඩුව ඒ පිළිබඳව අවධානය යොමු කරලා, ඒ ඉඩම් ටික නිදහස් කර ගැනීමට කටයුතු සම්පාදනය කිරීම සම්බන්ධයෙන් මම ඇත්තටම ස්තුතිවන්ත වෙනවා.

Hon. Presiding Member, கப்பல்துறை, முத்துநகர், வெள்ளைமணல் போன்ற பிரதேசங்களிலுள்ள பல்லாயிரக் கணக்கான மக்களுடைய எதிர்காலத்தைக் கேள்விக்குறி யாக்கிய பெரியதொரு பிரச்சினை சம்பந்தமாக இன்று அரசாங்கத் தரப்பினர் ஒரு பிரேரணையைக் கொண்டு வந்திருப்பது எங்களுக்குச் சந்தோஷமாக இருக்கின்றது. இந்த விடயத்துக்குப் பொறுப்பான அமைச்சர் அவர்கள் இங்கு இருக்கின்றார். அவர் இவ்விடயம் சம்பந்தமாக அமைச்சரவை யிலும் சரியானதொரு நிலைப்பாட்டுக்கு வந்திருப்பதாகக் கேள்விப்பட்டேன். உண்மையிலேயே சந்தோஷமாக இருக்கின்றது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இதற்கு முன்னர் இந்தப் பிரச்சினை பற்றி பேசும் ஒவ்வொரு சந்தர்ப்பத்திலும், ஆட்சியில் இருந்த அரசாங்கங்கள் வேறு காரணங்களை மனதில் வைத்துக்கொண்டு, இக்காணிகளை விடுவிக்காமல் இருந்தது. அதாவது, தனிப் பட்ட விடயத்துக்காகப் பயன்படுத்துவதற்கு அவற்றை வைத்துக்கொண்டு இருந்ததுபோலத் தெரிகின்றது.

ගරු ඇමතිතුමා දන්නවාද දන්නේ නැහැ, අදත් ත්‍රිකුණාමලයේ පොඩි protest එකක් තිබුණා කියලා. මොකද, එහි ඉඩම් වගයක් සූර්ය බලශක්තිය නිෂ්පාදනය කිරීම සඳහා සමාගම් 4කට දීලා තිබෙනවා. ඒ ගැසට් එක පළ කර තිබුණේ නම් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අවශ්‍යතාව මත. නමුත්, ඒකෙනුත් ඉඩම් කිහිපයක් දීලා තිබෙනවා. මට ලැබුණු තොරතුරු අනුවයි මේ කියන්නේ and subject to correction; I can be corrected, if I am wrong. ඒ පළාතේ ඉන්න අපේ කට්ටිය කිව්වා, අදත් ඒ පිළිබඳව පොඩි විරෝධයක් තිබුණා කියලා. මොකද, සූර්ය බලශක්තිය නිෂ්පාදනය කිරීම සඳහාත් ඒ ඉඩම් කිහිපයක් අරගෙන සමාගම් 4කට දීලා තිබෙනවා. ඒ සම්බන්ධයෙනුත් ආරාවුල් තත්ත්වයක් තිබෙනවා.

Adjournment Motion එක අනුව බැලුවාම පෙනෙනවා, අක්කර කීයක් තිබෙනවාද, අක්කර කීයක් නිදහස් කරන්න රජය දැනට තීරණය කර තිබෙනවාද, සීමා නිර්ණය කිරීම් - demarcate කිරීම් - ආදියට අදාළව Gazette Notification එකේ තිබෙනවාද යනාදිය සම්බන්ධයෙන් විස්තර ලැබිලා නැහැ කියලා. මේක අවුරුදු 40ක පමණ කාලයක් තිස්සේ විසඳා ගන්න බැරුව තිබෙන ප්‍රශ්නයක්. විශේෂයෙන් යුද්ධයෙන් පීඩාවට පත් වී සිටි සිංහල, දෙමළ, මුස්ලිම් ඇතුළු සියලු ජන කොට්ඨාසයන්ට අයිති ජනතාව එහේ ජීවත් වෙලා ඉන්නවා. එහි ඒගොල්ලන්ගේ වගා බිම් තිබෙනවා. ඒ සියල්ලක්ම සම්බන්ධයෙන් අවසාන තීරණයක් අරගෙන ශ්‍රී ලංකා වරාය අධිකාරියට අත්‍යවශ්‍ය නොවන ඉඩම් ටික ඒ ජනතාවට ලබා දීමට යෝජනා කිරීම පිළිබඳව අපි ස්තුතිවන්ත වෙනවා.

நான் இந்தச் சபையில் வேண்டுகோள் ஒன்றை முன்வைக்க விரும்புகின்றேன். அதாவது, நீங்கள் எந்தெந்தக் காணிகளை விடுவிப்பது, எந்த அடிப்படையில் விடுவிப்பது என்பதைத்

தீர்மானித்து அவற்றை விடுவித்த பிற்பாடு, அங்கு 1984ஆம் ஆண்டுக்கு முன்னர் - 1970ஆம் ஆண்டுக்குப் பின்னர் - இருந்தவர்களுக்குக் காணிகளைக் கொடுப்பதற்குரிய வேலைத்திட்டம் ஒன்றை உருவாக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

1970ට පස්සේ සහ 1984ට පෙර ඒ ප්‍රදේශවල ජීවත් වුණු, ඒ ප්‍රදේශවල කුඹුරු වගා කරපු ජනතාවට ඒවා ලබා දිය යුතුය කියන ප්‍රතිපත්තිමය තීන්දුව මේ ආණ්ඩුව ගත යුතුයි. ඒ වාගේම, ඒ ඉඩම් ටික ඒ දුක් විඳපු, ඒ ඉඩම් ඇත්තටම අයිති විය යුතු ජනතාවට අසාධාරණයක් නොවන විධියට, විනිවිදභාවයෙන් යුතු ක්‍රියා පිළිවෙතක් මත නිදහස් කර ගැනීම සඳහා මේ රජය කටයුතු කරයි කියන බලාපොරොත්තුවෙන්, මේ යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් නැවතත් අපගේ ස්තුතිය පළ කරමින් මා නිහඬ වෙනවා.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.13]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உண்மையிலேயே 1980களில் திருகோணமலையில் உருவாக்கப்பட்ட காணிப் பிரச்சினையைத் தீர்ப்பதற்கான சந்தர்ப்பம் இன்று எங்களுக்குக் கிடைத்தமையையிட்டு நான் சந்தோசப்படுகிறேன். குறிப்பாக, பல வருடங்களாக இந்த மக்களின் காணிகள் விடுவிக்கப்பட வேண்டுமென நாங்கள் வேண்டுகோள் விடுத்திருந்தாலும், தற்போது எமது காலப்பகுதியிலேயே இதைத் தீர்த்து வைப்பதற்கான ஒரு சந்தர்ப்பம் கிடைத்தமையை நான் பாக்கியமாகக் கருதுகின்றேன். கௌரவ இம்ரான் மஹ்ரூப் அவர்களின் தந்தையாரின் காலப்பகுதியாக இருக்கலாம், கௌரவ நிசாம் காரியப்பர் அவர்களின் கட்சியின் தலைவர்களான இருவர் இந்தத் துறைமுகம் சார்ந்த விடயங்களுக்குப் பொறுப்பான அமைச்சர்களாக இருந்த காலப்பகுதியாக இருக்கலாம், அந்தக் காலங்களில்கூட தீர்த்துவைக்க முடியாதிருந்த பிரச்சினைகளைத் தீர்த்துவைப்பதற்கு எங்களுக்குக் கிடைத்த சந்தர்ப்பத்தை மிகவும் முக்கியமானதாகப் பார்க்கிறோம்.

குறிப்பாக, திருகோணமலையின் லிங்க நகர், மட்கோ, பூம்புகார், சிங்கபுர, சுமேதகங்கரபுர, கப்பல்துறை, முத்துநகர், காவட்டிக்குடா, சீனக்குடா, நாச்சிக்குடா, வெள்ளைமணல் ஆகிய 11 கிராம சேவையாளர் பிரிவுகள் இதில் உள்ளடக்கப்பட்டிருக்கின்றது. இந்தக் காணிகள் சரியான முறையில் அடையாளங் காணப்பட்டு, அந்தப் பிரதேச செயலாளரின் நேரடிக் கண்காணிப்பின்கீழ், இலங்கைத் துறைமுக அதிகாரசபையையும் உள்வாங்கி நாங்கள் இந்த வேலையைச் செய்து வருகின்றோம். அந்த வகையில் 4,500 - 5,000 குடும்பங்களுக்குக் காணி அனுமதிப்பத்திரங்களை வழங்குவதற்கான ஏற்பாடுகள் செய்யப்பட்டிருக்கின்றது; சுமார் 800 ஹெக்டயர் காணிகளை விடுவிக்கக்கூடிய சந்தர்ப்பம் கிடைத்திருக்கிறது.

அடுத்து, மிகவும் முக்கியமானதும் தற்போதைய பேசுபொருளாகவும் இருக்கின்ற முத்துநகர் சம்பந்தப்பட்ட விடயத்தைப் பார்த்தால், அந்த நகரத்தில் உள்ள சுமார் 186 குடும்பங்களுக்கு அனுமதிப்பத்திரங்களை வழங்கக்கூடிய நிலைமை காணப்படுகிறது. இங்கே விவசாயக் காணிகள் தொடர்பான பிரச்சினையும் இருக்கின்றது. அந்தப் பிரச்சினையை விடுத்து, 186 குடும்பங்களுக்குக் குடியிருப்புக் காணிகளுக்கான அனுமதிப்பத்திரங்கள் வழங்கக்கூடிய நிலைமை காணப்படுகின்றது. பொதுவாக எமக்குக் கிடைத்த வெற்றியாக நாங்கள் இதனைக் கருதுகின்றோம். இந்தக் காணிப் பிரச்சினையை மாத்திரமல்ல, இனிவரும் காலங்களிலும் திருகோணமலை மாவட்டத்தில் இருக்கின்ற பல்வேறு காணிப் பிரச்சினைகள் தொடர்பாகவும் சரியான முறையில் அணுகி, அவற்றுக்குத் தீர்வுகளைப் பெற்றுக் கொடுக்கக்கூடிய சந்தர்ப்பத்தை இந்த அரசாங்கம் எங்களுக்கு ஏற்படுத்திக் கொடுத்திருக்கின்றது. நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.16]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இன்று திருகோணமலை மாவட்டத்தின் பட்டினமும் சூழலும் பிரதேச செயலாளர் பிரிவில் உள்ளடங்கும் 11 கிராம உத்தியோகத்தர் பிரிவுகளில் உள்ள, துறைமுக அதிகார சபைக்குச் சொந்தமான காணிகளை விடுவிப்பது சம்பந்தமாகக் கொண்டுவரப்பட்டிருக்கின்ற ஒத்திவைப்புவேளைப் பிரேரணை பொதுவாக வரவேற்கத்தக்க ஒன்றாகக் காணப்படுகின்றது. இருந்தபோதிலும், முத்துநகர் என்ற பிரதேசம் தொடர்பாக நாங்கள் பார்க்கின்றபோது, அந்த மக்கள் பல இன்னல்களை, பல கஷ்டங்களை அனுபவித்து இருக்கின்றார்கள். அதற்கான பொறுப்பை இந்த அரசாங்கம் எடுக்க வேண்டும் என்பது என்னுடைய வேண்டுகோள். ஏனென்றால், கௌரவ பிரதி அமைச்சர் அவர்கள் கூறியதுபோன்று, இது எனது தந்தையினுடைய காலத்தில் gazette பண்ணப்பட்டாலும், அதற்குப் பின்னர் எத்தனையோ பாராளுமன்ற உறுப்பினர்கள் அமைச்சர்கள் இதனோடு சம்பந்தப்பட்ட அமைச்சில் இருந்தாலும் இவ்வாறானதொரு கடினமான போக்கு அவர்கள்மீது காட்டப்பட்டு இருக்கின்றதா? என்பதைத்தான் நாங்கள் கேட்கின்றோம். ஏனென்றால், இது துறைமுக அதிகாரசபைக்குரிய காணி அல்லது அதற்கு ஒதுக்கப்பட்ட காணி என்றாலும் அம்மக்கள் அங்கு தங்களுடைய செயற்பாடுகளை மேற்கொள்கின்ற ஒரு சூழல் அந்த நேரங்களில் காணப்பட்டது. ஆனால், இந்த அரசாங்கத்தை நம்பி வாக்களித்து, இந்த அரசாங்கம் அமைவதற்குக் கூடுதலான பங்களிப்பைச் செய்த அம்மக்கள் இன்று அது தொடர்பாகப் பேசுவதற்கு அந்தப் பிரதிநிதிகளைச் சந்திப்பதே கடினமான விடயமாக மாறியிருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! அந்த மக்கள் இன்று கொழும்பில் ஆர்ப்பாட்டம் செய்கின்றார்கள்; சனாதிபதி காரியாலயத்திற்கு வருகின்றார்கள்; பிரதமர் காரியாலயத்திற்கு வருகின்றார்கள். ஏன், கடந்த 21 நாட்களாக எங்களுடைய கச்சேரியின் முன்பிருந்து தங்களுடைய தேவைகளை முன்னிலைப்படுத்தித் தீர்வைக் கேட்கின்றார்கள்.

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

கௌரவ உறுப்பினர் அவர்களால் கொண்டுவரப் பட்டிருக்கின்ற இந்தப் பிரேரணை உண்மையிலேயே தேவையானது என்பதை நாங்கள் ஏற்றுக் கொள்கின்றோம். இதனுடன் 11 கிராம சேவகர் பிரிவுகள் - GS Divisions - சம்பந்தப்படுகின்றன. அவையும் முத்துநகர் பிரச்சினை போன்று தீவிரமடைந்ததற்குப் பின்னர் இங்கு கொண்டு வரப்படாமல், இப்போதே தீர்வைக் காண்பது உண்மையிலேயே வரவேற்கத்தக்க விஷயம். ஆனால், முத்துநகர் பிரதேச மக்கள் இதற்கு முன்னர் இருந்த எந்த அரசாங்கக் காலத்திலும் இவ்வாறு கஷ்டத்தை அனுபவிக்கவில்லை. இன்று பல ஆர்ப்பாட்டங்களின்மூலம் அவர்களுடைய கோரிக்கையை முன்வைத்திருப்பதை நாங்கள் பார்க்கின்றோம். அவர்கள் அந்த விடயத்திலே எத்தனையோ முன்னெடுப்புகளைச் செய்கின்றார்கள். அவர்கள் சந்திக்க விரும்பியவர்களைக்கூட சந்திக்க முடியாதவொரு சூழ்நிலை காணப்பட்டது. அவர்களுக்கான ஒரு தீர்வை வழங்குவது, குறிப்பாக அந்த இடங்களை விடுவிப்பது என்பது ஒரு பக்கம் இருந்தாலும் அவர்களுக்கான தீர்வை வழங்கும் வகையில் ஒரு விடையளிப்பதற்கான சூழல்கூட ஏற்படுத்தப்படவில்லை.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
මම ඉක්මනින් අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

அதேபோன்றுதான் சில மாதங்களுக்கு முன்னர் நடைபெற்ற DCC கூட்டத்தில், மிகுதிக் காணிகளில் அங்கிருக்கின்ற விவசாயிகள் விவசாயம் செய்ய முடியுமென வழங்கப்பட்ட வாக்குறுதியை நம்பித் தமது விவசாய நடவடிக்கையை மேற்கொள்வதற்காகக் குறித்த காணிக்குச் சென்ற ஐந்து விவசாயிகள் பொலிஸாரினால் கைது செய்யப்பட்டுச் சிறையில் அடைக்கப்பட்டிருந்தார்கள். இது எந்த அரசாங்கக் காலத்திலும் நடைபெறவில்லை. அங்கிருந்த ஒரு குளம் முற்றுமுழுதாக மூடப்பட்டு, அங்கு பயிர்ச்செய்கை செய்தார்களா அல்லது மக்கள் வாழ்ந்தார்களா என்று தெரிந்துகொள்ளக்கூட முடியாத அளவுக்கு அந்த இடங்கள் மாற்றமடைந்திருக்கின்றன. இது எந்த அரசாங்கக் காலத்திலும் நடைபெறவில்லை. இதுபோன்ற பல விடயங்கள்மூலமாக அந்த மக்கள் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். ஆகையால், அந்த நிலைப்பாட்டைப் பார்க்கின்றபோது, இந்தப் பிரேரணை முன்வைக்கப்பட்டிருக்கின்ற வேளையில் இப்போதாவது மிகுதியாக அந்த GS Divisionsஇல் காணப்படுகின்ற காணிகளை விடுவிப்பதற்கு அரசாங்கம் முன்வந்தமைக்காக உண்மையிலேயே நாங்கள் பாராட்டுகின்றோம். தயவுசெய்து முத்துநகர் பிரதேசத்தில் இருக்கின்ற, 350 குடும்பங்களுக்கான தீர்வை வழங்குவதற்குரிய நடவடிக்கையை அரசாங்கம் எடுக்க வேண்டும்.

நாங்கள் இது பற்றி தொடர்ச்சியாக இந்தப் பாராளுமன்றத்திற்குள்ளேயும் பேசுகின்றோம், வெளியேயும் பேசுகின்றோம். எங்கு பேசினாலும் நீங்கள் 76 வருட சாபத்தைப் பற்றியே பேசுகின்றீர்கள்; சென்ற அரசாங்கக் காலங்களிலே gazette பண்ணப்பட்டதென்று சொல்லித் தப்பித்துக் கொள்கின்றீர்கள். மேற்குறித்த காணிகள் gazette பண்ணப்பட்டது நீங்கள் ஆட்சிக்கு வந்ததற்குப் பிறகல்ல என்பது உங்களுக்குத் தெரியும்! தேர்தலுக்கு வாக்குக் கேட்க உங்களுடைய சனாதிபதி வேட்பாளர் களமிறங்குகின்ற பொழுதே உங்களுக்குத் தெரியும்! ஆனாலும், நீங்கள் அந்த மக்களிடம் சொல்லியிருந்த விடயம், "நாங்கள் ஆட்சி அமைத்தால், எங்களுக்கான ஓர் அரசாங்கம் உருவாக்கப் பட்டால், நாங்கள் அந்தக் காணிகளை உங்களுக்குப் பெற்றுத் தருவோம்" என்பதாகும். அந்த நம்பிக்கையிலேதான் அந்த மக்கள் இன்னும் போராடிக் கொண்டிக்கின்றார்கள் என்பதை நீங்கள் விளங்கிக்கொள்ள வேண்டும். ஆரம்ப காலந்தொட்டு நாங்கள் “அந்த மக்களோடு பேசுங்கள்! அந்த மக்களுக்கான நிவாரணத்தை வழங்குங்கள்! அந்த மக்கள் கேட்கின்ற விடயங்களை நீங்கள் செய்யுங்கள்!” என்று சொல்லி வருகின்றோம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
මම අවසන් කරන්නම්.

வரலாற்றில் என்றும் இல்லாத வகையில், இம்முறை 159 உறுப்பினர்களைக் கொண்டு நீங்கள் ஆட்சி அமைத்திருக் கின்றீர்கள். ஆகையால், சனாதிபதி, பிரதமர், DCC Chairman எனப் பல அதிகாரபூர்வமான பதவிகளை வகித்துக் கொண்டிருக்கின்ற நீங்கள் தயவுசெய்து இதுபோன்ற பிரேரணையைக் கொண்டுவருவதோடு மாத்திரம் நிறுத்தி விடாமல், அந்த மக்களுக்கான தீர்வை மிக விரைவிலே வழங்கி, ஏனைய GS Divisionஇன் கீழுள்ள காணிகளையும் மக்கள் பாவனைக்கு விடுவிப்பதற்கான நடவடிக்கைகளையும் மேற்கொள்ளுங்கள் என்று கேட்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.21]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் திருகோணமலை மாவட்டத்தில் இலங்கைத் துறைமுக அதிகாரசபைக்குச் சொந்தமாகவுள்ள காணிகளை விடுவிப்பது சம்பந்தமான ஒத்திவைப்புவேளைப் பிரேரணை இச்சபையில் கொண்டுவரப்பட்டிருக்கின்றது. நல்ல விடயங்களை நாங்கள் வரவேற்கின்றோம். பிரதி அமைச்சர் கௌரவ அருண் ஹேமச்சந்திரா அவர்கள் ஆற்றிய உரையை நான் அவதானித்துக்கொண்டு இருந்தேன். மேலும், இங்கு உரையாற்றிய ஏனையவர்களுடைய கருத்துகளையும் நான் கேட்டிருந்தேன். மிக முக்கியமாக, திருகோணமலை மாவட்டத்தின் பட்டினமும் சூழலும் பிரதேச செயலாளர் பிரிவின் லிங்கநகர், பாலையூற்று, பூம்புகார், கப்பல்துறை, சீனக்குடா, முத்துநகர் உட்பட 11 கிராம அலுவலர்

பிரிவுகளைச் சேர்ந்த 800 குடும்பங்கள் பல வருடங்களுக்கு முன்னர் அங்கு வாழ்ந்து வந்தனர். 1979ஆம் ஆண்டு இந்திய - இலங்கை ஒப்பந்தத்தினூடாக அரசியலமைப்பின் 13ஆவது திருத்தம் மேற்கொள்ளப்பட்டு, மாகாண சபைகள் சட்டம் கொண்டுவரப்பட இருந்தபொழுது, அந்தச் சட்டம் நிறைவேற்றப்படுவதற்கு முன்னரே அந்தக் காலத்தில் இரவோடு இரவாக இந்த மக்களுடைய காணிகளின் உரிமையை இல்லாமற் செய்கின்ற செயற்பாட்டை அப்போது பாதுகாப்புத் துறை, வர்த்தகம் மற்றும் கப்பல் போக்குவரத்துத் துறை எனப் பல அமைச்சுப் பதவிகளில் இருந்த லலித் அத்துலத்முதலி அவர்கள் செய்திருந்தார். லலித் அத்துலத்முதலி செய்த மிகமோசமான காரியங்களில் இதுவும் ஒன்று!

இப்போது நீங்கள் அந்த மக்களுக்கு அதே காணிகளை வழங்க முன்வந்திருப்பதை நாங்கள் வரவேற்கிறோம். மிக முக்கியமாக, அந்தக் காலத்திலே மக்கள் குடியிருந்த மொத்தக் காணியின் அளவு 2,555 ஹெக்டயர் - 6, 379 ஏக்கர். ஆனால், இப்போது துறைமுக அதிகாரசபைக்கு அதிலேயும் 1,219 ஹெக்டயர் - 3,048 ஏக்கர் - காணிகள் வழங்கப்பட்ட பிற்பாடு, அங்கு வாழுகின்ற தமிழ் மக்களுக்கு வழங்கப்பட இருப்பது 790 ஹெக்டயர் - 1,975 ஏக்கர் - ஆகும். ஆகவே, மிகுதிக் காணிகளும் அந்த மக்களுக்கு வழங்கப்பட வேண்டும். நீங்கள் எடுத்திருக்கிற முயற்சி நல்லது; நாங்கள் வரவேற்கிறோம். ஆனால், லலித் அத்துலத்முதலி அவர்கள் அந்தக் காணிகளைப் பறிக்கின்றபோது அங்கு 800 குடும்பங்கள் இருந்தன. இப்பொழுது அங்கு 4,672 குடும்பங்கள் இருக்கின்றன. அந்த நேரம் இருந்த குடும்பங்களின் எண்ணிக்கை இப்போது எத்தனை மடங்கு அதிகரித்திருக்கிறது என்பது பிரதி அமைச்சர் கௌரவ அருண் ஹேமச்சந்திர உட்பட ஏனைய எல்லோருக்கும் விளங்கும் என நான் நினைக்கிறேன்.

1979ஆம் ஆண்டிலே அங்குள்ள மக்களிடமிருந்து இந்தக் காணிகள் பறிக்கப்பட்டன. அந்த வகையில், 46 ஆண்டுகள் கடந்த நிலையில் இப்பொழுது நீங்கள் அதனை மீள வழங்குவதற்கு முன்வந்திருக்கிற விடயம் மிகவும் முக்கியமானது. மிகமிக முக்கியமாக, 46 வருடங்களின் பின்னர் இவ்வாறு மேற்கொள்கின்ற செயற்பாட்டில் இன்னும் பல இடங்களையும் நீங்கள் இணைத்துச் செயற்படுத்த வேண்டும். அதாவது, திருகோணமலை மாவட்டத்தினுடைய பட்டினமும் சூழலும் பிரதேச செயலாளர் பிரிவிலே இருக்கின்ற 11 கிராம அலுவலர் பிரிவுகளின் காணிகளை அம்மக்களுக்கு மீள வழங்குவது மட்டுமல்லாது, குச்சவெளிப் பிரதேச செயலாளர் பிரிவு மற்றும் ஏனைய தமிழர்கள் வாழுகின்ற கூடுதலான பிரதேசங்களிலும்கூட மிகக் கூடுதலான அளவிலே நிலங்கள் பறிக்கப்பட்டுக் கொண்டிருக்கின்றன.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஒரு நிமிடம் தாருங்கள்!

அங்கு வலுக்கட்டாயமாக பௌத்த விகாரைகள் அமைக்கப்படுதல் மற்றும் அதனைச் சுற்றியுள்ள இடங்களில் இருக்கின்ற காணிகளைப் பறித்தல் போன்ற செயற்பாடுகள் இடம்பெற்று வருகின்றன. உதாரணமாக, திரியாய் போன்ற இடங்களில் இதுபோன்ற செயற்பாடுகள் மிக மோசமாக இடம்பெறுகின்றன. அந்த வகையில், குச்சவெளி, திரியாய் மற்றும் பட்டினமும் சூழலும் ஆகிய பகுதிகள் தொடர்பில் மிகக் கூடியளவு கவனம் செலுத்தப்பட வேண்டும். அந்த வகையில், பிரதி அமைச்சர் கௌரவ அருண் ஹேமச்சந்திரா அவர்களும் அவருடைய சகாக்களும் எடுத்த இந்த விடயத்தை நாங்கள் வரவேற்கிறோம். இதற்குப் பூரணமாக எங்களுடைய ஒத்துழைப்பு இருக்கும்! இதை எவ்வளவு வெற்றிகரமாக நீங்கள் செய்ய முடியுமோ செய்யுங்கள்! கடந்த அரசாங்கம் செய்த தவறைத் திருத்துவதற்கான ஒரு முன்முயற்சியாக இதனை நாங்கள் பார்க்கிறோம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බිමල් රත්නායක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.24]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රොෂාන් අක්මීමන ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට පිළිතුරු දීමට කැමැතියි. නමුත් මේ ලැබිලා තිබෙන කෙටි වේලාවේ මේ පිළිබඳ සම්පූර්ණ පසුබිම ඉදිරිපත් කරන්න අමාරුයි.

මම පළමුවෙන්ම කියන්න කැමැතියි, අපට පදිංචි වෙන්න තැන් වලට විකල්ප තිබුණාට ත්‍රිකුණාමලය වරායට විකල්ප නැති බව. ත්‍රිකුණාමලය වරාය ලෝකයටම එකයි. ඒ වාගේම ඒක ලෝකයේත් ඉතාම විශේෂ වරායක්. අපි අහලා තිබෙන විධියට ලෝකයේ දෙවෙනියට තිබෙන විශාලතම ස්වාභාවික වරාය. ඒක නිසා ඒක ඉතාම වැදගත් වරායක්. නමුත් අපට අවුරුදු සිය ගණනක් තිස්සේ ඒක අත්‍යවශ්‍ය සංවර්ධන ක්‍රියාවලියට ලක් කරගන්න බැරි වෙලා තිබෙනවා. ඒ වරාය ආශ්‍රිතව හරියාකාරව කර්මාන්ත ගොඩ නඟා ගන්න ගොඩක් දුරට බැරි වෙලා තිබෙනවා. යම් කර්මාන්ත ප්‍රමාණයකුත් තිබෙනවා.

ඒ ජනතාව වරාය තරම් පරණ නැති වුණත්, ඒ සංවර්ධන ව්‍යාපෘති දිගින් දිගටම ප්‍රමාද වුණත්, ඒ ජනතාවත් අවුරුදු සිය ගණන් තිස්සේ ඒ තැන්වල ඉන්නවා. එතකොට, ඒ ගොල්ලන්ට මේක වරායක් කියලා පේන්නේ නැහැ. මොකද වරාය තිබෙන්නේ මුහුදේ. ඒ වරාය ආශ්‍රිත ඉඩම් තමයි ඒ අති විශාල ප්‍රදේශයේ තිබෙන්නේ. පසුගිය අවුරුදු 50, 60, 70 තුළ ඒ ඉඩම් දියුණු වෙන්නේ නැතිකොට මිනිස්සු බලාගෙන ඉඳලා ඒවායේ විවිධ විධියට පදිංචි වුණා. ඒ වාගේම මම වගකීමෙන් කියනවා, දේශපාලන ව්‍යාපෘති ලෙසත් අහිංසක මිනිස්සු ගෙනැල්ලා මේ ඉඩම්වල බලෙන් පදිංචි කරලාත් තිබෙනවා කියලා. අපි ඒවා දන්නේ නැතිව කථා කරනවා නොවෙයි. ඡන්ද දිනන්න, ඡන්ද ළං වෙද්දී මිනිස්සු ඒ ඉඩම්වල පදිංචි කළ අවස්ථා තිබෙනවා. සමහරවිට ඉතාම වටිනා ඉඩම් දේශපාලනඥයන් අරගෙන වෙන මිනිස්සුන්ට දීලා තිබෙනවා. අපි ඒ ඔක්කෝම දන්නවා.

[ගරු බිමල් රත්නායක මහතා]

සිම්බාබ්වේ රටේ හිටියා මුගාබේ කියලා ජනාධිපතිවරයෙක්. ඔහු ඡන්දයක් ළං වුණාම විශාල වතු හිමියන්ගේ ඉඩම් අල්ලා ගන්නවා. ඒ වතු හිමියොත් colonizersලා තමයි. ඒවා ඒ ගොල්ලෝත් බලෙන් අල්ලපු ඉඩම් තමයි. ඒ මොනවා වුණත් දැන් ඒවාට අවුරුදු 100ක්, 200ක් ගිහිල්ලානේ. මුගාබේ අල්ලන ඉඩම්වලින් මුඩු ඉඩම් ටික ජනතාවට බෙදලා දෙනවා. දියමන්ති වාගේ දේවල් තිබෙන ගොඩක් වටින ඉඩම් ටික තියා ගන්නවා. ඒවාගේ දේවලුත් ත්‍රිකුණාමල වරාය ආශ්‍රිතව කරලා තිබෙනවා ඔය කථා කළ අයත්, ඉතිහාසයේ හිටපු ඒ ගොල්ලන්ගේ මැති ඇමතිවරුත්. ඒ ගැන අපට අදහසක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිනිස්සු පරම්පරා දෙකක් තුනක් තිස්සේ ඒ ඉඩම් ජීවිත භුක්තියට අරගෙන තිබෙනවා. දැන් රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමා කිව්වා ඒවායේ ආණ්ඩුවේ කාර්යාල පවා ගොඩ නඟලා තිබෙනවා කියලා. මේ ප්‍රශ්නය අපි ආණ්ඩුව ගත්තාට පස්සේ දැන ගත්ත එකක් නොවෙයි. ඡන්දයේදී ජනතාව අපට ඡන්දය දීපු හේතු එක එක ඒවා වෙන්න පුළුවන්. මේකත් එවැනි එක හේතුවක් වෙන්න පුළුවන්. නමුත් තව ගොඩක් හේතු නිසා මිනිස්සු ඡන්දය දීලා තිබෙනවා. මොකද, ඒ අය බොරුවලට රැවටිලාම එපා වෙලා. හැබැයි අපි පක්ෂයක් ලෙස ත්‍රිකුණාමල වරාය දියුණු කරනවා කියන එක ගැනත්, ඒ ජනතාවගේ ඉඩම් අයිතිය ලබා දිය යුතුයි කියන එක ගැනත් කවදාවත් ජාති, ආගම්, කුල භේදයෙන් බලලා නැහැ. අපි පිළිගන්නවා ඒවා දෙන්න ඕනෑ කියලා, දිය හැකි ප්‍රමාණයෙන්.

එම නිසා අපේ මේ ප්‍රවේශය සංවර්ධනාත්මක සහ මානුෂීය ප්‍රවේශයක්. වරාය තිබෙන්නට ඕනෑ. වරායට විකල්පයක් නැහැ. කවදා හෝ වරාය ආශ්‍රිත කර්මාන්ත දියුණු කරන්න ඕනෑ. මොකද, නැඟෙනහිර පළාත දියුණු කරනවා නම් එම වරාය අතිශය වැදගත් තැනක්. අපි පක්ෂයක් ලෙස ඡන්ද බලාගෙන නොවෙයි, අවුරුදු ගණනක් තිස්සේ මේ වෙනුවෙන් වැඩ කරලා තිබෙනවා. මට කථා කරන්න කාලය මදි නිසා මම මේ කාරණයත් කියන්න ඕනෑ. ගරු රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමා, ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු පොදුවේ පක්ෂයම මහන්සි වෙලා මේ සම්බන්ධව තොරතුරු සහ කරුණු කථා කළා. ඒ පිළිබඳව ආණ්ඩුව එක්කත් කථා කරලා, ජනාධිපතිතුමා එක්කත් කථා කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුවට අවුරුද්දයි කියලා වචනවලින් කිව්වාට, ඇමතිවරු දිවුරුම් දීලා අවුරුද්දක් නැහැ කියන එක ඔබතුමාත් දන්නවා. නොවැම්බර් 20 තමයි මම ඇමතිකම ගත්තේ. තවම අවුරුද්දක් පිරිලා නැහැ. අනෙක් එක, ඇමතිකම් කරපු විපක්ෂයේ ඔබතුමන්ලා කවුරුත් දන්නවා, ඇමතිකමට අදාළ කරන දේවල් කළමනාකරණය කර ගන්න තව කොච්චර preparatory period එකක් ඕනෑද කියලා. ඒ වාගේම අපි අය වැයක් සම්මත කළේ 2025 මාර්තු 21වැනිදා. ඊට පස්සේ ප්‍රාදේශීය සභා ඡන්දය තිබුණු නිසා මැයි 6 වෙනකල් සමහර දේවල් කරන්න බැහැ. ඉඩම් දෙන්න අවශ්‍ය වුණත් දෙන්න බැහැ.

මේ ලංකාවේ තිබුණු අකාර්යක්ෂම සහ දූෂිතම ආණ්ඩු කරපු කට්ටිය අද හීනෙන් නැඟිටලා වගේ ඇවිල්ලා අරක කළා, මේක කළා, ජනතාවට පහර දුන්නා කියලා කියනවා. ඒවා ඔක්කෝම දේශපාලන ප්‍රොජෙක්ට්. ඇත්තටම අපි වැඩ කරන විධියක් තිබෙනවා. අපි ෂෝ එක දමන ආණ්ඩුවක් නොවෙයි. මෙතුමන්ලා දැන් කෑ ගහන නිසා අපි ඉඩම් දෙනවාද? නැහැ. එහෙම කෑ ගහලා බලන්න කෝ. අපි ශ්‍රී ලංගමයේ ඒකාබද්ධ වැඩ සටහන්වලට ගියා. ඊට විරුද්ධව හර්තාලුත් කළා. නමුත් අපි නතර කළේ නැහැ නේ.

කොහොම වුණත් ජනතාවට ගැටලුවක් තිබෙනවා, ඔවුන් ඉඩම් අයිතිය ඉල්ලනවා. 1985 දී ගැසට් කරලා තිබියදීත් අවුරුදු 40ක්ම ඉඩම් ඔප්පු දුන්නේ නැත්තේ ඇයි? ඒ නිසා මම මෙය කෙටියෙන් කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමන්ලාගේ ඉල්ලීම මත - මෙතැන Minutes තිබෙනවා, ඒවා ගරු අගමැතිතුමියටත් ලබා දුන්නා - මමත්, ඒ වාගේම ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාත්, the Hon. Kumara Jayakody, Minister of Energy, the Hon. (Dr.) Susil Ranasinghe, Deputy Minister of Land and Irrigation, the Hon. Arun Hemachandra, Deputy Minister of Foreign Affairs and Foreign Employment and the Hon. Roshan Akmeemana, Member of Parliament for Trincomalee District, ඒ වාගේම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිතුමා ඇතුළු ප්‍රධානීන්, Energy Ministry එකේ ප්‍රධානීන්, ඒ සියලුදෙනා කැඳවලා මීට මාස එකහමාරකට කලින් අපි මේ ප්‍රශ්නය ගැන කථා කරලා සම්පූර්ණ තීන්දුවක් ගත්තා. නමුත් මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. කෙටියෙන්ම ගත්තොත්, මුත්තූනගර් කියන ප්‍රදේශයේ සූර්ය බලශක්ති ව්‍යාපෘති සඳහා බලශක්ති සමාගම්වලට බලපත්‍ර ලබා දීලා තිබෙනවා. ඒ පිළිබඳ විස්තර මම **සභාගත*** කරනවා.

ඒ සමාගම් 4ටම land reservations දීලා තිබෙන්නේ මෙසේයි: Blue Sun Technologies (Pvt.) Limited එකට 2022 දෙසැම්බර්; again, Blue Sun Technologies (Pvt.) Limited එකට 2023 නොවැම්බර්; ඊට පස්සේ, Sun Scape (Pvt.) Limited එකට 2023 මාර්තු; ඒ වාගේම, Future Energy Resources (Pvt.) Limited එකට licence එක දීලා තිබෙන්නේ 2024 මාර්තු. ඒ ගොල්ලන්ට lease agreements දීලා තිබෙන්නේ පිළිවෙළින් 2023 ඔක්තෝබර්, 2024 පෙබරවාරි සහ 2024 ජූලි, ඒ වාගේම 2024 අගෝස්තු 23ත් එකක් දීලා තිබෙනවා. මේ එකක්වත් අපි කරපු ඒවා නොවෙයි. මේ ගොල්ලෝ උදව් කරන, මේ ගොල්ලෝ කඩේ යන ආණ්ඩු තමයි මේවා කරලා තිබෙන්නේ. ඒ ආණ්ඩු තමයි මේ සමාගම්වලට ඒවා දීලා තිබෙන්නේ. මේ සමාගම් කෝටි ගණන් වියදම් කරලා තිබෙනවා, ආණ්ඩුවත් එක්ක agreements ගහලා තිබෙනවා, Energy Ministry එකත් එක්ක ගිවිසුම් ගහලා තිබෙනවා. Energy Ministry එකේ අවශ්‍යතාත් එක්ක තමයි ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඒවා බදු දීලා තිබෙන්නේ. එම නිසා මේ ක්‍රියාවලියේ කිසි වැරැද්දක් නැහැ. නමුත් මේවා අපි කරපු දේවල් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවායේ තිබෙන වැරදි ලිහන්නම මාස ගණනක් යන බව ඔබතුමා දන්නවා. මොකද, අපට ගිහිල්ලා *ad hoc* විධියට මේවා කඩන්න බැහැ. ඒ නිසා ඒ සාකච්ඡාවේදී අපි මේ දේ තමයි, කළේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

හොඳයි. මම ඉක්මනින් අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ සාකච්ඡාවේදී අපි කරුණු 5ක් පිළිබඳව තීන්දුවකට ආවා. එකක් තමයි, කලින්ම හඳුනාගෙන තිබෙන හෙක්ටෙයාර් 790ක් තිබෙනවා. එතැන පවුල් 4,000ක් විතර සිටිනවා. එම ඉඩම් වරායට අවශ්‍ය නැහැ කියලා ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින්ම තීන්දු කරලා තිබෙනවා. රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමන්ලා සහ අපි මැදිහත් වෙලා ඔප්පු නැති සියලු දෙනාටම අපි ඔප්පු දෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඒ වාගේම සූර්ය බලශක්ති ව්‍යාපෘතිය පටන් ගත් මුත්තුනගර් කියන ප්‍රදේශයේ වගා කළ ඉඩම් තිබෙනවා, ඒ වාගේම වගා නොකළ ඉඩම් තිබෙනවා. මිනිස්සු seasonally ඇවිල්ලා ඒ ඉඩම්වල වගා කරනවා. අපි ඒකටත් තීන්දුවක් ගත්තා. ඒ නිසා අපි ගත් තීන්දුව තමයි, ඒ power purchase agreements අත්සන් කරලා - එතැන පවුල් 135ක් විතර ඉන්නවා. රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමාට අදහසක් තිබෙනවා, එයින් පවුල් 110ත්, 118ත් අතර ප්‍රමාණයකට ඇත්තටම ඉඩම් නැහැ කියලා - අන්න ඒ power purchase agreementsවලට අත්සන් කර තිබෙන ප්‍රදේශවල ජනතාවට - ඔවුන් කන්න වගා කරමින් ආවා නේ - මේ කන්නය වගා කරන්න ලැබෙන්නේ නැත්නම් අපි ඔවුන්ට වන්දි දෙනවා කියන එක. කන්නයක් වගා කරන්න යන ගණන කීයද කියා සොයා බලා ඒ සියලු දෙනාටම වන්දි ලබා දෙනවා.

ඊළඟට, ඇත්තටම වගා කරන්න ඉඩම් නැති කට්ටිය කවුද කියා සොයා බලා ඒගොල්ලන්ට වගා කටයුතු සඳහා රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමන්ලා ඉඩම් ලබා දෙනවා. ඒ, වරාය ප්‍රදේශයෙන් නොවෙයි, අනෙක් ප්‍රදේශවලින්. මොකද, අපි power purchase agreements නතර කරන්න ගියොත් ඒගොල්ලන් නඩු දමනවා. එහෙම නඩු දැම්මොත් අපට කිසිවක් දෙන්න වෙන්නේ නැහැ.

ඉතාම කෙටියෙන් කිව්වොත්, අපි මේ කරන්න හදන්නේ වරායට අයිතිව තිබී වරාය දැන් අත් හරින්න එකඟ වෙලා තිබෙන ඉඩම් අක්කර 2,500ක හිටපු පවුල් 4,000කට සම්පූර්ණයෙන් ඔප්පු ලබා දීලා එම කරදරයෙන් එම ජනතාව මුදාලීමයි. ඒ වාගේම මුත්තු නගර්වලට කලින් කලට ඇවිල්ලා වගා කරන මිනිස්සුන්ට දැන් වගා කරන්න බැරි වන නිසා විදුලිබල අමාත්‍යාංශයෙන් ඒ අයටත් වන්දි ලබා දෙනවා, මේ මහ කන්නයට අදාළව. ඊළඟට, ඉඩම් නැති අයට වගා කිරීම සඳහාත් සොයා බලා අපි වෙනම ඔප්පු ලබා දෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම එතැන වරාය දියුණු කරන්නත්, එම කර්මාන්ත ඇති කරන්නත් අපි මහන්සි වෙනවා. ඒ නිසා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දේශපාලන නායකයන්ගෙන් අපි ඉල්ලීමක් කරනවා. මේ වරාය තමයි ඔබතුමන්ලාට ලැබී තිබෙන goldenම දේ, වැදගත්ම දේ. ඒකත් වැඩිදියුණු කරගෙන එම ජනතාවගේ අයිතිවාසිකම් ටිකත් ආරක්ෂා කරන්න කියලා අපි ඔවුන්ගෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් තව තත්පර 30ක කාලයක් ඉල්ලා සිටිනවා.

අපි ෂෝ එකට වැඩ කරන ආණ්ඩුවක් නොවෙයි. අපි ප්‍රතිපත්ති ලියාගෙන තිබෙන්නේ අපිට. ඒවා මතකත් නැහැ, මිනිස්සුන්ට. අපේ ප්‍රතිපත්ති, අපිට stone inscriptions. එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නේ, අපි. ඒවා කඩන්න බැරි කරගෙන තිබෙන්නේත් අපිමයි. නමුත් මට එක දෙයක් ගැන කනගාටුවක් ඇති වෙනවා. ඒ මොකද, අවුරුදු 40ක, 50ක කාලයක් පරම්පරා ගණනක් තිස්සේ ඒ පැතිවල මන්ත්‍රීකම් දරපු අය, ඒවාට අදාළව ඔප්පු දුන්නේ නැති අය දැන් මෙතැන කෑ ගහනවා. රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමන්ලා ඒ ජනතාවට ඔප්පු ලබා දෙනකොට එතැනට ගිහිල්ලා කුලියට strikes organize කරන කට්ටියගේ රක්ෂාත් නැති වෙනවා. ගරු රොෂාන් මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ අයට රැකියාත් සොයා දෙන්න.

මට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.35ට, 2025 ඔක්තෝබර් 09වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.35க்கு, பாராளுமன்றம் 2025 ஒக்ரோபர் 09, வியாழக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.35 p.m. until 9.30 a.m. on Thursday, 09th October, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.